# ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් විඳි වේදනා



දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්

ශ්‍රී ලංකා ධර්මදාන සංධානයේ
ප්‍රකාශනයකි

NCEASL

තැ. පැ. 113, දෙහිවල.

# ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් විඳි වේදනා



දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් විසිනි

Living Sacrifice Book Company
P.O. Box 2273
Bartlesville, OK 74005-2273

# Tortured For Christ

## Sinhalese Edition

Copyright 2015 Voice Media

info@VM1.global
Web home: www.VM1.global

All rights reserved. No part of the publication may be reproduced, distributed or transmitted in any form or by any means, including photocopying, recording, or other electronic, or mechanical methods, without the prior written permission of the publisher, except in the case of brief quotations embodied in critical reviews and certain other noncommercial uses permitted by copyright law. For permission requests, email the publisher, addressed "Attention: Permission Coordinator," at the address above.

This publication **may not be sold, and is for free distribution** only.

# කැපකිරීම

ගරු දේවගැති ඩබ්. ස්ටුවර්ට් හැරිස් වෙතය.
ප්‍රධාන අධ්‍යක්ෂක, යුරෝපීය කිතුණු දූතක සේවය ලන්ඩන් මොහු
1964 දී මාව සිරෙන් නිදහස් කල විට බටහිර ලෝකයේ
කිතුණුවන්ගේ පනිවිඩකරුවෙකු ලෙස රුමේනියාවට පැමිණියේය.
බොහෝ පූර්ව ආරක්ෂක උපක්‍රම අනුගමනය කොට මධ්‍යම
රාත්‍රියේදී පමණ මොහු අපගේ නිවසට ඇතුල්වී අප වෙත ප්‍රේමයේ
වචන සහ සැනසීමේ වචන මෙන්ම කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ
පවුල් සඳහා සහනයද ගෙනාවේය. මේකී විශ්වාසවන්ත
ඇදහිලිවන්තයන් වෙනුවෙන් මම මෙහි දී
අපගේ කෘතඥතාවය පලකර සිටිමි.

# පටුන

පෙරවදන

1. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් රුසියානුවන්ගේ තදබල ආශාව ........ 17

2. "මීට වඩා මහත් ප්‍රේමයක් මනුෂ්‍යයෙකුට නොමැත්තේය" ........ 45

3. වන්දිය ගෙවීම සහ බටහිර රටක වැඩ කිරීම පිනිස නිදහස් කිරීම........ 65

4. ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් කොමියුනිස්ට්වාදය පරාජය කිරීම........ 71

5. ඇදහිය නොහැකි පැතිරීමක් පවතින රහසිගත සභාව........ 111

6. ක්‍රිස්තියානිය මගින් කොමියුනිස්ට්වාදය පරදවන අන්දම ........ 153

7. බටහිර කිතුණුවන්ට උපකාර කල හැකි ආකාරය........ 181

අවසානය
උගතපුර්ණය
මුලාශ්‍ර

# ප්‍රකාශකයන්ගෙන්

වර්තමානයේ ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමේ හා ගෝලත්වයේ මිලය පිළිබඳ එතරම් අසන්නට නොලැබේ. එවැනිවු වකවානුවක කිතුණු ජීවිතයේ මූලික හරයන්ගේන් එකක් වන ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමේ එක් පැතිකඩක් වන දුක් විදිම සහ ගෝලත්වය පිළිබඳ අපේ කාලයේ ශාන්තුවරයකුගේ චරිතාපදානය පිළිබඳව ලියැවුණු "Tortured For Christ" නැමැති කෘතිය සිංහලයට පරිවර්තනය කිරීමට ලැබීම යුගයේ අවශ්‍යතාවයක් ඉටුකිරීමකි.

තම ජීවිත අත්දැකීම් "ක්‍රිස්තුස් උදෙසා විදි වේදනා" කෘතියක් ලෙස එලි දක්වමින් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීමේ මිලය පිළිබඳව ජීවමාන සාක්ෂියක් ඉදිරිපත් කළ වොයිස් ඔෆ් ද මාටර්ස් හි පුරෝගාමී දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් දේවගැති තුමාටද, මෙම පොත සිංහලයට පරිවර්තනය කොට එය සිංහල කථා කරන කිතුණු පාඨකයාට ලබාදීමට අවසර ලබා දෙමින් මූල්‍ය ආධාර සැපයූ "වොයිස් ඔෆ් ද මාටර්ස්" ආයතනයටද අපගේ හෘදයාංගම ස්තුතිය පුදකරමු.

මෙය ශ්‍රී ලංකා ධර්මදාන සංධානයේ ස්වභාෂා ප්‍රකාශනයන්ගේ එක් කෘතියකි. මෙම කෘතිය එළිය දැක්වීමට සහය දැක්වූ සියලු දෙනාට ස්තුතිවන්ත වන අතර මෙය ශ්‍රී ලාංකික කිතුණු සභාවට ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීම සහ දුක්විදීම පිළිබඳ අත් පොතක් වනු දැකීම අපගේ ප්‍රාර්ථනාවයි, යාච්ඤාවයි.

ශ්‍රී ලංකා ධර්මදාන සංධානය
2007 මාර්තු 08 දා

# පෙරවදන



## “ප්‍රාණ පරිත්‍යාගීවරයා”

“Tortured For Christ” නැමැති කෘතිය සාහිත්‍යමය වටිනාකමක් නොමැති එකක් බව රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් පවසයි. “එය මාව සිරෙන් නිදහස් කොට තුන් දිනකින් පමණක් ලියනු ලැබුවකි. එහෙත් එය පෑනෙන් හා කඳුළු වලින් ලියුවකි. යම්කිසි හේතුවක් නිසා දෙවියන්වහන්සේ මේ ලියවිල්ලට ආශිර්වාදකරන්ට තෝරාගත්තේය. එපමණක් නොව උන්වහන්සේගේ අරමුණු සඳහා එය උපයෝගීකරගන්නට තෝරාගත් සේක.” යනුවෙන් ද ඔහු පවසයි. මෙකී “Tortured For Christ” නැමැති කෘතියේ 30 වෙනි සංවත්සරික මුද්‍රණය තුල වෙනස්කම් කර ඇත්තේ ස්වල්පයකි. සභා පාලකවරයෙකුගේ දාහතර අවුරුදු කාලය වු සිරගතවීම පිළිබඳව ආරම්භක සාක්ෂිය නොවෙනස්ව පවතී. එය රුමේනියානු ආඥාදායකත්වය යටතේ සිදුවු එකකි.

වසර ගණනාවක් මුළුල්ලේ “Tortured For Christ” නැමැති කෘතිය භාෂා 65 කට පරිවර්තනය කරන ලදුව ලොව මුළුල්ලේ කෝටි සංඛ්‍යාත පිටපත් ගණනක් බෙදාහරිනු ලැබ තිබේ. මේ සාක්ෂිය ක්‍රිස්තුස් ශරිරය ශක්තිමත් කරලීම පිනිස දෙවියන්වහන්සේ උපයෝගිකරගත් ආකාරය ගැන අපි නොකඩවා පුදුමයට පත්වන්නෙමු. මෙකී ශරිරය තුල, ජයග්‍රහණය, ධෛර්යමත්කම, නැවත ප්‍රකෘතිතත්වයට පත්වීමේ හැකියාවට දේශසීමා මායිම්, හමේ වර්ණය, ජාතිකත්වය නොපවතින බව අපි සොයාගනු ලැබ තිබේ. ශුද්ධාත්මයාණන්වහන්සේ කාරණකොටගෙන සියල්ලන්ට ඒවා සමාන ලෙස බෙදා දෙනු ලැබේ.

චීන දේවගැතිවරුන්, ඇමරිකානු භාර්‍යාවන් සහ අරාබි ටැක්සි රියදුරන් යන සියලුදෙනාම මේ මගින් එනම් රුමේනියානු යුදෙව්වෙකු විසින් ලියූ පොතක් මගින් ආනුභාවයක්, ධෛර්‍යමත්කමක් ලබන බව දැනගැනීම ඉතාමත් කුතුහලය දක්වන සුළු එකකි. 1970 ගණන් වලදී දකුණු වියට්නාමය කොමියුනිස්ට්වරු විසින් අල්ලාගනු ලබන්ට යෙදෙතැයි පැවති බලාපොරොත්තුව යටතේ එහි සිටි වියට්නාම ගෘහ සභා පාලකවරයෙකු මා සමග පැවසුවේය. ඔව්හු "Tortured For Christ" නැමැති කෘතියෙහි වියට්නාම් පරිවර්තනය ආරක්ෂාවීමේ මගපෙන්වීම දක්වන පොතක් ලෙස බෙදාහරින ලද අතර අතිශයින් අමාරු වතාවරණයක් තුලදී ඇදහිල්ල ජයගන්නාවූ අන්දම පිළිබඳව සාක්ෂියක් හැටියට ද එය බෙදාහරිනු ලැබීය. මේ පොත කියවීමෙන් යේසුස්ක්‍රිස්තුස්වහන්සේ සමග පුද්ගලික සම්බන්ධතාවයකට ඇතුල්වූ ආකාරය ගැන බොහෝ දෙනා අපට ලියුම් එවා තිබුනි. ඔවුන් එසේ කරනලද්දේ ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය බලවත් යථාර්තයක් ලෙස අවබෝධකරගනිමිනි. මේ අනුව බලන කල මේකී පිටු මගින් දේශපාලනමය පහරදීමක් සිදු නොකරන නමුත් එය ඉදිරිපත් කරන්නේ ප්‍රාණ පරිත්‍යාගීවරයෙකුගේ ශුභාරංචි "සාක්ෂිය" යි.

වර්තමානයේ බොහෝ දෙනා සිතන්නේ ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු යනු එක එල්ලේම තමුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් මරණයට පත්වූ තැනැත්තෙකු කියාය. අවාසනාවන්ත ලෙස මේකී අර්ථදැක්වීම කරණකොටගෙන අපට ප්‍රාණ පරිත්‍යාගීභාවයේ සැබෑ වැදගත්කම හා ගැඹුරත්වය අහිමි කොට ඇත. ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු වන්නේ එකී පීඩා විඳීමෙන් නොව ඒ සඳහා ඉඩ සැලසුනු හේතුව කරණකොටගෙනය" යැයි වරක් සාතන් ඔගස්ටින්තුමා පැවසුවේය. ටී. එස්. එලියට් විසින් "ආසන දේව් මැදුර තුල සිදුවූ මිනිමැරුම" නැමැති තම නාටකය තුල ප්‍රාණපරිත්‍යාගීවරයෙකුව විස්තර කලේ මෙවැනි වදනකි. "ඔහු දෙවියන්වහන්සේගේ ආයුධයක් බවට පත්වුනු, තම කැමැත්ත දෙවියන්වහන්සේගේ කැමැත්ත තුල අහිමි වී ගිය, එහෙත් එය අහිමි වී ගිය නමුත් එය සොයාගනු ලැබූ තැනැත්තෙකි. එබැවින් ඔහු දෙවියන්වහන්සේට යටත්වීම තුල නිදහස සොයාගත් තැනැත්තෙකි. ප්‍රාණ පරිත්‍යාගීවරයා කිසිම දිනක තමන් වෙනුවෙන් කිසිවකට ආශානොවේ. එපමණක් නොව ඔහු ප්‍රාණ පරිත්‍යාගීභාවයේ ගෞරවය හා මහිමයට පවා ආශානොවේ."

ආරම්භක ග්‍රීක් අදහසට අනුව "ප්‍රාණ පරිත්‍යාගීවරයා" යන අරුත ඇති "Martyr" යන ඉංග්‍රීසි වචනයෙහි අර්ථයවන්නේ "සාක්ෂිකරුවා"

එනම් "witness" යන්නයි. හෙබ්‍රෙව් ලේකකයා මෙසේ සඳහන් කරයි. "සාක්ෂිකරුවන් මහත් වූ සමූහයක් මඟින් අපව වටකරනුලැබ තිබේ." (මෙහි සාක්ෂිකරුවන් යන්නට යොදා ඇත්තේ Martyrs" යන්නට යෙදූ ග්‍රීක් වචනයම වේ)" (හෙබ්‍රෙව් 12:1) තවද යේසුස්වහන්සේ ක්‍රියා 1:8 තුල අපට මෙසේ උපදෙස් දෙයි. "නුඹලා යෙරුසලමෙහි ද සකල යුදයාව තුල ද සමාරියාව සහ පොළොවේ කෙලවර දක්වා මාගේ සාක්ෂිකාරයන් (ප්‍රාණ පරිත්‍යාගීවරුන්) වන්නහුය."

නව ගිවිසුමේ ප්‍රාණ පරිත්‍යාගීවරයා යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ සත්‍යතාවය හා බලය පුද්ගලිකව, සාක්ෂිදරන්නාවූ අයෙකු පමණක් නොව ඒ සඳහා වැයවන මිළය ගැන තැකීමකින් තොරව අන්‍යයන්ට සාක්ෂිදැරීමට උපදෙස් ලැබ තිබෙන අයෙකි. පසුව ක්‍රියා පොත තුල ස්තේපන්ට ගල්ගැසීම පිළිබඳ සිද්ධියෙන් අපි කියවනුයේ සාක්ෂිදැරීම සඳහා වැයවන එකී පරම මිළය ගෙවීමට භාග්‍යලද්දා වූ ප්‍රථම තැනැත්තා හැටියට ඔහු පත්වූ බවයි. මේ කාලයේ දී ප්‍රාණ පරිත්‍යාගීවරයා නැමැති වචනය වඩා බලවත් අර්ථයක් ගෙනදුන් බව පෙනී යයි. එකී අර්ථය නම් සාක්ෂි දැරීමට පමණක් නොව ඉහත කී පත්වීමට හෝ තම ජීවිතය දීමට හෝ කැමති තැනැත්තෙකු යන වගයි.

ඉතාමත් බරපතල සත්‍යතාවය වන්නේ සාක්ෂිදැරීම පිනිස අපි දැරිය යුතු මිළය බරපතල එකක් වේය යන්නයි. එයට අපගේ ගෞරවය, ඕනප්‍රියතාවය සහ කීර්තිය පවා වැයවන්නට පුළුවන. එයට අපගේ පවුල්, මිතුරන්, හෝ අපගේ ජීවිත පවා වැයවන්නට පුළුවන. එහෙත් අපගේ සාක්ෂිදැරීමේ පනිවිඩය කොතරම් බලවත් එකක් දැයි කිවහොත් "සියලු බර පසකට දමා, අපව පහසුවෙන් උගුලට අසුකරගන්නා වූ පාපය ද පසකට දමා" (හේබ්‍රෙව් 12:1) යනුවෙන් අපට උපදෙස් දෙනු ලැබ තිබේ. එසේ උපදෙස් දෙනු ලැබ ඇත්තේ දෙවියන්වහන්සේ අපගේ ජීවිතය තුල අප ඉදිරියෙහි පිහිටුවා තිබෙන "දිවීම" දරාගනිමින් දුවන පිනිසය.

ක්‍රිස්තුස්වහන්සේගේ පනිවිඩය වූ "සාක්ෂිදැරීම" සඳහා භෞතික දේශ සීමාවන් වලට හෝ සීමා මායිම් වලට සීමාවී නැත. අප විසින් සුදුසු යැයි පෙනෙන පරිදි එය මත තබන්නාවූ කිසිදු ලේබලයක් හෝ එය යම් පෙට්ටියක් තුලට අපි අඩංගුකරන්නේ නම් එය ද හෝ අභිබවා එය ඉන් ඔබ්බට පවා විනිවිද පැතිරයයි. ප්‍රාණ පරිත්‍යාගීභාවය යනු බලාපොරොත්තු කඩවීමේ මානසික අසහනයකට පත්වීම නොව ගෝලීය

වු කිතුණු යථාර්තයෙහි යාච්ඤාවෙන් යුක්ත අවබෝධයක් තුලට අවශ්‍යවශයෙන්ම ගමන්කිරීමයි. ...... එය "ක්‍රිස්තුස්බහන්සේ වෙනුවෙන් පවරනු ලැබූ" – "උන්වහන්සේගේ නාමය නිසා වේදනාවිඳීම පිනිස" (පිලිප්පි 1:29) වු තත්වයන්ට පිවිසීම පිනිස පිළිගත යුතුවූ අවශ්‍යම දෙයකි. මේකී සාක්ෂිකරුවන්ගේ හෝ ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ ඇදහිල්ල පාලනය කරනුලබන්ට හෝ මරාදමන්නට නොහැක. එයට සිදුකල හැක්කේ "යෙරුසලමෙන් සහ සකල යුදයාවෙන් හා සමාරියාවෙන් ද පොළොවේ කෙලවර දක්වා ද" ඉන් ඔබ්බට ද දෙවියන්වහන්සේගේ රාජ්‍ය විහිදීම පිනිස බීජයක් පැලකිරීමට පමණකි (ක්‍රියා 1:8). එය යේසුස්වහන්සේගේ සත්‍යතාවයට සාක්ෂිදැරීම පිනිස ඔවුන්ගේ සාක්ෂිමත් ජීවිතයන් තුලින් සිදුකරනු ලැබේ. ක්‍රිස්තුස්වහන්සේ මෙසේ පැවසීය. "මේ පර්වතය පිට මම මාගේ සභාව ගොඩනගන්නෙමි. පාතාලයේ දොරටු එය අභිබවා ජයගන්නේ නැත" (මතෙව් 16:18).

මේකී අවබෝධය තුලින් දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් පිළිබඳව දැනගැන්මකට මා පැමිනියේ ඔහු තමාගේ මුළු ජීවිතය පුරාම ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු පිළිබිඹු කල නිසාය. එසේ කලේ මරණය විඳීමෙන් නොව වේදනාවිඳීම තුලින් සාක්ෂි දැරීම හේතුකොටගෙනය.

"Tortured For Christ" කෲර කොමියුනිස්ට් පාලනයේ හස්තය යටතේ වේදනාවිඳි මනුෂ්‍යයෙකුගේ ජීවිතය වටා සබැඳි කාරණා අනාවරණය කරන්නාවු පොතක් පමණක් නොව එය ක්‍රිස්තුස්වහන්සේ වෙත මනුෂ්‍යයෙකුගේ සැබෑ කැපවීම හා අන්‍යයන් සමඟ සත්‍යතාවය බේදාගැනීමට ඔහුට තිබෙන ආශාව පිළිබඳ දෘඩ උත්සහය සහ තදබල ඇදහිල්ල අනාවරණයකරයි. මේකී සෑම පිටුවක් තුලින් ජීවමානව නික්මෙන්නේ මේකී සත්‍යතාවයයි. එය බටහිර රටවල කිතුණුවන්ගේ සිතුවිලි රටාව වෙනස්කරයි. එසේ කරනුයේ ඉතිහාසය මුළුල්ලේ සහ වර්තමානයේ අදත් කිතුණුවන් දරාගන්නාවු භයානක වේදනාවිඳිම් සහ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ බලයට සහ උන්වහන්සේගේ ජීවිතයට සාක්ෂිදැරීම පිනිස මරණයට පත්වීමට පවා පසුබටනොවන්නාවු අනාවරණයවීම කරණකොටගෙනය.

මේ සාක්ෂිය ජීවත්වන එකක්වීම අපගේ යාච්ඤාව වේ. එමගින් යේසුස්ක්‍රිස්තුස්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය වඩා ගැඹුරුවූ දැනගැන්මකට පැමිණෙනු ඇතැයි සහ මේ පොළොව මත අපගේ යුතුකම පිළිබඳව වඩා ගැඹුරු දැනගැන්මකට අපි පත්වෙනු ඇතැයි අපගේ

යාච්ඤාව වේ. ප්‍රාණ පරිත්‍යාගීවරයෙකුගේ ජීවිතයෙහි සැබෑ අංගෝපාංග සහ දෙවියන්වහන්සේගේ කැමැත්ත කරණකොටගෙන එසේ වන්නේ නම් මෙවැනි සාක්ෂිකාරයෙකු වීමට කැමැත්තක් අප තුල තිබීමේ පුළුවන්කම පිළිබඳව අවබෝධයකට මෙමගින් අපි පැමිණෙන්නෙමු.

ටොම් වයිට්

අධ්‍යක්ෂක, ද වොයිස් ඔෆ්ද මාටර්ස් (ඇ.එ.ජනපදය)

# 1 පරිච්ඡේදය



# ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් රුසියානුවන්ගේ තදබල ආශාව

## *අදේවවාදියෙක් ක්‍රිස්තුස්වහන්සේව හඳුනා ගැනීම*

ජීවිතයේ පළමු වසරේදී මම අනාථවූවෙක්ව සිටියෙමි. ආගමක් හඳුනා නොගත් පවුලක හදාවඩාගත් කෙනෙකුව සිටියෙමි. ළමයෙකු ලෙස මට ආගමික අධ්‍යාපනයක් නොලැබිනි. තිත්ත ළමා කාලයෙහි ප්‍රථිපලක් වශයෙන් එනම් පළමුව ලෝක මහා යුද්ධයේ අමාරු කාලවල දිළිඳුකමින් පිරි ජීවිතයක් ගතකරද්දී වයස අවුරුදු 14ක් වන විට වර්තමානයේ කොමියුනිස්ට්වරුන් මෙන් මමද අදේවවාදී පොත් සෙවිවෙමි. එය මම දෙවියන්වහන්සේ තුල හෝ ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාස නොකිරීම පමණක් නොව – මම මෙවැනි හැඟීම් වලට වෛර කිරීමද සිදු කලෙමි. ඒවා මිනිස් මනසට හානිදායක බව සැලකුවෙමි. එලෙස මා වැඩුනේ ආගම කෙරෙහි තිත්තකම ඇතුවය.

එහෙත් මම මා නොදන්නා හේතුවක් නිසා දෙවියන්වහන්සේ විසින් තෝරාගත්තවුන් අතරින් එක් කෙනෙකු වීමේ අනුග්‍රහය ලැබු බව පසුව අවබෝධ කරගතිමි.

මම අදේවවාදියෙකු ලෙස සිටිය දී මා හට දේවස්ථාන සැමවිටම අනර්ඝනීය ස්ථාන බවට පත්වූයේ හේතු රහිත වු කරුණු නිසාය. දේවස්ථානයක් අසලින් යන විට එයට ඇතුල් නොවී යෑම මට

අපහසු විය. දේවස්ථාන තුල සිදුවන දේ පිළිබඳ මට කිසිදු අවබෝධයක් නොවිය. මම දේශනා ඇසූ නමුත් ඒවා මගේ හදවතට කිසිදු බලපෑමක් නොකලේය. මට, මා විසින් කීකරුවිය යුතු ස්වාමියෙකු වූ දෙවියන්වහන්සේගේ ස්වරූපය තිබිනි. මම මාගේ මනස තුල තිබුණු සිතුවිලි වල පරිද්දෙන් දෙවියන්වහන්සේගේ මේ වැරදි ස්වරූපයට වෛර කෙලෙමි. එහෙත් මේ විශ්වයේ කෙන්ද්‍ර ගත වූ යම් තැනක පවතින ප්‍රේමනීය හදවතක් දැනගැනීමට මම ඉතා ආශාවිමි. ළමා කාලය හා තරුණ කාලයේ මා දැන හිටියේ ප්‍රතිචිම්බ කිපයක් පමණක් බැවින් මා හට දැනෙන තරමේ හෘද ස්පන්දනයක් ඇති ප්‍රේමනීය හදවතක් දැනගැනීමේ ආශාවෙන් මම තදින් හසුවුනෙමි.



මම අදේවවාදියෙක් විමි. එහෙත් අදේව දෘෂ්ටිය මාගේ සිතට සමාදානයක් ගෙන නොදුන්නේය.

දෙවිකෙනෙක් නැතැයි මා තුලම ඒත්තුගතිමි. එබදු ප්‍රේමනීය දෙවිකෙනෙක් නොසිටීම ගැන මම කණගාටුවුයෙමි. වරක් මාගේ ඇතුලාන්ත ආත්මික ගැටුමක් හේතුකොට ගෙන මම කතෝලික දේවස්ථානයකට ඇතුල්වුයෙමි. මනුෂ්‍යයන් දණගසා යමක් පවසනු මම දුටුවෙමි. මම ද ඔවුන් අසලින් දනගසා ඔවුන් පවසන දෙය අසන්ට මට පුළුවන් බැවින් එම යාච්ඤාවන් නැවත කීමෙන් යමක් සිදුවේ නම් එය දකින්නට හැකි වෙතැයි මම සිතුවෙමි. ඔව්හු කන්‍යා මරිය තුමීට යාච්ඤාවක් පැවසුවෝය. "නමෝ මරියනි ප්‍රියප්‍රසාද පූර්ණවන්තියනි" මම නැවත නැවතත් මේ වචන කියෙව්වෙමි. මම කන්‍යා මරියාවන්ගේ රූපය දෙස බැළුවෙමි. කිසිවක් සිදු නොවිය. මම ඒ පිළිබඳව අතිශයින් කණගාටුවුයෙමි.

දිනක් මම ඉතාමත් තදින් අදේවවාදියෙකු වූ බව දෙවියන්වහන්සේට මෙලෙස යාච්ඤා කෙලෙමි. මාගේ යාච්ඤාව මෙවැන්නක් විය. "දෙවියන්වහන්ස ඔබ වැඩ නොසිටින බව සහතිකයෙන්ම දනිමි. එනමුත් ඔබ අහම්බෙන් හෝ වැඩ සිටින්නේ නම් ඔබ තුල විශ්වාසය නොතැබීම මාගේ යුතුකමකොට සලකන මම ඔබ සමඟ පොරබදිමි. මා

හට ඔබව අනාවරණය කිරීමේ වගකීම ඔබ සතුය." මම අදේවවාදියෙක් විමි. එහෙත් අදේවවාදය මාගේ සිතට සමාදානයක් නොගෙනාවේය.

ඇතුලාන්ත කැලඹිලිකාර ගතියෙන් පසුවු මේ කාලය තුල රුමේනියාවේ කඳුකරයක මුදුන් කොටසෙහි ගම්මානයක වාසය කල මහලු වඩුවෙකු මේ ආකාරයට යාච්ඤා කලේය. "මාගේ දෙවියන්වහන්ස මම පොළොවේ දී ඔබට සේවය කලෙමි. මම පොළොවේ දී මෙන්ම ස්වර්ගයේ දී ද මාගේ විපාකය ලබන්ට ආශාවෙමි. මාගේ විපාකය විය යුත්තේ යුදෙව්වෙකු ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ඒමෙන් තොරව මා මියනොයන පිණිසයි. ඒ මන්දයත් යේසුස්වහන්සේ පැමිණියේ යුදෙව් සෙනඟගෙන් වන නිසාය. මම දුප්පත් මහලු රෝගී තැනැත්තෙක්මි. මට තැනින් තැනට ගොස් යුදෙව්වෙකු සෙවිය නොහැක. මාගේ ගමේ යුදෙව්වෙක් නැත්තේය. මාගේ ගමට යුදෙව්වෙකු ගෙන එන්න. ඔහුව ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ඒමට මට කලහැකි උපරිම දෙය මම කරමි."

ප්‍රතිරෝධයක් දැක්විය නොහැකි යම් දෙයකින් මාව ඒ ගම්මානයට ඇදගෙන ආවේය. මට එහි යාමට හේතුවක් නොතිබිනි. රුසියාවේ ගම්මාන දොළොස් දහසක් තිබේ. ඒතාක් මා ගියේ ඒ ගම්මානයටයි. මම යුදෙව්වෙකු වශයෙන් දැනීම නිසා වඩුවා මාගේ ආශ්‍රයට වැටිනි. අලංකාර ගැහැණු ළමයෙකුගේ ආශ්‍රයට වැටුනාක් මෙන් ඔහු එසේ කලේහිය. ඔහු මාව දුටුවේ ඔහුගේ යාච්ඤාවට පිළිතුරු හැටියටය. ඔහු මට කියවීමට බයිබලයක් දුන්නේය. මීට පෙර බොහෝ වාර ගණනක් ආශාවකින් යුතුව මම බයිබලයක් කියවා ඇත්තෙමි. එතාක් ඔහු මට දුන් බයිබලය වෙනත් ආකාරයක බයිබලයක් විය. පසු කලෙක ඔහු මට පැවසු අන්දමට ඔහුත් ඔහුගේ භාර්‍යාවත් මා හා මාගේ භාර්‍යාවගේ සිත් හැරීම වෙනුවෙන් පැය ගණනක් යාච්ඤා කලෝය. ඔහු මට දුන්නාවු බයිබලය වචන එතරම් සඳහන් නොවු එකක් විය. එය ඔහුගේ යාච්ඤාවලින් ගිනි ඇවිලුනු ප්‍රේමයේ ගිනිදළු වලින් පිරුණු එකක් විය. මම යන්තම් එය කියෙව්වෙමි. මට යේසුස්වහන්සේගේ ජීවිතය සමඟ මාගේ නපුරු ජීවිතය සසඳමින් වැලපෙන්නට පමණක් හැකිවුනි. උන්වහන්සේගේ ධර්මිෂ්ටකම සමඟ මාගේ අපවිත්‍රකම ද උන්වහන්සේගේ ප්‍රේමය සමඟ වෛරය ද සසඳමින් වැලපෙන්නට හැකිවුයෙමි. — තවද උන්වහන්සේ මාව උන්වහන්සේගේම අයෙකු ලෙස පිළිගත්තේය.

ඉන්පසු වැඩි කල්යන්ට මත්තෙන් මාගේ භාර්‍යාවගේ ද සිත් හැරුනි. ඇය වෙනත් ආත්ම ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙනාවේය. එකී

වෙනත් ආත්ම තවතවත් ආත්ම ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙනාවේය. එලෙස රුමේනියාවේ අළුත් ලූතරන් සභාවක් පැන නැගුනි.

ඉන් අනතුරුව අපට මහත් සේ පීඩාවිඳින්ට සිදුවුනු නාසිවරුන්ගේ පාලනයට රට යටත්විනි. රුමේනියාව නාසිවරු ප්‍රොතෙස්තුන්ත කණ්ඩායම් වලට හා යුදෙව්වන්ට පීඩා කල අතිශයින් ලෝක සම්මතවාදී පුද්ගලයින්ගෙන් සැදුම්ලත් ආඥාදායක ආකාරයේ පාලනයක් පවත්වාගෙන ගියේය.

මාගේ විඳිමත් අභිෂේක කිරීමට ප්‍රථම පවා, මම දේව සේවය සඳහා සුදානම්විමට ප්‍රථම පවා මම මේ සභාවේ නායකයා විමි. එහි ආරම්භකයාව ද සිටියෙමි. මම ඒ ගැන වගකීමෙන් යුක්තව සිටියෙමි. කීපවරක්ම මා හා මාගේ භාර්‍යාවත් අත්අඩංගුවට ගෙන භාර දෙනු ලැබ නාසි විනිශ්වයකරුවන් ඉදිරියේ නඩු විභාග වලට ලක්වුනෙමි. නාසි භීෂණය අතිමහත් එකක් විය. එතාක් එය කොමියුනිස්ට්වරු යටතේ පැමිණෙන්නට තිබුණු භීෂණයේ බින්දු කිපයක් තොල ගා රස බැලිමක් පමණක් විය. මාගේ පුත්‍රයා වු මිහායිට ඔහුගේ මරණය වැලැක්විම පිණිස යුදෙව් නොවන නාමයක් ආරෝපණයකරගැනිමට සිදුවිය.

එහෙත් මෙහි නාසි කාලයේ දී එක් මහත් වරප්‍රසාදයක් පැවතිනි. ඔවුන්ම අපට ඉගැන්වු අන්දමට කායික පහරදීම් දරාගැනිමට පුළුවන. තවද දෙවියන්වහන්සේගේ උපකාරය ඇතුව මිනිස් ආත්මය භයානක වද වේදනා වලින් ගලවන්නට හැකිය. ඕව්හු අපට රහසිගත කිතුණු ක්‍රියාකාරකම් සඳහා උපක්‍රම ඉගැන්නුවෝය. එය මිට වඩා වැඩි වු බේදජනක පීඩාවක පැමිණිමට අපව සුදානම් කිරිමක්විය. – එම බේදජනක පීඩාව යන්තම් අප ඉදිරියෙන් පැමිණෙමින් තිබිනි.

## *රුසියානුවන් වෙත මාගේ සේවය.*

අදේවවාදියෙකුව සිටිමේ දුකින් බැහැරව මාගේ සිත් හැරිම සිදුවු පළමු දිනයේ ම මම රුසියානුවන්ට සාක්ෂිදැරීමට හැකිවනු පිණිස මහත්සේ ආශා වුනෙමි. රුසියානුවෝ ළමා කාලයේ සිට ආදේවවාදය තුල ඇති දැඩිවුවෝවෙති. රුසියානුවන් වෙත යෑමේ මාගේ ආශාව ඉෂ්ට වුනි. ඔවුන් වෙත යෑම පිණිස මට රුසියාවට යෑමට උවමනා නොවිය. එය ඉෂ්ටවෙන්ට පටන්ගත්තේ නාසි පාලන කාලයේදිය. ඒ මන්දයත් අපට ක්‍රිස්තියානි වැඩවල යෙදෙන්නට පුළුවන්වුයේ රුසියානු යුධ සිරකරුවන් දහස් ගණන් අතරේය. ඔවුහු රුමේනියාවේ සිටි අයවුහ.

එය විශ්මයජනක සිදුවීමක් විය. සක්‍රිය සිදුවීමක් සත්‍ය සිදුවීමක් විය. රුසියානු යුධ සිරකරුවෙකු සමග මාගේ ප්‍රථම හමුවීම මට කිසිකලෙකත් අමතකනොවේ. ඔහු ඉංජිනේරුවෙකි. ඔහු දෙවියන්වහන්සේ තුල විශ්වාසය තබනවා දැයි මම ඔහුගෙන් විමසුවෙමි. "නැත" යනුවෙන් ඔහුගෙන් පිළිතුරු වී නම් මම එය වැඩියෙන් ගණන් නොගන්නට ඉඩ තිබිනි. විශ්වාස කිරීම හෝ නොකිරීම සෑම මනුෂ්‍යයෙකු සතු තේරීමකි. මම මේ ප්‍රශ්නය ඔහුගෙන් අසූ විට ඔහු අනවබෝධයෙන් යුතුව ඔහුගේ ඇස් මා වෙත දිගුකරමින් මෙසේ පැවසීය. "විශ්වාස කිරීමට මට හමුදා ආඥාවක් ලැබී නැත. එසේ ආඥාවක් ලැබුනොත් මම විශ්වාසකරන්නෙමි."

කඳුළු මාගේ දෙකොපුල් දිගේ රුරා වැටුනේය. මාගේ හදවත ඉරි ගියාක් මෙන් විනි. මනස මැරුනාවු මනුෂ්‍යයෙක් මා ඉදිරියෙහි සිටින්නේය. දෙවියන්වහන්සේ මනුෂ්‍ය සංහතියට දුන් ශ්‍රේෂ්ඨතම දීමනාවක් – එනම් ඔහුගේ පුද්ගල අනන්‍යතාවය නැති මනුෂ්‍යයෙක් මා ඉදිරියෙහි සිටින්නෙහිය. ඔහුගේ මනස කොමියුනිස්ට්වරුන්ගේ අතෙහි සෝදනු ලැබු ආයුධයක් මෙන් විය. විශ්වාස කිරීමට සූදානම් වීම හෝ ආඥාවක් නොවීම එයට හේතුව විය. ඊට වඩා වැඩි යමක් ඔහුට සිතන්නට නොහැක. මෙය කොමියුනිස්ට් පාලනයෙන් පසු රුසියාවේ දක්නට ඇති සාමාන්‍ය දෙයකි. කොමියුනිස්ට්වාදය මනුෂ්‍ය සංහතියට කරතිබෙන දෙය දැකීමෙන් කම්පනයට පත්වූ මම මේ මිනිසුන් වෙනුවෙන් මාගේ ජීවිතය කැප කිරීමට දෙවියන්වහන්සේට පොරොන්දුවීමි. ඔවුන්ට ඔවුන්ගේ පෞරුෂත්වයන් නැවත ලබාදීමට දෙවියන්වහන්සේ තුල හා ක්‍රිස්තුස්වහන්සේ තුල ඇදහිල්ල ඔවුන්ට ලබාදීමට මම කැපවෙන්ට යෙදුනෙමි.

1944 අගෝස්තු 23 වන දින සිට දශලක්ෂයක රුසියානු හමුදාවෝ රුමේනියාවට ඇතුල්වූහ. මින් කලට පසු කොමියුනිස්ට්වරු අපගේ රටෙහි බලයට පත්විය. එතැනින් නාසිවරුන්ගෙන් පසු සහනයක් බලාපොරොත්තු වු අපට එය භයංකර සිහිනයක් බඳු දෙයක් බවට පත්වන්ට පටන්ගත්තේය.

එකල රුමේනියාවේ ජනගහනය දෙකෝටි හතලිස් ලක්ෂයක් විය. එහෙත් කොමියුනිස්ට් පක්ෂයට සිටියේ සාමාජිකයින් දස දහසක් පමණකි. සෝවියට් දේශයේ විදේශ ලේකම්වරයාව සිටි විසින්ස්කී අපි මහත්සේ ආදරය කල පළමුවෙනි මයිකල් රජුගේ කාර්‍යාලයට කඩාවැදි

ඔහුගේ අත මිට මොලවා මේසයට සැරෙන් පහර දී "ඔබ කොමියුනිස්ට්වරුන්ව රජයට පත්කලයුතුය" යනුවෙන් බලකලේය. අපගේ හමුදාව හා පොලිසිය නිරායුධකරනලදී. කලහකාරිකම් වලින් හා වෛරය වැපිරීමෙන් සහමුලින්ම වාගේ කොමියුනිස්ට්වරු බලයට පත්වුහ. එය එකල ඇමරිකානු හා බ්‍රිතාන්‍ය පාලකයින්ගේ සහයෝගය මත සිදුවුවක් නොවේය.

මනුෂ්‍යයෝ ඔවුන්ගේ පුද්ගලික පාප ගැනත් ඔවුන්ගේ ජාතික පාප ගැනත් දෙවියන්වහන්සේ ඉදිරියේ වගකිවයුත්තාහ. යටත්කරගත් සියළු ජාතීන්ට අයත් වු බේදවාචකයට ඇමරිකානු හා බ්‍රිතාන්‍ය කිතුණුවන්ගේ හදවත් වගකිවයුතුය. ඇමරිකානුවන් දැන දැනම අප මත මරණය හා භීෂණය ගෙනදෙන ආණ්ඩුවක් පත්කිරීමට රුසියානුවන්ට උපකාරකල කාලයක් තිබු බව දැනගතයුතුය. ක්‍රිස්තුස් ශරීරයේ කොටසක් ලෙස යටත්කරගත් සෙනඟට ක්‍රිස්තුස්වහන්සේගේ ආලෝකය කරා පැමිණෙන පිනිස උදව්කිරීම මගින් මේ පිළිබඳව ඇමරිකානුවන් සමගිකිරීමක් කලයුතුය.

## *සභාව නොමඟයැවීම*

කොමියුනිස්ට්වරු බලයට පත්වු පසු ඔවුන් දක්ෂ ලෙස සභාව නොමඟයැවීමේ මාර්ග උපයෝගිකරගත්හ. ප්‍රේමයේ භාෂාව හා නොමඟයැවීමේ භාෂාව එක හා සමානය. ගැහැණු ළමයෙකු භාර්‍යාවක් කරගැනිමට කැමති තැනැත්තා හෝ ඇය සමඟ රාත්‍රියක් ගතකිරීමට කැමති තැනැත්තා පවසන්නේ එකම වදනකි. "මම ඔබට ආදරෙයි" යන්නයි. යේසුස්වහන්සේ ප්‍රේමයේ භාෂාව හා නොමඟයැවීමේ භාෂාව විමසන්නට අපට පැවසුවේය. අවාසනාවන්ත ලෙස කොමියුනිස්ට්වරු බලයට පත්වු පසු දහස් ගණන් පුජකයින්, සභාපාලකවරුන් සහ දේවගැතිවරුන් මේ හඬවල් දෙක අතර වෙනස හදුනාගැනිමට දැන නොසිටියහ.

කොමියුනිස්ට්වරු සියලු ක්‍රිස්තියානි ආයතන වල ජාතික සංගමයක් අපගේ පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ රැස් කලෝය. සියලු නිකාය වල පුජකවරු, සභාපාලකවරු, දේවගැතිවරු 4000ක් පමණ එහි සිටියෝය. මේ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෝ මේ කොන්ග්‍රසයේ ගෞරවනීය සභාපති හැටියට යෝසෙප් ස්ටාලින්ව තෝරාගත්තේය. ඒ කාලයේදීම ඔහු ලෝක ව්‍යාප්ත දේව අභක්තික ව්‍යාපාරයේ සභාපතිවරයා හා

කිතුණු සමූලඝාතන කිරීමේ ව්‍යාපාරයේ මූලිකයාද විය. එක් කෙනෙක් පසුපස එක් කෙනෙක් බිෂොප්වරු, සභාපාලකවරු, නැගිට කොමියුනිස්ට්වාදයත් ක්‍රිස්තියානි දහමත් මූලික වශයෙන් එක සමාන බව ප්‍රකාශකරමින් ඒ දෙකට එකට පැවතිය හැකි බව ප්‍රකාශකලෝය. එක් එක් දේවගැතිවරයා කොමියුනිස්ට්වාදය කෙරෙහි ප්‍රශංසා මුඛයෙන් කථා කලෝය. ඔව්හු අළුත් ආණ්ඩුවට සභාවේ පක්ෂපාතිභාවය සහතික කලෝය.

මාගේ භාර්‍යාවත්, මමත් මේ කොන්ග්‍රසයේ සිටියෙමු. සබිනා මට කථා කොට "රිචඩ් නැගිට ක්‍රිස්තිස්වහන්සේගේ මුහුණින් මේ ලැජ්ජාව සෝදාහරින්න. ඔවුහු උන්වහන්සේගේ මුහුණට කෙල ගසමින් සිටියි." යැයි පැවසුවේය. මට ඇය පැවසුවේ "මම මෙසේ කිව්වොත් ඔබට ස්වාමිපුරුෂයා අහිමිවන්නේය." ඇගේ පිළිතුරවුයේ "නිවටයෙක් මාගේ ස්වාමිපුරුෂයාව සිටිමට මම කැමැති නොවෙමි" යන්නයි.

අනතුරුව මම නැගිට මේ කොන්ග්‍රසය ඉදිරියේ කථා කෙලෙමි. එතාක් යේසුස්ක්‍රිස්තුස්වහන්සේ සඳහන් කලේ අපගේ පක්ෂපාතිබව පළමුකොට උන්වහන්සේට හිමිවිය යුතු බවයි. මේ කොන්ග්‍රස් සභාවේ කරනලද කථා ගුවන් විදුලියෙන් විකාශනය කරනලදී. මුළු රටටම කොමියුනිස්ට් පාර්ලිමේන්තුවේ වේදිකාවේ සිට ක්‍රිස්තුස්වහන්සේගේ පණිවිඩය අසන්නට ඉඩසැලසිනි. මින් පසු මා හට මේ සඳහා මිළගෙවන්නට සිදුවුනි. එහෙත් එය එසේ සිදුවිම මම අගේ කොට සලකන්නෙමි.

කොමියුනිස්ට්වාදයට යටත්වීමට ඔර්තඩොක්ස් සභා නායකයින් හා ප්‍රොතෙස්තන්ත සභා නායකයින් අතර තරගයක් හටගත්තේය. ඔර්තඩොක්ස් තමාගේ ලෝගුවෙහි දැකැත්ත හා මිටිය යන සලකුණු දමාගෙන තම පූජකයා අමතා තවදුරටත් තමාට "උතුමාණෙනි" කියා නොඅමතන ලෙසත් "සහෝදර බිෂොප්තුමා" කියා අමතන ලෙසත් පැවසීය. පැට්‍රිස්තොයි සහ රොපියානු යන පූජකවරු වඩා සෘජු ලෙස කොමියුනිස්ට්වරුන්ට යටත්වුහ. ඔව්හු රහස් පොලිසියේ නිලධාරීන් බවට පත්වුහ. රුමේනියාවේ ලූතරන් සභාවේ නියෝජ්‍ය බිෂොප්වරයාව සිටි රැප් බිෂොප්වරයා දේව ධර්ම ශාස්ත්‍රාලය තුල අළුත් දේව ධර්මයන් උගන්වන්ට පටන්ගත්තේය. දෙවියන්වහන්සේ එළිදරව්වීම් තුනක් දුන් බවත් එකක් මෝසෙස් තුලින් බවත් එකක් යේසුස්වහන්සේ තුලින් බවත් තුන්වැන්න ස්ටාර්ලින් තුලින් බවත් අවසාන එළිදරව්විම කලින් එකට වඩා උතුම් බවත් ඔහු ඉගැන්විය.

මම රෙසීටා නගරයේ බැප්ටිස් සභාවේ කොන්ග්‍රස් රැස්වීමකට සහභාගිවුනෙමි. කොන්ග්‍රසයේ රැස්වුයේ රතු ධජය යටතේය. සෝවියට් සංගමයේ ජාතික ගීය වාදනය කරන විට සියල්ලෝම නැගිට සිටියහ. බැප්ටිස් සභාවේ සභාපතිවරයා ස්ටාර්ලින් ශ්‍රේෂ්ඨ බයිබල් ගුරුවරයෙකු බව පවසමින් ඔහුට ප්‍රශංසාකලේය. ඔහු, ස්ටාර්ලින් කලේ දෙවියන්වහන්සේගේ ආඥාවන් සපුරාලීම මිසක අන්කිසිවක් නොවන බව ප්‍රකාශකලේය.

සැබෑ බැප්ටිස්වරුන් මෙයට එකග නොවූ අතර ඔව්හු ක්‍රිස්තුස්වහන්සේට අතිශයින් විශ්වාසවන්ත වෙමින් බොහෝ පීඩා වින්ද බව ඔබ වටහාගතයුතුය. මම ඔවුන්ට බොහෝසේ ප්‍රේමවෙමි. කෙසේවෙතත් කොමියුනිස්ට්වරු ඔවුන්ගේ නායකයින් "තෝරාපත්කරගත්" අතර ඔවුන්ට එය පිළිගැනීම හැර වෙනත් කලහැකි කිසිවක් නොවීය. මෙම තත්වය අදත් කොමියුනිස්ට් ජාතින්ගේ රටවල "නිල"[1] සභාවේ ඉහලමට්ටමේ ආගමික නායකයින් තේරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මකව පවති. ක්‍රිස්තුස්වහන්සේගේ සේවකයින් වන තැනැත්තන් ඔවුන් හා සම්බන්ධ නොවන සහෝදරයින්ව ප්‍රතික්ෂේපකරන්ට පටන්ගත්තේය.

රුසියාවේ කිතුණුවන් ඔවුන්ගේ විප්ලවයට පසු රහසිගත සභාවන් නිර්මාණය කලා සේම කොමියුනිස්ට්වාදය බලයට පැමිනි පසු නිල සභා නායකයින්ගේ පාවාදීම හේතුකොටගෙන අපට ද රුමේනියාවේ රහසිගත සභාවක් නිර්මාණයකරන්ට අනිවාර්‍යයෙන්ම සිදුවුනි. එය ශුභාරංචි සේවයට විශ්වාසවන්ත, ශුභාරංචි දේශනාකරන ක්‍රිස්තුස්වහන්සේ වෙත කුඩා දරුවන්ව යොමුකරන සභාවක් විය. කොමියුනිස්ට්වරු මේ සියල්ල තහනම්කල අතර නිල සභාව එයට එකගත්වය පල කලාය.

අන් අය සමග එක්ව මම රහසිගත වැඩක් අරම්භ කෙලෙමි. බාහිර වශයෙන් ඉතාමත් ගෞරවනීය තත්වයක මම සිටියෙමි. එනම් නෝර්වීජියානු ලූතරන් ධර්මදූත සේවයේ පාලකවරයෙකු වශයෙන් සිටියමි. – මාගේ රහසිගත වැඩ ආවරණයකිරීම පිනිස මම එසේ

1. නිල සභාව යනු රජය සමග ලියාපදිංචිවූ, රජය මගින් පාලනය වන්නාවූ සභාවයි. නිල සභාවන්ගේ කිතුණු සමාජික ප්‍රතිශතය සමස්ථ කිතුණු සභාවෙන් සියයට දහයක් පමණවේ. අනෙක් අය "රහසිගත සභාවේ" නමස්කාර කිරීමට ප්‍රිය වෙති.

කලෙමි. ඒ අතරතුරම මම රුමේනියාවේ ලෝක සභා කවුන්සලය නියෝජනය කලෙමි. (මේ සංවිධානය කොමියුනිස්ට්වාදීන් සමඟ සහයෝගය දක්වන සංවිධානයක් ලෙස රුමේනියාවේ අපට කිසිදු වැටහීමක් නොතිබිනි. ඒ කාලයේ අපගේ රට තුල එය සභන වැඩහැරෙන්නට වෙනත් කිසිවක් නොකලේය). මෙකී තනතුරු දෙක අධිකාරීත්වයන් ඉදිරියේ ඉතාමත් යහපත් තත්වයක් මා හට ලබාදුන්නේය. ඔව්හු මාගේ රහසිගත වැඩ දැනනොසිටියහ.

මේ රහසිගත වැඩ වල දෙයාකාර අංගෝපාංග විය. ඉන් පළමුවැන්න නම් රුසියානු හමුදා සෙබලුන් අතර අපගේ රහසිගත සේවයයි. දෙවැන්න නම් රුසියාවේ වහල්බවට පත්වු මනුෂ්‍යයන් අතර කෙරෙන අපගේ රහසිගත වැඩයි.

## *රුසියානුවෝ – "පිපාසිත" ආත්ම ඇති සෙනඟක්*

මා හට රුසියානුවන්ට ශුභාරංචිය දේශනාකිරීම පොළවට ස්වර්ගය පැමිනිමක් හා සමානවිය. බොහෝ ජාතින්ගේ මනුෂ්‍යයන්ට මම ශුභාරංචිය දේශනාකර ඇත්තෙමි. එතාක් රුසියානුවන් මෙන් ශුභාරංචිය පානය කරන්නාවු සෙනඟක් මම කිසි දිනක දැකනැත්තෙමි. ඔව්හු පිපාසිත ආත්ම වලින් පිරි සෙනඟක් විය.

මාගේ මිතුරෙකු වු ඕර්තඩොක්ස් සභාවේ පියතුමෙක් දුරකථනයෙන් මා හට කථාකොට රුසියානු නිලධාරියෙක් පාප උච්චාරණය පිනිස තමා වෙත පැමිනි බව දැනුම්දුන්නේය. එහෙත් මාගේ මිතුරා රුසියන් භාෂාව දැන නොසිටියේය. කෙසේ වෙතත් මම රුසියානු භාෂාව කථාකරන බව ඔහු දැන සිටි බැවින් ඔහු ඒ නිලධාරියාට මාගේ ලිපිනය දුන්නේය. ඊළඟ දිනයේ මේ මනුෂ්‍යයා මා වෙත පැමිණුනේය. ඔහු දෙවියන්වහන්සේ කෙරෙහි මහත් ආශා ඇත්තෙකු වුයේය. ඔහු කිසිකලෙක බයිබලයක් දැකනොතිබිනි. ඔහුට ආගමික අධ්‍යාපනයක් ලැබී නොතිබිනි. (එකල රුසියාවේ සභාවන් ඉතා සුලබ නොවීය). දෙවියන්වහන්සේ ගැන කිසිදු දැනගැන්මක් නොමැතිව ඔහු දෙවියන්වහන්සේට ප්‍රේමකලේය.

මම ඔහුට කන්ද උඩ දේශනාව හා යේසුස්වහන්සේගේ උපමා කියෙව්වෙමි. ඒවා ඇසීමෙන් පසු ඔහු පුපුරා යන ප්‍රීතියකින් යුතුව කාමරය අවට නටමින් "කොපමණ පුදුමාකාර අලංකාරත්වයක්ද? මේ ක්‍රිස්තුස්වහන්සේව නොදැන මා ජීවත්වන්නේ කෙලෙසද?" යනුවෙන්

ප්‍රකාශකලේය. මෙය ක්‍රිස්තුස්වහන්සේ තුල යමෙකු ප්‍රීතියෙන් සිටිනවා මම දුටු පළමුවතාවයි.

අනතුරුව මම වරදක් කලෙමි. මම ඔහුට දුක්ප්‍රාප්තිය සහ ක්‍රිස්තුස්වහන්සේගේ කුරුස පත්වීම කියෙව්වෙමි. එය කියෙව්වේ ඔහුට මේ සඳහා සූදානම් කිරීමකින් තොරවය. ඔහු එය බලාපොරොත්තු නොවුනේය. ක්‍රිස්තුස්වහන්සේට කසපහර දෙන ලද අන්දම ඔහුට ඇසුනු විට උන්වහන්සේව කුරුසපත් කල අන්දම සහ උන්වහන්සේ මරණයට පත්වූ අන්දම ඔහුට ඇසුනු විට ඔහු හාන්සි පුටුවකට වැටී තදින් වැලපෙන්ට පටන්ගත්තේය. ඔහු ගැලවුම්කාරයෙකුව විශ්වාස කරතිබුනි. ඔහුගේ ගැලවුම්කාරයාණන් දැන් මියගොස් ඇත්තේය!

මම ඔහු දෙස බලා ලැජ්ජාවටපත්විමි. මම කිතුණුවෙකු ලෙස මාව හඳුන්වාදුන්නත්, සභාපාලකවරයෙකු සහ අන්‍යයන්ගේ ගුරුවරයෙකු ලෙස මාව හඳුන්වා දුන්නත් මේ රුසියානු නිලධාරියා සමග දැන් බෙදාගත් අන්දමට ක්‍රිස්තුස්වහන්සේගේ වේදනා විඳීම් ගැන මීට පෙර කිසි කලෙක බෙදාගෙන නොතිබුනි. ඔහු දෙස බැලූ කල එය හරියට මග්දලාහි මරියා කුරුසිය පාමුල වැලපෙමින් සිටිනවා වැනි දර්ශනයකි. යේසුස්වහන්සේගේ ශරීරය සොහොනෙහි තැන්පත්කල විට විශ්වාසවන්තකමින් පිරී ගොස් ඇය වැලපෙනවා හා සමාන දර්ශනයකි.

අනතුරුව උන්වහන්සේගේ නැවත නැගිටීමේ කථාව මම ඔහුට කියෙව්වෙමි. එසේ කොට ඔහුගේ හැඟීම් වෙනස්වෙනවා බලා සිටියෙමි. ඔහුගේ ගැලවුම්කාරයාණන් තම සොහොනින් නැවත නැගිට්ට බව ඔහු දැන නොසිටියේය. ඔහු මේ පුදුමාකාර ප්‍රවෘත්තිය ඇසූ විට ඔහුගේ දනිස් දෙකට බරදෙමින් දිව්රමින් – ඉතාමත් නරක ලෙස ඉතාමත් "ශුද්ධ" නුසුදුසු ආකාරයකින් දිවුරමින් හැසිරෙන්ට පටන්ගත්තේය. මෙය ඔහුගේ කථාකිරීමේ රළු ආකාරය විය. නැවතත් ඔහු ප්‍රීතියට පත්වුයේය. ප්‍රීතියෙන් කෑගසමින් "උන්වහන්සේ ජීවමානයි! උන්වහන්සේ ජීවමානයි!" යනුවෙන් පවසමින් නැවතවරක් පිරී ඉතිරීගිය ප්‍රීතියකින් යුතුව කාමරය පුරා නටන්නටවිය!

මම ඔහුට මෙසේ පැවසුවෙමි. "අපි දැන් යාච්ඤාකරමු" ඔහු යාච්ඤා කරන අන්දම දැන නොසිටියේය. ඔහු අපගේ "ශුද්ධවූ" ප්‍රකාශන දැන නොසිටියේය. ඔහු මා සමග දනින් වැටී ඔහුගේම වචන වලින් යාච්ඤාකරන්නට විය. "අනේ දෙවියන්වහන්ස ඔබ කොපමණ

අනර්ග කෙනෙක්ද! මම ඔබ නම්, ඔබ මා නම් මම කිසි කලෙක ඔබට, ඔබගේ පාපවලට සමාවක් දෙන්නේ නැත. එහෙත් ඔබ ඉතා කදිම පුද්ගලයෙකි! මම මාගේ මුළු හදවතින්ම ඔබට ප්‍රේමකරමි."

ස්වර්ගයේ සිටින සියලු දේවදූතයින් තමුන් කරමින් සිටි දේ නතරකොට මේ රුසියානු නිලධාරියාගේ යාච්ඤාවේ සුවඳ දුමට සවන්දෙන්ට ඇතැයි මම සිතමි. මේ මනුෂ්‍යයා ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගනු ලැබුවෙමි.

කඩයකදී රුසියානු කපිතාන්වරයෙක් කාන්තා නිලධාරිනියක් සමඟ මා හට මුණගැසුනි. ඔව්හු සියලු ආකාර දේවල් මිළදීගනිමින් සිටි අතර රුසියානු භාෂාව නොතේරෙන වෙළඳ සේවකයා සමඟ කථාකිරීමේ අපහසුතාවයකින් සිටියේය. මම ඔවුන් වෙනුවෙන් භාෂාව පරිවර්තනය කරන්ට ඉදිරිපත්විමි. අපි බොහෝසේ කුළුපගවුසේම මම ඔහුව මාගේ නිවසට දිවා ආහාරයකට ආරාධනය කලේමි. ආහාර ගැනිමට ප්‍රථම මම ඔවුන්ට මෙසේ පැවසුවෙමි. "ඔබ සිටින්නේ කිතුණු නිවසකය. අපට යාච්ඤාකිරීමේ පුරුද්දක් ඇත." මම රුසියානු බසින් යාච්ඤාකලෙමි. ඔව්හු ඔවුන්ගේ ගෑරප්පු හා පිහි පසෙකට දමා ආහාර ගැන උනන්දුවක් නැතුවාක් මෙන් සිටියෝය. ඒ වෙනුවට ඔව්හු දෙවියන්වහන්සේ පිළිබඳ ප්‍රශ්න පිට ප්‍රශ්න අසන්න පටන්ගත්තෝය. එපමණක් නොව ක්‍රිස්තුස්වහන්සේ හා බයිබලය පිළිබඳව ඔව්හු විමසුවෝය. ඔව්හු කිසිවක් දැන නොසිටියහ.

ඔවුන්ට කථාකිරීම එතරම් පහසු දෙයක් නොවීය. බැටළුවන් සිය දෙනෙකු සිටි එකෙකු නැති වු මනුෂ්‍යයා පිළිබඳ උපමාව මම ඔවුන්ට පැවසුවෙමි. ඔවුන් කොමියුනිස්ට්වාදී මතවලින් මොළ සෝදා තිබු නිසා එය තේරුම් නොගත්තෝය. "ඔහුට බැටළුවන් සිය දෙනෙක් සිටියේ කෙලෙසද? කොමියුනිස්ට්වරුන්ගේ සාමුහික ගොවිපලක් මගින් ඒවා පැහැර නොගත්තේ මන්ද?" වැනි ප්‍රශ්න ඔව්හු ඇසුවෝය. අනතුරුව යේසුස්වහන්සේ රජෙකු බව පැවසුවෙමි. ඔවුන්ගේ පිළිතුර වුයේ "සියලු රජවරු නපුරු මනුෂ්‍යයෝය. ඔව්හු මනුෂ්‍යයින්ගේ නිදහස පාලනයකලෝය. එබැවින් යේසුස්වහන්සේද ආඥාදායකයෙකු විය යුතුය." මම ඔවුන්ට මිදිවත්තේ සේවකයින්ගේ උපමාව පැවසු විට ඔවුන් පැවසුවේ "ඔවුන් මිදිවත්තේ අයිතිකාරයාට විරුද්ධව කැරලිගැසීම යහපත් දෙයක් බවයි. මිදිවත්ත සාමුහික ගොවිපලක් විය යුතුය." සියල්ල ඔවුන්ට අළුත් විය. මම ඔවුන්ට යේසුස්වහන්සේගේ උපත පිළිබඳව පැවසු විට බටහිර ජාතිකයෙකුට දේව අපහාසයක්සේ පෙනෙන දෙයක් ඇසුවෝය. "මරියා

දෙවියන්වහන්සේගේ භාර්‍යාවද?" ඔව්හු ප්‍රශ්නකලෝය. ඔවුන් සමඟ කථාකිරීමේදී මෙන්ම වෙනත් බොහෝ දෙනා සමඟ කථාකිරීමේදී රුසියානුවන්ට ශුභාරංචිය දේශනාකිරීමට මම ඉගෙනගතිමි. අවුරුදු ගණනාවක් කොමියුනිස්ට්වාදය පැතිර ගියායින් පසුව අපිට අළුත් යොමුවීමක් දෙසට සහමුලින්ම හැරෙන්ට ඕනැව තිබුනේය.

මේ සත්‍යතාවය වෙනත් බොහෝ සංස්කෘතියන්ට අදාලය. මධ්‍යම අප්‍රිකාවට පිටත්ව ගිය මිෂනාරිවරුන්ට යෙසායා පැවසූ වචන පරිවර්තනයකිරීම අපහසුවී තිබුනි. "නුඹගේ පාප ලක්ෂා මෙන් රතුවුවත් මම ඒවා හිම මෙන් සුදුකරන්නෙමි" (1:18). මධ්‍යම අප්‍රිකාවේ කිසිවෙකුත් හිම කිසි කලෙක දැක නැති නිසා එය ඔවුන්ට අරුත්සුන් වදනකි. මිෂනාරිවරු මෙය පරිවර්තනය කලේ "ඔබගේ පාප පොල් ගෙඩියේ මදයමෙන් සුදුවන්නේය." කියාය.

එබැවින් අපට ශුභාරංචිය "මාර්ක්ස්වාදී භාෂාවට" පරිවර්තනය කරන්ට සිදුවිය. එසේ කරන්ට වුයේ එය ඔවුන්ට හඳුනාගැනීමට පහසුවන පිනිසය. එය අපටම අපගේ ශක්තියෙන් කල හැක්කක් නොවේ. නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ අප තුලින් ක්‍රියාකරමින් උන්වහන්සේගේ වැඩය කලේය. කපිතාන්වරයා සහ කාන්තා නිලධාරිනියගේ සිත්හැරීම එම දිනයේ සිදුවිය. පසුව ඔවුන් රුසියානුවන් අතර අපගේ රහසිගත සේවයට මහත්සේ උපකාරවුවෝය.

ඔව්හු දහස්ගණන් ශුභාරංචි පොත් හා වෙනත් කිතුණු පොත පත රහසිගතව මුද්‍රනයකොට රුසියානුවන් අතරේ බෙදාහැරියෝය. සිත් හැරුනු රුසියානු සෙබලුන් තුලින් අපි බයිබල් සහ බයිබල්කොටස් රහසිගතව රුසියාවට ගෙනාවෙමු. රුසියානුවන්ගේ අතට දේව වචනයේ පිටපත් පත්විම පිනිස අපි වෙනත් උපක්‍රමයන්ද භාවිතා කෙලෙමු. රුසියානු සෙබලුන් වසර ගණනාවක් තිස්සේ සටන් කරමින් සිටියෝය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් තම දරුවන්ව නිවසේ තබා පැමිණ සිටියෝය. ඔව්හු ඔවුන්ව මේ සියලු කාලවලදී නොදැක සිටියෝය. (රුසියානුවෝ දරුවන්ට මහත්සේ ආදරය කරන පිරිසකි.) මාගේ පුත්‍ර මිහායිද වෙනත් දරුවන්ද එනම් වයස දහයට අඩු සියල්ලෝම විදිවල හා උද්‍යානවල සිටි රුසියානු සෙබලුන් වෙත බයිබල් ශුභාරංචි හා වෙනත් පත්‍රිකා ඔවුන්ගේ සාක්කුවල දමාගෙන ගියෝය. රුසියානු සෙබලුන් ඔවුන්ගේ හිසට තට්ටුකරමින් ඔවුන්ට ප්‍රේමනීය ලෙස කථාකරමින් වසර ගණනාවක් මුළුල්ලේ ඔවුන් නුදුටු ඔවුන්ගේම දරුවන් යැයි සිතමින්

කටයුතු කලෝය. සෙබලුන් ඔවුනට චොකලට් සහ සීනි බෝල දුන් අතර ළමයින් එයට ප්‍රති උපකාරයක් සේ සෙබලුන්ට බයිබල් හා ශුභාරංචි පොත් දුන්නෝය. ඔවුන් ඒවා උවමනාවෙන් පිලිගත්තෝය. නිතරම අපහට කිරීමට භයානකයැයි සැලකූ දෙය අපගේ දරුවන් සම්පූර්ණ ආරක්ෂාවෙන් යුතුවම විවෘතවම සිදුකලෝය. ඔව්හු රුසියානුවන්ට "තරුණ මිශනාරිවරුන්" විය. එහි ප්‍රථිපලය අතිවිශිෂ්ට විය. බොහෝ රුසියානු සෙබලුන්ට මේ අන්දමින් ශුභාරංචිය ලැබුණු අතර ඔවුන්ට එය ලබා දීමට වෙනත් අයුරක් නොවිය.

## රුසියානු හමුදා බැරුක්ක තුල දේශනා කිරීම

අපි තනි පුද්ගල සාක්ෂි දැරීම පමණක් නොව රුසියානුවන් අතරද සේවය කිරීම සිදුකලේමුව. අපිට කුඩා කණ්ඩායම් රුස්වීම් පවත්වන්ට හැකියාව ලැබුනි.

රුසියානුවෝ ඔරලෝසු වලට බොහෝ ආශා ඇත්තෝය. ඔව්හු සැම අයගෙන්ම ඔරලෝසු සොරකම් කලෝය. ඔව්හු විදී වලදී මනුෂ්‍යයින් නවතාලමින් ඒවා ඔවුන්ට දෙනලෙස බලකලෝය. රුසියානුවන්ගේ එක් අතක ඔරලෝසු කිහිපයක් තිබෙනු අප දැක ඇත්තෙමු. රුසියානු කාන්තා නිලධාරිනියන් ඇගේ ගෙලෙහි එලාම් ඔරලෝසුවක් එල්ලාගෙන සිටියාය. ඔවුන්ට මින් පෙර කිසි කලෙක ඔරලෝසු නොතිබුනි. ප්‍රමාණවත් ලෙස ඒවා ලබාගැනිමටද පුළුවන්කමක් නොතිබුනි. ඔරලෝසුවක් අවශ්‍යවන රුමේනියානුවෙකුට සෝවියට් හමුදා බැරුක්කයක් වෙත ගොස් සොරාගත් එකක් මිළදී ගන්නට සිදුවිය. නිතරම ඔවුන් ඔවුන්ගේම ඔරලෝසු ආපසු මිළදී ගත්තෝය. ඒබැවින් රුමේනියානුවන් රුසියානු බැරුක්ක තුලට ඇතුලුවීම සාමාන්‍ය දෙයක් විය. මෙකී සංසිද්දිය රහසිගතව සභාව විසින් භාවිතයට ගන්නා ලදී. ඔවුන්ගෙන් ඔරලෝසු මිළදී ගැනිමේ මුලාවෙන් ඔවුන්ගේ බැරුක්ක තුලට ඇතුල්වුවෝය.

පළමුවරට මම රුසියන් බැරුක්කයක් තුල දේශනා කල දිනය වුයේ ඕර්තඩොක්ස් සභාවේ ශුද්ධවු පාවුල් සහ ශුද්ධවු ප්‍රේතුස් තුමන්ගේ මංගල්‍යය දිනයේදීය. ඔරලෝසුවක් මිළදී ගැනිමේ මුවාවෙන් මම හමුදා කදවුරකට ඇතුල්වුවෙමි. එම ඔරලෝසුවේ මිළ අදික යැයි පවසමින් තවත් එකක් කුඩායැයි පවසමින් තවත් එකක් විශාලයැයි පවසමින් මම එහි රඟපෑමක් කෙලෙමි. සෙබලුන් කිහිපදෙනෙක් මා වටා රොක් වුහ. ඔව්හු සැම කෙනෙක්ම මා හට යමක් විකුණන්නට උත්සහ

කලෝය. විහිලුවට මෙන් මම ඔවුන්ගෙන් මෙසේ ඇසුවෙමි "ඔබ අතරින් කවරෙක් හෝ පාවුල් හෝ ප්‍රේත්‍රැස් යන නම දරන්නේද?" සමහරු ඒ නම දරමින් සිටියෝය. අනතුරුව මම මෙසේ පැවසුවේමි "අද දින ඕර්තඩොක්ස් සභාවේ ශුද්ධවූ පාවුල් සහ ශුද්ධවූ ප්‍රේත්‍රැස්ට ගෞරවකරන දිනය බව ඔබ දන්නවාද?" (සමහර මහලු රුසියානුවෝ එය දැන සිටියහ.) එබැවින් මම මෙසේ ඇසුවෙමි "පාවුල් සහ ප්‍රේත්‍රැස් යනු කවුදැයි ඔබ දන්නවාද?" කිසිවෙක් එයදැන නොසිටියේය. එබැවින් මම ඔවුනට පාවුල් හා ප්‍රේත්‍රැස් පිළිබඳව පැවසුවෙමි. ඒත් එක් මහලු රුසියානු සෙබලෙක් මගේ කථාවට බාධා කොට "ඔබ පැමිනියේ ඔරලෝසු මිළදී ගැනිමට නොවේ ඔබ පැමිනියේ ඇදහිල්ල ගැන අපට පැවසීමටය. මෙහි වාඩිවෙන්න, අපට කථාකරන්න එහෙත් ප්‍රවේසම් වෙන්න. අපි කවරෙකුගෙන් ප්‍රවේසම් විය යුතුදැයි දනිමු. මා අවට සිටින මේ සියලු මනුෂ්‍යයෝ හොඳ අයය. එහෙත් මම මගේ අත ඔබගේ දනිස් මත තබනවිට ඔබ ඔරලෝසු ගැන පමනක් කථාකල යුතුය. මගේ අත ඉවත් කල විට ඔබට ඔබගේ පණිවිඩය නැවත කථා කරන්නට පුළුවන." මද වෙලාවකින් මහත් සමුහයක් වු සෙනග මා අවට රුස් විය. මම පාවුල් සහ ප්‍රේත්‍රැස් පිළිබඳව ඔවුන්ට කථා කලෙමි. පාවුල් හා ප්‍රේත්‍රැස් මරණයට පත්වුයේ ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් බවද පැවසුවෙමි. කලින් කලට ඔවුන් විශ්වාස නොතිබු පුද්ගලයෙක් අප කරා ළංවු විට ඉහත කී සෙබලා මා ගේ දණිස් මත තම අත් තැබීය. මම එවිට ඔරලෝසු ගැන කථාකරන්ට විමි. ඒ මනුෂ්‍යයා පිටත්ව ගිය කල මම ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව දේශනා කිරිමට නැවත පටන්ගත්තේමි. මේ බැහැදැකිම ගණන් නැති වසර ගණනක් නැවත නැවතත් සිදුවුනි. රුසියානු කිතුණු සෙබලුන්ගේ උපකාර ඇතුව එය සිදුවුනි. ඔවුන්ගෙන් බොහෝ දෙනා ක්‍රිස්තුස්වහන්සේව හදුනාගත්තේය. ශුභාරංචි පොත් දහස්ගණනක් රහසිගතව බෙදා දෙන ලදි.

රහසිගත සභාවේ අපගේ සහෝදර සහෝදරියන් කිහිපදෙනෙක් මේ නිසා අසු වී තදබල ලෙස ඔවුන්ට පහර දෙන ලදි. එහෙත් ඔවුහු අපගේ සංවිධානය පාවා නුදුන්නෝය. මේ වැඩ අතරතුරදි රුසියාවේ රහසිගත සභාවේ සහෝදරවරුන් මා හට මුණගැසුනි එයින් මා ප්‍රිතියට පත්විය. ඔවුන්ගේ අත්දැකිම් පිළිබඳව මට අසන්ට ලැබිනි. පළමුව, ශ්‍රේෂ්ඨ ශුද්ධවන්තයින්ව සැදිම ඔවුන් තුල මම දුටුවෙමි. අපි කොමියුනිස්ට්වාදී මිත්‍යා මුලධර්ම වලට යටව බොහෝ කාලයක් ගතකරතිබුනි. එහෙත් ලුණු වතුරෙහි ජීවත්වන මාළුවෙකු උගේ මාංශය මිහිරිව තබාගන්නාක් මෙන් ඔව්හු කොමියුනිස්ට් පාසැල් හා විශ්වවිද්‍යාල

පසුකරමින් ඔවුන්ගේ ආත්මයන් පවිත්‍රවද ක්‍රිස්තුස්වහන්සේ තුල ඉද්ධවද තබාගෙන සිටියෝය.

මෙහි රුසියානු කිතුණුවන් හට කදිම ආත්මයක් තිබුනේය. ඔව්හු "අපි දැකැත්ත සහ මිටිය සහිත තරුව දන්නෙමු. අපි අනතක්‍රිස්තුස්ගේ තරුව අපගේ තොප්පිවල පළිදින්නෙමු." යනුවෙන් මහත් කණගාටුවෙන් යුතුව පැවසුහ. ඔව්හු රුසියානු සෙබලුන් අතර ශුභාරංචිය බෙදාහැරීම පිනිස අපිට මහත්සේ උපකාරකලෝය.

ඔවුන්ට ප්‍රීතිය නැමැති ගුණාංගය හැර අන් සියලුම කිතුණු ගුණාංග තිබුණි. මෙය සිත්හැරීමේ දී ඔවුන්ට තිබුනු අතර පසුව එය අතුරුදහන් විය. මම මේ පිළිබඳව මහත්සේ සිතුවෙමි. වරක් මම බැප්ටිස්ට්වරයෙකුගෙන් මෙසේ ඇසුවෙමි "ප්‍රීතියක් නැතැයි ඔබ දන්නේ කෙලෙසද?" ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "මම මාගේ සභාවේ පාලකවරයාගෙන් සැඟවෙන්ට උත්සහාකරන විට මට කෙබඳු ප්‍රීතියක්ද? මම සැබෑ කිතුණුවෙකු බව, යාච්ඥා ජීවිතයක් ගතකරන බව සහ ආත්ම දිනන්නට උපකාර කරන බව මම ඔහුගෙන් සඟවන්නෙමි. සභාවේ පාලකවරයා රහස් පොලිසියට තොරතුරු සපයන්නෙකි. අපි එකිනෙකාට විරුද්ධව ඔත්තු සපයමින් සිටින්නෙමු. අපගේ හදවතේහි ගැලවීමේ ප්‍රීතිය ගැඹුරෙන් පවතී. එහෙත් බාහිර ප්‍රීතිය – ඔබට ඇති බාහිර ප්‍රීතිය අපට තවදුරටත් නැත."



අපි සම්පූර්ණයෙන්ම අලුත් ආකාරයේ කිතුණුවන්ව මුණගැසුනේය. - ඔව්හු රහසිගත සභාවේ කිතුණුවනිවූහ.

ක්‍රිස්තියානි අපට විශ්මයජනක සිදුවීමක් වී තිබේ. නිදහස් රටවල කිතුණුවන් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ආත්මයක් දිනන විට නිශ්ශබ්දවම ජීවමාන සභාවට සාමජිකයෙකු එකතුවේ. එහෙත් වහල් ජාතියක සිටින්නවුන් එසේ කරන විට ඔවුන්ට සිරගතවන්ට සිදුවන බව අපි දනිමු. ඔවුන්ගේ දරුවන් අනාතයන් බවට පත්වේ. යම් අයෙකුව ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ඒමේ ප්‍රීතිය එයට ගෙවිය යුතු මිලය සමඟ මුසුවී පවතින හැඟීමක් බවට සැමවිට පත්ව තිබේ. අපට සම්පූර්ණයෙන්ම අළුත් ආකාරයේ කිතුණුවන්ට මුණගැසී තිබුනි. – රහසිගත සභාවේ කිතුණුවන්ට මුණගැසී තිබුනි.

මෙහි අපට බොහෝ පුදුමයන් ඇත.

කිතුණුවන් යැයි විශ්වාසකරන එනමුත් සැබවින්ම කිතුණුවන් නොවන අය ද එහි සිටි අතර අදේවවාදීන් යැයි විශ්වාසකරන සැබවින්ම අදේවවාදීන් නොවන අයද රුසියානුවන් අතර අපට හමු විය.

දුම්රියකදී රුසියානු නිලධාරියෙක් මා ඉදිරියේ හිඳගත්තේය. මම ඔහුට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කථාකලේ මිනිත්තු කිපයක් පමණකි. එසේ කලේ ඔහු අදේවවාදීන්ගේ විතර්ක ගණනාවක් මා ඉදිරියේ ගෙනහැර දක්වන්ට පටන්ගන්නාතෙක් පමණි. මාක්ස්, ස්ටාර්ලින්, වෝල්ටර්, ඩාවින් යන අයගේ කියමන් සහ බයිබලයට විරුද්ධව බොහෝ කරුණු ඔහුගේ මුඛයෙන් පිටවුනි. ඔහුට විරුද්ධව වචනයක්වත් කථාකරන්ට ඔහු මට ඉඩනොදුන්නේය. දෙවිකෙනෙක් නැතැයි මා හට එත්තුගන්වන්ට ඔහු පැයක් පමණ කාලයක් කථාකලේය. ඔහු කථාකොට නිමවූ කල මම ඔහුගෙන් මෙසේ ප්‍රශ්න කලෙමි: “දෙවිකෙනෙක් නැත්නම් කරදරයකදී ඔබ යාච්ඤාකරන්නේ මන්ද?” “මා යාච්ඤා කරන බව ඔබ දන්නේ කෙලෙසද?” සොරකම්කරද්දී හසුවුනු සොරෙකු මෙන් පුදුමයට පත්වෙමින් ඔහු මගෙන් ඇසුවේය. මම ඔහුට ගැලවෙන්ට ඉඩ නොදුනෙමි. “මම ඔබෙන් ප්‍රශ්නයක් ඇසීමි. ඔබ යාච්ඤාකරන්නේ මන්දැයි මම ඇසීමි. කරුණාකර පළමුව එයට පිළිතුරු දෙන්න” ඔහු ඔහුගේ හිස නමා එය පිලිගෙන “යුධ පෙරමුනේදී අපට ජර්මානුවන් විසින් වටකල විට අප සියල්ලෝම යාච්ඤාකලෙමු. එය කරන අන්දම අප නොදැන සිටියෙමු. එබැවින් අපි මෙසේ පැවසුවෙමු. “දෙවියන්වහන්සේ සහ මව්වරුන්ගේ ආත්මය” යනුවෙන් අපි පැවසුවෙමු. සිත් දෙස බලන්නාවූ තැනැන්වහන්සේ ඉදිරියෙහි එය සහතිකලෙසම හොඳ යාච්ඤාවක් වන්නට ඉඩතිබුනි.

මට රුසියානු යුවලක් මුණගැසුනි. ඔව්හු රූප අඹන්නෝ වූහ. මම ඔවුන්ට දෙවියන්වහන්සේ පිළිබඳව කථාකල විට ඔව්හු මෙසේ පිලිතුරු දුන්නෝය. “නැහැ. දෙවියන්වහන්සේ වැඩ නොසිටී. අපි බෙෂ්බොස්නිකි වරුය – එනම් දෙවියන්වහන්සේ නැත්තවුන්ය. එහෙත් අපට සිදුවූ කදිම දෙයක් මම ඔබට පවසන්නද?”

වරක් අපි ස්ටාර්ලින්ගේ පිළිරුවක වැඩකලෙමු. වැඩ කරන අතරතුරේදී මාගේ භාර්‍යාව ‘මහපට ඇඟිල්ල කෙසේ වේද? අපට විරුද්ධවාදී මහපට ඇඟිල්ලක් නොතිබිණි නම් – අපගේ ඇඟිලි පාදයේ ඇඟිලි මෙන් වන්නේය. – අපට මිටියක්, අතකොළුවක්, ආයුධයක්,

පොතක්, පාන් කැබැල්ලක් අල්ලා ගැණීමට නොහැක. මේ මහපට ඇඟිල්ල සැදුවේ කවුද? අපි දෙදෙනාම පාසැලේදී මාක්ස්වාදය උගත්තෙමු. අහසත් පොළොවත් නිරායාසයෙන් සැදුනු බව අපි දනිමු. ඒවා දෙවියන්වහන්සේ විසින් මවනු නොලැබුනි. ඒසේ අපි ඉගෙනගත්තෙමු. අපි විශ්වාස කෙලෙමු. දෙවියන්වහන්සේ අහසත් පොළොවත් මැව්වේ නැත්නම් උන්වහන්සේ මහපට ඇඟිල්ල මැව්වේ නම් උන්වහන්සේට සුළු දේවල් සඳහා ප්‍රශංසාකලයුතුය."

"'අපි එඩිසන්, බෙල් සහ ස්ටිවන්සන් යන අයට ප්‍රශංසාකරන්නෙමු. ඒ මන්දයත් ඔව්හු විදුලි බල්බය, ටැලිපෝනය සහ දුම්රිය සහ තවත් බොහෝ දේවල් සොයාගත් බැවිනි. එහෙත් මහපට ඇඟිල්ල සොයාගත් තැනැන්වහන්සේට අපි ප්‍රශංසානොකරන්නේ මන්ද? එඩිසන්ට මහපට ඇඟිල්ලක් නොතිබුනි නම් ඔහුට කිසිවක් සොයාගැනිමට නොහැකිවන්නේය. මහපට ඇඟිල්ල සාදන දෙවියන්වහන්සේට පමණක් නමස්කාරය හිමිවිය යුත්තේය."

ස්වාමිපුරුෂයා ඉතා කෝපයට පත්විය. භාර්යාවත් ප්‍රඥාවන්ත දේ කථාකරන විට ස්වාමිපුරුෂයින් කෝපයට පත්විම නිතරම සිදුවේ. "මෝඩ ලෙස කථා නොකරන්න. දෙවිකෙනෙක් නැති බව ඔබ ඉගෙනගත්තෙහිය. අපගේ නිවස තුල මකුණන් ඇතිවූ කල අපි කරදරයට පත්වෙමු. ඒ බව ඔබ හොඳින් දනී. නැවතත් ඔබගේ සිතේ තබාගන්න. මුළු ජිවිත කාලයටම සිතාගන්න. දෙවිකෙනෙක් නැතැයි සිතන්න. ස්වර්ගයෙහි කිසිවෙක් නැත!"

එවිට භාර්යාව මෙසේ පිළිතුරුදුන්නාය. "මේක මීට වඩා තවත් පුදුමයකි. ස්වර්ගයේ සර්වබලධාරි දෙවිකෙනෙක් සිටි නම් උන්වහන්සේ තුල අපගේ පියවරුන් විශ්වාසය තැබීම මෝඩකමක් වේ නම් අපට මහපට ඇඟිල්ලක් තිබීම ස්වාභාවික දෙයක් පමණී. සර්වබලධාරි දෙවිකෙනෙකුට සියල්ල කරන්න පුළුවනි. උන්වහන්සේට මහපට ඇඟිල්ලක් තිබීම ස්වාභාවික දෙයක් පමණී. සර්වබලධාරි දෙවිකෙනෙකුට සියල්ල කරනන පුළුවනි උන්වහන්සේට මහපට ඇඟිල්ලක්ද සාදන්ට පුළුවන. ස්වර්ගයේ "කිසිවෙක්" නැත්තම් මම මාගේ මුළු හදවතින් මහපට ඇඟිල්ල සැදු 'ඒ කිසිවෙක් නැත්තාට' නමස්කාර කරන්නෙමි."

එබැවින් ඔව්හු "කිසිවෙක් නැත්තාට" නමස්කාර කරන්නෝවුහ! එහෙත් කාලයක්ම "කිසිවේක් නැත්තාට" ඔවුන් තුල පැවති නමස්කාරයේ වර්ධනය වෙත්ම ඔවුහු උන්වහන්සේ මහපට ඇඟිල්ලේ පමණක් නොව

සියලු තාරකා, මල්, ළමයින් හා ජීවිතයේ සියලු අලංකාර දේ වල මැවුම්කාරයාණන් බව විශ්වාසකරන්ට පටන්ගත්තෝය. එය හරියට මුල් කාලයේ ඇතැන්ස් හිදී "නොදන්නා දෙවිකෙනෙකුට" නමස්කාරකරන්නන් පාවුල්තුමාට මුණගැසුනා හා සමාන විය. (ක්‍රියා 17:23)

මේ යුවලට ඔවුන් හරි දේ විශ්වාසකරන බව දැනගැනීමෙන් කිව නොහැකි ප්‍රීතියක් ඇතිවිනි. ස්වර්ගය තුල සැබවින්ම "කිසිවෙක් නැති" තැනැත්තෙක් සිටී. – දෙවියන්වහන්සේ ආත්මයකි. උන්වහන්සේ ප්‍රේමයෙන්, ප්‍රඥාවෙන්, සත්‍යතාවයෙන්, බලයෙන් ආත්මයාණෝය. උන්වහන්සේ මනුෂ්‍යයන්ට කොපමන ප්‍රේමකලේදයත් තම ඒකජාතක පුත්‍රයාණන් කුරුසිය මත ඔවුන් වෙනුවෙන් යාගවීමට එවන ලදී.

ඔව්හු නොදැනම දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස කල තැනැත්තෝ වුහ. ඔවුන්ට තව පියවරක් ඔබ්බට ගෙන යැමට මට මහත් වරප්‍රසාදයක් ලැබිනි. – ගැලවීමේ මිදීමේ අත්දැකීම් කරා ගෙන යැමට මට පුළුවන් වුනි.

මම දිනක් වීදියේ රුසියානු කාන්තා නිලධාරිනියක් ගමන්කරනවා දුටිමි. මම ඇය වෙත ළඟා වී ඇගෙන් සමාව ඉල්ලා "නොදන්නා කාන්තාවකට විදියේදී කථාකිරිම සුදුසු නොවන බව මම දනිමි. එහෙත් මම දේවගැතිවරයෙක්මි. මාගේ අරමුණ අවංකය මම ඔබට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කථාකරන්ට කැමැත්තෙමි." යනුවෙන් පැවසුවෙමි.

ඇය මට පිළිතුරු දෙමින් මෙසේ ඇසුවාය. "ඔබ ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකරනවා?" මම ඇයට මෙසේ පැවසුවෙමි. "ඔව් මගේ මුළු හදවතින්ම." ඇය මගේ දෑත අල්ලාගෙන මා නැවත නැවතත් සිප වැලඳගන්ට වුවාය. මම දේවගැතිවරයෙක් බැවින් අතිශයින් ලැජ්ජාවට පත්වුනෙමි. අපි ඥාතින් යැයි සිතන පරිදි මනුෂ්‍යයන්ට පෙනෙන්නට මෙන් මම ඇයවද සිපගතිමි. ඇය මා හට පුදුමයෙන් මෙසේ පැවසුවාය: "මමද ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේම කරමි." මම ඇයව මගේ නිවසට ගෙන ගියෙමි. එහෙත් මගේ පුදුමයට මෙන් ඇය ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කිසිවක් දැන නොසිටියාය. සම්පුර්ණයෙන්ම දැන නොසිටියාය. නමින් පමණක් දැන සිටියාය. එසේ වුවද ඇය උන්වහන්සේට ප්‍රේමකලාය. උන්වහන්සේ ගැලවුම්කාරයාණන් බව ඇය දැන නොසිටියාය. ගැලවීමේ අර්ථය කුමක්දැයි ඇය නොදැන සිටියාය. උන්වහන්සේ කොතන ජීවත්වුනේදැයි කෙලෙස ජීවත්වුනේ දැයි කෙලෙස මරණයට පත්වුනේදැයි ඇය නොදැන

සිටියාය. ඇය උන්වහන්සේගේ ඉගැන්වීම් උන්වහන්සේගේ ජීවිතය හෝ දේව සේවය ගැන පවා නොදැන සිටියාය. මා හට ඇය මානුෂික කුතුහලයක් වන්ට විය. යමෙකුව නමින් පමණක් දැනගෙන ඔහුට ප්‍රේමකරන්නේ කෙලෙසද?

මම ප්‍රශ්න කල කල ඇය මෙසේ පැහැදිලි කලාය. "ළමයෙකු ලෙස මම පින්තූර වලින් කියවන්ට ඉගෙනගතිමි. **A** අකුර සඳහා ඇපල් ගෙඩියක්ද **B** අකුර සඳහා සීනුවක්ද **C** අකුර සඳහා බළලෙක්ද යනාදී වශයෙන් කියෙව්වෙමි."

මම උසස් පාඨශාලාවට ගියකල මගේ කොමියුනිස්ට්වාදී පිතෘභූමිය ආරක්ෂා කිරීම මගේ ශුද්ධවූ යුතුකම බව මම ඉගෙනගතිමි. මම කොනියුනිස්වාදී ආචාරධර්ම පිළිබඳව ඉගෙනගතිමි. එහෙත් "ශුද්ධවූ යුතුකම" යනු හෝ "ආචාරධර්ම" යනු කෙබඳු දේවල් දැයි මම දැන නොසිටියෙමි. මේවා සඳහා මට පින්තූරයක් අවශ්‍යය වුනි. දැන් මගේ පෙර පියවරුන්ට සෑම දෙයක් සඳහාම අලංකාර පින්තූරයක් තිබුනු බව මම දනිමි. ජීවිතය තුල ප්‍රශංසා කටයුතු සත්‍යවාදී සියල්ල වෙනුවෙන් ඔවුනට පින්තූරයක් තිබුණි. මගේ ආච්චි සෑම විට මේ පින්තූරය ඉදිරිපිට දණ නැමුවාය. එය ක්‍රිස්තොස් (ක්‍රිස්තුස්වහන්සේ) නම් අයෙකුගේ පින්තූරයක් බව පැවසුවාය. මම මේ නමට අතිශයෙන් ප්‍රේම කෙලෙමි. මේ නමට මා හට සැබෑවක් බවට පත්වුනි. කෙතරම් එසේ වුයේද කිවතොත් මේ නම මට මහත්වූ ප්‍රීතියක් ලබාදුන්නේය."

ඇයට සවන්දෙමින් පිලිප්පි 2:10 හි ලියා ඇති දේ මම සිහිකලෙමි. එනම් යේසුස්වහන්සේගේ නාමයට සෑම දණක්ම නැමිය යුතුබවයි. සමහර විට අන්තක්‍රිස්තුස්ට ලෝකයෙන් දෙවියන්වහන්සේ පිළිබඳ දැනගැන්මක් මකා දමන්නට හැකිවන්නට පුළුවන. එහෙත් ක්‍රිස්තුස් යන නාමය තුල බලය තිබේ. එය ආලෝකය වෙත මනුෂ්‍යයන්ව යොමුකරවයි.

ඇයට ප්‍රීතියෙන් යුතුව මගේ නිවස තුල ක්‍රිස්තුස්වහන්සේව හමුවුවාය. දැන් ඇගේ සිත තුල ඇය ප්‍රේම කරන නාමය ජීවත්වන්නේය.

මම රුසියානුවන් සමග ජීවත්වූ මුළුකාලය කාව්‍යයෙන් පිරි ගැඹුරු අර්ථයක් ඇතුව ජීවත් වුනිමි. දුම්රිය වේදිකාවේ ශුභාරංචි පතුරුවා හල කාන්තාවන්, ඒ පිළිබඳ උනන්දුව දැක්වූ අයෙකුට මගේ

ලිපිනය දුන්නාය. එක් සන්දෑවක ඔහු මගේ නිවසට ඇතුල් වුයේය. ඔහු උසැති කඩවසම් රුසියානු ලුතිනන්වරයෙක් විය.

"මම ඔබට සේවය කරන්නේ කෙලෙසද?" මම ඔහුගෙන් විමසුවෙමි.

"මම අලෝකය සොයා පැමිණියෙමි." ඔහු පිළිතුරු දුන්නේය.

මම ශුද්ධ ලියවිල්ලෙහි ඉතාමත් අත්‍යාවශ්‍ය කොටස් ඔහු වෙත කියවන්ට පටන්ගතිමි. ඔහු ඔහුගේ අත මා මත තබා මෙසේ පැවසුවෙහිය "මම මගේ මුළු හදවතින් ඔබෙන් මෙසේ ඉල්ලමි. මාව විනාශයට පමණක් යොමුනොකරන්න. මම අදුරේ සිටින මනුෂ්‍යයන්ට අයත්ව සිටින්නේමි. කරුණාකර මට මෙය පවසන්න. මෙය සැබවින්ම දේව වචනයද?" මම ඔහුට එය සහතික කලෙමි. ඔහු පැය ගානක් මට සවන් දුන්නේය. පසුව ක්‍රිස්තුස්වහන්සේව පිළිගත්තේය.

රුසියානුවෝ කලාතුරකින් පමණක් අන්දානුකරණයෙන් ක්‍රියාකරන්නෝව ආගමික කාරණා ගැන නොගැඹුරුව ජිවත්වන්නන්ව සිටිනහුය. ඔවුහු ආගමට විරුද්ධව සටන් කලත් ආගම වෙනුවෙන් සටන්කොට ක්‍රිස්තුස්වහන්සේව පිළිගත්තත් එසේ කරන්නේ ඔවුන්ගේ මුළු ආත්මයෙනි. රුසියාවේ කොමියුනිස්ට්වාදය තුල කිතුණුවන්, ආත්ම දිනාගන්නාවු මිෂනාරිවරුන් වුයේ එබැවිනි. රුසියානුවෝ ඓතිහාසිකව ආගමික මනුෂ්‍යයන්වුහ. මෙවැනි රටවල් ශුභාරංචි වැඩ සඳහා පිබිදෙන්නාවු එලදරණ රටවල්ය. අපි උවමනාවෙන් යුතුව ඔවුන් සමඟ ශුභාරංචිය බෙදාගත්තොත් ලෝකයේ ඉරණම වෙනස්වන්නේය. රුසියාවත් ඇගේ සෙනගත් දේව වචනය කෙරෙහි මෙතරම් සාපිපාසිතව සිටියදී බොහෝ දෙනෙකුට එය නොලැබෙනවා සේ පෙනෙන්ට වීම කෙතරම් ඛේදජනක දෙයක්ද?

රුසියානුවන් වෙත අපගේ දේව සේවය බොහෝ සෙමින් එලදැරුනි.

මට පියොට්රෙ (පීටර්) ව සිහිවේ. කුමන රුසියානු සිරමැදිරියකදී ඔහු අතුරුදහන් වුයේ දැයි කිසිවෙකු නොදනි. ඔහු කෙතරම් ලාබාල වියේ පසුවුනිද කිවහොත් සමහර විට වයස අවුරුදු විසි ගණන්වල අයෙකුවන්ට පුළුවන. ඔහු රුමේනියාවට පැමිණියේ රුසියානු හමුදාවත්

සමඟය. ඔහු රහසිගත රැස්වීමකදී සිත්හැරීමට ලක්වූ පසු ඔහුව බව්තිස්මකරන්නැයි මා හට පැවසුවේය.

ඔහුව බව්තිස්ම කල පසු ඔහුට වඩාත් හැඟීම් ගෙන දෙන්නේ කුමන බයිබල් පදයදැයි මා හට පවසන ලෙස මම ඔහුගෙන් විමසුවෙමි. ඔහු ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණෙන්නට මහත් ලෙස බලපෑම් කලේ කුමන බයිබල් පදයදැයි ඔහුගෙන් විමසුවෙමි.

ඔහු මෙසේ පැවසීය: අපගේ රහසිගත රැස්වීමකදී ලූක් 24 වන පරිච්ඡේදය මම කියවා ඇත. එහි එම්මාවුස් නගරයට යන විට ගෝලයන් දෙදෙනෙකුට යේසුස්වහන්සේ මුණගැසුනු කථාව තිබේ. ඔව්හු ගම්මානය අසලට ලංවූ විට "උන්වහන්සේ (යේසුස්වහන්සේ) තමා තව දුරයන්නට යෙදෙන බව ඔවුන්ට හැගෙව්වේය." (28වන පදය) පියොට්රෙ මෙසේ පැවසුවේ "යේසුස්වහන්සේ මෙසේ පැවසුවේ මන්දැයි මම පුදුම වෙමි. උන්වහන්සේට තම ගෝලයින් සමඟ නවතින්ට උවමනායැයි මට සහතිකය. තව දුරයන්නට උන්වහන්සේට උවමනාවූ බව උන්වහන්සේ පැවසුවේ මන්ද? මගේ පැහැදිලි කිරීම වුයේ යේසුස්වහන්සේ විනිත අයෙකු බවයි. උන්වහන්සේ කෙරෙහි ආශාවීම උන්වහන්සේ වඩා උනන්දුවෙන් බලා සිටියේය. උන්වහන්සේව පිළිගන්නා බව දුටු විට උන්වහන්සේ කැමැත්තෙන්ම ඔවුන් සමඟ ඇතුල්වුනි. කොමියුනිස්වරු අවිනිත අයය. ඔවුහු කලහාකාරී ස්වභාවය අපගේ මනස හා සිත් තුලට ඇතුල්කරන්නේය. ඔව්හු ඔවුන්ට සවන්දෙන ලෙස උදෑසන සිට රාත්‍රිය දක්වා අපට බලකරති. ඔව්හු මෙය ඔවුන්ගේ පාසැල් තුලින්, ගුවන්විදුලිය තුලින්, ප්‍රවෘත්ති පත්‍ර තුලින් පෝස්ටර් තුලින්, චිත්‍රපටි තුලින් සහ අදේවවාදී රැස්වීම් තුලින් අපට පවසති. අපි යන කොතැනකදී වුවද ඔව්හු අපට මෙය පවසති. අපි නොකඩවාම කැමතිවුනත් නැතිවුනත් ඔවුන්ගේ දේව අභක්තික ප්‍රචාරක කටයුතු වලට සවන්දෙන්ට ඕනැය. යේසුස්වහන්සේ අපගේ නිදහසට ගරුකරන්නේය. උන්වහන්සේ මෘදුලෙස අපගේ සිතෙහි දොරටුවට තට්ටුකරන්නේය."

"යේසුස්වහන්සේ උන්වහන්සේගේ විනිතකමින් මාව දිනාගත්තේය." යනුවෙන් පියෙට්රෙ මාහට පැවසුවේය. මෙය මුළුමනින්ම කොමියුනිස්ට්වාදයට පටහැනිය. නැවත ක්‍රිස්තුස්වහන්සේ උන්වහන්සේව මට ඒත්තුගැන්විය. යේසුස්වහන්සේගේ චරිතයෙහි මේ ගුණාංගය මෙලසින් දැන්වූ එකම රුසියානුවා ඔහු පමණක් නොවේ. (පාලකවරයෙකු ලෙස මම මීට කලින් මෙලෙස කිසිකලෙක සිතා නොතිබුනි.)

ඔහුගේ සිත්හැරීමෙන් පසුව පියෙට්ට්‍රෙ කිපවතාවක්ම තම නිදහස හා ජීවිතය අවදානමට තබමින් ක්‍රිස්තියානි ප්‍රකාශන රුමේනියාවේ රහසිගත සභාවේ සිට රුසියාවට හොරෙන් ගෙනයැමට ක්‍රියාකලේය. අවසානයේදී ඔහු හසුවිය. මා ඔහු ගැන ඇසූ අවසාන දෙය නම් ඔහු තවමත් සිරගෙය තුල සිටින බවයි. ඔහු මරණයට පාත්‍රවුයේද? ඔහු දැනටමත් ස්වර්ගයේ සිටින්නේද? නැතහොත් පොළව මත සිටිමින් යහපත් යුද්ධයෙහි යුද්ධකරන්නේද? මම නොදනිමි. ඔහු අද කොහේ සිටින්නේදැයි දන්නේ දෙවියන්වහන්සේ පමණි. පියෙට්ට්‍රෙ මෙන් බොහෝ දෙනා එකවර සිත්හැරීමට ලක් නොවුනි. අපි ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ආත්මයක් දිනාගැනීම කිසිකලේක නතර කල නොයුත්තෙමු. මෙසේ කිරීමෙන් අප කර ඇත්තේ වැඩෙන් අඩක් පමණි. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දිනාගත්තාවු සැම ආත්මයන්ම ආත්ම දිනන්නේකු බවට පත්කල යුතුය. රුසියානුවන්ගේ සිත් හැරුනා පමණක් නොව ඔහු රහසිගත සභාවේ "මිෂනාරිවරු" වුහ. ඔව්හු තමුන්ගේ ජීවිතය අවදානමට ලක්කරමින් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ක්‍රියා කලෝය. සැමවිටම ඔවුන් වෙනුවෙන් මරණයට පත්වු ක්‍රිස්තුස්වහන්සේට ඔවුන්ට කලහැකි වු අඩුම දෙය හෝ කිරීමට පෙළඹුණෝය.

## *වහල්වු ජාතියකට අපගේ රහසිගත දේව සේවය*

අපගේ දේව සේවයේ දෙවන පැතිකඩ වන්නේ රුමේනියානුවන් අතර අපගේ රහසිගත මිෂනාරි වැඩය විය.

ආරම්භයේ දී කොමියුනිස්ට්වරු සහ නායකයින්ව ඔවුන්ගේ පැත්තට දිනාගැනීම පිණිස මංමුලාකිරීම භාවිතාකලෝය. බොහෝ ඉක්මනින් ඔව්හු ඔවුන්ගේ රුවට්ලිකාර මුහුණු අත්හලෝය. ඉන්පසු භීෂණය පටන්ගත්තේන් දහස්ගණනක් අත්අඩංගුවට ගැනිනි. අපිට ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ආත්මයක් දිනාගැනීමද අමාරු දෙයක් බවට පත්වුනි. එය බොහෝ කලකට පෙර සිට රුසියානුවන් හට අමාරුව් තිබුනි.

උදාහරන වශයෙන් මා හට ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ආත්ම දිනාගැනීමට දෙවියන්වහන්සේ විසින් උපකාර පිණිස එවු ආත්ම සමග මමද පසු කලෙක සිරගතව සිටියෙමි. දරුවන් සය දෙනෙකු අත්හැර දමා මා සමග එකම සිරමැදිරියේ සිටි අයෙකු විය. ඔහු තම කිතුණු ඇදහිල්ල වෙනුවෙන් සිරගතව සිටියේය. ඔහුගේ භාර්‍යාව හා දරුවන් කුසගින්නේ පසුවුහ. ඔහු සමහරවිට කිසිකලෙක ඔවුන්ව නොදකින්නට

පුළුවන. මම ඔහුගෙන් මෙසේ ඇසුවෙමි. "මම ඔබව ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ඒම ගැන ඔබ තුල මා කෙරෙහි යම් වෛරයක් තිබෙනවාද? ඔබගේ පවුල මෙතරම් කාලකණ්ණි තත්වයකට පත්වුනේ මේ නිසාය." ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. "පුදුමාකාර ගැලවුම්කාරයාණන් වෙත ඔබ මාව ගෙන ඒම ගැන ඔබට තුති පුදන්ට මට වචන නොමැත. මට එය වෙනත් ආකාරයකට ලැබෙන්නේ නැත."



**යොහාන් බව්තිස්ත මෙන් අපි විවෘතවම මිනිසුන්ට හා පාලකයින්ට ක්‍රිස්තුස්-වහන්සේගේ පිළිබඳව පැවසුවෙමු.**

මේ වාතාවරණයන් තුල දේශනා කිරීම පහසුනොවේ. අපගේ සෙනග අතිශයින් පීඩනයට පත්වුවෝය. කොමියුනිස්ට්වරු සියලුදෙනාගේම වස්තුව රැගෙන ගියෝය. ගොවින්ගෙන් ඔව්හු කෙත්වතු හා බැටළුවන් ගත්තෝය. බාබර්වරයෙක්ගෙන් හා ටේලර්වරයෙක්ගෙන් ඔව්හු ඔවුන්ගේ කුඩා වෙළඳසැල් ගත්තෝය. ධනවාදීන් පමණක් නොව දිලිඳුන්වද දේපල අයිතියෙන් ඉවත්කලෝය. බොහෝ දිලිඳු මනුෂ්‍යයින් අතිශයින් පීඩා වින්දෝය. හැම පවුලකම එක් අයෙකු සිරගතව සිටියේය. දිළිඳුකම ඉමහත් විය. මනුෂ්‍යයෝ මෙසේ අසන්ටවූහ. "ප්‍රේමයේ දෙවියන්වහන්සේ නපුරට ජයගන්නට ඉඩදී තිබෙන්නේ කෙලෙසද?"

යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වන විට "මාගේ දෙවියනි, මාගේ දෙවියනි ඔබ මා අත් හැරියේ මන්ද?" යනුවෙන් මොරාසා කීම පිළිබඳව මහ සිකුරාදා දිනයේදී ක්‍රිස්තුස්වහන්සේව දේශනා කිරීමට අපෝස්තුළුවරුන්ට පහසු කටයුත්තක් නොවුනක් මෙන් එය සිදුවිය. එහෙත් සේවය මගින් නොකඩවා පලදැරීම හේතුකොටගෙන එය අපගෙන් නොව දෙවියන්වහන්සේගෙන් බව සනාථ වේ. මොහොතකට, යේසුස්වහන්සේ, දිළිඳු හිඟන්නෙකු වු අපි මෙන් පීඩා ලැබු ලාසරස් පිළිබඳව අපට පැවසු දේ බලන්න. ඔහු මරණයට පත්වෙමින් කුසගින්නෙන් සිටියේය. ඔහුගේ වණ බල්ලෝ ලෙවකෑවෝය. එහෙත් අවසානයේදි දේවදුතයෝ ඔහුව ආබ්‍රහම්ගේ තුරුලට ගෙන ගියෝය.

## රහසිගත සභාව අර්ධවශයෙන් විවෘතව ක්‍රියාකල අන්දම

රහසිගත සභාව නිවෙස් තුල, කැලෑවේ සහ පොළව යට කාමර තුල රහසේ හමුවුනි. එලෙස ඔවුන්ට හැකි ස්ථානවල ඔවුහු රැස්වුනි. බොහෝ වහල් ජාතින්වල වර්තමානයේ පවතින්නාක් මෙන් රුමේනියාවේ රහසිගත සභාවද අර්ධවශයෙන් පමණක් රහසිගතව ක්‍රියාකලේයැයි කීම සැබෑය. අයිස් කන්දක් මෙන් එහි වැඩයෙන් කුඩා කොටසක් විවෘතවිය. කොමියුනිස්ට්වරු යටතේ විදී වල දේශනා කිරිම සිදුකිරිමට ඔවුහු සැලැස්මක් ක්‍රියාත්මක කලෝය. මෙය ඒ කාලයේ අතිශයින් අවදානම් සහගත එකක් විය. මේ මාර්ගයෙන් අපි බොහෝ ආත්ම කරා ළඟා වුනෙමු. වෙනත් ආකාරයකින් ඔවුන්වෙත ළඟාවෙන්ට ක්‍රමයක් නොවිය. මගේ භාර්‍යාව මේ තුල ඉතා සක්‍රියව යෙදී සිටියාය. සමහර කිතුණුවන් විදී කොන්වල රැස්වී ගීත ගායනා කරන්ට පටන්ගත්තෝය. මනුෂ්‍යයෝ අලංකාර ගී ගැයුම් අසන පිණිස ඔවුන් අසල රැස්වුනෝය. මාගේ භාර්‍යාව පණිවිඩය බෙදාගත්තාය. රහස් පොලිසිය එතැන්ට එන්ට ප්‍රථම අපි එතැනින් පිට වුනෙමු.

එක් සන්ධ්‍යාවක මම වෙනත් ස්ථානයක ක්‍රියාකාරීව සිටියදී මගේ භාර්‍යාව බුකාරිස්ට් නුවර මලක්ෂා පැක්ටරිය අසල දොරටුව ඉදිරිපිට සේවකයින් දහස් ගණනකට පණිවිඩය බෙදා දුන්නාය. ඇය දෙවියන්වහන්සේ හා ගැලවීම පිළිබඳව සේවකයින්ට කථාකලාය. ඊලග දිනයේ කර්මාන්ත ශාලාව තුල සේවකයින් බොහෝ දෙනෙක් කොමියුනිස්ට්වරුන්ගේ අසාධාරණ කම් වලට විරුද්ධව කැරලි ගැසීමට පසු වෙඩි තබා මරා දමන ලද්දෝය. ඔව්හු නියම වෙලාවට පණිවිඩය අසා තිබුනි.

අපි රහසිගත සභාවේ සිටියෙමු. එහෙත් යොහාන් බව්තිස්ත මෙන් මනුෂ්‍යයින්ටත් පාලකයින්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව විවෘතවම කථාකෙලෙමු. වරක් අපගේ රජයේ ගොඩනැගිල්ලක පියගැට පෙලක් අසලදී කිතුණු සහෝදරවරුන් දෙදෙනෙක් අපගේ අගමැතිවරයාවු ජෝර්ජියු ඩෙජ් ගමන්කල මාර්ගයේදී ඔහුට මුණගැසුනේය. ඔවුන් ගතකල සුළු මොහොතකදී ඔව්හු ඔහුට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ සාක්ෂි දැරුවෝය. ඔහුගේ පාපයෙන් හා පිඩාවෙන් ඉවත් වන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියෝය. ඔවුන්ගේ නිර්භිත සාක්ෂිදැරීම හේතුකොටගෙන ඔහු ඔවුන්ව සිරගත කලෝය. වසර ගනනාවකට පසු අගමැති ඩෙජ් අතිශයින් රෝගීව සිටියදී ඔවුන් වසර ගණනකට පෙර රෝපණය කල ශුභාරංචියේ බීජය ඔහු අතිශයින් පිඩා

විදියදී එලදරන්ට විය. අවශ්‍යතාවයෙන් පෙළුණ මොහොදකදී අගමැතිවරයාට ඔහුට කථාකල වචන සිහිවිය. එහි වචන බයිබලය පවසන පරිදි “ජිවමාන හා බලවත් කොයිම දෙමුවහත් කඩුවකටවත් වඩා තියුණු ඒවා විය” (හෙබ්‍රෙව් 4:12). ඒවා ඔහුගේ දැඩි සිත කපාදැමුයේය. ඔහු ක්‍රිස්තුස්වහන්සේට තම ජිවිතය යටත් කලේය. ඔහු තම පාප කියාදී ගැලවුම්කාරයාණන්ව පිළිගෙන ඔහුගේ රෝගය තුල උන්වහන්සේට සේවය කිරීමට පටන්ගත්තේය. ඉන් වැඩිකලක් ගතවෙන්ට මත්තෙන් ඔහු මරණයට පත්වුයේය. එහෙත් කිතුණුවන් දෙදෙනෙක් මිළිය ගෙවන්ට කැමති වු හෙයින් ඔහු සොයාගත් අළුත් ගැලවුම්කාරයාණෝ වෙතට ඔහු පිටත්ව ගියේය. තවද ඔවුහු වර්තමානයේ වහල් ජාතින් තුල සිටි ධෛර්යමත් කිතුණුවන්ගේ ආදර්ශය විය.

කොමියුනිස්ට්වරුන්ගේ පීඩනය යටතේ ශුභාරංචිය බෙදා ගැනිම අතිශයින් අසීරු විය. එහෙත් අපි කිතුණු පත්‍රිකා කිහිපයක් මුද්‍රණයකරන්ට සාර්ථකව පෙළඹුනෙමු. ඒවා කොමියුනිස්ට්වරුන්ගේ බරපතල බාධා කිරීම් තුලින් වුවද බෙදාහැරීමට හැකිවුනි. තහනම් කරන ලද පොතක ඉදිරිපස කාල්මාක්ස්ගේ පින්තූරයක් යොදා බෙදාහරින්ට අපි සමත්වුනෙමි. කාල්මාක්ස් යනු කොමියුනිස්ට්වාදයේ පියාය. ආගම මනුෂ්‍යයන්ට අබිං යන කියමන ඔහුගේ එම පොතෙහි මාතෘකාව විය. ඔව්හු එය කොමියුනිස්ට් මුද්‍රණයක් යැයි සලකා ඔවුන්ගේ අනුමත කිරීමේ මුද්‍රාව ඒ මත තැබුවේය. එහි පිටු කිහිපයක් මාක්ස්, ලෙනින් ස්ටාර්ලින් වැනි අයගේ උපුටා දැක්වීම් වලින් අපි පිරවුයේ පාලකයින් සතුටු කිරීමටය. එලෙස ක්‍රිස්තුස්වහන්සේ පිලිබඳව අපගේ පණිවිඩය අපි දුන්නෙමු.

අපි අනතුරුව කොමියුනිස්ට්වාදී රැස්වීම් වලට ගොස් මේ “කොමියුනිස්ට්” පොත බෙදාහැරියෙමු. මාක්ස්ගේ පින්තූරය දුටු ඔව්හු මේ පොත ගන්ට පොරකෑහ. ඔව්හු දසවන පිටට එළඹෙන විට එය දෙවියන්වහන්සේ හා යේසුස්වහන්සේ පිළිබඳව බව සොයාගන්නා විට අපි බොහෝ දුර ගොස් සිටියෙමු.

එලෙස රහසිගත සභාව, රහසිගත රැස්වීම් වල සහ නිති විරෝධි ක්‍රියාකාරීත්වයන් වල පමණක් නොව කොමියුනිස්ට්වරුන්ගේ විදී වල නිර්භිතව, විවෘතව ශුභාරංචිය දේශනා කිරීමෙහි නිරත වුවෝය. කොමියුනිස්ට් නායකයින්ටද ශුභාරංචිය දේශනාකරන ලදී. එයට මිළියක් ගෙවිමට අපි සුදානම්ව සිටියෙමු. රහසිගත සභාව අද ද ඒ මිළිය ගෙවිමට සුදානම්ව සිටී.

## රහසිගතව වැඩ කිරීම

රහස් පොලීසිය රහසිගත සභාවට තදින් පීඩා කලේය. එසේ කලේ ඉතිරිව පවතින එකම ප්‍රතිරෝධය එය පමණක් වන බැවිනි. එය යම් ආකාරයක ප්‍රතිරෝධයක් විය. (ආත්මික ප්‍රතිරෝධයක් විය). එයට බාධා නොකොට පැවතුනෙහි නම් ඔවුන්ගේ අදේවවාදී බලය බිඳී වැටෙන බව ඔව්හු දැනසිටියහ. එය ඔවුන්ට ක්ෂනික තර්ජනයක් විය. මනුෂ්‍යයෙක් ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාස කරන්නේ නම් ඔහු කිසි කලෙක මනසක් රහිත තැනැත්තෙකු නොවන බවත් කැමැත්තට යටත් අයෙකු වන බවත් ඔව්හු දැන සිටියහ. මනුෂ්‍යයෙකුගේ කායික ශරීරය සිරගත කල නොහැකි බවත් ඔව්හු දැන සිටියහ. එනම් දෙවියන්වහන්සේ තුල ඔහුගේ ඇදහිල්ල සිරගත කල නොහැකි බව ඔව්හු දැන සිටියහ. එබැවින් ඔව්හු තදින් සටන් කලෝය.

එහෙත් රහසිගත සභාවට කොමියුනිස්ට් රජය තුල සහ රහස් පොලිසිය තුල පවා අනුකම්පාව දක්වන්නෝ හෝ සාමාජිකයෝ සිටියහ.

අපි රහස් පොලිසියට බැදෙන ලෙස කිතුණුවන්ට උපදෙස් දුන්නෙමු. අපගේ රට තුල තදින්ම වෛර කරනු ලබන සහ ප්‍රතික්ෂේප කරනු ලබන නිල වස්ත්‍රය පලඳින ලෙස අපි ඔවුන්ට පැවසුවෙමු. එසේ කිරීම මගින් ඔවුන්ට රහසිගත සභාව වෙත රහස් පොලිසියේ ක්‍රියාකාරිත්වයන් වාර්තා කරන ලෙස දැන්වුයෙමු. රහසිගත සභාවේ සමහර සහෝදරවරු ඔවුන්ගේ ඇදහිල්ල සඟවා තබාගනිමින් මෙසේ කලෝය. එය ඔවුන්ගේ පවුල මගින්, මිතුරන් මගින් ප්‍රතික්ෂේප කරනු ලබන කොමියුනිස්ට් නිල වස්ත්‍රය පැළඳීම ඔවුන්ට අසීරුවක් වුනි. එසේ කොට ඔවුන්ගේ සැබෑ දූත මෙහෙවර අනාවරණය නොකර සිටීම ඔවුන්ට අමාරු එකක් වුනි. එනමුදු ඔව්හු, එසේ කලහ. ක්‍රිස්තුස්වහන්සේ වෙත ඔවුන්ගේ ප්‍රේමය මහත් එකක් විය.

මාව පොලිසිය මගින් පැහැර ගෙන ගොස් ඉතා රහසිගතව වසර ගණනක් මුළුල්ලේ සිරගතකර සිටියදී කිතුණු වෛද්‍යවරයෙකු සැබැවින්ම රහස් පොලිසියේ සාමාජිකයෙකු බවට පත්ව මා සිටින ස්ථානය ගැන දැනගන්ට සෙව්වේය. රහස් පොලිසියේ වෛද්‍යවරයෙකු ලෙස ඔහුට සියලු සිරකරුවන්ගේ කුටි වලට ඇතුල් වීමට අවසර ලැබු අතර ඔහුගේ බලාපොරොත්තුව වුයේ මා සෙවීමය. ඔහුගේ සියලු මිතුරෝ ඔහු අත්හලෝය. ඔහු කොමියුනිස්ට්වාදියෙකු යැයි සිතමින් ඔව්හු

එසේ කලෝය. පීඩා කරන්නන්ගේ නිල කබාය ඇඳගෙන එහා මෙහා යාම සිරකරුවෙකුගේ නිල වස්ත්‍රය ඇඳගෙන එහා මෙහා යෑමට වඩා මහත් යාගශීලි එකක් විය.

වෛද්‍යවරයා ගැඹුරු අඳුරු කුටියක මා සිටින බව සොයාගෙන මම ජිවත්ව සිටිනවාය යන පණිවිඩය එව්වේය. මගේ සිරගතවීමේ පළමු අවුරුදු අටහමාරක කාලය තුලදී මාව සොයාගත් ප්‍රථම මිතුරා ඔහු විය! ඔහු නිසා, මම ජිවත්ව සිටි යන පණිවිඩය පැතිර ගියේය. එයිපන් නවර් හා කෲෂෙස්ගේ 1956 දී පැවැත්වූ සාකච්ඡාවේදී කිතුණුවන් මාගේ නිදහස වෙනුවෙන් කටයුතු කල අතර සිරකරුවන් නිදහස් කිරීමේදී මාව කෙටි කලෙකට නිදහස් කරන ලදී. මේ වෛද්‍යවරයා නොසිටින්නට එනම් මා සෙවීම පිණිස විශේෂයෙන්ම රහස් පොලිසියට බැඳුනු මොහු නොසිටින්නට මාව නිදහස්කරනු ලබන්නට ඉඩ නොතිබිනි. මම තවමත් සිරගතව සිටින්ට හෝ අද සොහොනෙහි සිටින්නට ඉඩතිබිනි.

රහස් පොලිසියේ තමන්ගේ තනතුර භාවිතාකරමින් රහසිගත සභාවේ සාමාජිකයෝ බොහෝ අවස්ථාවල අපට අනතුරු ඇඟවූ අතර ඔව්හු මහත් වූ උපකාරයක් විය. කොමියුනිස්ට් රටවල රහසිගත සභාවට අද ද රහස් පොලිසියේ මනුෂ්‍යයන්ගෙන් කිතුනුවන්ට මතු පැමිණෙන්නට යෙදෙන අනතුරු පිළිබඳව ඇඟවීම් කරන මනුෂ්‍යයන් සිටිති. සමහරු රජයේ තනතුරු වල ඉහල ස්ථාන වල සිටිති. ඔව්හු ක්‍රිස්තුස්වහන්සේ තුල ඔවුන්ගේ ඇදහිල්ල රහසිගතව පවත්වා ගනිමින් අපට මහත්සේ උපකාර කලෝය. දැන් රහසිගතව සේවය කරන අයට යම් දිනක ස්වර්ගයේදී ප්‍රසිද්ධියේ ක්‍රිස්තුස්වහන්සේ බව ප්‍රකාශකරන්නට පුළුවන.

එය කෙසේ වෙතත් රහසිගත සභාවේ බොහෝ සාමාජිකයින්ව සොයනු ලැබ සිරගත කරන ලදී. අපට "යුදස්" වැනි පාවා දෙන්නවුන්ද සිටියෝය. ඔව්හු රහස් පොලිසියට අප ගැන වාර්තා කලෝය. පහරදෙමින්, මත්ද්‍රව්‍ය යොදාගනිමින්, තර්ජනය කරමින්, බ්ලැක්මේල් කරමින්, කොමියුනිස්ට්වරු, තමුන්ගේ සහෝදරයින් ගැන වාර්තාකරනු පිණිස දේවගැතිවරු හා ගිහියන් සොයා ගැනිමට උත්සහා කලෝය.

## 2 පරිච්ඡේදය



# “මීට වඩා මහත් ප්‍රේමයක් මනුෂ්‍යයෙකුට නොමැත්තේය.”

මම නිල වශයෙන් හා රහසිගත ආකාරයට 1948 පෙබරවාරි 29 වන දින දක්වා එලෙස වැඩ කලෙමි. එකි අලංකාර ඉරිදා උදෑසන මා සභාවට යන විට විදියේදී රහස් පොලිසිය මා පැහැරගෙන ගියේය.

බයිබලය කිහිපවරක් සඳහන්කරන “මනුෂ්‍යයින් සොරකම් කිරීම” යන්නෙහි අර්ථය කුමක් දැයි මම නිතරම කල්පනා කලෙමි. කොමියුනිස්ට්වරු එය කුමක් දැයි අපට ඉගැන්නුවෝය.

බොහෝ දෙනා ඒ කාලයේ මේ අන්දමින් පැහැරගනු ලැබුවෝය. රහස් පොලිසියේ වෑන් රථයක් මා ඉදිරියෙහි නතරකොට මනුෂ්‍යයින් හතර දෙනෙක් එයින් පිටතට අවුත් මාව එයට නංවාගත්තෝය. සිරගෙදර මා ගතකල කාලය තුල වසර 8ක් මාව රහසිගතව තබාගන්නා ලදී. එම කාලයේදී මා ජීවත්වන බව හෝ මරණයට පත් වු බව කිසිවෙකු දැන නොසිටියහ. නිදහස් වු සහකාර සිරකරුවන් මෙන් රඟපෑ රහස් පොලිසිය විසින් මාගේ භාර්යාව මුණගැසෙන්නට පැමිණියෝය. ඔව්හු මාගේ භාර්යාවට මාගේ භූමදානයට සහභාගීවු බව දැන්වුවෝය. ඇගේ සිත බිඳවැටිනි.

එකල සියලු නිකාය වල දහස් ගණන් ඇදහිලිවන්තයින් සිරගත කරන ලදි. පුජකවරු පමණක් නොව සාමාන්‍ය ගැමියන්ද තම ඇදහිල්ල

ගැන සාක්ෂිදැරූ තරුණයන් හා තරුණියන්ද සිරගත කරන ලදී. රුමේනියාවේ සිරගෙවල් පිරී පැවතිනි. සියලු කොමියුනිස්ට් රටවල සිරගත කිරීම යනු වධබන්ධන වලට ලක්වීමයි.

එම වධබන්ධන සමහර විට භයානක විය. මා හසුවුනු එබඳු දේ ගැන බොහෝ දේ කථාකරන්ට බලාපොරොත්තු නොවෙමි. ඒවා අතිශයින් වේදනාත්මකය. මට එසේ වු විට රාත්‍රියේ නිදාගැනිමට නොහැකි වුනි.

"දෙවියන්වහන්සේගේ රහසිගත සභාව තුල" දෙවියන්වහන්සේ සමඟ අපේ අත්දැකීම් බොහෝ කොට තොරතුරු සහිතව විස්තරාත්මකව මම ආවර්ජනය කරමි.

## කිව නොහැකි වධබන්ධන

ප්ලෝරෙස්තු නැමැති දේවගැතිවරයෙකුව රතුවෙන්නට ගිනියම් කල යකඩ දැති හා පිහියා වලින් වධබන්ධනයට ලක්කරන ලදී. ඔහුට ඉතා නපුරු ලෙස පහර දෙනලදී. විශාල පයිප්ප තුලින් ඔහුගේ සිරමැදිරියට කුසගින්නේ සිටින මීයන්ව එවන ලදී. මේ සියලු අවස්ථා වලින් ඔහුව අරක්ෂාවීමට උවමනා වු බැවින් ඔහුට නිදන්නට නොහැකි විය. ඔහු මොහොතකට හෝ විවේක ගත්තේ නම් මීයන් ඔහුට පහර දෙනු ඇත.

සති දෙකක් මුළුල්ලේ දවල් කාලයෙත් රාත්‍රියෙත් ඔහුට සිටගෙන සිටින්නට අණකොට තිබුනි. ඔහුට තම සහෝදරයින්ට ද්‍රෝහි වන ලෙස, ඔවුන්ව පාවාදෙන ලෙස කොමියුනිස්ට්වරු බලකලෝය. එහෙත් ඔහු තදින් එයට විරුද්ධත්වය දැක්විය. ඉන් අනතුරුව ඔව්හු ඔහුගේ වයස අවුරුදු 14ක පුතා සිරමැදිරියට ගෙනවුත් පියා ඉදිරියේ පුතාට කසෙන් තලන්නට සැලැස්විය. දේවගැතිවරයා ඔවුන් බලාපොරොත්තු වන දෙය පවසන තුරු ඔවුන් ඔහුට පහර දෙන බව පැවසුවෝය. දිළිඳු මනුෂ්‍යයා භාගෙට පිස්සු වැටුනේය. ඔහු තමාට හැකි පමණ දෑත් දිගුකොට මහත් හඬින් හඬා වැටෙමින් තම පුත්‍රයාට මෙසේ කීවේය. "ඇලෙක්සැන්ඩර් ඔවුන්ට උවමනා දෙය මම පැවසිය යුතුය, ඔබට තවදුරටත් පහර දෙනවා මට බලාසිටින්නට බැරිය." පුතා පිළිතුරු දුන්නේ මෙසේය. "පියාණෙනි මා නිසා එසේ නොකරන්න. දෙමව්පියෙකු ලෙස ද්‍රෝහි වීමෙන් අසාධාරණය නොකරන්න. කෙලින් සිටින්න. ඔව්හු මාව මරණවා

නම් මම යේසුස්වහන්සේ සහ මාගේ පිතෘ දේශය යන වචන සමග මරණයට පත්වන්නෙමි." කොමියුනිස්ට්වරු කෝපයෙන් වියරු වැටි දරුවා පිට නැගී මැරෙන තුරු ඔහුට පහරදුන්නේය. සිරමැදිරියේ බිත්ති මත ලේ ගලා ගියේය. ඔහු දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින් මරණයට පත්වුයේය. අපගේ ආදරණීය සොහොයුරු ජලෙරෙස්තු මෙය දැකීමෙන් පසු කිසිකලෙක නැවත ඒ සමාන හොඳ සිහියකින් නොසිටියේය.

තියුණු ඇණ සහිත මාංචු අපගේ දැත් වලට දමනු ලැබීය. අපි සම්පූර්ණයෙන්ම නිශ්චලව සිටියේ නම් ඒවායින් අපව කැපී නොගියේය. එහෙත් තදින් ශීතල සිරකුටි තුල අපි ශීතලේ ගැහෙන විට අපගේ දැත් ඒ ඇණ වලින් ඉරී ගියේය.

කිතුණුවන්ගේ හිස පහතට දමා ලණුවලින් එල්ලා ඔවුන්ට තදින් පහර දුන්නෝය. ඔවුන්ගේ ශරීර පිටුපසට පැද්දෙන විට ඔවුන්ට තදින් පහර දෙන ලදි. කිතුණුවන්ව ශීත කරන ලද සිරකුටි වල දමන ලදි. ඒවා කෙතරම් ශීතලද කිවහොත් ඇතුලත අයිස් මිදී තිබුනි. මාගේ ඇග යන්තම් පමණක් වැසී තිබිය දී වරක් මාව එවැන්නකට දමන ලදි. සිරගෙදර වෛද්‍යවරු හිම මිදීම හේතුකොටගෙන මරණයට ළංවන අවස්ථාවේ රෝග ලක්ෂණ සිර කුටියට යටින් බලා සංඥාවක් තිබුත් කල විට රැකවලුන් අවුත් අපව මැදිරියෙන් පිටතට ගෙන අපව උණුසුම් කලහ. අපව හොඳින් උණුසුම් වූ පසු ක්ෂණිකව නැවත එම අයිස් පෙට්ටියට අපව දමන ලදි. මෙසේ හිම දියවීමත් නැවත මිදීමත් මරණයට ළංවීමත් යනාදී ලෙසට නැවත නැවතත් සහ නැවත නැවතත් සිදුවෙන්ට සලස්වනලදි. වර්තමානයේ පවා මට ශීතකරණයක් විවෘතකරන්නට බැරි අවස්ථාවන් ඇත.

කිතුනුවන් ලෙස සමහර අවස්ථාවලදී අපට වඩා යන්තම් උසැති ලී පෙට්ටි වල සිටගෙන සිටින්ට බලකරන ලදි. එහි සෙලවෙන්ට ඉඩකඩක් නොවීය. පෙට්ටිය ඇතුලේ තියුණු ඇණ දුසිම් ගණනක් විය. ඒවායේ තියුණු තුඩවල් ලෑලි වලින් ඇතුලට කා වැදී තිබුනි. අපි සම්පූර්ණයෙන්ම නිශ්චලව සිටගෙන සිටින්නේ නම් අපට අනතුරක් නැතිව සිටින්ට පුළුවන. එවැනි පෙට්ටි තුල පැය ගණනක් සිටගෙන සිටින්ට අපට බලකරනලදි. අපි වෙහෙසට පත්ව අධික වෙහෙසින් පැත්තට ඇලවුනොත් ඒ තියුණු ඇණ අපගේ සිරුරු තුවාල කරයි. අපි සෙලවුනොත් මාංශපේශි එහා මෙහා කලොත් එතැනට තියුණු ඇණ ඇනෙනු ඇත.

මිනිස් අවබෝධයට අනුව විඳින්නට නොහැකි තරම් වධබන්ධන වලට කොමියුනිස්ට්වරු කිතුණුවන්ව ලක් කලෝය. පුපුරා හැලෙන ප්‍රීතියකින් යුතුව ඇදහිලිවන්තයින්ට පීඩා විඳින්ට සලස්ව ප්‍රීතියෙන් හැසිරෙන කොමියුනිස්ට්වරුන්ව මම දුටුවෙමි. ඔව්හු කිතුණුවන්ට වධබන්ධන දෙමින් "අපි යක්ෂයෝ" යනුවෙන් කෑ මොරගැසුවෝය.

අපි මාංශයටත්, රුධිරයටත් විරුද්ධව සටන් නොකෙලෙමු. එහෙත් අපි අධිපතින්ටත් පරාක්‍රමධාරීන්ටත් විරුද්ධව සටන්කෙලෙමු. කොමියුනිස්ට්වාදය මනුෂ්‍යයන්ගෙන් නොව යක්ෂයාගෙන් බව අපි දනිමු. එය ආත්මික බලවේගයකි. – නපුරු බලවේගයකි. එය ජයගත හැක්කේ ඊට වඩා මහත් වු ආත්මික බලවේගයකට පමණකි. එනම් දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේට පමණකි.

මම නිතරම මෙම වධබන්ධන දෙන්නන් ගෙන් මෙසේ ඇසුවෙමි. "ඔබගේ සිත්වල අනුකම්පාවක් නැද්ද?" ඔව්හු ලෙනින්ගේ වදනක් පිළිතුරු වශයෙන් මා හට දැන්වුවෝය. "බිත්තරයේ කට්ට නොකඩා ඔම්ලට් සැදිය නොහැක." තවද ඔව්හු මෙසේද පැවසුවෝය. "පතුරු විහිදෙන්ට සලස්වන්නේ නැතිව බට ලීයක් කපන්ට නුපුළුවන." මම ඔවුන්ට නැවතත් මෙසේ පැවසුවෙමි. "නමුත් මෙහි වෙනසක් ඇත්තෝය. ලීයක් කපන විට එයට හැඟීම් නොදැනේ. එහෙත් මෙහිදී ක්‍රියාකරන්නේ මනුෂ්‍යයින් සමඟය. සැම පහර දීමකින්ම වේදනාව උපදී. වැලපෙන්නාවු මව්වරු සිටිති." එහෙත් එය පලක් නොවීය. ඔව්හු භෞතිකවාදියෝය. ඔවුන්ගේ ද්‍රව්‍ය එසේ පවතිනවා යන්න හැරෙන්ට වෙන යමක් ලබාගන්ට නොහැකිවිය. ඔවුන්ට මනුෂ්‍යයෙක් වුවද ලීයක් මෙනි. බිත්තර කට්ටක් මෙනි. මේ විශ්වාසය සමඟ ඔව්හු මහත් ලෙස සිතාගත නොහැකි අන්දමේ වධබන්ධන වල නිරතවෙති.

අදේවවාදයේ කෲරකම විශ්වාස කිරීමට අසීරුය. මනුෂ්‍යයෙකුට යහපත සඳහා විපාකයක් හා නපුර සඳහා දඬුවමක් යන දෙය ගැන ඇදහිල්ලක් නොමැති විට ඔහු මනුෂ්‍යයෙකු වීමට හේතුවක් නොමැත. මනුෂ්‍යයා තුල තිබෙන නපුරුකමෙහි ගැඹුරුභාවය සතුව හික්මවීමක් නොමැත. මැඩපැවැත්වීමක් නොමැත. කොමියුනිස්ට්වාදී වධබන්ධනකරුවන් නිතරම මෙසේ පැවසුහ. "දෙවිකෙනෙක් නොමැත. මෙතැනින් පසුව නපුර සඳහා දඬුවමක් නොමැත අපට කැමති දෙයක් කරන්ට පුළුවන." එක් වධබන්ධනකරුවකු මෙසේ පවසනු මට ඇසුනි. "මම විශ්වාස නොකරන දෙවියන්වහන්සේට ස්තුතිකරමි. මා ජීවත්ව සිටින්නේ මේ පැය සඳහායි.

මට මාගේ හිතේ හැටියට සියලු නපුර කරන්නට පුළුවන් වන බැවින් මම එසේ කරමි." ඔහු සිතාගතනොහැකි තරම් වලට වධබන්ධන සිරකරුවන් පත් කලේය.

කිඹුලෙක් මනුෂ්‍යයෙකු සැපීම ගැන මට කණගාටුයි. නමුත් මට ඒ කිඹුලාට තදින් දොස්නගන්නට නොහැක. ඒ මන්දයත් ඌ සුචරිතවත් සත්වයෙකු නොවන නිසාය. කොමියුනිස්ට්වරු ඔවුන් තුල ඇති සුචරිතවත් හැඟීම් කොමියුනිස්ට්වාදය මගින් විනාශකර තිබේ. ඔවුන්ගේ සිත් තුල අනුකම්පාව නොමැතිවීම ගැන ඔව්හු පාරට්ටු කරගනිති.

මම ඔවුන්ගෙන් ඉගෙනගෙන තිබේ. ඔව්හු ඔවුන්ගේ සිත තුල යේසුස්වහන්සේට කිසිදු ඉඩක් නොතිබෙන නිසා මම ද සාතන් හට මාගේ සිතතුල කිසිදු ඉඩක් තබා නොදෙන්නට තීරණය කලෙමි.

ඇමරිකා එක්සත් ජනපදයේ සෙනට් මන්ත්‍රණ සභාවේ අභ්‍යන්තර ආරක්ෂක උපකමිටුව ඉදිරියේ මම සාක්ෂිදරා ඇත්තෙමි. එහිදී මම මේ භයංකර දේවල් විස්තර කෙලෙමි. කිතුණුවන් දින හතරක් රාත්‍රී හතරක් කුරුසිය තබා ගැට ගසා තිබීම වැනි දේවල් මම පැවසුවෙමි. කුරුස පොළව මත තබා තිබු අතර සිය ගණන් සිරකරුවන් කුරුසපත්කරන ලද අයගේ ශරීර හා මළ මුත්‍රා මත සිටගෙන තමන්ගේ ශරීර අවශ්‍යතාවයන් ඉෂ්ට කිරීමට සිදුවිය. අනතුරුව කුරුස නැවත ඔසවා තබා කොමියුනිස්ට්වරු ප්‍රීතියෙන් මෙසේ නින්දාකරන්ට වුහ. "ඔබේ ක්‍රිස්තුස්වහන්සේ දෙස බලන්න! ඔහු කොතරම් අලංකාරද! ඔහු ස්වර්ගයෙන් ගෙනෙන්නාවු සුවද කෙතරම් මිහිරිද!" යනුවෙන් ඔව්හු පැවසුහ. මේ වධබන්ධන වලින් පිස්සු වැටෙන තරම් තත්වයට පත්වු අන්දම ගැන මම විස්තර කෙලෙමි. එක පුජකයෙකුට මිනිස් මළ මුත්‍රා වලට ආශීර්වාද කොට ඒ ආකාරයෙන් කිතුණු ඉද්ධවු සහභාගිකම පැවැත්වීමට බලකල අන්දම මම විස්තර කලෙමි. මෙය රුමේනියාවේ සිටෙස්ට් සිරගෙය තුල සිදුවිය. මේ නින්දිතත්වයට ලක් නොවී මරණයට පත්වන්නට ඔහු සුදානම් නොවුයේ මන්දැයි මම පුජකයාගෙන් ඉන්පසුව විමසුවෙමි. ඔහුගේ පිළිතුර වුයේ "මා විනිශ්චය නොකරන්න. කරුණාකර එසේ විනිශ්චය නොකරන්න. මම ක්‍රිස්තුස්වහන්සේට වඩා දුක්විද ඇත්තෙමි. බයිබලය තුල විස්තර කර තිබෙන නිරය හා ඩාන්ටේගේ ඉන්ෆෝනෝහි වේදනාවන් කොමියුනිස්ට් සිරමැදුරක වධබන්ධන සමග සමකල නොහැක."

මෙය එක් ඉරිදා දිනක සිදුවූ ඉතා සුළු කොටසක් පමණකි. සිටෙස්ට් බන්ධනාගාරයේ වෙනත් බොහෝ ඉරිදා දිනවලදී ද මෙසේ සිදුවිය. සිදුවූ වෙනත් දේවල් එක එල්ලේ කිව නොහැකි තරම්වේ. ඒවා නැවත නැවතත් පවසන විට මාගේ සිත වේදනාවට පත්වේ. ඒවා එතරම් භයානකය. ලිවීමට තරම් නොවන පිළිකුල් දර්ශන වලින් යුක්තය. ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සහෝදර සහෝදරියන් ලක්වන්නාවූ සහ තවමත් ලක්වෙමින් සිටින්නාවූ වධබන්ධන මෙසේය.

කොමියුනිස්ට් වධබන්ධකරුවන්ගේ භයානකකම් කියමින් මට සිටින්නට වේ නම් කිතුණුවන් කලාවූ ස්වයං පූජාවන් සියල්ල මට නොකඩවා පවසන්නට වේ නම් මට ඒවා නිමකලනොහැකිවේ. එහි වධබන්ධන තිබුනා පමණක් නොවිය. වීර ක්‍රියා වලට උදාහරණ මෙසේය.

ඇදහිල්ලේ මහත් වීරයෙක් වූයේ දේවගැති මිලාන් හයිමොවිරය.

සිරගෙදර මහත් පිරිසක් රැඳී සිටියහ. ජේලර්වරු අපව නමින් දැන නොසිටියහ. ඔව්හු අපව ඇමතුවේ සිරගෙදර යම් නිතියක් කඩා කසපහර 25ක් කෑවාවූ තැනැත්තා යනුවෙනි. කිවනොහැකි වාර ගණනක් දේවගැති හයිමොවිසි වෙනත් අයෙකු වෙනුවෙන් පහර කෑමට පිටත්ව ගියේය. ඔහු මේ ගැන අනිත් සිරකරුවන්ගේ ගෞරවය දිනුවේ ඔහු වෙනුවෙන්ම පමණක් නොව ඔහු නියෝජනය කලාවූ ක්‍රිස්තුස්වහන්සේද වෙනුවෙනි. අප සමග රහසිගත සභාවේ සේවය කල තරුණ ගැහැණු ළමයෙක් විය. කොමියුනිස්ට් පොලිසිය ඇය රහසිගතව ශුභාරංචිය බෙදන බවත් ළමයින්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබදව පවසන බවත් සොයාගත්තේය. ඔව්හු ඇයව අත්අඩංගුවට ගැනීමට තිරණය කලේය. එහෙත් ඇයව අත්අඩංගුවට ගැනිම වේදනාත්මක හා දුක්කදායක එකක් බවට පත්කරලීම පිනිස විවාහවෙන දවස පැමිණෙන තුරු සතියක් ඔව්හු ඇයව අත්අඩංගුවට ගැනීම ප්‍රමාදකලෝය. ඇගේ විවාහ දවසේ දී ඇය මනාලියක ලෙස හැදපැළද සිටියදී ඉතා පුදුමාකාර ලෙස තරුණියකගේ ජිවිතයේ ප්‍රිතිමත්ම දවසේදී හදිසියේ රහස් පොලිසිය ඇය සිටි තැනට ඇතුල් විය.

මනාලිය රහස් පොලිසිය දුටු විගස මාංචු දැම්මට ඇගේ දැත් දිගුකලාය. ඔව්හු දරුණු ආකාරයෙන් ඇගේ අත්වලට මාංචු දැමුවෝය.

ඇය තමාගේ පෙම්වතා දෙස බලා එම මංචු සිප "මාගේ ස්වර්ගීය මනාලයාට මේ ආභරණ මාගේ විවාහ දිනයේ දී මට

පරිත්‍යාග කිරීමට හැකිවීම ගැන මම ස්තූතිවන්ත වෙමි. උන්වහන්සේ වෙනුවෙන් වේදනා විඳිමට මම වටිනා තැනැත්තියක් බැවින් මම උන්වහන්සේට ස්තූතිවන්ත වෙමි." යැයි ඇය පැවසුවාය. කිතුණුවන් හා ඇගේ මනාලයා වැළපෙන අතරතුර ඇයව ඇදගෙනයන ලදී. කොමියුනිස්ට් ජේලර්වරුන් හමුවේ තරුණ කිතුණු ගැහැණු ළමයෙකුට සිදුවු දෙය දන්නේ ඔවුන් පමණකි. ඇගේ මනාලයා ඇය වෙනුවෙන් විශ්වාසවන්තව බලා සිටියේය. වසර 5 කට පසු ඇයව නිදහස්කරන ලදී. ඇය විනාශයට ලක්වුනු බිදුනාවු සිතැති වයස අවුරුදු තිහකින් පමණ මහලු වු තැනැත්තියක ලෙස පෙනුනාය. ඇය පැවසුවේ ඇගේ ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ඇයට කරන්ට තිබුණු අඩුම දෙය මෙය බවයි. එබදු අලංකාර කිතුණුවන් රහසිගත සභාවේ සිටියෝය.

## මොල සේදීමට ප්‍රතිවිරෝධය දැක්වීම

බටහිර ජාතින් කොරියානු හා වියට්නාම් යුද්ධ වලදී සිදුකල මොල සේදීම පිළිබදව අසා තිබෙන්නට පුළුවන මම ද මොළ සේදීමේ කෘෘරතර ක්‍රියාව මැදින් ගිය අයෙක්මි. එය ඉතාමත් භයානක වධදීමකි.

අපට දිනකට පැය 17ක් හිදගෙන – සති ගණනක් මාස ගණනක් සහ අවුරුදු ගණනක් – මෙසේ පවසනු අසන්නට සිදුවුනි.

කොමියුනිස්ට්වාදය හොඳයි!
කොමියුනිස්ට්වාදය හොඳයි!
කොමියුනිස්ට්වාදය හොඳයි!
ක්‍රිස්තියානිය මෝඩයි!
ක්‍රිස්තියානිය මෝඩයි!
ක්‍රිස්තියානිය මෝඩයි!
අත්හරින්න!
අත්හරින්න!
අත්හරින්න!

සමහර කිතුණුවෝ මොළසේදීමට ප්‍රතිරෝධය දැක්විය යුත්තේ කෙලෙසදැයි මගෙන් ඇසුවෝය. එයට ඇති එකම ක්‍රමය "සිත සෝදාගැනීම" බව මම පැවසුවෙමි. යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් සිත සෝදාගැනිම සිදුවුනි නම් සිත උන්වහන්සේට ප්‍රේමකරන්නේ නම් යමෙකුට වධබන්ධන වලට ප්‍රතිරෝධය දැක්විය හැක. ප්‍රේමනිය මනාලියන්

ප්‍රේමනීය මනාලයෙක් වෙනුවෙන් නොකරන දෙයක් ඇද්ද? ප්‍රේමනීය මවක් ඇගේ දරුවා වෙනුවෙන් නොකරන දෙයක් ඇද්ද? මරියා කල ආකාරයට ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකලේ නම් ඇගේ අතෙහි රදවාගෙන සිටි ළිදරුවෙකු වු ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකලේ නම් ඔබ මනාලියක තම මනාලයාට ප්‍රේමකරන්නා සේ යේසුස්වහනසේට ප්‍රේමකරන්නෙහි නම් ඔබට එබදු වධබන්ධන වලට ප්‍රතිරෝධය දැක්විය හැක.”

*යේසුස්ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයත් යමෙකුගේ සිත පවිත්‍රකරනු ලැබූ කල සියලු ආකාරයේ වධබන්ධන වලට ප්‍රතිරෝධය දක්වන්ට ඔහුට හැකිවන්නේය.*



අපි දරාගන්නා ප්‍රමාණය අනුව දෙවියන්වහන්සේ අපව විනිශ්චය නොකරන්නේය. අප දක්වන ප්‍රේමය අනුව මිස උන්වහන්සේ අපව විනිශ්චයකරන්නේ නැත. සිරගෙය තුලදී තමුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් වේදනා වින්දාවු කිතුණුවන්ට ප්‍රේමකිරීමට පුළුවන. ඔවුන්ට දෙවියන්වහන්සේට හා මනුෂ්‍යයින්ට ප්‍රේමකල හැකි බවට මම සාක්ෂිකාරයෙක් වෙමි.

මෙම වධබන්ධන හා කෲරතර ක්‍රියා නැවතීමක් නැතිව නොකඩවා කරනු ලැබිනි. මාගේ සිහිය මට නැතිව ගිය අවස්ථාවලදී හෝ තවදුරටත් රහසිගත සභාව පිළිබදව මට වධබන්ධන දුන්නාවු අයට තොරතුරු දැක්වීමේ යම් බිදකදු හෝ බලාපොරොත්තු මාත්‍රයක් මා ගැන තබන්නට පුළුවන් තත්වයකට මා පත්වෙන අවස්ථාවේදී මම ආපසු මගේ සිරමැදිරියට පැමිණ වැතිර සිටින්නෙමි. තවද එසේ සිටින අතරතුර කිසිදා සාත්තුවක් නොලැබ හාගෙට මිය ගොස් සිටින ආකාරයට සිටියෙමි. ඔවුන්ට මට නැවත වධ දීමට හැකි තත්වයට පත්වන තුරු සුළු ශක්තියක් නැවත ලැබෙන තෙක් බලා සිටියෝය. මේ තත්වයේදී බොහෝ අය මේ අවස්ථාවේදී මරණයට පත්වුවෝය. නමුත් මාගේ ශක්තිය නැවත යම්කිසි ආකාරයකින් මා වෙත ලැබුනේය. මේ වසර ගණනාව තුලදී විවිධ සිරගෙවල් තුල මා ගතකලෙමි. මාගේ කොදු ඇට හතරක් බිඳ

දමනලදි. ඔව්හු මාව ස්ථාන දොළොසකින් පෙති ගසනලදි. මාගේ ශරීරය පුළුස්සා ස්ථාන 18කින් සිදුරු කරන ලදි.

මා සහ මාගේ පවුල වෙනුවෙන් කප්පම් ගෙවා මාව රුමේනියාවෙන් පිටතට ගෙන නෝර්වේ රටට ගෙනා කල ඔස්ලෝහි වෛද්‍යවරු මේ සියල්ල බලා ක්ෂය රෝගය නිසා මාගේ පෙනහළු වල තිබුනු තුවාල කැලලිද බලා මා ජීවත්වීම සම්පූර්ණයෙන්ම හාස්කමක් යැයි ප්‍රකාශකලෝය. ඔවුන්ගේ වෛද්‍ය පොත් වලට අනුව මා මියගොස් වසර ගණනාවක් ගතවෙන්ට ඉඩ තිබුනි. එය හාස්කමක් බව මම දනිමි. දෙවියන්වහන්සේ හාස්කමේ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේ මේ පුදුමය සිදුකලේ පීඩාවිඳින රටවල රහසිගත සභාවෙහි හඬ මාගේ කටහඬ තුලින් ඔබට අසනු ලබන පිනිස බව මම විශ්වාසකරමි. උන්වහන්සේ මට මේ පීඩා තුලින් පිටතට පැමිණ විශ්වාසවන්ත සහෝදරයන්ගේ වේදනා විඳිම ගැන හඬගා කියන්නට මාව ජීවත්ව තැබුසේක.

## කෙටි නිදහස – නැවත අත් අඩංගුවට ගැනිම.

1956 වසර පැමිනියේය. මම වසර අටහමාරක් මුළුල්ලේ සිරගතව සිටියෙමි. මාගේ බර බොහෝ සෙයින් අඩු වී ගියේය. කැත තුවාල කැලලි වලින් මා පිරී ගියේය. ඒවා මට කෲර ලෙස පහර දීමෙන්, පා පහර ගැසීමෙන් හටගත් ඒවා විය. තවද ඔව්හු මාව සමච්චලයට ලක්කලෝය, මාව මහත්සේ පීඩනයට පත්කලෝය, මගෙන් ප්‍රශ්න කලෝය, තර්ජනය කරනලදි. නොසලකාහරින ලදි. මේ කිසිවකින් මාව අත් අඩංගුවට ගත්තවුන්ගේ බලාපොරොත්තු ඉටු නොවීය. එබැවින් බලවත්සේ අධෛර්යට පත්ව, මාගේ සිරගත කිරීම ගැන විරෝධතා පල කිරීමද නිසා ඔවුහු මාව නිදහස් කලෝය. මාව මගේ පැරණි තනතුරට එනම් දේවගැතිවරයකු වීමට නැවත එක සතියක් සඳහා ඉඩ හරින ලදි. මට දේශනා කිරීමට ඉඩ ලැබුනේ දේශනා දෙකක් පමණි. ඔවුහු මා කැඳවා තවදුරටත් දේශනා කල නොයුතු බව පැවසුවෝය. තවදුරටත් මා ආගමික ක්‍රියාවල නිරත නොවිය යුතු බව පැවසුහ. මා කුමක් පවසන්නද? මං මගේ සභාවේ ඇදහිලිවන්තයින්ට උපදෙස් දුනිමි. “ඉවසන්න, ඉවසන්න, තවත් ඉවසන්න” යනු ඒ උපදේශයයි. “මෙහි අර්ථය ඔබ ඔවුන්ට ඉවසන්නට යැයි කිවේ ඇමරිකානුවන් පැමින ඔවුන්ව නිදහස් කරතැයි යන බලාපොරොත්තුවෙන්ද?” යනුවෙන් පොලිසිය මා හට තර්ජනය කලේය. මම ඔවුන්ට පැවසුවේ රෝදය කැරකෙනවා මෙන් කාලය වෙනස් වන බවය. “ඔබ ඔවුන්ට කොමියුනිස්ට්වරු දිගටම

පාලනය නොකරන බව පවසන්නේද? මෙය ප්‍රතිවිප්ලවකාරින්ගේ බොරුවකි!" ඔව්හු ගුගුලෝය. එය මාගේ ප්‍රසිද්ධ සේවයේ අවසානය විය.

මම ඔවුන්ට විරුද්ධව ක්‍රියාකිරීමට බියවනු ඇතැයි සහ රහසිගත සාක්ෂිදැරීම දිගටම කරගෙන යනු ඇතැයි සමහර විටක අධිකාරීන් විශ්වාස කලා විය හැක. එහිදී ඔවුන්ට වැරදුනෝය. මගේ පවුලේ උපකාරය ඇතුව මම රහසිගතව කලින් කලාවූ වැඩය වෙත නැවතත් එළඹුනෙමි. නැවතත් මම විශ්වාසවන්ත රහසිගත කණ්ඩායම ඉදිරියේ සාක්ෂිදරමින් විශ්වාසය තැබිය හැකි අයගේ රැකවරනය යටතේ අවතාරයක් මෙන් එහා මෙහා ගියේමි. මේ අවස්ථාවේ සාක්ෂිය දැරීමේදී මාගේ තුවාල කැළැල්ද පෙන්වමින් අදේවවාදින්ගේ කෘෘරකම් හෙලි කරමින් මුලාව යන ආත්ම වලට නිර්භිතව සිටීමට ධෛර්‍ය ලබාදීමට හැකිවිය. පසුබටවන්නාවු ආත්මවලට දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබා නිර්භීතවන්ට ධෛර්යමත් කලෙමි. කොමියුනිස්ටවරුන්ගේ ඇස් අන්ධ කරමින් දේව පිහිටෙන් යුතුව එසේ කරමින් ශුභාරංචිය ගෙන යෑමට උදව්කරන ඉවැන්ජලිස්තවරුන්ගේ රහසිගත ජාලයකට මම නායකත්වය දුනිමි. දෙවියන්වහන්සේගේ හස්තය ක්‍රියාකරන අන්දම නොදකින ලෙස මනුෂ්‍යයෙකුට අන්ධවිය හැකි නම් ඔවුන් සමහර විටක ඉවැන්ජලිස්තවරයෙකුද දකින්නට නොපුළුවන් බව තේරුම් ගතිමි.

අවසානයේදී පොලිසිය මාගේ ක්‍රියාකාරීත්වයන් ගැන කෙලවරක් නොමැතිව උනන්දුව දැක්වූ අතර ඔවුන්ට ගෙවනු ලබන්නේ කෙලෙසදැයි යන්න පිළිබඳව උනන්දුවක් දැක්විය. නැවතත් මම සොයාගෙන ලැබ සිරගත කලෝය. කිසියම් හේතුවක් නිසා මේ අවස්ථාවේදී මාගේ පවුල සිරගත කිරීමට නොහැකි විය. සමහරවිටක සියලු ප්‍රසිද්ධිය මා ලබා ගෙන තිබු නිසා විය හැක. මම වසර අවුරුදු අටහමාරක සිරදඬුවමක් විඳ තිබෙන අතර අනතුරුව සාපේක්ෂ නිදහසක් ලැබූ වසර කිහිපයක් විය. දැන් මාව තවත් අවුරුදු අටහමාරකට සිරගතකරන ලදි.

දෙවන සිර දඬුවම පළමු සිරදඬුවමට වඩා අතිශයින් දරුණු විය. බලාපොරොත්තු විය යුත්තේ කුමක් දැයි මම දැනගෙන සිටියෙමි. මාගේ කායික තත්වය අතිශයින් නරක අතට හැරුනි. එය ක්ෂනිකව සිදුවිය. එහෙත් රහසිගත වැඩ අපට හැකි අයුරින් අපි කරගෙන ගියෙමු. එය කොමියුනිස්ට් සිරගෙය තුල කරගෙන ගියෙමි.

## අපි එකගත්වයකට එළඹුනෙමු: එනම් අපි දේශනාකරමු ඔවුන් අපට පහරදෙති.

සිරගෙය තුල අනිත් සිරකරුවන්ට දේශනාකිරීම තදින් තහනම් විය. එය වහල් නීතියක් වු බැවින් එසේ සිදුවිය. කවරෙකු හෝ එසේ කොට අසුවුවහොත් ඔහුට තදින් පහරදෙනු ලැබිනි. අපි කිපදෙනෙක් මිළිය ගෙවා දේශනාකිරීමේ වරප්‍රසාදය හිමිකරගන්ට තිරණය කලෙමු. එබැවින් අපි ඔවුන්ගේ කොන්දේසි පිළිගත්තෙමු. එය ගණුදෙනුවක් විය. අප දේශනාකරන්ටත් ඔවුන්ට අපට පහරදෙන්ටත් සැලැස්වුනි. දේශනාකිරීමෙන් අපි ප්‍රීතිවුනෙමු. පහරදිමෙන් ඔවුන් ප්‍රීතිවුවෝය. එබැවින් සියල්ලෝ ප්‍රීතිවුවෝය.

පහත සඳහන් සිද්ධිය මට මතක ඇති හැටියට බොහෝ වාර ගණනක් සිදුවිය. සහෝදරයෙකු අනික් සිරකරුවන්ට දේශනා කරන විට ජේලර්වරුන් හදිසියේ එතැනට කඩා වැදී ඔහු කියවමින් සිටි වැකිය නිමවෙන්ටත් ප්‍රථම ඔහුව පුදුමයට පත්කරමින් කොරිඩෝව දිගේ ඔහුව ඇදගෙන ගොස් "පහරදීමේ කාමරය"ට දැමුවෝය. කෙලවරක් නොමැතිව ඔහුට පහරදී ඔව්හු ආපසු ඔහුව ගෙනවිත් කාමරයට විසිකලෝය. – ලේ හා තුවාල වලින් පිරි සිරගෙයි පොළව මත ඔහු වැතිර සිටියදී සෙමින් සෙමින් තමාගේ වේදනා විදින පහර ලත් ශරීරය කෙලින් කරගෙන ඔහුගේ ඇදුම් පැළඳ ගනිමින් "දැන් සහෝදරවරුනි මා නැවැත්වු තැන කොතැනද?" යනුවෙන් අනිත් අයගෙන් විමසමින් ඔහුගේ ශුභාරංචි පණිවිඩය කරගෙන ගියෝය.

මම අලංකාර දෙයක් දැක ඇත්තෙමි.

සමහර අවස්ථාවල දේශකයින් ගිහි මනුෂ්‍යයින් වුහ. නිතරම අලංකාර ලෙස දේශනාකරන ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේප ලැබු සරල මනුෂ්‍යයින් විය. ඔවුන්ගේ සිත දේව වචනයෙන් පිරි තිබිනි. අමාරු වාතාවරණයක් යටතේ දේශනාකිරීම ඔවුන්ට අසීරු කාරණයක් නොවිය. ජේලර්වරුන් එවිටද පැමිණ දේශකයාව ගෙන ගොස් භාගෙට මැරෙන තෙක් ඔහුට පහරදෙන්නේය.

ගෙර්ලා සිරගෙය තුල ග්‍රේතු නම් වු කිතුණුවෙක් සිටියේය. මැරෙන තෙක් පහර දෙන්ට ඔහුට නියම කෙරෙනි. මේ ක්‍රියාදාමය සති කීපයක් තිස්සේ පැවතුනි. එහිදී ඔහුට ඉතා සෙමින් පහර දෙන ලදි. සමහර

අවස්ථා වලදී ඔහුගේ යටි පතුලට රබර් පොල්ලකින් පහරදෙන ලදී. වෘෂණකෝෂ වලටද පහරදෙන ලදී. වෛද්‍යවරයා අනතුරුව ඔහුට එන්නතක් දෙන ලදී. ඔහු සුවවූ පසු ඔහුගේ ශක්තිය ලැබෙන පිනිස ඔහුට හොඳ ආහාර දෙන ලදී. ඉන්පසු නැවතත් ඔහුට පහරදෙන ලදී. මෙලෙස සෙමින් සෙමින් ඔහු අවසානයේදී මරණයට පත්වන තුරු ඔහුට පහරදෙන ලදී. මේ වධබන්ධනයට නායකත්වය දුන් එක් අයෙකු වූයේ කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටුවේ සාමාජිකයෙකු වූ රෙක් නැමැති තැනැත්තාය.

මෙම පහරදීම අතරතුර දී කොමියුනිස්ට්වරු නිතරම කිතුණුවන්ට පවසන දෙයක් රෙක් ග්‍රේතුට පැවසුවේය. "මම දෙවියන්වහන්සේ බව ඔබ දන්නවාද? මට ඔබගේ ජීවිතය හා මරණය මත බලය තිබේ. ස්වර්ගයේ සිටින තැනැත්තාට ඔබගේ ජීවිතය ගැන තීරණයකරන්ට නොහැක. සියල්ල මා මත රඳාපවතී. මම කැමති නම් ඔබ ජීවත්වන්නෙහිය. මම කැමති නම් ඔබ මැරෙන්නෙහිය. මම දෙවියන්වහන්සේ වෙමි." එලෙස ඔහු කිතුණුවන් සමච්චලයට ලක්කලේය.

මෙම භයානක අවස්ථාවේදී සහෝදර ග්‍රේතු රෙක් නැමැති තැනැත්තා හට ඉතා කදිම පිළිතුරක් දුන්නේය. මෙය පසු අවස්ථාවක රෙක් නැමැති තැනැත්තාගෙන්ම මම දැනගතිමි. ඔහු මෙසේ පැවසුවේය. "ඔබ පැවසූ දෙයෙහි ගැඹුරු අර්ථයක් ඔබ නොදන්නෙහිය. සෑම දලඹුවෙක්ම සැබවින්ම සමනලයෙක්වේ. එසේ වන්නේ ඌ හරියාකාරව වැඩුනොත්ය. ඔබ මවනලද්දේ වදදෙන්නෙකු, මිනීමරණ මනුෂ්‍යයෙකු ලෙස නොවේ. ඔබ දෙවියන්වහන්සේ හා සමාන වන පිනිස මවන ලදී. ඔබගේ සිත තුල දෙවියන්වහන්සේගේ එම ජීවනය පවතින පිනිස මවනලදී. ඔබ මෙන් බොහෝ පීඩාවන් කල සැමදෙනාම අපොස්තුළුවර පාවුල් හා සමාන ලෙස මනුෂ්‍යයෙකුට මෙවැනි පීඩා පැමිණවීම ලැජ්ජා සහගත දෙයක් බව අවබෝධකරගත්තේය. ඔබට මීට වඩා බොහෝ හොඳ දේ කරන්නට පුළුවන. එබැවින් ඒවා ඔබගේ දිව්‍යමය ස්වභාවයේ පංගුකාරයෝ වන්නහුය. යේසුස්වහන්සේ උන්වහන්සේගේ කාලයේ යුදෙව්වන්ට මෙසේ පැවසුවේය. 'නුඹලා දෙවිවරුය' මාව විශ්වාසකරන්න. රෙක් මහාතාණෙනි, ඔබව දෙවියන්වහන්සේ හා සමාන වන පිනිස සැබවින්ම කැඳවනු ලැබ ඇත්තේය. දෙවියන්වහන්සේගේ චරිතය ඔබ තුල පවතින පිනිස මිස වදදෙන්නෙකු වීම පිනිස ඔබව මවා නැත."

එම මොහොතේදී රෙක් නැමැති තැනැත්තා ඔහුගේ අවධානය මේ වචන පැවසූ තැනැත්තා වෙත යොමුනොකලේය. තාර්සස්හි සාවුල්

ඔහු ඉදිරියේ මරාදමනු ලැබූ ස්තේපන්ගේ සාක්ෂිය වෙත අවධානය යොමුනොකලා සේම ඔහු ද ඒ ගැන අවධානය යොමුනොකලේය. එහෙත් මේ වචන ඔහුගේ සිත තුල ක්‍රියාකලේය. තවද රෙක් පසුකලෙක මෙය ඔහුගේ සැබෑ කැදවීම වූ බව අවබෝධකරගත්තේය.

කොමියුනිස්ට්වරුන්ගේ සියලු පහරදීම් වධබන්ධන වලට ලක්කිරීම් සහ කායික පීඩන වලට ලක්කිරීම් සියල්ල හමුවේදී එක මහත් පාඩමක් පැහැදිලිවුනේය. "එනම් ආත්මය ශරීරයෙහි ස්වාමියා බවයි." අපට වධවේදනා හැඟීගියේය. එහෙත් ඒවා අප තුල ඇති ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයෙන් හා එතුමාගේ අභිමුඛත්වය නිසා ආත්මයෙන් බැහැර ඈතක ඇති වේදනා සේ දැනුනි.

අපිට සතියකට වරක් පාන් පෙත්තක් දෙන ලද අතර කිලුටු සුප් එකක් දිනපතා දෙන ලදි. ඒවායින් වුවද "දසයෙන් කොටස" දීමට අපි විශ්වාසවන්තව තීරණය කලෙමු. සෑම දහවෙනි සතියේම අපි පාන් පෙත්ත රැගෙන එය ස්වාමීයාණන්ට දෙන අපගේ "දසයෙන් කොටස" ලෙස දුර්වල සහෝදරයෙකුට දුන්නෙමු.

එක් කිතුණුවෙකුව මරාදමන්නට නියමකල විට ඔහුව මරාදමනු ලබන්ට ප්‍රථම ඔහුගේ භාර්යාවට ඔහුව දකින්නට ඉඩදෙන ලදි. ඔහුගේ භාර්යාව වෙත ඔහුගේ අවසන් වචන වූයේ "මා මරා දමන අයට ප්‍රේමකරමි. මම මිය යන බව ඔබ දන්නෙහිය. ඔවුන් කරන්නාවූ දෙය ඔවුන් නොදන්නෙහිය. මාගේ අවසාන ඉල්ලීම වන්නේ ඔවුන්ටද ප්‍රේමකරන ලෙසය. ඔබට ආදරයකරන තැනැත්තාව ඔවුන් මරාදමන නිසා ඔබගේ සිත තුල තිත්තකම ඇතිකරනොගන්න. අපි ස්වර්ගයේදී හමුවෙමු." මෙකී වචන ඔවුන් දෙදෙනාගේ හමුවීම සිදුවූ ස්ථානයේ සිටි රහස් පොලිස් නිලධාරියා තුල බලපෑමක් ඇතිකලේය. පසුව කිතුණුවෙකු වීම නිසා ඔහුව සිරගෙදරට එවන ලදුව සිරගෙදරදී ඔහු මා සමඟ මෙය පැවසුවේය.

"ටිර්ගු-ඔක්නා සිරගෙය තුලදී මැච්චිසි නැමැති ඉතා ලාබාල සිරකරුවෙක් වූයේය. ඔහුව වයස අවුරුදු 15දී සිරගතකරනලදි. ඔහුට දුන් වධබන්ධන නිසා ඔහු ක්ෂය රෝගයෙන් අතිශයින් පීඩාවට පත්විය. ඔහුගේ පවුලට ඔහු බරපතල ලෙස රෝගාතුරව සිටින බව දැනගන්නට ලැබුනු හෙයින් ඔහු වෙත ස්ට්‍රෙප්ටොමයිසින් නැමැති ඖෂධය බෝතල් 100ක් එව්වේය. ජීවිතයත් මරණයත් අතර සිටි ඔහුට වෙනසක් ඇති

කිරීමට මෙයට පුළුවන්කම තිබිනි. සිරගෙයි සිටි දේශපාලන නිලධාරියා මැච්විසිට මේ පාර්සලය පෙන්වා ඔහුට මෙසේ පැවසුවේය. "ඔබගේ ජීවිතය බේරා ගැනීමට හැකි ඖෂධ මෙහි ඇත. එහෙත් ඔබගේ පවුලෙන් මේ පාර්සලය ඔබට ලබාගැනීමට ඔබට ඉඩ නැත. පුද්ගලිකව මම ඔබට උපකාරකරන්ට කැමතිය. ඔබ තරුණය. ඔබ සිරගෙය තුල මිය යනු දකින්නට මම කැමති නැත. මෙයින් ඔබට උපකාරකරන්නට හැකිවනු පිනිස මට උපකාරකරන්න! ඔබට මේ පාර්සලය මම දෙන්නේ මන්දැයි මාගේ උසස් නිලධාරීන් ඉදිරියේ සාධාරණීකරණය කරනු හැකි වනු පිනිස ඔබගේ සහකාර සිරකරුවන් ගැන මට තොරතුරු සපයන්න."

මැච්විසී මෙසේ පිළිතුරු දුන්නේය. "මම ජීවත්ව සිටින්ට බලාපොරොත්තු නොවෙමි. කැඩපතක් ඉදිරියේ ලැජ්ජාශීලීව සිටින්නට බලාපොරොත්තු නොවෙමි. මන්ද එහි දී ද්‍රෝහියෙකුගේ මුහුණ මම දකින්නෙමි. මට එබදු කොන්දේසියක් පිළිගතනොහැකිය. මම මිය යන්නට කැමැත්තෙමි." රහස් පොලිසියේ නිලධාරියා මැච්විසිගේ අත අල්ලා එය තදින් සොලවා "මම ඔබට සුභ පතමි. ඔබෙන් වෙනත් පිළිතුරක් මම බලාපොරොත්තු නොවෙමි. එහෙත් මම ඔබට වෙනත් යෝජනාවක් කරන්ට කැමැත්තෙමි. සමහර සිරකරුවන් අපට තොරතුරු දන්වන්නන් බවට පත්ව ඇත. ඔව්හු කොමියුනිස්ට්වරු බව අයිතිවාසිකම් කියාපාමින් ඔබව ප්‍රතික්ෂෙප කරති. ඔව්හු දෙබිඩි ජීවිතයක් ගතකරති. ඔවුන් තුල අපට විශ්වාසයක් නැත. ඔවුන් කොතරම් දුරට අවංක දැයි දැනගැනීමට අපි කැමතිය. ඔබගේ වචන හා ක්‍රියා ගැන අපට තොරතුරු දන්වමින් ඔහු ඔබට බලවත්සේ අනතුරුකරමින් ද්‍රෝහීන් මෙන් ක්‍රියාකරන්නෝය. ඔබගේ සහෝදරයින්ව පාවා දෙන්ට ඔබට උවමනා නැති බව මම අවබෝධකරගතිමි. එහෙත් ඔබට විරුද්ධව සිටින අය පිළිබඳව අපට තොරතුරු ඔබ දෙතොත් ඔබ ඔබගේ ජීවිතය බේරාගන්නෙහිය. මැච්විසී කලින් වර මෙන් මෙවරද ස්ථිර ලෙස මෙසේ පිළිතුරු දුන්නේය. "මම ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයෙක්මි. අපගේ සතුරන්ට ප්‍රේමකරන ලෙස උන්වහන්සේ අපට උගන්වා තිබේ. අප පාවා දෙන තැනැත්තන් අපට බලවත් ලෙස අනතුරු කරතත් ඔවුන්ට නපුරට නපුර කරන්ට මට නොහැකිය. ඔවුන්ට විරුද්ධව තොරතුරු දෙන්න මට නොහැකිය. මම ඔවුන් ගැන අනුකම්පා කරමි. මම ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරමි. මම කොමියුනිස්ට්වරු සමග කිසිදු සම්බන්දතාවයක් පවත්වා ගැනීමට බලාපොරොත්තු නොවෙමි." මැච්විසී දේශපාලන නිලධාරියා සමග සාකච්ඡාවෙන් පසු ආපසු පැමිනියේය. ඔහු මම සිටි සිරමැදිරිය තුලම මිය ගියේය. ඔහු මරණයට පත්වනු මම දුටුවෙමි. ඔහු

දෙවියන්වහන්සේට ප්‍රශංසාකරමින් මරණයට පත්වුයේය. ජීවිතය සඳහාවු ස්භාවික ආශාව පවා ප්‍රේමය මගින් ජයගන්නා ලද්දේය.

සංගීතයට මහත්සේ ආශා කරන දිළිඳු මනුෂ්‍යයෙක් ඔහුගේ අන්තිම ඩොලරය පවා සංගීත සන්දර්ශනයකට සවන් දෙන පිනිස වැය කරන්නේය. ඉන් අනතුරුව ඔහුට මුදල් නොමැතිවුවද තම බලාපොරොත්තු කඩවීමේ හැඟීමක් ඔහුට ඇති නොවේ. ඔහු අලංකාර දේවල් අසා තිබුනි. සිරගෙය තුල බොහෝ වසර ගණනාවක් නාස්තිවුනාට මම කලනොකිරෙන්නෙමි. මම අලංකාර දේවල් දැක ඇත්තෙමි. මම සිරගෙදර තුල දුර්වල හා නොවැදගත් අයෙක්ව සිටියෙමි. එහෙත් මම සිරමැදිරිය තුලම මහත්වු සාන්තුවරයන් සමඟ විසීමේ භාග්‍ය ලැබුවෙමි. පළමු ශතවර්ෂයේ කිතුණුවන් හා සමාන ලෙස ඇදහිල්ලේ වීරවරයන් සමඟ සිටීමේ භාග්‍ය ලැබුවෙමි. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මරණයට මුහුණ දීමට ප්‍රීතියෙන් පිටත්ව ගියෝය. එබදු සාන්තුවරයින්ගේ ආත්මික අලංකාරත්වය හා ඇදහිල්ලේ වීරත්වය කිසිකලෙක විස්තර කල නොහැක්කේය.

මෙහිදී මම පවසන දේවල් සුවිශේෂ දේවල් නොවේ. තමන්ගේ ප්‍රථම ප්‍රේමයට ආපසු පැමිනි රහසිගත සභාව තුල සිටින කිතුණුවන්ගේ ජීවිත තුල ආශ්චර්යමත් දේවල් ස්වභාවික දේවල් බවට පත්වුනේය.

එහෙත් සිරගෙයට ඇතුල්වීමට පෙර මම ක්‍රිස්තුස්වහන්සේට බොහෝසේ ප්‍රේමකලෙමි. එහෙත් සිරගෙය තුල ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය (උන්වහන්සේගේ ආත්මික ශරීරය) දුටුවායින් පසුව මම ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකලාක් මෙන්ම ඒ හා සමානව රහසිගතව සභාවටද ප්‍රේමකරන බව පවසන්නට යෙදුනි. මම ඇගේ යාගවීමේ ආත්මය හා ඇගේ අලංකාරත්වය දැක ඇත්තෙමි.

## *මගේ භාර්‍යාවට හා දරුවාට කුමක් සිදුවේද?*

මාව පැහැරගෙන ගිය පසු මගේ භාර්‍යාවට කුමක් සිදුවුනේදැයි මම නොදැන සිටියෙමි. බොහෝ වසර ගණනකට පසු ඇයද සිරගතකරන ලද බව මම දැනගත්තෙමි. සිරගෙය තුල පුරුෂයින්ට වඩා කිතුණු කාන්තාව වේදනා විඳින්නේය. ගැහැණු ළමයින්ව කෲර රැකවලුන් විසින් දුෂණයකරනු ලබන අතර අපහාසය, අශිෂ්ට දේවල් භයානක ලෙස

පැවතිනි. බිං ගෙවල් තුල වැඩ කිරීමට කාන්තාවන්ට බලකරනලදී. පුරුෂයින් කරනවා හා සමාන ලෙස එම වැඩ ප්‍රමාණයම කරන්ට බලකරන ලදී. ඔව්හු ශීතල කාලයේ දී සවලකින් පොළව හැරුවෝය. ගණිකාවන් ඔවුන්ව රැකබලාගැනීමට යෙදවූ අතර විශ්වාසවන්ත අයට පීඩා කිරීමෙන් ඔවුන් පළමු ස්ථානයේ සිටියෝය. ජීවත්ව සිටීම පිනිස ගවයන් මෙන් තණකොල කෑමට මාගේ භාර්යයාවට සිදුවුනි. කුසගින්නේ පෙළුණු සිරකරුවන් මෙවන් උමං තුල වාසය කල මීයන් හා සර්පයින්ව ආහාර ලෙස ගත්තෝය. රැකවලුන්ගේ එක් ප්‍රීතියක් නම් ඉරිදා දින වල කාන්තාවන්ව ඩැනියුබ් ගඟට විසිකොට අනතුරුව ඔවුන්ව දැල් ආධාරයෙන් නැවත මාළු අල්ලාන්නාක්මෙන් පෙරලා අල්ලාගෙන ඔවුන් දෙස බලා සිනහා වීම, ඔවුන්ගේ නාන සිරුරු දෙස බලා සමච්චල්කිරීම හා නැවත නැවතත් එසේ ඔවුන්ව ගඟට විසිකොට නැවත මත්ස්‍යයින් සේ දැල්වලින් අල්ලාගැනීමයි. මේ ආකාරයට මාගේ භාර්යාවද ඩැනියුබ් ගඟට විසිකර තිබේ.

මාගේ පුත්‍රයා පියාව හා මවව පැහැරගෙන ගියායින් පසුව වීදියේ මංමුලාවීමට අතහැර දමනලදී. මිහායි ඒමා කාලයේ සිට ඉතා ආගමික භක්තියකින් යුක්තවූ අතර ඇදහිල්ල පිළිබඳ කරුණු සම්බන්ධයෙන් ඉතා උනන්දුවක් දැක්විය. වයස අවුරුදු 9 දී ඔහුගේ දෙමව්පියන්ව පැහැරගෙන ගියායින් පසුව ඔහුගේ ක්‍රිස්තියානි ජීවිතය තුල පීඩාකාරී සමයක් උදාවිය. ඔහු තුල ඔහුගේ ආගම පිළිබඳව ප්‍රශ්න හටගත් අතර තිත්තකමක්ද ඇතිවිය. මේ වයසේ ළමයින් මුහුණනොදෙන ප්‍රශ්න වලට ඔහුට මුහුණදෙන්ට සිදුවිය. ඔහුගේ ජීවත්වීම සඳහා මුදල් ඉපයීම ගැන ඔහුට සිතන්නට සිදුවිය.

කිතුණු ප්‍රාණ පරිත්‍යාගකරුවන්ගේ පවුල් වලට උපකාර කිරීම අපරාධයකි. ඔහුට උදව්කල කාන්තාවන් දෙදෙනෙක්වම අත්අඩංගුවට ගෙන ඔවුන්ට තදින් පහර දී සම්පූර්ණයෙන්ම ආබාධිත තත්වයට පත්කලේය. සිරකරුවන්ගේ පවුල් වලට උපකාරකිරීමේ වරදට මිහායිව තම නිවසට පිළිගැනීමට තමාගේ ජීවිතය අවදානමකට ලක්කල කාන්තාවකට අට අවුරුදු සිරදඬුවමක් දෙන ලදී. ඇගේ සියලු දත් ගලවන ලද අතර ඇගේ ඇට කටු බිඳදමන ලදී. ඒ දත් ගලවා ඇත්තේ පා පහර දීමෙනි. ඇයට කිසිකලෙක නැවත වැඩකරන්නට හැකියාව නොලැබිනි. ඇයද ජීවිත කාලය පුරාම ආබාධිතව සිටියාය.

**"මිහායි, යේසුස්වහන්සේ තුළ විශ්වාසය තබන්න."**

වයස අවුරුදු 11 දී මිහායි සමාන්‍ය කම්කරුවෙකු මෙන් ඔහුගේ ජිවිතය සඳහා මුදල් උපයන්ට පටන්ගත්තේය. පීඩා විඳිම නිසා ඔහුගේ ඇදහිල්ල සසලවෙන්ට පටන්ගත්තේය. සබීනාගේ සිරගතවීමේ දෑඅවුරුද්දකට පසුව ඇයට ඔහුව දකින්නට ඉඩදුන්නේය. ඔහු කොමියුනිස්ට් සිරගෙය තුලට ගොස් යකඩ කූරු පිටුපස සිටි ඔහුගේ මව දුටුවේය. ඔහු කිලිට්ව සිහින්ව වක්වු අත් ඇතිව සිරකරුවෙකුගේ අවලක්ෂණ නිල ඇදුම හැඳ සිටි තම මව දුටුවාය. ඔහු ඇයව හඳුනාගත්තේ ඉතා අමාරුවෙනි. ඇයගේ ප්‍රථම වදන් වුයේ "මිහායි, යේසුස්වහන්සේ තුල විශ්වාසය තබන්න" යන්නයි. රැකවලුන් වියරු වැටි මවව මිහායිගෙන් පසකට ඇද ගෙන ගියාය. ඔහුගේ මවව ඇදගෙන යනු දුටු මිහායි වැලපෙන්නට විය. ඔහුගේ සංවාදයේ එකම මිනිත්තුව වුයේ මේ මිනිත්තුවමයි. මෙබදු වාතාවරණයේදී ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේමකල හැකි නම් උන්වහන්සේ සැබෑ ගැලවුම්කාරයාණන් බව ඔහු දැනගත්තේය. ඉන්පසු ඔහු මෙසේ පැවසුවේය: "මාගේ මව ක්‍රිස්තුස්වහන්සේ විශ්වාසකරනවා යන කාරණයට මට කිතුදහම කෙරෙහි විශ්වාසය තැබීමට ප්‍රමානණවත්ය." ඔහු ක්‍රිස්තුස්වහන්සේව සම්පුර්ණයෙන්ම පිළිගත් දිනය එදින විය. පාසැල තුලදී ඔහුට නොකඩවාම ඔහුගේ පැවැත්ම වෙනුවෙන් සටන්කරන්ට සිදුවුනි. ඔහු හොඳ ශිෂ්‍යයෙක් විය. එයට කරන ලද සැලකීමක් වශයෙන් ඔහුට රතු පැහැති පලදනාවක් පැලදීමට දෙන ලදි. එය තරුණ කොමියුනිස්ට් පුරෝගාමින්ගේ සලකුණකි. එහිදි මාගේ පුතා මෙසේ පැවසුවේය. "මාගේ මවවත්, පියාවත් සිරගත කල තැනැත්තන්ගේ මේ පළඳනාව මම නොපළඳිමි." මේ නිසා ඔහුව පාසැලෙන් නෙරපා හරින ලදි. වසරක පාසැල අහිමිවීමකින් පසු ඔහුට නැවතත් පාසැලට ඇතුල්වීමට ඉඩ ලැබුනි. එසේ කිරීමට හැකිවුයේ ඔහු කිතුණු සිරකරුවන්ගේ පුතෙකු යැයි යන කාරණය සඟවාලමින් කටයුතු කිරීමෙනි.

පසුව ඔහුට බයිබලයට විරුද්ධව රචනාවක් ලියනලෙස අණක් ලැබිනි. මේ රචනාව තුල ඔහු මෙසේ ලිව්වේය. "බයිබලයට විරුද්ධව පවතින විතර්ක බෙහෙවින්ම දුර්වලය, බයිබලයට විරුද්ධව උපුටා දැක්වීම් අසත්‍යය සහතික ලෙසට මහාචාර්‍යවරයා බයිබලය කියවා නැත. බයිබලය විද්‍යාව සමඟ සැබවින්ම ගැලපෙන්නේය" නැවතත් ඔහුව පිටුවහල්කරන ලදි. මෙවර ඔහුට වසර දෙකක් අහිමි විය.

අවසානයේදී ඔහුට සෙමනේරියකට ඇතුල්වී ඉගෙනගැනීමට ඉඩ ලැබිනි. එහිදී ඔහුට "මාක්ස්වාදි දේවධර්මය" උගන්වන ලදි.

සියල්ල කාල් මාක්ස්ගේ රටාවට අනුව පැහැදිලිකර දෙනු ලැබිනි. මිහායි පන්තියේදී ප්‍රසිද්ධියේ විරුද්ධත්වය දැක්විය. අනිත් සිසුන්ද ඔහුට එකතුවිය. ප්‍රතිඵලය වුයේ ඔහුව පිටුවහල්කරනු ලැබීමයි. මේ නිසා ඔහුට දේවධාර්මික අධ්‍යාපනය නිමකිරීමට ඉඩ නොලැබිනි.

වරක් පාසැලේ දී මහාචාර්‍යවරයෙකු අදේවවාදී කථාවක් පවත්වනු ලබන විට මාගේ පුත්‍රයා නැඟිට මහාචාර්‍යවරයා සමඟ ඊට පටහැනිව කථාකලේය. බොහෝ තරුණයන් මංමුලාකිරීමට යොමුකරන මේ නියමයන් වල වගකීම ඔහු බාරගන්නේද යන්න පුත්‍රයා ප්‍රශ්න කලේය. පළමුව යමෙකුට කථාකිරීමට ධෛර්යක් අවශ්‍යය. අනතුරුව සියල්ලෝම ඔහුගේ පැත්ත ගත්තෝය. අධ්‍යාපනය ලැබීම පිනිස ඔහු නිතරම තමා වර්ම්බ්‍රන්ඩ්ගේ පුත්‍රයා යැයි යන කාරණය සඟවන්ට උත්සහා දැරිය. ඔවුන් කිතුණු සිරකරුවෙකුගේ පුත්‍රයෙකු යැයි යන කාරණය සඟවන්ට උත්සහා දැරිය. එහෙත් නිතරම එය සොයාගනු ලැබු විට නැවතත් ඔහුව පාසලේ අධක්ෂකවරයාගේ කාමරයට ගෙන්වා පිටුවහල් කිරීම සුපුරුදු දෙයක් විය.

මිහායි බොහෝ විට කුසගින්නේ පීඩා වින්දේය. කොමියුනිස්ට් රටවල කිතුණුවන් සිරගතකරනු ලැබු විට එම පවුල්වල බොහෝ දෙනා මරණය දක්වා කුසගින්නේ සිටින්නට සිදුවිය. ඔවුන්ට උදව්කිරීම මහත් අපරාධයකි. පෞද්ගලිකව දන්නාවු පවුලක පීඩා විඳීමක් පිළිබඳ කාරණයක් මම ඔබට පවසන්නෙමි. රහසිගත සභාව තුල තමා සිදුකරන ලද වැඩය හේතුකරගෙන සහෝදරයෙකුට සිරගෙයට ඇතුල්විමට සිදුවිය. ඔහු තමන්ගේ භාර්‍යාවත් දරුවන් 6 දෙනාත් අතහැර සිරගෙයි ජීවත්විය. ඔහුගේ වැඩිමහල් දියණියන් දෙදෙනා අවුරුදු 17ක හා 19ක වයසේ පසුවුවද ඔවුන්ට රැකියාවක් නොලැබිනි. කොමියුනිස්ට් රටක රැකියාවක් සපයන එකම ආයතනය රජයයි. කිතුණු “අපරාධකරුවන්ගේ” දරුවනට එය රැකියා නොසපයයි. මෙහි ආචාරධර්මානුකුල නොවන ස්වභාවයක් ගැන සිතා මෙය විනිශ්චය නොකරන්න. කාරණය විතරක් සිහි තබාගන්න. කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරයෙකුගේ දියණියන් දෙදෙනා – ඔවුන් කිතුණුවන්ව සිටියදීම – තමුන්ගේ රෝගී මව හා බාල සහෝදරයින්ට උපකාර කරණ පිනිස වෛශ්‍යාවන් බවට පත්වුවෝය. ඔවුන්ගේ වයස 14ක තරුණ සහෝදරයා මෙය දැක පිස්සු වැටුනු හෙයින් ඔහුව උන්මන්තකාගාරයට යවන ලදී. පසු කලෙක සිරගතවු ඔහුගේ පියා ආපසු පැමිණ පසු ඔහුගේ එකම යාච්ඤාව වුයේ “මෙය දකින්ට මම අකමැති නිසා, මෙය දරාගන්ට බැරි නිසා දෙවියන්වහන්සේ මාව නැවතත් සිරගෙදරට රැගෙන යන්න” යනුවෙනි. ඔහුගේ යාච්ඤාවට පිළිතුරු ලැබුනි. ළමයින්ට

ක්‍රිස්තුස්වහන්සේ ගැන සාක්ෂිදැරීමේ අපරාධය නිසා ඔහුව නැවතත් සිරගත කරන ලදි. ඔහුගේ දියණියන් තවදුරටත් වෛශ්‍යාවන් නොවුහ. රහස් පොලිසියේ බරපතල ඉල්ලීම හේතුකොටගෙන ඔවුන්ට රැකියාවල් ලැබිනි. එය ලැබීමත් සමග රහස් පොලිසියේ ඉල්ලීමට අනුව ඔවුහු රහස් පොලිසියට තොරතුරු සපයන්නන් වුහ. කිතුණු ප්‍රාණ පරිත්‍යාගවරයෙකුගේ දියණියන් නිසා ඔවුන්ට සෑම නිවසක් තුලම ගෞරව ලැබුනි. ඔවුහු සවන් දුන් සියල්ල රහස් පොලිසියට වාර්තාකරන ලදි. මෙය අශෝභන හා ආචාරධර්ම විරෝධි දෙයක් යැයි නොපවසන්න. ඇත්තවශයෙන්ම එය එසේය. මෙබදු ඛේදජනක අවස්ථාවන් උදා වු විට ඔබද මෙවැනි තත්වයකට නොවැටෙන්නේදැයි විමසන්න. එබදු කිතුණු පවුල් අත්හරිනු ලදුව නිදහසේ සිටින අයගේ උපකාරයන් නැති විට මෙබදු තත්වයට නොවැටෙන්නේ දැයි ඔබට සිතන්නට පුළුවන්ද?

# 3 පරිච්ඡේදය



# වන්දිය ගෙවීම සහ බටහිර රටක වැඩකිරීම පිනිස නිදහස්කිරීම

සිරගෙය තුල අවුරුදු 14ක් මම ගතකලෙමි. මේ කාලය තුල මම බයිබලයක් නොකියෙව්වෙමි. වෙනත් කිසිම පොතක් නොකියෙව්වෙමි. මට ලියන ආකාරය අමතකවී තිබුනි. කුසගින්නේ සිටීම, මත් බෙහෙත් පෙවීම, වධවිදීම හේතුකොටගෙන මට ශුද්ධ ලියවිල්ල අමතකවී තිබුනි. මම වසර 14ක් එහි ගතකල පසු හදිසියේම වාගේ මාගේ මනසට මේ පදය සිහියට නැගුනි. “එලෙස යාකොබ් රාකෙල් වෙනුවෙන් සත් අවුරුද්දක් වැඩකලේය. ඇය වෙනුවෙන් ඔහුට තිබු ප්‍රේමය හේතුකොටගෙන එය ඉතා ස්වල්ප දවසක් මෙන් ඔහුට පෙනුනි” (උත්. 29:20). මීට දින කිපයකට පසු ඇමරිකානු මහජනතාවගේ බලපෑම යටතේ අපගේ රට තුල දෙනලද පොදු සමාවක් තුලින් මා නිදහස්කරනු ලැබුනි.

මම මාගේ භාර්යාව නැවත දුටුවෙමි. ඇය වසර 14ක් විශ්වාසවන්තව මා වෙනුවෙන් බලාසිටියාය. දිළිඳුකමින් යුතුව අපි අපගේ අළුත් ජීවිතය ආරම්භ කලෙමු. එසේ වුයේ අපව අත්අඩංගුවට ගත් තැනැත්තන් අප සතු සියල්ල පැහැරගෙන ගොස් තිබුනු නිසාය. නිදහස්කරන ලද පුජකයින් හා සභාපාලකවරුන්ට කුඩා සභාවක් පවත්වාගෙන යෑමට අවසර ලැබුනි. මා හට ඕර්සොවා නගරයේ සභාවක් ලබාදුනි. මිත්‍යා ඉගැන්වීම් පිළිබඳ කොමියුනිස්ට් දෙපාර්තමේන්තුව මා හට පැවසුවේ එහි සමාජිකයින් 35 දෙනෙකු සිටින බවත් කිසිකලෙක සමාජිකයින් 36කේ නොවියයුතු බවත් ඔවුන් අනතුරු අගවා සිටියෝය.

තවද මා හට ඔවුන්ගේ ඒජන්තවරයෙකු වන ලෙස පැවසූ අතර සෑම සමාජිකයෙකු පිළිබඳව රහස් පොලිසියට වාර්තාකරන ලෙස දැන්වූයේය. මේ හැරෙන්නට තරුණයින්ව එයට පැමිණීමෙන් වලක්වන ලෙස දැනුම්දුන්නෝය. කොමියුනිස්ට්වරු සභාවත් ඔවුන්ගේ පාලනයේ "ආයුධයක්" කොට ගත්තේ එලෙසය.

මම දේශනා කල විට බොහෝ දෙනා අසන්ට එන බව මම දැනසිටියෙමි. එබැවින් නිල සභාවේ වැඩ ආරම්භකරන්නට මම කිසි කලෙක උත්සහා නොකෙලෙමි. ඒ වෙනුවට මම නැවතත් රහසිගත සභාවේ සේවය කලෙමි. මේ වැඩයේ සකල අලංකාරත්වය හා අනතුරුදායකකම බෙදාගනිමින් එසේ සේවය කලේය.

මම සිරගතව සිටි කාලයේ දෙවියන්වහන්සේ පුදුමාකාර ලෙස ක්‍රියාකොට තිබුනි. රහසිගත සභාව තවදුරටත් අත්හරිනු ලැබ අමතකකරනු ලැබ නොතිබුනි. ඇමරිකන්වරු හා වෙනත් කිතුණුවන් අපට උපකාරකරන්ට සහ අප වෙනුවෙන් යාච්ඤාකරන්ට පටන්ගෙන තිබුනි.

එක් සවසක මම ප්‍රදේශයේ නගරයක වෙසෙන සහෝදරයෙකුගේ නිවසක විවේක සුවයෙන් ගතකලෙමි. ඔහු මා අවදිකොට මෙසේ පැවසුවේය. "විදේශයක සිට සහෝදරවරු පැමිණතිබේ." බටහිර රටවල කිතුණුවෝ අපව අමතකකොට අත්හරිනු ලැබ නොතිබුනි. කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වල අය සඳහා සහන ගෙනදීමට රහසිගත වැඩ පිළිවෙලක් එම කිතුණුවෝ සංවිධානයකොට තුබුනි. ඔව්හු කිතුණු ලියකියවිලි හා උපකාර රට තුලට රහසිගතව ගෙනාවෝය.

ඊළඟ කාමරයේදී මේ වැඩවල නිරත වන සහෝදරයින් හයදෙනෙකු මට මුණගැසුනි. මා සමග දීර්ඝ ලෙස කථා කල පසු ඔව්හු මා හට පැවසුවේ 14 අවුරුද්දක් සිරගෙය තුල වසන අයෙකු මේ ලිපිනයෙහි සිටින බව ඔවුන් අසාතිබුනු බවයි. ඔවුන් මා දකින්ට කැමැත්තෙන් පසුවුහ. ඒ මනුෂ්‍යයා මා බව මම ඔවුන්ට පැවසුවෙමි. ඔවුන් පැවසුවේ "අපි මළානික අයෙකු දකින්නට බලාපොරොත්තු වු බවයි. ඔබ සම්පූර්ණ ප්‍රීතියෙන් සිටින නිසා ඔබ මේ පුද්ගලයා විය නොහැක." මම සිරගතව සිටි තැනැත්තා බව ඔවුන්ට සහතික කලෙමි. මාගේ ප්‍රීතිය ඔවුන් පැමිනි නිසා ඒ බව දැනගැන්මෙන් හටගත් එකක් බවත් ඔවුන්ට දැන්වූයෙමි. එක එල්ලේම රහසිගත සභාවට නිතිපතා උපකාරය ලැබෙන්ට පටන්ගත්තේය.

රහසිගත මාර්ග වලින් අපට බොහෝ බයිබල් හා වෙනත් කිතුණු පොත්පත් ලැබුනි. කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වලට මෙලෙස සහනාධාරද ලැබුනි. දැන් ඔවුන්ගේ උපකාරය ඇතුව අපට රහසිගත සභාවේ වැඩ වඩා හොඳින් ගෙනයන්නට පුළුවන. ඔවුන් අපට ලබාදුන්නේ දේව වචනය පමණක් නොව ඔවුන්ගේ ප්‍රේමයද අපි දුටුවෙමු. ඔවුන් අපට සැනසීමේ වචන ගෙනාවෝය. වසර ගණනාවක් මොළ සේදීමට යටත්ව සිටි අපි "කිසිවෙකු ඔබට ප්‍රේමකරන්නේ නැත. කිසිවෙකු ඔබට ප්‍රේමකරන්නේ නැත." යන වචන අසා තිබුනු අපි, ඔවුන්ගේ ජිවිත අවදානමට තබා අපට ප්‍රේමය පෙන්වීම පිනිස පැමිනි ඇමරිකානු හා ඉංග්‍රිසි කිතුණුවන්ව දුටුවෙමු. අපි රහසිගත වැඩ සඳහා තාක්ෂණයක් වර්ධනය කරගැනිමට ඔවුන්ට අපි උපකාර කලෙමු. රහස් පොලිසිය විසින් වටකරන ලද නිවෙස් වලට රහසිගතව, සොයාගැනිමට නොහැකි අයුරින් රිංගා යැමට එමගින් ඔවුන්ට හැකිවුනි. මේ ආකාරයේ බයිබල් තුල "පිහිනමින්" සිටින ඇමරිකානු හා ඉංග්‍රිසි කිතුණුවන්ට ඔවුන් විසින් රහසේ ගෙන එන ලද බයිබල් වල වටිනාකම අවබෝධකරගත නොහැකි තරම් විය.

විදේශිය කිතුණුවන්ගේ යාච්ඤාවෙන් ලැබෙන උපකාරයකින් තොරව මට හා මාගේ පවුලට අරක්ෂා විය හැකිව නොතිබුනි. මෙම සත්‍යතාවය බොහෝ වෙනත් රහසිගත පාලකවරුන්ට හා කොමියුනිස්ට් රටවල ප්‍රාණ පරිත්‍යාගීවරුන් සම්බන්ධයෙන් සැබෑ එකකි. ඔවුන් දුන්නාවු උපකාර හා නිදහස් ලෝකය තුල මේ අරමුණින් පිළියෙල කරන ලද විශේෂ දුත මෙහෙවර කරණකොටගෙන මා හට ලැබුනු මානුෂික උපකාර ගැන මාගේ අත්දැකීම් මට සාක්ෂි වශයෙන් ප්‍රකාශකරන්ට පුළුවන. අපහට මේ ඇදහිලිවන්තයින් දෙවියන්වහන්සේ විසින් එවන ලද දේවදුතයින් මෙනි.

රහසිගත සභාවේ එම වැඩ අළුත් කිරිමෙන් පසුව තවත් වරක් මාව අත්අඩංගුවට ගැනිමේ අතිභයානක අනතුරුදායක තත්වයක් උදාවුනි. මේ අවස්ථාවේදී කිතුණු සංවිධාන දෙකක් එනම් යුදෙව්වන් සඳහා වු නොර්විජියානු ධර්මදුත කණ්ඩායම සහ හේබ්‍රිව් කිතුණු සංවිධාන මා වෙනුවෙන් ඩොලර් 10,000ක කප්පමක් කොමියුනිස්ට් ආණ්ඩුවට ගෙව්වේය. එය දේශපාලන සිරකරුවෙකුගේ සම්මත වටිනාකම මෙන් පස්ගුණයකි. මට දැන් රුමේනියාවෙන් පිටවෙන්නට පුළුවන.

## *මම කොමියුනිස්ට් රුමේනියාවෙන් පිටවූයේ මන්ද?*

මේ අනතුරුදායකකම් මධ්‍යයේ මම රුමේනියාවෙන් පිටවන්නට වූයේ රහසිගත සභාවේ නායකයින් ලැබුනු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන රටින් පිටවී නිදහස් ලෝකය වෙත රහසිගත සභාවේ “හඬ” වන්න යැයි ඔව්හු මට අණකල නිසාය. ඔවුන්ගේ වේදනාවිඳීම් සහ අවශ්‍යතාවයන් පිළිබඳව බටහිර ලෝකයේ ඔබට මා කථාකිරීම ඔවුන්ගේ බලාපොරොත්තුව විය. මම බටහිරට පැමිනියේ මාගේ හදවත තවමත් එහි තබාගෙනය. ඔබට මාගේ දූත මෙහෙවර මගින් රහසිගත සභාවේ වේදනා විදීම් හා ධෛර්‍යයමත් වැඩ ගැන අසන්නට මහත් අවශ්‍යයතාවයක් තිබෙන බව මම අවබෝධකර නොගත්තෙම් නම් මම රුමේනියාවෙන් පිටවෙන්නට කොහෙත්ම ඉඩනොතිබිනි.

රුමේනියාවෙන් පිටවීමට පෙර මාව දෙවරක් රහස් පොලිසියට කැඳවනු ලැබිනි. ඔව්හු මා හට ලැබී ඇති මුදල් පිළිබඳව මට පැවසුවෝය. (කොමියුනිස්ට්වාදය අපගේ රටට ගෙනවිත් තිබෙන ආර්ථික අර්බුදය හේතු කොටගෙන රුමේනියාව මුදල් වලට තම පුරවැසියන් විකුණති). ඔව්හු මට මෙසේ පැවසුවෝය: “බටහිර ලෝකයට ගොස් ඔබට කැමති තරම් ක්‍රිස්තුස්වහන්සේව දේශනාකරන්න. එහෙත් අපට විරුද්ධව වචනයක්වත් නොපවසන්න. එහෙත් සිදුවූ දේවල් පිළිබඳව ඔබ පැවසුවහොත් අපි ඔබට කරන්ට සැලසුම්කරන දෙය හොඳින්ම අපි ඔබට පවසන්නෙමු. පළමුව ඔබව මරා දැමීමට ඩොලර් දාහකට අපිට අපරාධකාරයන්ව සොයාගැනිමට පුළුවන. අපට ඔබව පැහැරගෙනයන්නට පුළුවන”. (ඕර්තඩොක්ස් බිෂොප්වරයෙකු වූ වැසිලි ලෙවුල් සමඟ මම එකම සිරමැදිරියේ සිටියෙමි. ඔහුව ඔස්ට්‍රියාවේදී පැහැරගෙන ගොස් රුමේනියාවට ගෙන එන ලදි. ඔහුගේ සියලු නියපොතු උගුලා දමන ලදි. මම බර්ලින් නගරයේ අන්‍යයන් සමඟ සිට ඇත්තෙමි. රුමේනියානුවන්ව ඉතාලියෙන් හෝ පැරීසියෙන් පැහැරගෙන යනු ලැබිනි). ඔව්හු තවදුරටත් මට මෙසේ පැවසුවෝය. “අපට ගැහැණු ළමයෙක්, සොරකමක් හෝ ඔබගේ තරුණ කාලයේ යම් පාපයක් පිළිබඳ කථාවක් පතුරුවා හරිමින් ඔබට අචාරධර්මානුකූල අන්දමේ විනාශයක් ද පැමිනිවිය හැක. බටහිර ජාතින් විශේෂයෙන්ම ඇමරිකානුවන්ව ඉතා පහසුවෙන් රැවටිය හැක.”

එසේ මා හට තර්ජනයකොට ඔව්හු බටහිරට පැමිනීමට මට ඉඩදෙන ලදි. මා විසින් පසුකර ගිය මොල සේදීම තුල ඔව්හු මහත් විශ්වාසයක් තැබූ අයවුහ. මා මෙන් එම මොල සේදීම පසුකර ගිය

බොහෝ දෙනෙක් බටහිර රටවල් තුල නිශ්ශබ්දව සිටිති. කොමියුනිස්ට්වරුන්ගෙන් පීඩා ලැබීමෙන් පසුව වුවද ඔව්හු කොමියුනිස්ට්වාදය ප්‍රශංසාවට ලක්කරති. මම ද එසේ වෙතැයි නැතහොත් නිශ්ශබ්ද වෙතැයි කොමියුනිස්ට්වරුන්ට සිතුවෝය.

එලෙස 1965 වසරේ දෙසැම්බර් මාසයේදී මමත් මාගේ පවුලත් රුමේනියාවෙන් පිටවුනෙමු.

මාගේ අවසාන ක්‍රියාව වුයේ මාව අත්අඩංගුවට ගන්න අණදුන් සහ වසර ගණනාවක තිස්සේ වධදෙන්නට අණකල කර්නල්වරයාගේ සොහොන් කොත බලන්ට ගියෙමි. මම මලක් ඒ සොහොන මත තැන්පත් කෙලෙමි. මම මෙසේ කිරීම මගින් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රීතිය මා වෙත ගෙන එන්නට මාවම කැපකරගතිමි. ආත්මිකව හිස් කොමියුනිස්ට්වරුන් හට කල හැකිව තිබුනේ එපමණකි.

මම කොමියුනිස්ට් ක්‍රමයට වෛරකරන නමුත් මනුෂ්‍යයින්ට ප්‍රේමකරමි. මම පාපයට වෛරකරන නමුත් පව්කාරයාට ප්‍රේමකරමි, මම කොමියුනිස්ට්වරුන්ට මාගේ මුළු සිතින් ප්‍රේමකරමි. කොමියුනිස්ට්වරුන්ට කිතුණුවන්ව මරන්ට පුළුවන් නමුත් ඔවුන් විසින් මරාදමන්නාවූ අපගේ ප්‍රේමය මරන්නට නුපුළුවන. මා හට කොමියුනිස්ට්වරුන්ට විරුද්ධව හෝ මට වධදුන් අයට විරුද්ධව කිසිදු තිත්තකමක් හෝ වෛරයක් නොමැත.

## 4 පරිච්ඡේදය



# ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයෙන් කොමියුනිස්ට්වාදය පරාජයකිරීම

යුදෙව්වන් අතර මෙවැනි ජනකථාවන් ඇත. ඔවුන්ගේ මුල් පියවරුන් ඊජිප්තුවෙන් මිදී එද්දී ඊජිප්තුවරු රතු මුහුදෙහි ගිලුනෝය. දේවදූතයෝ ඊශ්‍රායෙල්වරු සමග එක්ව ජයග්‍රාහී ගීතිකා ගැයුහ. දෙවියන්වහන්සේ දේවදූතයින්ට මෙසේ පැවසුවේය. "යුදෙව්වරු මනුෂ්‍යයෝ. ඔවුන්ට ඔවුන්ගේ ගැලවීම ගැන ප්‍රීතිවන්නට පුළුවන. එහෙත් නුඹලාගෙන් මීට වඩා වැඩි අවබෝධයක් මම බලාපොරොත්තුවන්නෙමි. ඊජිප්තුවරු ද මාගේ මැවිලි නොවන්නෝද? මම ඔවුන්ට ප්‍රේමනොකරන්නේද? ඔවුන්ගේ කණගාටුදායක ඉරණම පිළිබඳව මාගේ හැඟීම ගැන තේරුම්ගන්නට ඔබ අසමත්වන්නේ මන්ද?"

යොෂුවා 5:13 මෙසේ පවසයි. "තවද යොෂුවා යෙරිකෝව ළඟ සිටියදී තමාගේ ඇස් ඔසවා බැලූ කල තමා ඉදිරිපිට මනුෂ්‍යයෙක් ඇඳගත් කඩුවක් අතේ ඇතිව සිටිනවා දුටුවේය. යොෂුවා ඔහු ළඟට ගොස් නුඹ අපේ පැත්තටද නොහොත් අපේ විරුද්ධකාරයින්ගේ පැත්තට දැයි ඔහුගෙන් ඇසුවේය."

යොෂුවාට මුණගැසුණේ මනුෂ්‍යයෙක් පමණක් නම් පිළිතුර විය හැකිව තිබුනේ "මම ඔබ වෙනුවෙන් පැමිනියෙමි" හෝ "මම ඔබගේ සතුරන් වෙනුවෙන් පැමිනියෙමි" යන්න හෝ "මම ස්වාධීනව සිටිමි"

යන්න වේ. එබඳු ප්‍රශ්නයකට විනිත ප්‍රතිචාරයක් වියහැක්කේ ඉහත සඳහන් පිළිතුර පමණකි. යොෂුවාට මුණගැසුණු තැනැත්තා ස්වාමින්වහන්සේ විසින් එවන ලද්දෙකු වු බැවින් ඔහු ඊශ්‍රායෙල් වෙනුවෙන්ද ඊශ්‍රායෙලට විරුද්ධවද යන වග විමසු විට ඔහුගේ පිළිතුර වුයේ බලාපොරොත්තු නොවු අවබෝධ කරගැනිමට අපහසු එකකි. "එසේ නොවෙමි" එම පිළිතුරයි. මේ "එසේ නොවෙමි." යන්නෙහි අර්ථය කුමක්ද?

ඔහු පැමිනියේ උදව්වට හෝ විරුද්ධව හෝ නොවන ස්ථානයක සිටය. සියලු දෙනාවම හා දේවල්ම අවබෝධ කරගත් ස්ථානයක සිටය. ඔහු අනුකම්පාවෙන් පිරුණු දයානුකම්පාවෙන් යුතුව ප්‍රේමයේ ගින්නෙන් ඇවිලීගෙන ආවේය. කොමියුනිස්ට්වාදය සමඟ අවසානය වනතෙක් සටන්කල යුතු මානුෂික මට්ටමක් ඇත. මේ මට්ටමේදී අපි කොමියුනිස්ට්වරු සමඟ සටන්කරන්ට ඕනැය. මේ කෲර විනාශකාරී අදහසෙහි උදව්කාරයෝ ඔව්හු වන බැවින් එසේ කලයුතුව ඇත.

එහෙත් කිතුණුවන් මනුෂ්‍යයින්ට වඩා උසස් වු සෙනගකි. ඔව්හු දෙවියන්වහන්සේගේ දරුවන්ය. දිව්‍යමය ස්වභාවයේ පංගුකාරයෝය. එබැවින් කොමියුනිස්ට් හිරගේ තුල සිදුවු වධබන්ධනවලින් මාව කොමියුනිස්ට්වරුන්ට වෛරකරන්නෙකු බවට පත්වුයේ නැත. ඔව්හු දෙවියන්වහන්සේගේ මැවිලිය. මම වෛරකරන්නේ කෙලෙසද? ඒතාක් මට ඔවුන්ගේ මිතුරෙකුවන්නට ද නුපුළුවන. මිත්‍රත්වය යනු එකම ආත්මයක් සහ හදවත් දෙකක් වේ. මම කොමියුනිස්ට්වරුන් සමඟ එකම ආත්මයක්නොවිමි. ඔව්හු දෙවියන්වහන්සේ යන වචන මාත්‍රයට පවා වෛරකරයි. මම දෙවියන්වහන්සේට ප්‍රේමකරමි.

මගෙන් "ඔබ කොමියුනිස්ට්වරුන්ට පක්ෂද නැතහොත් විපක්ෂද" යනුවෙන් විමසු විට මාගේ පිළිතුරවන්නේ සංකිර්ණ එකකි. කොමියුනිස්ට්වරු මනුෂ්‍ය සංහතියට මහත්වු කරදරයකි. මම එයට සහමුලින්ම විරුද්ධවෙමි. එය පෙරලා දමන තුරු සටන්කරන්ට බලාපොරොත්තුවෙමි. එතාක් ආත්මයෙන් මම යේසුස්වහන්සේ සමඟ ස්වර්ගයේ ස්ථානවල හිදගෙන සිටිමි. මම මේ පරාසය තුල "නැත" යන ස්ථානයක හිදගෙන සිටිමි. ඒ තුල ඔවුන්ගේ සියලු අපරාධ සමඟ එකඟ නොවෙමි. එහෙත් කොමියුනිස්ට්වරුන්ව අවබෝධ කරගතිමි. ඔවුන්ට ප්‍රේමකරමි. එය මනුෂ්‍ය සංහතියේ උතුම්ම එල්ලයකට එනම් ක්‍රිස්තු ස්වරූපයට ළඟාවීම පිනිස සෑම කෙනෙකුටම උපකාර කිරිමට උත්සහකරන්නාවු දේවදුතයින් තුල පවත්නා පරාසයකි. එබැවින් මාගේ අරමුණවන්නේ කොමියුනිස්ට්වරුන්ට

ශුභාරංචිය බෙදාදීමත් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව යහපත් ආරංචිය ඔවුන්ට ලබාදීමත්ය. උන්වහන්සේ මාගේ ස්වාමියාණෝය. උන්වහන්සේ කොමියුනිස්ට්වරුන්ට ප්‍රේමකරයි. උන්වහන්සේ සියලු මනුෂ්‍යයින්ට ප්‍රේමකරන 99 දෙනෙකු අත්හැර දමා නැතිවු බැටළුවෙකු සොයා යෑමට ඔහු විනාශවීමෙන් වලක්වා ගැනිමට කටයුතුකරන්නාවු තැනැන්වහන්සේය. උන්වහන්සේගේ අපොස්තුළුවරු හා ක්‍රිස්තුස්වහන්සේ සියලු ශ්‍රේෂ්ට ගුරුවරු උන්වහන්සේගේ නාමය තුල මෙම විශ්මිය ප්‍රේමය ගැන උගන්වා තිබේ. ශාන්ත මැකාරි මෙසේ පැවසිය: “මනුෂ්‍යයෙකු සියලු මනුෂ්‍යයන්ට අනුකම්පාවෙන් යුතුව ප්‍රේමකරන්නේ නම් සහ එක මනුෂ්‍යයෙකුට පමණක් ප්‍රේම කල නොහැකි බව පවසන්නේ නම් එසේ පවසන්නාවු මනුෂ්‍යයා තවදුරටත් කිතුණුවෙකු නොවේ. ඔහුගේ ප්‍රේමය සියලු දෙනාව වැළඳගන්නේ නැත.” ශුද්ධවු ඔගස්ටින් මෙසේ උගන්වයි. “සියලු මනුෂ්‍යයින් ධර්මිෂ්ඨව සිටියදී එක් මනුෂ්‍යයෙක් පමණක් පව්කාරව සිටියදී මේ එක පව්කාරයා වෙනුවෙන් ක්‍රිස්තුස්වහන්සේ එම කුරුසිය දරාගන්නට යෙදෙන තරමට උන්වහන්සේ සියලු පුද්ගලයින්ට ප්‍රේමකරන්නේය”. කිතුණු ඉගැන්වීම පැහැදිලි එකකි. කොමියුනිස්ට්වරු මනුෂ්‍යයෝය. ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරයි. එලෙස ක්‍රිස්තුස්වහන්සේගේ සිත ඇති සැම මනුෂ්‍යයෙක්ම කල යුතුය. අපි පාපයට වෛර කරනවා වුවද පව්කාරයාට ප්‍රේමකරමු.



**කොමියුනිස්ට්වරු මනුෂ්‍යයෝය. ක්‍රිස්තුස්වහන්සේ ඔවුන්ට ප්‍රේමකරන්නේය. එලෙස සැම මනුෂ්‍යයාම ක්‍රිස්තුස-වහන්සේගේ සිත ඇතුව සිටිය යුත්තෝය.**

අපි ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව දන්නෙමු. කොමියුනිස්ට්වරුන් වෙත උන්වහන්සේගේ ප්‍රේමය පිළිබඳව දන්නෙමු. අපගේම ප්‍රේමය පිළිබඳව පවා දන්නෙමු.

මම කොමියුනිස්ට් සිරගෙවල් තුලදී රාත්තල් 50ක දම්වැල් තමන්ගේ අත් දෙකෙහි රඳවාගෙන රතුවෙන තෙක් ගිනියම් කෙරුන යකඩ කූරු වලින් වද දෙනු ලැබු හා ලුනු හැඳි ගණන් බලහත්කාරයෙන් ගිල්වනු ලැබු, කුසගින්නේ සිටිමින්, කසපහර විදිමින්, ශීතලේ පිඩා විදිමින් කොමියුනිස්ට්වරු වෙනුවෙන් උනන්දුවෙන් යාච්ඤාකරන

කිතුණුවන් දැක ඇත්තෙමි. මෙය මානුෂික වශයෙන් පැහැදිලි කල නොහැක. එය ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයයි. එය අපගේ සිත්වලට වගුරවනු ලැබ ඇත්තේය.

පසුව අපට පීඩා කරනු ලැබූ කොමියුනිස්ට්වරුන්ව සිරගෙවල් වලට යවන ලදි. කොමියුනිස්ට්වාදය යටතේ කොමියුනිස්ට්වරුන්ද කොමියුනිස්ට් පාලකයින්වද ඔවුන්ගේ සතුරන් ලෙස සලකා සිරගත කරනු ලැබ තිබේ. දැන් පීඩා කරන්නන් පීඩා විඳින්නන් සමග එකම සිරමැදිරියක සිටියි. මෙසේ වන අතරතුරේදී කිතුණු නොවන අය ඔවුන්ට කලින් වද දුන් අය වෙත වෛරය පෙන්වා ඔවුන්ට පහර දෙති. එවන් අවස්ථාවලදී කිතුණුවන් ඔවුන්ගේ ආරක්ෂාව සඳහා සිට පහර කෑමේ අවදානම දරාගනිමින් කොමියුනිස්ට්වරුන් සමග එක්ව වැඩ කරන්නන් යැයි චෝදනා ලැබීමේ අවදානම තුල පවා එසේ ඔවුන්ව ආරක්ෂාකරති. කිතුණුවන් ඔවුන්ගේ අවසාන පාන් පෙත්ත පවා ඔවුන්ට දෙනවා දැක ඇත්තෙමි (සතියකට එක පාන් පෙත්තක් අපට දුන්නෝය). තවද ඔවුන්ගේ ජීවිත ආරාක්ෂා කරගැනිම පිනිස දුන් ඖෂධ දැන් අප මෙන් සිරකරුවන්ව සිටින කොමියුනිස්ට් වධබන්ධනා කරුවන්ට ඔව්හු දුන්නෝය.

සිරගෙයක් තුල මරණයට පත්වූ රුමේනියාවේ කලින් සිටි අගමැතිවරයාවූ කිතුණුවෙක්වූ ඉයුලිව් මානිව්ගේ අවසාන වචන මෙසේය: "අපගේ රට තුල කොමියුනිස්ට්වරුන්ව පලවාහරිනු ලබන්නේ නම් සැම කිතුණුවකුගේම ශුද්ධවූ යුතුකම වන්නේ වීදියට බැස, තමන්ගේ ජීවිත අවධානමට ලක්කොට ඔවුන්ව විනාශකරන්නට උත්සහාකරන සමූහයකගේ ධර්මිෂ්ට කෝපයෙන් හා වියරුවෙන් කොමියුනිස්ට්වරුන් ආරක්ෂා කිරීමයි."

මාගේ සිත්හැරීමෙන් පසු පළමු දිනයේදී මට තව දුරටත් ජීවත්විය නොහැකි ස්වභාවයක් හැඟී ගියේය. වීදියේ ඇවිද යන විට මට මා පසුකරයන්නාවූ සැම කාන්තාවක් හා පුරුෂයෙක් සඳහාම කායික වේදනාවක් හැගෙන්නේය. එය මගේ හදවතට පිහියක් බදු විය. මා තුල දැවෙන ප්‍රශ්නය වුයේ ඔහු හෝ ඇය ගැලවීම ලබා ඇද්ද හෝ නැද්ද යනවගයි. සභාවේ සභිකයෙකු පව්කල විට මම පැය ගණනක් ඔහු වෙනුවෙන් වැලපෙන්ට යෙදුනි. සියලු ආත්මවල් ගැලවීම ලැබීමේ ආශාවෙන් මගේ සිත තුල පැවතුනි. කොමියුනිස්ට්වරුන්ව ඉන් බැහැර කොට නැත.

තනි සිරකුඩුවක සිරගතව සිටියදී අපට පෙර මෙන් යාච්ඤාකල නොහැකි විය. අපට කිවනොහැකි කුසගින්නක් දැනෙන්ට

විය. මෝඩයින් මෙන් ක්‍රියාකරන තුරු අපට මත් ද්‍රව්‍ය ශරීරගත කරන ලදි. අපි ඇටකටු පෙනෙන තරම් කෘෂව් දුර්වල වුනෙමු. ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව අපෙන් බොහෝසේ ඈත්ව තිබුනි. එය අපට දීර්ඝ වැඩිවිය. එය පැවසීමට තරම් මතක නැති තත්වයකට පත්වුනි. නැවත නැවතත් කී මාගේ එකම යාච්ඤාව වුයේ "යේසුනි මම ඔබට ප්‍රේමකරමි" යන්නයි. තවද අනතුරුව එක මහිමාන්විත දිනයක යේසුස්වහන්සේගෙන් මට පිළිතුරක් ලැබිනි. "ඔබ මට ප්‍රේමකරනවාද? මම ඔබට ප්‍රේමකල අන්දම මම ඔබට පෙන්වන්නෙමි." එක්වරම මගේ හදවත තුල ගින්නක් ඇවිලි ගියාක්මෙන් දැනිනි. ඒවා සූර්යාගෙන් පැමිනි රශ්මි මාලාවක් මෙන් මා දවන්නට විය. එම්මාවුස්ට යන මාර්ගයේදී හමුවු ගෝලයින් පැවසුවේ යේසුස්වහන්සේ ඔවුන් සමඟ කථාකරන විට ඔවුන්ගේ හදවත් ගිනිමෙන් දැල්වුනු බවයි. එය දැන් මා සමඟ වේ. අප වෙනුවෙන් කුරුසිය මත තම ජිවිතය දුන්නාවු තැනන්වහන්සේගේ ප්‍රේමය මට දැන් දැනගන්ට පුළුවන. කොමියුනිස්ට්වරුන්ගේ පාපය කෙතරම් බරපතල වුවද ඔවුන්ව එබදු ප්‍රේමයකින් අත්හල නොහැකි විය.

කොමියුනිස්ට්වරු තවමත් භයංකර දේවල කැපවී සිටිති. ඔවුන් පෙරද ඒවාට කැපවී සිටියෝය. නමුත් "ප්‍රේමය මරණය මෙන් බලවන්තය ඊර්ෂ්‍යාව සොහොන මෙන් කෘෘරය... බොහෝ වතුර වලට ප්‍රේමය නිවන්ට නොහැකිය. ජල ගංගා වලට එය යටකරන්ට නොහැකිය." (සලමොන්ගේ ගීතිකාව 8: 6 සහ 7). සොහොන සියල්ලන්ව – ධනවතුන් හා දුප්පතුන්ට, තරුණයින් හා මහල්ලන්ව, සියලු ජාතින්ට අයත් මිනිසුන්ව, සියලු රටවලට අයත් මිනිසුන්ව, සියලු දේශපාලන සිතුවිලි දරණ මිනිසුන්ව, ශුද්ධවන්තයින්ව හා අපරාධකාරයින්ව රදවාගෙන සිටින්නාක් මෙන් ප්‍රේමයද සියල්ලන්ව වැළඳගනී. ක්‍රිස්තුස්වහන්සේගේ මාංශවත්වු ප්‍රේමය උන්වහන්සේ වෙත සියල්ලන් පැමිණෙනවාට, කොමියුනිස්ට්වරුද පැමිණෙනවාට කැමතිය.

දේවගැතිවරයෙකු හට තදබල ලෙස පහර දී මගේ සිරකුටියට දැම්මේය. ඔහු අඩක් මැරී සිටියේය. ඔහුගේ මුහුණ හා ශරීරය පුරා ලේ විසිරගොස් තිබිනි. අපි ඔහු පිරිසිදු කලෙමු. සමහර සිරකරුවෝ කොමියුනිස්ට්වරුන්ට ශාප කලෝය. කෙඳිරිගාමින් ඔහු මෙසේ පැවසුවේය. "කරුණාකර ඔවුන්ට ශාප නොකරන්න. නිශ්ශබ්දව සිටින්න. මම ඔවුන් වෙනුවෙන් යාච්ඤාකරන්න කැමැත්තෙමි."

*සිරගෙය තුලදී පවා අපට ප්‍රීතියෙන් සිටිය හැකි ආකාරය.*

එම සිරගෙය තුල මා ගතකල වසර 14 දෙස ආපසු හැරී බැලූ කල එය කලාතුරකින් ඉතා ප්‍රීතිමත් කාලයක් විය. ඉතාමත් භයානක වතාවරණයන්හිදී පවා කිතුණුවන්ට ප්‍රීතියෙන් සිටිය හැකි ආකාරය ගැන සිරගෙයි ජේලර්වරු පවා සහ අනිකුත් සිරකරුවන් පුදුමයට පත්විය. අපට ගීතිකා ගායනා කිරීමෙන් වැලකිය නොහැක. මේ නිසා අපට පහර දෙන ලදි. නයිටිංගේල් නම් කුරුල්ලන්ද තමන්ගේ ගීත නාද නිම කල පසු ඒ නිසාම ඔවුන්ව මරණු ලබන බවට දැන දැන පවා ගීත ගායනා කරන බව මට කල්පනා විය. සිරගෙය තුල ප්‍රීතියෙන් නටන්නට විය. මෙබඳු භයානක වතාවරණයකදී ඔවුන්ට මෙසේ ප්‍රීතියෙන් සිටිය හැක්කේ කෙලෙසද?

මම සිරගෙය තුලදී නිතරම යේසුස්වහන්සේගේ වචන මෙනෙහි කලෙමි. උන්වහන්සේ තම ගෝලයින්ට එය පැවසුවේය. "නුඹලා දකින දෙය දකින්නාවූ ඇස් ආශීර්වාද ලද්දෝය" (ලූක් 10:23). ගෝලයින් භයානකකම් දකිමින් පලස්තිනය පීඩාවට ලක්වූ රටක් විය. භයංකාර මිනිසුන්ගේ භයානක පීඩා සැම තැනම පැවතිනි. ගෝලයින්ට රෝග, වසංගත, කුසගින්න සහ කණගාටුව මුණගැසිනි. දේශප්‍රේමීන්ව සිරගතකර තිබුනු අවස්ථාවලදී ඔවුන් සිටි නිවෙස් වලට ඔව්හු ඇතුල්විය. එහිදී වැලපෙන දෙමව්පියන් හා භාර්යාවන් එහි සිටිනවා ඔව්හු දුටුවෝය. ඒ දෙස බැලීමට තරම් එය අලංකාර ලෝකයක් නොවිය.

එසේවුවද යේසුස්වහන්සේ මෙසේ පැවසුසේක. "නුඹලා දකින දෙය දකින්නාවූ ඇස් ආශීර්වාද ලද්දෝය." එසේ පවසන ලද්දේ ඔවුන් පීඩා විඳිනවා පමණක් දකින නිසා නොවේය. ඔව්හු ගැලවුම්කාරයාණන්වද දැන තිබුනේය. පළමුවරට කැත දළඹුවන් කිපදෙනෙක් – පණුවන් කිපදෙනෙක් ගසක කොළයක් මත බඩගාමින් සිටියදී – අවබෝධ කරගත යුත්තේ මේ කාලකණ්නි ජීවියා අලංකාර වර්ණ සහිතව පියාසර කිරීමේ හැකියාවෙන් යුක්ත වන බවයි. මෙය අපටද ප්‍රීතියකි.

මා අවට "යෝබ්වරු" ද සිටියේය. සමහරු යෝබ්ට වඩා වැඩියෙන් පීඩා විඳ තිබුනෝය. එහෙත් යෝබ්ගේ කථාව අවසානයේ මම දැන සිටියේ ඔහුට පෙර තිබුනු මට්ටමට වඩා දෙගුණයක් ආශීර්වාද ලැබුනු බවයි. මා අවට ලාසරුස් මෙන් හිගන්නෝ සිටියෝය. ඔව්හු

කූසගින්නෙන් පිරි වණ වලින් ගහණව සිටියෝය. එහෙත් දේව දූතයෝ මේ මනුෂ්‍යයින් ආබ්‍රහාම්ගේ තුරුල්ලට ගෙන යන බව මම දැනසිටියේය. ඔව්හු අනාගතයේදී සිටිනා අන්දම මම දුටුවෙමි. කිලිටු වැරහැලි වස්ත්‍ර වලින් යෝබ් දුර්වල ප්‍රාණ පරිත්‍යාගීවරු මම දුටුවෙමි. ඔවුන් මා අසල විය. ඔව්හු අනාගතයේදී මහිමාන්විත ලෙස ඔටුණු දරණ ඉද්ධවන්තයෝ වන්නාහුය.

මෙවන් මනුෂ්‍යයින් දෙස බලමින් ඔවුන් දැන් සිටින ආකාරයෙන් නොව මත්තට ඔවුන් සිටින්නට යන ආකාරය දකිමින් මට තාර්ෂස්හි සාවුල් කෙනක් මෙන් අපට පීඩාකරන්නවුන්ව දකින්නට හැකිවිමි. එනම් අනාගත අපොස්තුළුවර පාවුන් මෙන් අපට පීඩාකරන්නවුන්ව දකින්නට හැකිවිමු. තවද සමහරු දැනටමත් ඒ තත්වයට පත්ව ඇත. රහස් පොලිසියේ බොහෝ නිලධාරින්ට අපි සාක්ෂි දැරීම හේතුකොටගෙන ඔවුන් කිතුණුවන් වී අපගේ ක්‍රිස්තුස්වහන්සේව හමුවූ නිසා පසු කලෙක සිරගතවී වේදනාවිඳීමට තරම් ඔව්හු ප්‍රීතියටපත්වුවෝය. අපට කස පහර ගහන අවස්ථාවලදී පාවුල් මෙන් පිලිප්පි නගරය තුල ජේලර්වරයා මෙන් සිත් හැරෙන්නට ඉඩ තිබෙන අපගේ ජේලර්වරුන්ව අපි මෙලෙස දුටුවෙමු. ඔව්හු ඉතා ඉක්මනින් ගැලවෙන පිනිස "අපි කුමක් කල යුතුද?" යන්න විමසනු අපි සිහිනෙන් දුටුවෙමු. කිතුණුවන්ට උසුළු විසුළු කරනු ලැබූ, ඔවුන්ව කුරුසිය මත තබා ගැටගසනු ලැබූ ඔවුන් මත මළ මුත්‍රා තැවරූ අය තමන්ගේ පාපය ගැන බියට පත්ව තමන්ගේ ළියට ගසාගත් ගොල්ගොතාහි ජන සමුහය මෙන් වක්‍ර අපි දුටිමු.

කොමියුනිස්ට්වරුන් සඳහා ගැලවීමේ බලාපොරොත්තුව අපට ඇතිවුණේ සිරගෙදරදීය. එය ඔවුන් කෙරෙහි අපි ඇති කරගත් වගකීමේ හැඟිමක් විය. එය අපට වධ දෙනු ලැබූ තැනැත්තන්ට අපි ප්‍රේමකිරීමට ඉගෙන ගැනීම විය.

මාගේ පවුලේ විශාල කොටසක් මරා දමන ලදි. ඔවුන්ගේ මිනිමරුවාගේ සිත් හැරෙන ලද්දේ මාගේම නිවස තුලදීය. එය ඒ සඳහා ඔහුට සුදුසුතම ස්ථානය විය. එබැවින් කොමියුනිස්ට් සිරගෙවල් තුලදී කොමියුනිස්ට්වරු සම්බන්ධව කිතුණු දූත මෙහෙවරෙහි අදහස උපන්නේය.

අපි ඒ ඒ දේවල් දකින ආකාරයට වෙනස් ආකාරයකින් දෙවියන්වහන්සේ ඒවා දකී. කුඹියෙකුට වඩා වෙනස් ආකාරයකින් අපි යමක් දකින්නාක් මෙන් එය එසේ සිදුවේ. මිනිස් දෘෂ්ටි කෝණයට අනුව

කුරුසියක ගැටගසා ඒ මත මළ මුත්‍රා තැවරීම භයානක දෙයකි. එය කෙසේ වෙතත් ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ වේදනා විඳීම් "සැහැල්ලු පීඩා විඳීම්" ලෙස බයිබලය හඳුන්වයි. සිරගෙයක වසර 14ක් ගතකිරීම අපට දීර්ඝ කාලයක් වුවද බයිබලය එය හඳුන්වන්නේ "මොහොතකට පමණක්වූ" දෙයක් ලෙසටය. මේවා "ඉතාමත් වැඩිවශයෙන් සදාකාල තේජස් බාරයක් සදාදෙන්නේය" (2 කොරින්ති 4:17) යැයි බයිබලය අපට පවසයි. මෙය අපට, කොමියුනිස්ට්වරුන්ගේ භයානක අපරාධ සමාව දිය නොහැකි ඒවා ලෙස යන හැඟීමක් දක්වන්නේ වුවද අපගේ ඇස් වලට වඩා දෙවියන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි ඒවා සැහැල්ලුය. ඔවුන්ගේ කෲර කම් සම්පූර්ණ ශතවර්ෂයක් මුළුල්ලේ පැතිර පැවතුනද අවුරුදු දහස්ගණනක් එක දවසක් හා සමාන වන දෙවියන්වහන්සේ ඉදිරියෙහි මොහොතකට පමණක් මුළා වී නොමග යෑමක් වෙයි. ඔවුන්ට තවමත් ගැලවීම ලබාගැනීමට හැකියාව ඇත්තේය.

කොමියුනිස්ට්වරුන්ට ස්වර්ගයේ දොරටු වැසී නැත. ඔවුන් කෙරෙහි ආලෝකය නිවී ගොස් නැත. ඔවුන්ව වෙනත් ඕනෑම අයෙකු මෙන් පසුතැවිලිවෙන්නට පුළුවන. අපි ඔවුන්ට පසුතැවිලිවෙන්ට කැඳවිය යුතුය.

කොමියුනිස්ට්වරු හා ත්‍රස්තවාදීන්ව වෙනස් කල හැක්කේ ප්‍රේමයෙන් පමණකි. (ප්‍රේමයක් යනු කිතුණු නොවන දර්ශනවාදයක් සමග එකගවීම කෙරෙන් පැහැදිලිව වෙනස්විය යුතු දෙයකි. බොහෝ සභා නායකයින් මෙවැනි වගකීම් අනුගමනය කරති.) වෛරය අන්ධය හිට්ලර් කොමියුනිස්ට් විරෝධියෙක් විය. එහෙත් ඔහු එයට වෛර කලේය. එබැවින් ඔවුන්ව අභිබවා ජයගන්නවා වෙනුවට ඔහු ඔවුන්ට ලෝකයෙන් 1/3ක් දිනාගැනීමට උපකාර කලේය.

ප්‍රේමයෙන් යුතුව අපි සිරගෙය තුල සිටි කොමියුනිස්ට්වරුන් අතර ධර්මදූත සේවා වැඩක් සැලසුම්කලේය. තවද එහි දී අපි පළමුව සිතුවේ කොමියුනිස්ට් පාලකයින් ගැනය.

සමහර ධර්මදූත අධ්‍යක්ෂකවරු සභා ඉතිහාසය සුළුවෙන් අධ්‍යනය කරන බව පෙනේ. නොර්වේ රට කිතුණු වුයේ කෙසේද? ඔලොෆ් රජුව දිනාගැනීම මගිනි. රුසියාවට පළමුව ශුභාරංචිය ලැබුනේ එහි රජුවූ වලැඩිමීර් දිනාගැනීමෙනි. හංගේරිය දිනාගනු ලැබුවේ එහි රජුවූ ශුද්ධවූ ස්තේපන් තුමාව දිනාගැනීමෙනි. පෝලන්ත ගැනද කිව යුත්තේ මෙයමය. අප්‍රිකාව තුල ගෝත්‍රයක නායකයෙකු දිනාගත්විට ගෝත්‍රය එය අනුගමනය

කලේය. අපි අපේ ධර්මදූත මෙහෙවර ඉහළ ස්ථාන වල සිටින මනුෂ්‍යයින් කෙරෙහි යොමුකල විට ඔව්හු ඉතා කඳිම කිතුණුවන්වූහ. එහෙත් කුඩා බලපෑමක් මගින් මෙවන් දේවල් සිදුකල නොහැක.

අපි පාලකයින්, දේශපාලන නායකයින්, ආර්ථික බලවතුන්, විද්‍යාවේ හා කලාවේ මුල්තැන ගත්තවුන් දිනාගතයුතුය. ඔව්හු මනුෂ්‍යයන්ගේ ආත්ම හැඩගස්වන්නෝය. ඔවුන්ව දිනාගැනිම තුලින් ඔබට ඔවුන් නායකත්වය දෙන්නාවූ මනුෂ්‍යයන් මත බලපෑම් ඇතිකරන්නට පුළුවන.

මිෂනාරි දර්ශනය තුලින් බැලුවිට අනිකුත් සමාජීය ක්‍රම වලට වඩා කොමියුනිස්ට් වාදය වඩා කේන්ද්‍රගතව ඇති එකක් බැවින් එහි ප්‍රයෝජනයක් තිබේ. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා මෝමන්ඩ් ධර්මයට හැරුණහොත් ඒ නිසා මුළු රට මෝමන්වරු නොවෙන්නෝය. එහෙත් කොමියුනිස්ට් අණ්ඩු නායකයින් කිතුණුවන් වූ විට සමහරවිට ඔවුන්ගේ මුළු රටම කෙරෙහි ළඟාවෙන්නට පුළුවන්කම ලැබේ. එලෙස නායකයින් මගින් මහත් බලපෑමක් ඇතිකරන්ට පුළුවන.

මෙහි නායකයින්ගේ සිත් හරවන්නට පුළුවන්ද? සහතිකයෙන්ම පුළුවන. ඒ මන්දයත් ඔවුන්ද ඔවුන්ගේ ගොදුරු බවට පත්වූ අය මෙන් අනාරක්ෂිත, ප්‍රීතියෙන් තොර පුද්ගලයින් බැවිනි. රුසියාවේ සියලු කොමියුනිස්ට් නායකයින්ව සිරගෙය තුල ඔවුන්ගේ දිවි කෙලවර කිරීම හෝ ඔවුන්ගේ සහෝදරයන් එසින් මරාදමනු ලැබීම සිදුවුනි. එම දෙයම චීනය තුල සිදුවිය. අභ්‍යන්තර කටයුතු පිළිබඳ අමාත්‍යවරුන් හැටියට හිටි ඉයගෝනා, යොෂොජ්, බෙරියා යන අය ප්‍රථිවිප්ලවකාරීන් මෙන් ඔවුන්ගේ ගෙලට වෙඩි තැබීම මගින් මරාදමන ලදි. වසර ගණනකට පෙර සෝවියට් සංගමයේ අභ්‍යන්තර කටයුතු භාර අමාත්‍යවරයාව සිටි සෙලවින් සහ යුගෝස්ලෝවියාවේ අභ්‍යන්තර කටයුතු භාර අමාත්‍යවරයාව සිටි රැන්කොවික් යන අයව හිල්වූ වැරහැල්ලක් මෙන් බලයෙන් පහකරන ලදි.

## *ආත්මිකව කොමියුනිස්ට්වාදයට පහරදිය හැකි අන්දම*

කොමියුනිස්ට් පාලනට කිසිවෙකු ප්‍රීතිමත්කලේ නැත. එයින් අයුතු ලාභ ලැබුවන්ව පවා ප්‍රීතිමත්කලේ නැත. පක්ෂයේ ගමන් මඟ වෙනස්වීම හේතුකොටගෙන ඕනෑම රාත්‍රියකදී රහස් පොලිසියේ වෑන් රථයක් පැමිණ ඔවුන්ව පැහැරගෙන යන්නට ඉඩ තිබීමෙන් ඔවුන් වේවුලමින් සිටියෝය.

මම බොහෝ කොමියුනිස්ට් නායකයින්ව පුද්ගලිකව දනිමි. ඔව්හු බොහෝ බර හා වෙහෙස දරාගත් මනුෂ්‍යයෝය. ඔවුන්ට සහනය දිය හැක්කේ යේසුස්වහන්සේට පමණකි.

කොමියුනිස්ට් පාලකයින්ව ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනාගැනිම යනු ලෝකය න්‍යෂ්ටික විනාශයන් ආරක්ෂාකිරිම හා සමානය. මනුෂ්‍ය සංහතිය කුසගින්නෙන් ගලවාගැනිම හා සමානය. මන්ද ඔවුන්ගේ ධනය බොහෝකොට වැයවන්නේ වියදම් අධික ආයුධ නිෂ්පාදනය සඳහාය. කොමියුනිස්ට් පාලකයින්ව දිනාගැනිම යනු ජාත්‍යන්තර අවදානම් සහිත ස්වභාවය කෙලවරකිරිමය. කොමියුනිස්ට් නායකයින්ව දිනාගැනිම යනු ක්‍රිස්තුස්වහන්සේව හා දේවදූතයින්ව ප්‍රීතියෙන් පිරවිමයි. වෙනත් බොහෝ ප්‍රදේශ වල මිශනාරිවරුන්ගේ වෙහෙස ඉතා අමාරුවක් වුවා සේ පෙනෙන නිව්ගිනි රාජ්‍ය හා මැඩගස්කරය ආදී ප්‍රදේශවලදී ඔවුන් අමාරුකමට පත්වුවා සේම කොමියුනිස්ට් නායකයින්ව දිනාගැනිමට නම් අපි ඔවුන්ව අනුගමනය කලයුතුය. ඒ මන්දයත් එයින් ක්‍රිස්තියානියට සම්පූර්ණයෙන්ම අළුත් වු ජවයක් බිහිකරන බැවිනි.

මම සිත් හැරුනාවු කොමියුනිස්ට්වරුන්ව පුද්ගලිකව දනිමි. මාගේ තරුණ කාලයේ මම ප්‍රබල අදේවවාදියෙක් විමි. සිත්හැරුනු අදේවවාදින් හා කොමියුනිස්ට්වාදින් බොහෝ කොට පව්කර තිබු නිසා ඔවුන් ක්‍රිස්තුස්වහන්සේට මහත් ලෙස ප්‍රේමකරති.

මිෂනාරි වැඩය තුල උපායමාර්ගික සිතුවිලි අවශ්‍යය. ගැලවීමේ දෘෂ්ටිකෝණයෙන් බැලු කල සියලු ආත්ම සමානය. මිෂනාරි උපාය මාර්ගික දෘෂ්ටි කෝණය තුලින් බැලු විට ඒවා එක හා සමාන නොවේ. එබැවින් මහත් බලපෑම් ගෙන ඒමට පුළුවන් මනුෂ්‍යයෙක්ව දිනාගැනිම ඉතාමත් වැදගත්ය. ඔහුට ඉන්පසු දහස් ගණනක් දිනාගතහැක. ගැලවීම තමාට පමණක් යැයි සිතන වනචාරි මනුෂ්‍යයෙකුට කථාකිරීමට වඩා මෙය හොඳය. යේසුස්වහන්සේ තමන්ගේ කුඩා ගම්මානය තුල පමණක් උන්වහන්සේගේ සේවය නොකොට ලෝකයේ ආත්මික මුලස්ථානය වු යෙරුසලම තුලද සේවය කලේය. මේ හේතුව නිසාම පාවුල් රෝමයට ළඟාවීමට මහත් වෙහෙසක් දැරිය.

ස්ත්‍රීයකගේ බීජය සර්පයාගේ හිස පොඩිකරන බව බයිබලය පවසයි (උත්. 3:15). අපි සර්පයාව උගේ කුසෙන් පැගු විට ඌ සිනහවේ. අද තවමත් සර්පයා චිනය, උතුරු කොරියාව, වියට්නාමය හා ලාඕසය

තුලින් බඩගා යන්නේය. මැද පෙරදිග එකම දේවස්ථාන ගොඩනැගිල්ලක්වත් පවත්වන්නට ඉඩ නොදෙන්නාවූ ජාතින් සිටිති. එබදු වහල් ජාතීන්ගේ තත්වය. සභා නායකයින් හා ධර්මදූත අධ්‍යක්ෂවරුන් මෙන්ම සීතා මතා වැඩකරන්නාවූ සැම කිතුණුවෙක් විසින්ම නොකඩවා කල්පනාවග ගත යුතුය.

අපි සතිපතා කරන වැඩ අත්හල යුතුය. මෙසේ කියනු ලැබ තිබේ. "ස්වාමින්වහන්සේගේ වැඩය වංචනිකකමින් කරන්නා ශාපලද්දෙක්ය" (යෙර. 48:10). සභාව වහල් ජාතීන් තුල අධිපතින් මත, ආත්මික පහරදීම් හා පෙරමුණේ සිට පහරදීම් කිරීමට ඉදිරි පියවර තැබිය යුතුය. යුධ සටන් ජයගනු ලබන්නේ ප්‍රහාරක ආකාරයෙන් සටන්කිරීමෙන් මිස ආරක්ෂක හා උපායශීලී ආකාරයෙන් සටන්කිරීමෙන් නොවේ.

ගීතා. 107:16 මෙසේ පවසයි. දෙවියන්වහන්සේ යකඩ දඬු දෙකට කපනසේක. යකඩ තිරය උන්වහන්සේට කුඩා දෙයකි.

මුල් සභාව රහසිගතව හා නිතීවිරෝධීව ක්‍රියා කොට ජයගත්තේය. අපි ද ඒ ආකාරයට ක්‍රියා කිරීමට නැවතත් ඉගෙනගත යුතුය.

කොමියුනිස්ට්වරුන්ගේ යුගය පැමිණෙන තුරු නව ගිවිසුමේ බොහෝ පුද්ගලයින්ව අනුවර්ථ නාම වලින් හැදින්වුයේ මන්දැයි මම අවබෝධකර නොගතිමි. නීගර් නම් ලත් සීමියොන්, යොහාන් නම්ලත් මාක් වැනි යනාදී වශයෙන් හැදින්විය. වහල් ජාතීන් තුල අපගේ වැඩයේදී අපි අපගේ රහසිගත නාම භාවිතා කලෙමු.

යේසුස්වහන්සේ උන්වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය සැකසීම සඳහා බලාපොරොත්තු වන ස්ථානයෙහි ලිපිනය ඉදිරිපත් නොකොට "නගරයට ගොස් වතුර කලයක් රැගෙන යන මනුෂ්‍යයෙකු නුඹට හමුවන්නේය." යනුවෙන් පැවසුවේ මන්දැයි මම කිසිකලෙක අවබෝධකර නොගත්තේමි (මාක් 14:13). දැන් මම එය අවබෝධකරගතිමි. අපිද රහසිගත සභාවේ වැඩ සඳහා එබදු හදුනා ගැනීමේ රහසිගත සලකුණු පවත්වාගත යුතුය.

මේ ආකාරයට වැඩකිරීමට අප එකගවුවහොත් එනම් මුල් කිතුණු සභාවේ ක්‍රමවලට අප ආපසු පැමිනෙන්නේ නම් වැසුනු රටවල් තුලට ක්‍රිස්තුස්වහන්සේව ගෙනයාමට ඵලදායක ලෙස ක්‍රියා කිරීමට අපට පුළුවන.

එහෙත් බටහිර රටවල සමහර සභා නායකයින් මට මුණගැසුණුවිට කොමියුනිස්ට්වරුන් වෙත ප්‍රේමය පෙන්වනු වෙනුවට – කොමියුනිස්ට් රටවල් තුල දීර්ඝ කාලයකට පෙර මිෂනාරි වැඩය සංවිධානය කල අයට මෙන් – ඔව්හු කොමියුනිස්ට්වරුන්ගේ පැත්ත ගෙන ඔවුන්ගේ ප්‍රථිපත්තිය සකස්කොට තිබෙන බව මම දනිමි. මෙහි දී කාල්මාර්ක්ස්ගේ නිවසේ මංමුලාවු ආත්ම වෙත යහපත් සමාරියයාගේ දයානුකම්පාව මට හමු නොවේ.

මනුෂ්‍යයෙකු ඔහුගේ විශ්වාශ ලක්ෂණය කටපාඩම් කිරීමෙන් සැබවින්ම එය විශ්වාස නොකරන්නේය. එහෙත් ඔහු යමක් වෙනුවෙන් මියයන්නට සුදානම්ද ඒ දේ පමණක් ඔහු විශ්වාසකරන්නේය. රහසිගත සභාවේ කිතුණුවන් ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් මියයන්නට සුදානම් බව සනාථකර තිබේ. වහල් ජාතීන් තුල රහසිගත වැඩක් සමඟ අපගේ ජාත්‍යන්තර ධර්මදූත ජාලය අදද ක්‍රියාත්මකවන්නේය. එබදු රටක එය හසුවුන හොත් එහි අර්ථයවන්නේ සිරගත කිරිම්, වධදීම් සහ මරණය වේ. මා ලියන දෙය මම විශ්වාසකරමි.

මම මෙය අසන්නෙමි: කොමියුනිස්ට්වාදය සමඟ මිත්‍රවුනු ඇමරිකාවේ සභා නායකයින් ඔවුන්ගේ විශ්වාසය වෙනුවෙන් මියයන්නට සුදානම්ද? බටහිර රටවල ඔවුන් දරණ උසස් තනතුරු අත්හැර නැගෙනහිර රටවල් සමඟ එනම් කොමියුනිස්ට්වාදය සමඟ එක එල්ලේ සහයෝගය දක්වමින් නැගෙනහිර රටවල නිල සභා පාලකවරුවීමෙන් ඔවුන්ව වලක්වන්නේ කවුද? බටහිර රටවල කිසිදු සභා නායකයෙකු විසින් මේ දක්වා එබදු ඇදහිල්ලක සාක්ෂියක් පෙන්වා නැත.

එකිනෙකාගේ අවශ්‍යතා අවබෝධකරගෙන එකිනෙකා කෙරෙහි හැඟීම් පලකිරීම මිනිස් වචන වලින් හටගනි. දෙවියන්වහන්සේගේ අභිරහස් සහ ආත්මික ජීවිතයේ උස ප්‍රමාණවත් අන්දමින් පලකිරීමට හැකි මිනිස් වචන කිසිදු ස්ථානයක නොමැත. එමෙන්ම යක්ෂයාගේ කෲරකමෙහි ගැඹුර විස්තර කරලීමට හැකි මිනිස් වචනද කිසිදු ස්ථානයක නැත. නාසිවරුන්ගේ ගිනි උදුනකට විසිකරනු ලැබු මනුෂ්‍යයෙකුගේ හැගිම් ඔබට වචන වලින් පලකරන්ට පුළුවන්ද? ඒසේ නැතහොත් මේ ගිනි උදුනට තමාගේ දරුවා විසිකරනවා දුටු මනුෂ්‍යයෙකුගේ හැඟීම් ඔබට වචන තුලින් පලකරන්ට පුළුවන්ද?

එලෙසම කොමියුනිස්ට්වරුන් යටතේ කිතුණුවන් වින්දාවු හා විඳින්නාවු දුක් කම්කටොළු විස්තර කිරීමට උත්සාහ කිරීම නිෂ්ඵලය.

මම සිරගෙය තුල ලූත්‍රච්ච් පැට්‍රස්තානු සමඟ සිටියෙමි. රුමේනියාවට කොමියුනිස්ට්වාදයේ බලය ගෙනාවේ ඔහුය. ඔහුගේ සගයන් ඔහුව සිරගතකිරීමෙන් ඔහුට විපාකදුන්නෝය. ඔහු හොඳ සිහියෙන් සිටි නිසා පිස්සු මනුෂ්‍යයෙක් සමඟ මානසික රෝහලට දමා ඔහුටද පිස්සු වැටෙන තුරු ඔහුව එහි තැබුවේය. ඔව්හු ඔවුන්ගේ කලින් සිටි රාජ්‍ය ලේකම්වරයා වූ ඇනා පව්කර් හට ද එලෙසම කලෝය. කිතුණුවන් හට ඒ හා සමාන බන්ධන නිතරම දුන්නෝය. ඔව්හු ඔවුන්ට විදුලි කම්පනයෙන් පහරදුන්නෝය. එසේ කොට ඔවුන්ව තවත් වධබන්ධන වලට ලක්කලෝය.

චීනයේ වීදි වල සිදුවනදේ වලින් ලෝකය බියට පත්වී තිබේ. සැම දෙනෙකුගේම ඇස් ඉදිරියෙහි රතු හමුදාව භීතිය ගෙන දෙන දේ සිදුකරති. චීනයේ සිරගෙවල් තුල වෙනත් කිසිවෙකු නොදකින ආකාරයෙන් කිතුණුවන්ට සිදුවන දේ ගැන කල්පනාකිරීමට උත්සහා කරන්න. ප්‍රසිද්ධ චීන ජාතික ශුභාරංචිය ප්‍රකාශකරන ලේඛකයෙකු සහ වෙනත් කිතුණුවන් ඔවුන්ගේ ඇදහිල්ල ප්‍රතික්ෂේප කිරීමට මැලි වූ විට ඔවුන්ව අත්අඩංගුවට ගත් අය විසින් ඔවුන්ගේ කන්, දිව හා පාද කපා දමා දමනු ලැබුවේ යැයි මම අසා තිබේ. කිතුණුවන් අද තවමත් චීන සිරගෙවල් වල සිටිති.

එහෙත් කොමියුනිස්ට්වරු කරන නරකම දෙය මනුෂ්‍යයින්ගේ ශරීර වලට වධදීම හා ඔවුන් මරා දැමීම නොවේ. ඔව්හු බලාපොරොත්තු විරහිත ලෙස මනුෂ්‍යයින්ගේ සිතුවිලි වලට බොරුව කාවද්දති. තරුණයින්ව හා දරුවන්ව එහි විශෙන් මත්කරවයි. ඔව්හු සභාවල නායක තනතුරුවල ඔවුන්ගේ මිනිසුන්ව දමා කිතුණුවන්ව හා සභාවන් මෙහෙයවීමට කොමියුනිස්ට්වාදීන්ව තබා එයින් ඔවුන්ව විනාශකරවයි.

ඔවුන්ගේ තරුණයින්ට දෙවියන්වහන්සේ හා ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන ලෙස උගන්වයි.

වසර ගණනාවක් සිරගෙය තුල ගතකොට ඔවුන්ගේ නිවෙස් වලට එන කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ට මුහුණ දෙන්ට සිදුවන ඛේදවාචකය ඔවුන්ගේ දරුවන් විසින් සමච්චලයට ලක්කිරීමෙන් ඔවුන්ව පිළිගැනීම නම් කුමන වචන වලින් එය විස්තර කල හැකිද? ඒ වන විට ඔවුන්ගේ දරුවෝ සටන්කාමී අදේව දෘෂ්ටිකමින්ව සිටිති. මේ පොත ලියනු ලබනුයේ තීන්ත වලින් නොව ලේ පැතිරෙන හදවත් වලින් ගලන ලේ වලිනි.

දානියෙල් පොතෙහි ගිනි උදුනට දමනු ලැබූ තරුණයින් තිදෙනා එයින් පිටතට ගත් විට ඔවුන්ට ගිනි ගඳ දැනී නොතිබුනා සේම කොමියුනිස්ට් සිරගෙවල් වල සිටින කිතුණුවන්වද කොමියුනිස්වරුන්ට විරුද්ධව තිත්තකමෙහි ගඳ නොදැන සිටියෝය.

ඔබගේ පාද යට පොඩිවෙන මලක් එහි සුවඳ ප්‍රතිවිපාක වශයෙන් ඔබට ලබාදෙන්නාක් මෙන්ම කිතුණුවන්ද කොමියුනිස්ට්වරුන් විසින් පීඩා කරනු ලැබූ කල ප්‍රේමය මගින් ඔවුන්ට පීඩා කරනු ලබන්නන්ට ප්‍රතිවිපාක ලබාදෙති. අපි ක්‍රිස්තුස්වහන්සේ වෙත අපගේ ජේලර්වරුන් බොහෝදෙනා ගෙනැවිත් ඇත්තෙමු. අපව පාලනය කරනු ලබන්නේ එකම එක ආශාවක් මගින් පමණකි. අපට පීඩාකරන කොමියුනිස්ට්වරුන්ට අපට දෙන්නට ප්‍රළුවන් උපරිම දෙය ස්වාමීවූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ කෙරෙන් පැමිණෙන ගැලවීම දෙන්නට කටයුතුකිරීමයි.

මාගේ ඇඳහිල්ල දැරූ බොහෝ සහෝදරවරුන්ට මෙන් සිරගෙය තුල ප්‍රාණ පරිත්‍යාගීවරයෙකුගේ මරණය අත්පත් කරගන්නට මම වරප්‍රසාද නොලදිමි. මාව නිදහස් කරනු ලදුව රුමේනියාවෙන් බටහිර රටවල් වෙත ඒමට අවස්ථාව ලදිමි.

බටහිරදී මා දුටුවේ යකඩ කඩතිරය සහ උණ බම්බු කඩතිරය පිටුපස පැවති රහසිගත සභාව මුල්කරගත් දේවල් වලට වඩා පටහැනිවූ දේවල් මුල්කරගත් බොහෝ කිතුණු නායකයින් බටහිරදී මට හමුවිය. බටහිර රටවල වෙසෙන බොහෝ කිතුණුවන්ට වහල් ජාතීන් තුල සිටින කිතුණුවන් කෙරෙහි ප්‍රේමය නොමැත. එයට සාක්ෂිය නම් ඔවුන්ගේ ගැලවීම සඳහා ඔවුන් කලාවූ යමක් නොමැතිවීමයි. ඔවුන්ගේ ධර්මදූත මෙහෙවර යොමුවන්නේ කිතුණුවන්ව එක් නිකායක සිට තවත් නිකායකට වෙනස්කිරීමට කරන වෙරදැරීමක් වශයෙනි. බොහෝ දෙනෙකුට වහල් ජාතීන් තුල ධර්මදූත මෙහෙවරක් නොමැත. එය නීතියට විරුද්ධ යැයි ඔව්හු පවසමින් නොකර සිටිති. ඔව්හු ඔවුන්ට ප්‍රේම නොකරති. ඒසේ නොවන්නේ නම් ඉන්දියානුවන්ට ප්‍රේමකල විලියම් කේරි සහ චීන ජාතිකයින්ට ප්‍රේමකල හඩ්සන් ටේලර් ඔවුන්ගේ ධර්මදූත මෙහෙවර දී කලාක් මෙන් කල නොහැකි දේ කිරීමට කටයුතු කරන ආශාවන් ඔවුන් තුල ඇතිවෙන්නේ නැත.

එහෙත් වහල් ජාතියක් තුල සිටින්නවුන්ට ප්‍රේමකිරීමට හා ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දිනාගැනීමට එය පමණක්

ප්‍රමාණවත් නොවේ. ඔවුන්ගේ උදාසීන බව සහ ඔවුන්ගේ නොසලකාහැරීම කරණකොටගෙන සමහර බටහිර නායකයින් ඔවුන්ගේ බෙලහීනයන් තමුන්ගේ බෙලහීනකම තුල ශක්තිමත්කරති. ඔව්හු කොමියුනිස්ට්වරුන්ට බටහිර සභාවන් තුලට රහසිගතව ඇතුල්වී ලෝකයේ සභාවල නායකත්වය දිනාගැනිමට ඔවුන්ට උපකාර කරති. ඔව්හු කිතුණුවන්ට කොමියුනිස්ට්වාදයේ භයානකකම නොදැන සිටින්නට සලස්වති.

කොමියුනිස්ට් වරුන්ට හෝ වහල් ජාතීන්ට ප්‍රේම නොකිරීම හා ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනා ගැනීමට කිසිවක් නොකිරීම නිසා බටහිර කිතුණු නායකයින් තම රැළට මෙම ආත්මික සංග්‍රාමයට හවුල්වීමට ඉඩ දෙන්නේද නැත.

*එබඳු වැඩ "නීතියට විරුද්ධ" යයි කියමින් බොහෝ දෙනෙකුට එවැනි ධර්ම දූත මෙහෙවරක් වහල් ජාතීන් වෙත නොමැත.*



## *ඉතිහාසය විසින් නොසලකා හරිනුලැබූ පාඩම්*

පළමුවන ශතවර්ෂය තුල ක්‍රිස්තියානිය උතුරු අප්‍රිකාවේ බහුල ලෙස පැතිරී ගියේය. එතැනින් සාන්ත ඔගස්ටීන්, සාන්ත සිප්‍රියන්, සාන්ත ඇතනේසියන්, සහ ටර්ටුලියන් වැනි අය බිහිවුහ. උතුරු අප්‍රිකාවේ කිතුණුවන් එක් වැඩක් අමතකකලෝය. එනම් මහමත් භක්තිකයින් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දිනාගැනිම අමතක කලෝය. එහි ප්‍රථිපලයක් වශයෙන් මහමත් භක්තිකයින් උතුරු අප්‍රිකාව ආක්‍රමනය කොට එහි ශතවර්ෂ ගණනාවක් මුල්බැසගෙන සිටි ක්‍රිස්තියානිය උගුලාදැමුවෝය. වර්තමානයේ වුවද උතුරු අප්‍රිකාව මුස්ලිම්වරුන්ට අයිතිය. ඔව්හු කිතුණු ධර්මදූතවරුන් විසින් හඳුන්වනු ලබන්නේ "සිත්හරවාගත නොහැකි කණ්ඩායම" වශයෙනි. අපි ඉතිහාසයේ පාඩමක් ඉගෙන ගතිමු.

ප්‍රතිසංකරණ කාලයේදී හස්, ලූතර් හා කැල්වින් ආගමික වශයෙන් උනන්දුව දැක්වුයේ යුරෝපියානු සෙනග පාප් තුමාගේ වියගහින්

ඉවත්කරලීම සම්බන්ධයෙන් පමණකි. මන්ද එය පීඩනකාරී දේශපාලනික හා ආර්ථික බලවේගයක්ව තිබුනු බැවිනි. ඒ ආකාරයෙන්ම වර්තමානයේ ද හිතියට ලක්ව ඇති රාජ්‍යයන්හි හා ඔවුන්ගේ ගොදුරු බවට පත්ව ඇති සෙනග කෙරෙහි ශුභාරංචිය බෙදාහැරීමේ රහසිගත සභාවේ උනන්දුව නිදහසේ ජීවත්වීමට සියලු නිදහස් මිනිසුන් දක්වන උනන්දුව සමඟ එකක් බවට පත්වේ.

බොහෝ භයංකර රාජ්‍යයන්ට න්‍යෂ්ටික ආයුධ තිබේ. කෝටි සිය ගණනක් එක විට ගොදුරක් බවට පත්කරගත හැකි තව ලෝක යුද්ධයක් ඇරඹීමට හැකි හමුදාමය බලය ඔවුන්ට තිබේ. බොහෝ බටහිර පාලකයින්ගේ මොල සෝදා ඇති අතර ඔව්හු එබඳු පාලකයින්ව බලයෙන් පහකිරීමට කැමති නොවෙති. ඔව්හු මේ බව නිතර නිතරම පවසමින් සිටිති. ඔව්හු මත්ද්‍රව්‍ය භාවිතය, කණ්ඩායම් ගැසී වැරදි වැඩ වල නිරතවීම, පිළිකාව, ක්ෂය රෝගය වැනි දේ අතුරුදහන්කිරීමට බලාපොරොත්තු වෙතත් කොමියුනිස්ට්වාදය වැනි නපුරු ක්‍රම පහ කිරීමට කැමති නැත.

සෝවියට් ලේඛකයෙකි වු ඉල්යා ඒරම්බර්ග් පවසන අන්දමට ස්ටාලින්ට තම ජීවිතකාලය තුල තමාගේ ගොදුරු බවට පත්ව මියගිය අහිංසක මිනිසුන්ගේ නම් වීම හැර අන් කිසිවක් කරන්නට ඉඩනොතිබුනි නම් ඔහුගේ ජීවිත කාලය තුල ඔහුට එම වැඩය නිමකරන්නට නොහැකිවනු ඇතැයි පවසයි. කොමියුනිස්ට් පක්ෂයේ 20 වෙනි කොන්ග්‍රස් සභාවේදී කෲෂෙ පැවසු අන්දමට "ස්ටාර්ලින් අවංක සහ වරදින් තොර කොමියුනිස්ට්වරු දහස්ගණනක් විනාශකලේය. ........... 17 වෙනි කොංග්‍රසය මගින් තෝරා පත්කරන ලද මධ්‍යම කමිටුවේ සාමාජිකයින් සහ අපේක්ෂකයින් 139 දෙනාගෙන් 98 දෙනෙක්ම පසුකලෙක අත්අඩංගුවට ගෙන වෙඩි තබන ලදි. මෙය එහි සිටියවුන්ගෙන් සියයට 70කි."

ඔවුන් කිතුණුවන්ට කල දෙය දැන් කල්පනාකරන්න! කෲෂෙව් ස්ටාර්ලින් සමග තමාගේ කිසි සම්බන්ධයක් නැතිබව පවසමින් එම දෙයම සිදුකරගෙන ගියේය. 1959 සිට සෝවියට් රුසියාවේ විවෘතකර තිබු දේවස්ථාන වලින් අඩක්ම වසාදමනලදි.

චීනය තුල ස්ටාර්ලින්ගේ කාලපරිච්ජේදයේ තිබුනාටත් වඩා මහත්වු ම්ලෙච්චත්වයේ රැල්ලක් පැතිරී ගියේය. විවෘත සභා ජීවිතය සම්පුර්ණයෙන්ම අත්හැර දමන ලදි. රුසියාවේ හා රුමේනියාවේ අළුත්

අත්අඩංගුවට ගැනීම සිදුවිය. (සෝවියට් සංගමයේ කොමියුනිස්ට්වාදයේ වැටීමෙන් පසු රුසියාව තුල විශාල වශයෙන් කිතුණුවන් අත්අඩංගුවට ගනුලැබු බව රජය පිළිගත්තේය.)

කෝටි 100ක් වැඩියෙන් වෙසෙන රටවල් තුල හටගත් භීතිය හා රැවටිලිකාරකම ඔස්සේ බටහිර ජාතීන්ගෙන් පැමිණෙන සියල්ල කෙරෙහි වෛරකරන්ට සහ විශේෂයෙන්ම ක්‍රිස්තියානිය කෙරෙහි වෛරකරන්ට ගොඩනගනු ලැබු සම්පූර්ණ තරුණ පරම්පරාවක් බිහිවිය.

ප්‍රාදේශිය නිලධාරීන් දේවස්ථාන ඉදිරියේ සිටගෙන ළමයින් දෙස පරීක්ෂාවෙන් බලාසිටීම රුසියාවේ අසාමාන්‍ය දර්ශනයක් නොවිය. දේවස්ථානයට ගිය අයවළුන්ට කම්මුල් පහරදී ඔවුන්ව එලියට ඇද දමන ලදී. බටහිර ක්‍රිස්තියානිය අනාගතයේදී විනාශකරන්නවුන් ප්‍රවේශම් සහගතව හා ක්‍රමානුකූලව ඇතිදැඩි කරන ලදී.

එම නපුරු ආණ්ඩු වෙනස් කල හැක්කේ එකම එක බලවේගයකට පමනි. එය මිත්‍යාදෘෂ්ටික රෝම අධිරාජ්‍යයේ තැන ගැනීමට ක්‍රිස්තියානි රාජ්‍යයන්ට අවකාශ ලබාදුන් එම බලවේගයමවේ. ම්ලේච්ච ටියුමන්වරු සහ වයිකිංවරු කිතුණුවන් බවට පත්කල එම බලවේගයම වේ. කතෝලික පරික්ෂක සභාවේ ලේ හෙලවීම් අභිබවා ක්‍රියාකරමින් එය පහකර දැමු එකම බලවේගයයි. එය නම් ශුභාරංචියේ බලයයි. සියලු වහල් ජාතීන් තුල ක්‍රියාකරන රහසිගත සභාව මගින් නියෝජනය කරන බලවේගයයි.

මේ සභාව දරාගැනීමට සහ ඇයට උපකාරකිරීමට ඉදිරිපත් වීම අපගේ පීඩා විඳින සහෝදරයින් සමග ඒකත්වය පැවැත්වීමේ ප්‍රශ්නයක් පමණක් නොවේ. එය ඔබගේ රටේහිත් ඔබගේ සභාවන් වලත් ජීවනය හා මරණය පිළිබඳ ප්‍රශ්නයකි. මෙම සභාව දරාගැනීමට නිදහස් කිතුණුවන්ගේ උනන්දුව පමණක් ප්‍රමාණවත් නොවේ. නිදහස් ආණ්ඩුවල ප්‍රතිපත්තියද එයට ඇතුල්විය යුතුය. රහසිගත සභාව ක්‍රිස්තුස්වහන්සේ වෙත කොමියුනිස්ට් පාලකයින් දිනාගැනීම දැනටමත් සිදුකර තිබේ. රුමේනියාවේ අගමැතිවරයාව සිටි ජොර්ජිව් ඩෙජ් මරණයට පත්වුයේ තමාගේ පාප කියා දී තමාගේ පාපිෂ්ඨ ජීවිතය වෙනස්කොට සිත් හැරුණු මනුෂ්‍යයෙකු වීමෙන් පසුවය. බොහෝ වහල් ජාතීන් වල සැඟවුනු කිතුණුවන්ව සිටින රජයේ සමාජිකයින් සිටිති. මෙය පැතිරී යන්නට පුළුවන. මෙය සමහර ආණ්ඩුවල ප්‍රතිපත්තීන්ගේ සැබෑ වෙනස්වීමක්

බලාපොරොත්තු වීමට අපට හැකියාව ලබාදෙයි. ටිටෝ සහ ගොමුල්කා වැනි අයගේ වෙනස්වීම පමණක් නොව කෲර අදේවවාදී පක්ෂය විසින් නොකඩවා කරගෙන යනු ලබන එකම ආඥාදායකත්වය පවා වෙනස්කරන්ට පුළුවන. කිතුනුවන් වෙත හා නිදහස වෙත හැරීමක් ඇතිවන්නට පුළුවන.

දැන් මේ සඳහා සුවිශේෂී අවස්ථාවන් උදාවීතිබේ.

කොමියුනිස්ට්වාදය තුල සිටින ඇදහිලිවන්තයෝ කිතුණුවන් ලෙස ඔවුන්ගේ ඇදහිල්ල සම්බන්ධයෙන් අවංකව නිතරම කටයුතුකරති. ඒ අතරම මහත් අර්බුදයක් පසුකර යමින් සිටිති.

ඔව්හු සැබවින්ම විශ්වාස කරනුයේ කොමියුනිස්ට්වාදය ජාතීන් අතර සහොදරත්වයක් නිර්මානය කරන බවයි. දැන් ඔවුන් දකිනුයේ කොමියුනිස්ට් රටවල්ද නැගෙනහිර යුරෝපීය රටවල් මෙන් වැටෙනු ඇති බවයි.

කොමියුනිස්ට්වාදය ලෝකය තුල පාරාදීසියක් නිර්මාණය කරනු ඇතැයි ඔව්හු විශ්වාස කලෝය. ඔව්හු එය ස්වර්ගය තුල තිබෙන මනඃකල්පිත පාරාදීසියට එදිරිව බිහිවන්නක් ලෙස සැලකූහ. එහෙත් දැන් ඔවුන්ගේ සෙනඟ කුසගින්නේ පසුවන්නාහ. තිරිඟු ධනවාදී රටවලින් ආනයනය කරන්නේය. උතුරු කොරියාවේ සාගතය මෙන් තත්වයක් පවතින්නේය. ලෝකයේ තනිවූ ඉතාමත්ම බරපතල තනිකමක් අත්දකින රාජ්‍යයන් ගැන සැලකිලිමත් වීමේදී උතුරු කොරියාව වර්තමානයේ බලවත් භෞතික විනාශයක් අත්පත්කරගනිමින් සිටී. ගම්වතුර වගාවන් විනාශකර තිබේ. එයින් ඔවුන්ගේ ආහාර සැපයුම සම්පූර්ණයෙන්ම වනසා දමා ඇත. දැන් බලාපොරොත්තු විරහිත ලෙස උතුරු කොරියාව ඔවුන්ගේ දොර කවුළු සෙසු ලෝකයාට විවෘත කරන්ට පටන්ගෙන ඇත. කටුකම්බි වැටට පිටින් ඇති දෙයෙහි මාත්‍රාවක් සෙසු ලෝකයට දැනගත හැකිවන සේ මෙම බිඳුනු විවෘත කිරීම සිදුකර තිබේ.

කොමියුනිස්ට්වරු ඔවුන්ගේ නායකයින් කෙරෙහි විශ්වාසය තැබුවෝය. දැන් ඔවුන් ඔවුන්ගේ ප්‍රවෘත්ති පත්‍රවල ස්ටාර්ලින් මිනීමරුවෙකු බවත් කෲෂෙව් මෝඩයෙකු බවත් කියවමින් සිටිති. රැකෝසි, ග්‍රේරෝ, ඇනා පව්කර්, රැංකොවිසී සහ යනාදී ලෙසට වූ ඔවුන්ගේ ජාතික වීරයන් ගැනද ඒම දෙයම කියවමින් සිටිති. කොමියුනිස්ට්වරු තවදුරටත්

ඔවුන්ගේ නායකයින්ගේ නොවරදින සුළු ස්වභාවය ගැන විශ්වාස නොකරති. ඔව්හු හරියට පාප්වරයෙකු නොමැති කතෝලිකයින් බදුය.

කොමියුනිස්ට්වරුන්ගේ සිත් තුල නිශ්චලකම පිරී තිබේ. හිස්කම පිරී තිබේ. මේ හිස්කම පිරවිය හැක්කේ ක්‍රිස්තුස්වහන්සේට පමණකි. මිනිස් සිත ස්වභාවයෙන්ම දෙවියන්වහන්සේව සොයයි. ක්‍රිස්තුස්වහන්සේ විසින් පුරවන තෙක් සෑම මනුෂ්‍යයෙකුගේම ඇතුලාන්තයේ ආත්මික හිස්කමක් තිබේ. මෙය කොමියුනිස්ට්වරු සම්බන්ධවද වෙනත් වහල් ජාතීන් සම්බන්ධවද සැබෑ එකකි. ශුභාරංචිය තුල ඔවුන්ට ආයාචනා කිරීමක් සිදුකරන ප්‍රේමයේ බලයක්ද ගැබ්වී තිබේ. එය සිදුවනු මම දැක තිබේ. එය කල හැකි බව මම දන්නෙමි.

කොමියුනිස්ට්වරුන් විසින් සමච්චලයට ලක්කරනලද සහ වධබන්ධන වලට ලක්කරනලද කිතුණුවන් ඔවුන්ට පුද්ගලිකව හා ඔවුන්ගේ පවුල් වලට කරන ලද දෙය අමතකකොට ඔවුන්ට සමාව දී තිබේ. ඔහු ඔවුන්ට හැකි පමණ උපරිම අයුරින් අර්බුදය තුලින් ගමන්කරමින් ක්‍රිස්තුස්වහන්සේව සොයාගැනීමට කොමියුනිස්ට්වරුන්ට උදව්වෙති. මේ වැඩය සඳහා ඔවුන්ට අපගේ උපකාරය අවශ්‍යය.

මෙපමණක් නොව ක්‍රිස්තියානි ප්‍රේමය සැමවිටම විශ්වීය එකකි. කිතුණුවන් නොවේ. පක්ෂග්‍රාහි දෙවියන්වහන්සේ විසින් මැවූ සූර්‍ය්‍යයා යහපත් අයටත් අයහපත් අයටත් පායන බව යේසුස්වහන්සේ පැවසුවේය. ක්‍රිස්තියානි ප්‍රේමය සම්බන්ධයෙන්ද මෙය එසේමය.

බටහිර ජාතීන් තුල සිටින කිතුණු නායකයින් කොමියුනිස්වරු සමඟ මිත්‍රතත්වය පවත්වති. වෙනත් මෙලෙස භයංකර ලෙස ක්‍රියාකරන රාජ්‍යයන්ද සමඟ මිත්‍රතත්වය පවත්වන ඔවුන් අප අපගේ සතුරන්ට ප්‍රේම කල යුතු බව පවසමින් එය සාධාරණ බව දක්වති. එතාක් අපි සතුරන්ට පමණක් ප්‍රේමකල යුතු බව යේසුස්වහන්සේ කිසිකලෙකත් ඉගැන්වුයේ නැත. ඒසේ කරමින් අපගේ සහෝදරයින් අමතක කරදැමිය යුතු බව ඉගැන්වුයේ නැත.

ඔව්හු කිතුණුවන්ගේ ලෙයින් තමන්ගේ දැත් තෙත් වී පවතින අය සමඟ එකට වැඩකරමින් එකට ආහාර ගනිමින් ඔවුන්ගේ “ප්‍රේමය” පෙන්වති. එතාක් ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය බෙදා නොදෙති. එහෙත් මෙහි ඔවුන් විසින් පීඩාවට පත්කරන ලද තැනැත්තන්ව අමතක කරදමති. ඔවුන්ට ප්‍රේම නොකරති.

දශකයට පෙර බටහිර ජර්මනියේ ඉවැන්ජලිකල් සහ කතෝලික සභාවන් විසින් කුසගින්නේ පසුවන්නන්ට ඩොලර් කෝටි 12 1/2ක් ලබාදෙන ලදී. ඇමරිකානු කිතුණුවන් මීට වඩා මුදලින් ලබාදෙන ලදී.

ක්‍රිස්තුස්-
වහන්සේ
කුරුසිපත් කල
උන්වහන්සේගේ



එක් අතක්
බටහිර
දිශාවටත්
අනෙක් අත
නැගෙනහිර
දිශාවටත්
දිගුකල සේක.

බොහෝ කුසගින්නේ පසුවන මිනිස්සු සිටිති. එහෙත් කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ට වඩා, නිදහස් කිතුණුවන්ගෙන් උපකාර බලාපොරොත්තුවීමට අයිතියක් ඇති අයෙකු හෝ ඔවුන්ට වැඩියෙන් කුසගින්නෙන් පසුවන වෙනත් අයෙකු ගැන මට සිතා ගැනිමට නොහැකිය. ජර්මානු, බ්‍රිතාන්‍ය, ඇමරිකානු සහ ස්කැන්ඩිනේවියානු සභාවන් සහන කටයුතු සඳහා මෙපමණ මුදලක් රැස්කරන්නේ නම් අවශ්‍යතාවයෙන් පෙලෙන සෑම අයෙකු වෙතම එය යායුතුය. නමුත් ප්‍රථමයෙන් කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන් සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන් එය යායුතුය.

මෙය දැන් සිදුවන්නේද?

කිතුණු සංවිධාන විසින් මා වෙනුවෙන් කප්පම් ගෙවා මාව මුදාගන්නා ලදි. එයින් සනාථවන්නේ කිතුණුවන්ව කප්පම්ගෙවා නිදහස්කර හැකි බවයි. කිතුණුවන් විසින් රුමේනියාවෙන් කප්පම් ගෙවා මෙලෙස මුදාගන්නා ලද එකම කිතුණුවා මා පමණකි. තවද මාව කප්පම් ගෙවා මුදාගැනිමෙන් බටහිර ජාතීන් තුල කිතුණු සංවිධාන අන්‍යයන් සම්බන්ධව ඔවුන්ගේ යුතුකම් ඉටු නොකල බවට චෝදනාවක් හටගත්තේය.

මුල් කිතුණුවන් මේ අළුත් සභාව යුදෙව්වන් වෙනුවෙන් පමණක්ද? අන්‍යජාතීන් සඳහා පවතින්නේද? යන්න ඔවුන්ගෙන්ම විමසුවෝය. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර ලැබුනේය. වෙනත් ආකාරයකින් මේ ප්‍රශ්නයම 20 වන ශත වර්ෂයේ නැවත හටගෙන තිබේ. ක්‍රිස්තියානිය බටහිර ජාතීන් සඳහා පමණක් නොවේ. ක්‍රිස්තියානි ඇමරිකාව, එන්ගලන්තය සහ වෙනත්

ප්‍රජාතන්ත්‍රවාදී රටවල් සඳහා පමණක් අයත් නැත. ක්‍රිස්තුස්වහන්සේව කුරුසිපත් කරනු ලැබූ විට උන්වහන්සේගේ එක අතක් බටහිර දෙසටද අනික් අත නැගෙනහිර දෙසට විහිදුවා තිබුනි. උන්වහන්සේ යුදෙව්වන්ගේ රජුවීමට පමණක් නොව අන්‍යජාතීන්ගේද කොමියුනිස්ට්වරුන්ගේද බටහිර ලෝකයේද රජුවීමට බලාපොරොත්තුවේ. යේසුස්වහන්සේ මෙසේ පවසයි "ලොව පුරා ගොස් සැම මැවිල්ලකටම ශුභාරංචිය දේශනාකරන්න." (මාර්ක් 16:15)

උන්වහන්සේ උන්වහන්සේගේ ලේ සියල්ලන් වෙනුවෙන් දුන්සේක. එසේ කලේ සියල්ලෝම ශුභාරංචිය අසා විශ්වාසකරනු පිනිසය.

වහල් ජාතීන් තුල ශුභාරංචිය දේශනාකිරීමට අපට ධෛර්යමත් කරන්නේ කුමක්ද? ඒ සඳහා සම්පූර්ණ ප්‍රේමයෙන් හා ජ්වලිතකමෙන් පිරුණු කිතුණුවන් බවට අපි පත්විය යුතුය. මට ඇල් මැරුණු රුසියානු කිතුණුවන් එක් අයෙකුදුවත් මුණනොගැසුනි. කලින් කොමියුනිස්ට්වරු හා මුස්ලිම්වරුන්ව සිටි තරුණ අය ක්‍රිස්තුස්වහන්සේගේ අනගිභවනීය ගෝලයින්ව සිටියෝය.

ක්‍රිස්තුස්වහන්සේ මේ මනුෂ්‍යයින්ට ප්‍රේමකල අතර ඔවුන්ව නිදහස්කිරීමට ආශාවුයේය. සියලු පව්කාරයින්ට උන්වහන්සේ ප්‍රේමකල ලෙස ඔවුන්ව පාපයෙන් නිදහස්කිරීමට ආශාවූ ලෙස උන්වහන්සේ මේ අය සම්බන්ධයෙනුත් එලෙසම කටයුතු කළ සේක. සමහර බටහිර සභා නායකයින් මෙය වෙනස්කරමින් වෙනත් එකකින් මෙහි එකම නිවැරදි ආකල්පය විස්ථාපනයකරති. එනම් කිතුණුවන්ට පීඩා කරන්නන් වෙත ප්‍රසාදජනක ආකල්පයක් ඔව්හු ඇතිකරති. ඔව්හු මෙහි පාපිෂ්ඨයින්ට අනුග්‍රාහය දක්වමින් මෙහි පීඩා කරන්නන්ට ඔවුන්ගේ බලය පවත්වාගෙන යැමට උපකාරකරයි. ඒ අතරම මෙහි සතුරන්ගේ ගැලවීමට මෙන්ම ඔවුන්ගේ ගොදුරක් බවට පත්වුවන්ගේ ගැලවීමට ද බාධාකරති.

## මාගේ නිදහසින් පසු මා සොයාගත් දෙය

සිරගෙයින් මා නිදහස ලැබූ පසු මාගේ භාර්‍යාව සමඟ මම නැවත එක්සත්විමි. මාගේ අනාගත සැලසුම් කුමක් දැයි ඇය මාගෙන් විමසුවාය. මම මෙසේ පිළිතුරු දුන්නෙමි. "ආත්මිකව හුදකලාව සිටින්නෙකුගේ ජීවිතයක් මා ඉදිරියේ තිබෙන බව බලාපොරොත්තු

වෙතැයි" මම පැවසුවෙමි. ඇයටද එම සිතුවිල්ලම පහළවී ඇති බව මාගේ භාර්‍යයාව පැවසුවාය.

මාගේ තරුණ කාලයේ මම ජව වේගයකින් යුක්ත තැනැත්තෙක්විමි. එහෙත් සිරගෙය තුල සිටි කාලයේදී විශේෂයෙන්ම වසර ගණනාවක් හුදකලා කාමරයක සිටින්නට වීමෙන් මම භාවනාත්මක සමාධිගත පුද්ගලයෙක් වුයේය. සිතේ ඇති සියලුම කුණාටු නිශ්චලව තිබුනේය. මම කොමියුනිස්ට්වාදය ගැන තැකිමක් නොකෙලෙමි. මම ඒ ගැන කිසිදු සැලකිල්ලක් නොදැක්විමි. ස්වර්ගයේ මනාලයාගේ වැළඳගැනීම තුල මම සිටියෙමි. මට හිරිහැර කල අය වෙනුවෙන් මම යාච්ඤාකලෙමි. මාගේ මුළු සිතින් ඔවුන්ට ප්‍රේමකලෙමි.

මා නිදහස ලැබිමෙන් පසු මා හට තිබුනේ ඉතා සුළු බලාපොරොත්තුවක් පමණකි. කලින් කලට, මා නිදහස් කල පසු කුමක් කරන්නද යනුවෙන් විමතියට පත්වෙමින් සිටියෙමි. ස්වර්ගීය මනාලයා සමඟ කාන්තාරයක් තුල මිහිරි සම්බන්ධයක් පවත්වන ජීවිතයක් ගතකරමින් විශ්‍රාමිකව දිවි ගෙවීමට මම සැමවිටම කල්පනා කලෙමි.

දෙවියන්වහන්සේ "සත්‍යය". බයිබලය යනු "සත්‍ය පිළිබඳ සත්‍යයයි." දේවධර්මය යනු "සත්‍ය පිළිබඳව සත්‍යය සම්බන්ධයෙන් සත්‍යයි." කිතුණු මනුෂ්‍යයින් ජිවත්වන්නේ සත්‍ය පිළිබඳ පවතින මෙවන් සත්‍යතාවයන් තුලය. තවද ඔවුන් මේ හේතුකොටගෙන "සත්‍යය" නොපවති. කුසගින්නේ පසුවන පහරකනු ලැබු හා මත්ද්‍රව්‍යයන් ශරීර ගතකරන ලද අපට දේවධර්මය හා බයිබලය අමතකවී ගොස් තිබේ. අපට "සත්‍ය පිළිබඳ සත්‍යය" අමතකවී ඇති නිසා අපි "සත්‍ය" තුල ජීවත් වෙමු. මෙසේ ලියා තිබේ. "නුඹලා බලාපොරොත්තු නොවන පැයකදි මනුෂ්‍ය පුත්‍රයා පැමිණෙන්නේය" (මතෙව් 24:44). අපට තවදුරටත් සිතන්නට නොහැක. මගේ පීඩා විඳීමේ අඳුරුම අවස්ථාවේදී මනුෂ්‍ය පුත්‍රයා අපවෙත පැමිණියේය. සිරගෙයි බිත්ති දියමන්තිමෙන් බබලන්නට සලස්වමින් කුටිය ආලෝකයෙන් පුරවමින් එතුමා පැමිණියේය. ශරීරය නැමැති විෂය පතය තුල අපට පහලින් දුර, අපට පීඩාකරන්නෝ පසු වු නමුත්, අපගේ ආත්ම ස්වාමීන්වහන්සේ තුල ප්‍රීති විය. රජ මාලිගා සඳහා අපි මේ ප්‍රීතිය අත්නොහලෙමු.

යමෙකුට හෝ යමකට විරුද්ධව සටන්කරන්ට ඇති ආශාව හෝ යමක් තවදුරටත් මාගේ මනස තුල නොවීය. කුමන යුද්ධයක් හෝ

සාධාරණ යුද්ධයක් හෝ මට සටන්කරන්ට උවමනා නොවීය. ක්‍රිස්ස්වහන්සේ වෙනුවෙන් ජීවමාන මාලිගාවක් ගොඩනැගීමට මම ආශාවීමි. මම සිරගෙයින් පිටවු පසු භාවනායෝගීව ඉදිරි කාලය නිශ්චලව ගතකරන්ටවු මාගේ බලාපොරොත්තුව මාගේ සිත තුල විය.

එහෙත් මාව නිදහස්කරනු ලැබු එම දිනයේම මාගේ සිරගතවීමේදී මා විදී සියලු වධබන්ධන වලට වඩා අතිශයින් අවලක්ෂණ වු කොමියුනිස්ට්වාදයේ එක්තරා අංශයකට මම මුහුණදීමි. එකෙක් පසුපස එකෙක් බැගින් මට විවිධ සභාවල ශ්‍රේෂ්ඨ දේශකයින් හා පාලකවරුන් සහ බිෂෝප්වරුන් මුණගැසුණු අතර ඔවුන්ගේ රුළ ගැන රහස් පොලිසියට තොරතුරු සැපයු ඔත්තුකරුවන් ඔවුන් බවට මහත් කණගාටුවකින් යුතුව ඔවුන් උච්චාරණය කලෝය. මම ඔවුන්ගෙන් මෙසේ විමසුවෙමි. තොරතුරු සපයන්නන් වෙනවා වෙනුවට සිරගතවීමේ අවදානමට ලක්වීමට ඔවුන සුදානම්ද යන වග ඔවුන්ගෙන් විමසුවෙමි. ඔවුන් සියල්ලෝම "නැත" යනුවෙන් පිළිතුරු දුන්නෝය. ඔවුන් පැහැදිලි කරමින් එයින් ඔවුන්ව වලක්වන්නේ ඔවුන්ගේම මනුෂ්‍යයින් කෙරෙහි පවතින බිය නොවන බව පැවසුවෝය. සභා තුල අළුතින් වර්ධනය වී ඇති දේවල් අනුව මාගේ අත්අඩංගුවට ගැනිමට පෙර නොමැති දේවල් ඇතිවී තිබෙන බව ඔව්හු මා හට පැවසුවෝය. එනම් තොරතුරු සපයන්නෙකු බවට පත් නොවුවහොත් ඔවුන්ගේ සභාව වසාදමනු ලැබිමට ඉඩ තිබෙන බවයි.

සැම නගරයක් තුලම "මිත්‍යා ඉගැන්වීම්" පාලනය පිණිස රජයේ නියෝජිතයෙක් විය. ඔහු රහසිගත රහස් පොලිසියේ මනුෂ්‍යයෙක් විය. ඔහුට ඕනෑම පුජකයෙක් ඔනෑම සභා පාලකවරයෙක් ඔහු කැමති අවස්ථාවක කැඳවා ප්‍රශ්නකිරීමට අයිතියක් ඇත. සභාව තුල සිටින මනුෂ්‍යයින් කවුරුන්ද නිතරම ශුද්ධවු සහභාගීකමට පංගුකාරවන්නේ කවුරුන්ද?, ආගම ගැන ජ්වලිතව සිටින්නේ කවුරුන්ද?, ආත්ම දිනන්නේ කවුරුන්ද?, මනුෂ්‍යයින් පාපොච්චාරණයේදී පවසන්නේ කුමක්ද? යනාදී ලෙසට ප්‍රශ්නකරන්නට අයිතිය ඔහුට ඇත. ඔබ එයට පිළිතුරු නොසැපයුවහොත් ඔබව ඉවත්කොට වෙනත් "දේවගැතිවරයෙකුව" ඒ ස්ථානයට පත්කිරීමට පුළුවන. රජයේ නියෝජිතයින්ට එබදු වෙනස්කිරීමක් කල නොහැකි විටකදී (එය කිසිවිටකත් සිදුවී නොමැත.) ඔව්හු සභාව වසාදමති. චීනය තුල වර්තමානයේ සිදුවන්නේ මෙයයි.

බොහෝ දේවගැතිවරු රහස් පොලිසියට තොරතුරු ලබාදෙති. සමහරු අකමැත්තෙන් වුවද සමහර තොරතුරු සඟවන්ට උත්සහාකරමින්

එසේ කරති. සමහරුන්ට මේ පුරුද්දක් වී ඇති අතර තවත් අය ඒ සඳහා දැඩි ආශාවක් ඇතුව සිටිති. ඔවුන් ඉල්ලා සිටිනවාට වඩා වැඩි දේවල් ඔව්හු පවසති.

තමන්ට කරුණාවන්තකම් දැක්වූ පවුල් පිළිබඳව තොරතුරු ලබාදෙන්ට බැඳී සිටින, කිතුණු ප්‍රාණ පරිත්‍යාගීකරුවන්ගේ දරුවන් කලාවු පාපොච්චාරණද මම ඇසුවෙමි. එසේ නොවුයේ නම් ඔවුන්ට ඔවුන්ගේ අධ්‍යාපනය පවත්වාගෙනයන්ට ඉඩ නොලැබෙන බවට තර්ජනය කරනු ලැබිනි.

මම බැප්ටිස් ජාතික සංගමය පවත්වන රැස්වීමක් වෙත ගියෙමි. එය රතු ධජය යටතේ සංකේතාත්මකව පැවතුනි. “තෝරාගත යුතු නායකයින්” කවුදැයි තිරණයකරනු ලබන්නේ කොමියුනිස්ට්වරු විසිනි. සියලු නිල සභා වල නායකයින්ව තිරණය කරනු ලබන්නේ කොමියුනිස්ට් පක්ෂය විසින් බව මම දැනසිටියෙමි. මෙහිදී යේසුස්වහන්සේ කථාකල පාළුකරන පිළිකුල මම දකිමින් සිටින බව අවබෝධකරගතිමි.

එහි යහපත් හා නපුරු සභා පාලකවරු හා දේශකයින් සැමවිටම සිටියෝය. එහෙත් දැන් දිව්රුම් දුන් අදේවවාදී පක්ෂයක එනම් ආගම මුලින්ම උපුටා දැමිය යුතුයැයි අරමුණු තුල අදේවවාදී පක්ෂයක මධ්‍යම කාරක සභාව විසින් සභා ඉතිහාසයේ ප්‍රථමවරට සභා නායකයින් කවුදැයි තීරණය කරයි. කුමන අරමුණක් සඳහා එසේ නායකත්වය දෙනු පිණිසද? සහතික ලෙසම ආගම මුලින් උපුටා දැමීමට උපකාරකරනු පිණිසය.

ලෙනින් මෙසේ ලිව්වේය. “සැම ආගමික අදහසක්ම, දෙවියන්වහන්සේ පිළිබඳ සැම අදහසක්ම, දෙවියන්වහන්සේ පිළිබඳව කුමණ ආකාරයේ අදහසක් පවා කිව නොහැකි ආකාරයේ ඉතාමත් භයානක ආකාරයේ දුෂ්ටකමකි. ඉතාමත් පිළිකුල් ආකාරයක දුෂිතකමකි. දෙවිකෙනෙකු යන ආත්මික අදහසට සහ රුවට්ලිකාර අදහසට වඩා කෝටි සංඛ්‍යාත පාප පිළිකුල් සහිත ක්‍රියා කලහාකාරී ක්‍රියා සහ කායික දූෂ්ටකම් භයානක කමින් ඉතා අඩුය.” සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂය ලෙනින්වාදී එකකි. ඔවුන් හට ආගම පිලිකාවකට, ක්ෂය රෝගය හෝ උපදංශයට වඩා භයානකය. ආගමික නායකයින් විය යුත්තේ කවුරුන්දැයි ඔහු තීරණය කරති. නිල සභාවේ නායකයින් සහයෝගයෙන් සිටිති. ඔවුනොවුන් සමඟ අඩුවෙන් හෝ වැඩියෙන් එකඟවීම් වලට එළඹෙති.

ළමයින් සහ තරුණයින් අදේවවාදයෙන් විෂසහිත මත්විමකට පත්වනු මම දැක ඇත්තෙමි. නිල සභාවන්ට ඒ සමග සටන්කිරීමට මදකුදු හෝ හැකියාවක් නොමැත. අපගේ අගනුවරවූ බුකාරිස්ට් වල කිසිදු සභාවක් තුල ළමයින් සඳහා සබත් පාසැලක් හෝ තරුණ රැස්වීමක් සොයාගැනීමට නුපුළුවන. කිතුණුවන්ගේ දරුවන්ව වෛරයේ පාසැල තුල ඇතිදැඩි කරනු ලබයි.

තවද මේ සියල්ල දැකීමෙන් පසු මම කොමියුනිස්ට්වාදයට වෛර කලෙමි. එහි වධබන්ධනකරුවන් යටතේ සිටීමෙන් නොව මේවා නිසාම මම කොමියුනිස්ට්වාදයට වෛර කලෙමි.

මම එයට වෛරකලේ එය මා හට කරනලද දේ නිසා නොවේ. එය දෙවියන්වහන්සේගේ මහිමයට කරන ලද වරද හේතුකොටගෙනය. ක්‍රිස්තුස්වහන්සේගේ නාමයට කරන ලද වරද හේතුකොටගෙනය. ඒ යටතේ සිටින කෝටි සියයක්වූ මනුෂ්‍යයින්ගේ ආත්ම වලට කරන ලද වරද හේතුකොටගෙනය.

මුළු රට මුළුල්ලෙන්ම ගැමියන් මා බලන්න අවුත් සිදුවෙමින් පවතින සාමූහික කාරණය පිළිබඳව මා හට පැවසුවෝය. ඔවුන්ගේ කලින් කෙත් වතු තුල ඔවුන් දැන් කුසගින්නේ පසුවන වහලුන් බවට ඔව්හු පත්වී ඇත. ඔවුන්ට පාන් නොමැත. ඔවුන්ගේ දරුවන්ට කිරි නොමැත. පළතුරු නොමැත. තවද පැරණි කානාන් දේශය මෙන් මේ රටද ස්වභාවික සම්පත් වලින් පිරී රටක්ව පැවතිනි.

ලෙනින්වාදී කොමියුනිස්ට්වාදී ආණ්ඩුව ඔවුන් සියලු දෙනාවම හොරු හා බොරුකාරයින් බවට පත්කල බව ඔව්හු මා හට පැවසුවෝය. කුසගින්න නිසා මුලදී ඔවුන්ගේ කෙත් වතු හැටියට පැවතුනු එහෙත් දැන් සාමූහික අයිතියට අයත් කෙත් වතු වලින් ඔව්හු හොරකම් කල බව මා හට පැවසුවෝය. අනතුරුව ඔවුන්ගේ හොරකම වසාගැනීමට ඔව්හු බොරුකීව්වෝය.

කර්මාන්ත ශාලා තුල පවතින තර්ජනකාරී වතාවරණය ගැන කම්කරුවෝ කථාකලහ. තවද ධනවාදී රටක පෙර නොපවතින අන්දමට, සිහිනෙන්වත් නොසිතූ අන්දමට ශ්‍රම බලය සූරාගනු ලැබීම පිළිබඳව ඔව්හු මා හට පැවසුවෝය. මේ සේවකයින්ට වැඩවර්ජනය කිරීමට අයිතියක් නැත.

බුද්ධිමතුන්ට තමුන්ගේ ඇතුලාන්ත හැඟීමට පටහැනිව දෙවිකෙනෙක් නොමැතිබව ඉගැන්වීමට සිදුව තිබේ.

ලොව 1/3ක සෙනගගේ සමස්ත ජීවිතයම සහ සිතුවිලි විනාශකර හෝ බොරුවෙන් පුරවා හෝ තිබේ. අදද, මෙලෙස සීමා පනවා ඇති ජාතීන් තුල මෙය සිදුවේ.

කොමියුනිස්ට් තරුණ සංවිධානයට තරුණ ගැහැණු ළමයින්ව කැඳවා ඔවුන්ට තදින් අවවාද කල බවත් කිතුණුවෙකු වු පිරිමි ළමයෙකු ඔවුන්ව සිපගත් නිසා ඔවුන් විසින් තවත් ඔවුන්ට ඉදිරිපත් කරන නමක් තිබෙන අයෙකුව සිපගතයුතු යැයි තර්ජනය කල බව පැමිණිලි කරන්නට මා වෙත පැමිණියෝය.

මේ සියල්ලම අතිශයින්ම වැරදි හා කැත චෝදනාවේ.

රහසිගත සභාවේ මා සමග සිට සටන් කල දීර්ඝ කාලයක් මුළුල්ලේ මාගේ සහෝදරයෙකුව සිටි අයව මම හමුවුනෙමි. ඔවුන් අතරින් සමහර දෙනෙක්ව දැනටමත් අත්අඩංගුවට ගනුලැබ නොතිබු අතර තවත් අයව සිරගෙයින් නිදහස් කල පසු නැවතත් සටන් බිමට පිවිස සිටින අයවළුන්ව සිටියෝය. ඔව්හු මා කැඳවා ඔවුන් සමග සටන් කරන්නට පිවිසෙන්න යැයි කීවෝය. මම ඔවුන්ගේ රහසිගත රැස්වීම් වලට සහභාගිවුනෙමි. එහිදී ඔව්හු අතින් ලියන ලද ගීතිකා පොත් රැගෙන ගායනා කලෝය.

මට මහා ශාන්ත ඇන්ටනීව සිහිපත් විය. ඔහු 30 වසරක් කාන්තාරයේ සිටියේය. ඔහු ලෝකයෙන් පිටව ගොස් සිටියේය. ඔහු ඔහුගේ මුළු ජීවිතයම නිරාහාරයෙන් යාච්ඤාකලේය. එහෙත් ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය පිළිබඳව ශුද්ධවු ඇතනිසියස් සහ එරියස් අතර සටන් ගැන අසන්ට ලැබු කල ඔහුගේ තපස් ජීවිතය අතහැර ඇලෙක්සැන්ඩ්‍රියාවට පැමිණි ඔහු සත්‍ය ජයගැනීමට උදව්කලේය. මට ක්ලෙයාර්වොක්ස්හි ශුද්ධවු බර්නාඩ් තුමා සිහිපත්වේ. එතුමා කඳුකරයේ උසස් ස්ථානයක ජීවත්වු තපස්වරයෙකි. ඔහු කුරුස යුද්ධවල මෝඩකම පිළිබඳව ඇසු විට, කිතුණුවන් හිස්වු සොහොනක් දිනාගැනීමට තවත් ඇදහිල්ලක සිටින ඔවුන්ගේ සහෝදරවරු සහ අරාබිවරු හා යුදෙව්වරුන්ව මරාදමන බව ඔහුට අසන්ට ලැබුනු විට, ඔහු ඔහුගේ තාපසාරාමයෙන් පිටවී අවුත් කුරුස යුද්ධ වලට විරුද්ධව දේශනාකලේය.

සියලු කිතුණුවන් කල යුතුවු දෙය කිරීමට මම තෝරාගත්තෙමි. ක්‍රිස්තුස්වහන්සේගේ ආදර්ශය අනුගමනය කිරීමට මම තෝරාගත්තෙමි. අපොස්තුළුවර පාවුල් හා ශ්‍රේෂ්ඨ ශුද්ධවන්තයින්ගේ ආදර්ශය අනුගමනය කොට විශ්‍රාමිකව සිටිමේ තිරණය ඉවත්කොට සටන් කිරීමට තෝරාගත්තෙමි. එය කුමන ආකාරයක සටනක්ද?

සිරගෙය තුල සිටින කිතුණුවන් සැමවිටම ඔවුන්ගේ සතුරන් වෙනුවෙන් යාච්ඤාකලෝය. ඔවුන් වෙත අලංකාර සාක්ෂියක් සපයා දුන්නෝය. අපගේ සිත්වල පවතින ආශාව විය යුත්තේ ඔවුන්ද ගැලවෙන්ට ඕනෑ බවයි. එය සිදුවන අවස්ථාවලදී අපි ප්‍රීතියට පත්විමු. එහෙත් මම නපුරු කොමියුනිස්ට් ක්‍රමයට වෛරකරන්නෙමි. රහසිගත සභාව ශක්තිමත් කිරීමට බලාපොරොත්තුවිමි. මේ භයංකර දුෂ්ට පාලනය පෙරලා දැමිය හැකි එකම බලවේගය ශුභාරංචියේ බලය පමණකි.

මම රුමේනියාව පිළිබඳව පමණක් කල්පනා නොකෙලෙමි. කෙසේ වෙතත් මට බටහිර රටවල් තුල මේ පිළිබඳව බොහෝ නොසැලකිලිමත්විම් හමු වී ඇත.

ලොව පුරා ලේඛකයෝ කොමියුනිස්ට් ලේඛකයින් දෙදෙනෙකු වු විනියව්ස්කි සහ ඩැනියෙල් යන අයව ඔවුන්ගේ පක්ෂයේ සහෝදරවරුන් විසින්ම සිරගතකරන ලද අවස්ථාවේදී විරෝධය පෑහ. ඒහෙත් කිසිදු සභාවක් ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් කිතුණුවන්ව සිරගත කරන ලද අවස්ථාවේදී විරෝධය නොපෑවෝය.

සිරගත කරන ලද සහෝදර කුෂ්න් ගැන සැලකිල්ල දැක්වුයේ කවුද? බයිබලයේ කොටස් සහ ටෝරිගේ නමස්කාරමය පොත් ඇති වැනි "විෂ සහිත" ක්‍රිස්තියානි පොත පත බෙදා හැරිමේ වරදට ඔහුව සිරගත කරන ලදි. මුද්‍රිත දේශනා බෙදාහැරිමේ වරදට සහෝදර ප්‍රොකොපිට් හට සිර දඩුවම් දීම පිළිබඳව දන්නේ කවුද? රුසියාවේදී ඒ හා සමාන වරදකට සිරදඬුවම් දෙන ලද හේබ්‍රව් කිතුණුවකු වු කෲස් වෝල්ස් ගැන දන්නේ කවුද? තවද කොමියුනිස්ට්වරු ඔහුගේ දරුවාගේ ජීවිතය ඔහු කෙරෙන් පැහැරගත් බව දන්නේ කවුරුන්ද? මාගේ මිහායි කෙරෙන් මාව ඉවතට ගනු ලැබු අවස්ථාවේ මට දැණුනු හැගීම් මම දනිමි. මම සහෝදර කෲස් වොල්ස් සමග සහ ඉවැතේස්තෝ, ග්‍රුකී ෂෙව්ජුක්, ටාජියා ටිකවෙස්කෝ, එක්මරීනා වෙකසිනා, ජෝර්ජි

ටෙක්සෙන්ටිස් සහ ලැම්බියාවේ පයිලට් යුවල සහ යනාදී වශයෙන් වූ අය සමඟ පීඩා වින්දෙමි. මේවා ශුද්ධවන්තයින්ගේ නම් හා 20 වෙනි ශත වර්ෂයේ ඇදහිල්ලේ වීරයන්ගේ නම්ය! මම දණ ගසා ඔවුන්ගේ දම්වැල් සිපගත්තෙමි. මුල් කිතුණුවන් ඔවුන්ගේ සහයක ඇදහිලිවන්තයින් වන මෘගයින්ට විසි කල අවස්ථාවේදී ඔවුන්ගේ දම්වැල් සිපගත්තාක් මෙන් මම එය කලෙමි.

සමහර බටහිර සභා නායකයින් ඒ පිළිබඳ සැලකිල්ල නොදක්වයි. ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ නම් ඔවුන්ගේ ලේඛන තුල නැත. ඔවුන්ට පීඩාකරනු ලබන විට සහ ඔවුන්ව සිරගත කරනු ලබන විට ඔවුන්ව ප්‍රතික්ෂේප කොට පාවා දුන්නාවූ බැප්ටිස් සහ ඕර්තඩොක්ස් සභා වල නිල නායකයින් නව-දිල්ලියේදී හා ජිනිවා වලදී සහ වෙනත් සම්මේලන වලදී මහත් ගෞරවයක් ලබා ගත්තාහ. රුසියාවේ සම්පුර්ණ ආගමික නිදහස තිබෙන බව ඔව්හු අන්‍යයන්ට තහවුරු කලෝය.

බොල්සොවික් අග්‍ර-රාජගුරු ප්‍රසාදී නිකොඩිම් මේ සහතිකය දෙනවිට ලෝක සභා සම්මේලනයේ නායකයෙකු ඔහුව සිපගත්තේය. ලෝක සභා කවුන්සිලය යන නම ආරූඪ කරගනිමින් ඔහු එකිනෙකාට භෝජන සංග්‍රහ පැවැත්වූහ. ශුද්ධවන්තයින් සිරගෙය තුල තම ශරීරයෙන් නික්මෙන අපවිත්‍රදේ සමඟ ගෝවා කමින් සිටියදී ඔහු එසේ කලෝය. මම ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ආහාර ලෙස ගත්තේ ඒවාය.

මේවා මෙලෙසම පැවතිය නොහැකිවුනි. හැකියාවක් ලැබී තිබුනු නිසා මම රටින් පිටවිය යුතුයැයි රහසිගත සභාව තීරණය කලාය. එසේ ගොස් සිදුවන දේ පිළිබඳ බටහිර රටවල කිතුණුවන්ව දැනුවත්කල යුතු බව දැන්නුවාය.

මම කොමියුනිස්වරුන්ට ප්‍රේමකලද කොමියුනිස්ට්වාදය ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර ඇත්තෙමි. කොමියුනිස්ට්වාදය ප්‍රතික්ෂේප කිරීමකින් තොරව ශුභාරංචිය දේශනාකිරීමට මට අයිතියක් ඇතැයි නොසිතමි.

සමහරු මා හට මෙසේ පවසති. "පිරිසුදු ශුභාරංචිය පමනක් දේශනාකරන්න." මෙයින් මට මතක් වන්නේ කොමියුනිස්ට්වාදය ගැන සඳහන් නොකොට ක්‍රිස්තුස්වහන්සේව පමණක් දේශනාකරන ලෙස කොමියුනිස්ට් රහස් පොලිසිය මට කිවාවු දෙයයි. එය එසේ නම්

"පිරිසිදු ශුභාරංචියක්" යනුවෙන් හඳුන්වනු ලබන දේ සඳහා කථාකරන අය කොමියුනිස්ට් රහස් පොලිසිය මෙන්ම එම ආත්මයෙන්ම අනුභාවය ලැබුවෝද?

මේ ඊනියා පිරිසිදු ශුභාරංචිය යනු කුමක්දැයි නොදනිමි. යොහාන් බව්තිස්තගේ දේශනා මෙලෙස පිරිසිදු විද? ඔහු "පසුතැවිලි වෙන්න. දේව රාජ්‍ය අතළඟය! (මතෙව් 3:2) යන්න පැවසුවා පමණක් නොව ඔහු හෙරෝද් කල සියලු නපුරු දේ වලට (හෙරෝද්ට) දෝෂාරෝපනය කලේය" (ලූක් 3:19). ඔහුගේ හිස ගසා දමන ලද්දේය. සංෂිප්ත දේශනාවලට ඔහු සීමා නොවීම හේතුකොටගෙනය යේසුස්වහන්සේ කන්ද උඩ දේශනාවේදී "පවිත්‍ර" දේශනා පමණක් නොකලේය. උන්වහන්සේ සමහර සභා නායකයින් විසින් ඍෘණාත්මක දේශනා යැයි හඳුන්වනු ලබන ඒවාද කලෝය. "ලියන්නනි, ඵරිසිවරුනි, වංචාකාරයෙනි නුඹලාට දුක්වේ! ......... සර්පයෙනී පොලොංවංශය නුඹලාට දුක්වේ!" (මතෙව් 23:27, 33). උන්වහන්සේව කුරුසිපත් කරන ලද්දේ මේ "අපවිත්‍ර" දේශනා හේතුකොටගෙනය. ඵරිසිවරු කන්ද උඩ දේශනා ගැන කරදර වන්නට යෙදුනේ නැත.

පාපය එහි නමින්ම ඇමතිය යුතුය. කොමියුනිස්ට්වාදය වර්තමාන ලෝකයේ පවතින ඉතාමත් භයානක පාප වලින් එකකි. කොමියුනිස්ට්වාදය ප්‍රතික්ෂේප නොකරන ශුභාරංචිය පවිත්‍ර ශුභාරංචිය නොවේය. ජීවිතය හා නිදහස අවදානමට ලක්කරමින් රහසිගත සභාව එය ප්‍රතික්ෂේපකරයි. බටහිර සිටින අපි ඊට වඩා අඩුවෙන් නිශ්ශබ්දව සිටිමු.

මම කොමියුනිස්ට්වාදය ප්‍රතික්ෂේපකරන්ට තීරණය කර ඇත්තෙමි. එසේ කරනුයේ "කොමියුනිස්ට් විරෝදින්" යැයි තමන්ව නම්කරගත් අය එය කරන ආකාරයට නොවේ හිට්ලර්ද කොමියුනිස්ට් විරෝදියෙකු වු අතර භයංකර පුද්ගලයෙක් විය. අපි පාපයට වෛර කොට පව්කාරයාට ප්‍රේමකරමු.

## *බටහිර රටවල් තුලදී මම වේදනා වින්දේ මන්ද?*

කොමියුනිස්ට් රටවලදී මම වේදනා වින්දාට වඩා බටහිර රටවල් තුලදී මම වේදනා විදිමි.

මගේ වේදනා විදිමට අන්තර්ගත වන්නේ පළමුවෙන්ම රහසිගත සභාවේ කිව නොහැකි අලංකාරත්වය කෙරෙහි මා දක්වන අතිශය

ආශාවයි. මෙම සභාව පැරණි ලතින් කියමනක්වූ **Nudisnudum Christi Sequi** – නියුඩිස්නියුඩිම් ක්‍රිස්ට් සෙක්වි – "නිරුවත්ව නිරුවත් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කරන්න" යන්න සම්පූර්ණ කරන සභාවයි.

වහල් ජාතීන් තුල මනුෂ්‍ය පුත්‍රයා සහ උන්වහන්සේට අයත් අයවළුන් හට හිස සනසවන්නට තැනක් නැත. බොහෝ කිතුණුවන් තමුන්ට නිවාස ඉදිනොකරති. කුමන යහපතක් සඳහාද? ඔවුන්ගේ ප්‍රථම අත්අඩංගුවට ගැනීමේදීම ඒවා රජයට පවරාගනිති. ඔබට අළුත් නිවසක් තිබීම ඔබව සිරගත කරනු ලැබීමට මහත් පෙළඹීමක් ඇතිකරන සාධකයක් වන්නේය. ඒ මන්දයත් ඔබගේ නිවස පැහැර ගැනීමට බලාසිටින තැනැත්තන් සිටින බැවිනි. එහිදී ඔබට ඔබගේ පියාව වළලන්නට ඉඩ නොලැබෙන්නේය. ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීම පිණිස ඔබගේ පවුලෙන් සමුගැනුමට වදනක් පැවසීමට ඉඩක් නොලැබෙන්නේය. ඔබගේ මව, ඔබගේ සහෝදරයෝ, ඔබගේ සහෝදරිය කවුරුන්ද? මේ සම්බන්ධයෙන් දෙවියන්වහන්සේගේ කැමැත්ත ඉෂ්ටකිරීම සඳහා පමණකි. ස්භාවික සම්බන්දතා හා සමාන ලෙස නිතරම මනාලයා මනාලියව ප්‍රතික්ෂේපකරන විට, දරුවන් දෙමව්පියන්ව ප්‍රතික්ෂේපකරන විට, භාර්‍යාවන් ස්වාමිපුරුෂයන්ව ප්‍රතික්ෂේපකරන විට ගණන් ගත හැක්කේ තවදුරටත් ආත්මික සම්බන්ධතා පමණකි.

රහසිගත සභාව දිළිදු එකකි. පීඩා විඳින සභාවකි. එහෙත් එහි මලානික සාමාජිකයින් ඇත්තේ කීපදෙනෙක් පමණකි.

රහසිගත සභාවල ආගමික දේව මෙහෙයන් අවුරුදු 1900 කට ප්‍රථම මුල් සභාවේ පැවතුනාක් මෙන් පැවැත්වේ. දේශකයා සවිස්තරාත්ම දේව ධර්මය නොදනී. පේත්‍රුස්ද දේශනා ශිල්පය නොදැන සිටියාක් මෙන් ඔහු ද දේශනා ශිල්පය නොදනී. පෙන්තකොස්ත දවසේදී පෙත්‍රුස් කලාවූ දේශනාවට දේව ධර්මය පිළිබඳ ඔනෑම මහාචාර්‍යවරයෙක් දෙන්නේ සුළු ලකුණු සංඛ්‍යාවකි. බොහෝ රටවල මනුෂ්‍යයන් බයිබලීය පද හොඳින් දන්නේ නැත. ඒ මන්දයත් බයිබල් ගෙන ඒමට අවසර නොලැබෙන බැවිනි. ඊට අතිරේකව දේශකයා බයිබලයක් නොමැතිව සිරගෙය තුල බොහෝ කාලයක් ගතකර තිබෙන අයෙකි. ඔහු පියාණන්වහන්සේ තුල තමන්ගේ ඇදහිල්ල ප්‍රකාශකරන විට එහි අර්ථය එය පිටුපස පවතින බලය තහවුරු කිරීම හේතුකොටගෙන එය පවසන දෙයට බොහෝකොට වැඩි වූ අර්ථයකි. සිරගෙය තුලදී ඔව්හු දිනපතා පියාණන්වහන්සේගෙන් පාන් ඉල්ලා සිටිති. ඒතාක් ඒ වෙනුවට ඔවුන්ට

ලැබෙන්නේ කිවනොහැකි තරම් අපවිත්‍ර දේවල් සමඟ ගෝචාය. එය කෙසේ වෙතත් ප්‍රේමනීය පියෙකු ලෙස ඔව්හු දෙවියන්වහන්සේව විශ්වාස කරති. එය හරියට දෙවියන්වහන්සේ ඔහුව මරා දැමුවත් යෝබ් උන්වහන්සේ තුල විශ්වාසය තබන බව පැවසුවාක් මෙනි. ඔවුන් හරියට පියාණන්වහන්සේ කුරුසිය මත දී යේසුස්වහන්සේව අත් හැරියාක් මෙන් පෙනෙන විට පවා දෙවියන්වහන්සේට "පියාණන්" යනුවෙන් යේසුස්වහන්සේ ඇමතුවාක් මෙන් ක්‍රියා කලේය.

රහසිසත සභාවේ ආත්මික අලංකාරත්ව දන්නාවු තැනැත්තෙකුට සමහර බටහිර සභාවල පවතින හිස්භාවයෙන් තෘප්තියට පත්විය නොහැක.

කොමියුනිස්ට් සිරගෙය තුල සිටිනවාට වඩා බටහිර රටවලදී මම බොහෝ කොට වේදනා වින්දෙමි. එයට හේතුව වුයේ බටහිර ශිෂ්ටාචාරය මිය යමින් සිටින බව මම මාගේ ඇස් දෙකෙන්ම දකින නිසාය.

ඔස්වල්ඩ් ස්පෙන්ඩ්ලර් "බටහිරෙහි ඇදවැටීම" යන පොතෙන් මෙසේ ලිව්වේය.

> "ඔබ මිය යමින් සිටින්නෙහිය. ඔබ තුල කුණුවීමේ ලකුණු සියල්ලම මම දකින්නෙහිය. ඔබගේ මහා ධනය හා මහා දිළිදුකම, ඔබ ධනවාදය හා සමාජවාදය ඔබගේ යුද්ධ සහ විප්ලවයන්, ඔබගේ අදේවවාදය ස්වභාවය, ඔබගේ දුෂ්චරිතවත්භාවය, ඔබගේ බිඳවැටුනු විවාහ, ඔබගේ උපත් පාලනය මට දකින්නට පුළුවන. ඒවා පත්ලේ සිට ලේ ගැලීම ඇතිකරයි. ඔබගේ හිස මුදුනේ දක්වා ඔබව මරාදමයි. – පැරණි රාජ්‍යයක්වු ඇලෙක්සැන්ඩ්‍රියාව, ග්‍රීසිය හා පිස්සු වැටුනු රෝමය වැනි පැරණි රාජ්‍යයන්ගේ මරණයේ යුගයන්හිදී දක්නට ලැබුනු සියලු අංග ලක්ෂණ ඔබට ද ඇති බව මට සනාථකල හැක."

මෙය ලියන ලද්දේ 1926 දීය. එතැන් පටන් ප්‍රජාතන්ත්‍රවාදය හා ශිෂ්ටාචාරය යුරෝපය තුල අඩකින් දැනටමත් මරණයට පත්වී ඇති අතර එය කියුබාව දක්වා පැතිරගොස් තිබේ. බටහිරෙහි බොහෝ දෙනෙකු නිදාගෙන සිටිති.

එක් බලවේගයක් නොනිදා සිටිති. පෙරදිගදී කොමියුනිස්ට්වරු බලාපොරොත්තු කඩවී ඔවුන්ගේ සිහින විනාශවී ගොස් සිටිති. බටහිරදී

මානවවාදී කොමියුනිස්ට්වාදයක් බොහෝ විෂ සහිතව තවමත් සිටිති. බටහිරදී මානවවාදීන් කොමියුනිස්ට්වාදීන් කොමියුනිස්ට් රටවල් වල සිදුවූ පීඩාවේ කෲරතරභාවය සහ දුක්බදායකභාවය පිළිබඳව කරන ප්‍රවෘත්ති සියල්ල විශ්වාස නොකරති. ඔව්හු ඔවුන්ගේ ඇදහිල්ල වෙහෙසක් නොබලන ජ්වලිතකමකින් යුක්තව දසත පතුරුවති. ඔව්හු ඉහළ පන්තිකයන්ගෙන් සැදුම් ලත් සමාජයක් තුල, බුද්ධිමතුන්ගේ සමාජශාලා තුල, විද්‍යාල තුල, මුඩුක්කු තුල, සභාවන් තුල මේවා පතුරුවති. කිතුණුවන්වූ අපි සැබෑ සත්‍ය පැත්තට අඩක් පමණක් විවෘතවුනු හදවත් ඇතිව නිතරම සිටිති. ඔව්හු බොරුවට සම්පූර්ණයෙන් විවෘතවුනු හදවත් සහිතව සිටිති.

> කිතුණුවන් නිතරම සම්පූර්ණ සත්‍යතාවය කෙරෙහි අඩක් පමණ විවෘතවුනු සිත් ඇතිව සිටිති. කොමියුනිස්ට්-වරු බොරුව කෙරෙහි සම්පූර්ණයෙන් විවෘතවුනු සිත් ඇතිව සිටිති.



මේ අතර බටහිර දේවධර්මඥයින් නොවටිනා දේ ගැන සාකච්ඡා කරති. එය මට පහත සදහන් දේ සිහිපත් කරවයි. 1493 දී 2 වැනි මොහොමඩ්ගේ හමුදාවන් විසින් කොන්ස්තන්තිනෝපලය වටකරන විට තීරණය කල යුතුව තිබුනේ බෝල්කන් රාජ්‍යයන් කිතුණුවන් යටතේ තැබිය යුතුද, මුස්ලිම්වරුන්ගේ පාලනය යටතේ ශතවර්ෂ ගණනක් තිබියයුතුද යන්නයි. එහෙත් වටලනු ලැබූ නගරයේ ස්ථානීය සභා කවුන්සලය පහත සඳහන් ප්‍රශ්න ගැන සාකච්ඡාකරමින් සිටියෝය. කන්‍යමරියාවගේ ඇස් වල වර්ණය කුමක්ද? දේව දුතයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය කුමක්ද? ශුද්ධවූ ජලයට මැස්සෙකු වැටුණු විට මැස්සා ශුද්ධවන්නේද? ජලය අපවිත්‍රවන්නේද? මෙය ඒ කාලය සම්බන්ධව පැවසෙන ජනකථාවක් පමණක් වුවත් වර්තමානයේ සභා සගරාවන් කියවන විටද තත්වය මෙයම බැව් ඔබට හැඟෙනු ඇත. මේවායේ සාකච්ඡාකරන ප්‍රශ්නද මේ හා සමාන බව

පෙනේ. පීඩාකරන්නන්ගේ අනතුරුදායක තත්වය සහ රහසිගත සභාවේ පීඩාවන් ගැන සඳහන්වන්නේ ස්වල්පවශයෙනි.

ඒවායෙහි දේවධර්මික කරුණු සම්බන්ධයෙන් කෙලවරක් නැති සාකච්ඡාවන් අඩංගුවේ. චාරිත්‍ර විදි සහ අනවශ්‍යය දේවල් පිළිබඳව කෙලවරක් නැති කරුණු අඩංගුවේ.

ප්‍රිය සම්භාෂණයකදී යමෙකු මෙසේ අසන්නට පුළුවන "ඔබ නැවක සිටියේ නම් ඒ නැව ගිලුනේ නම් ඔබට කිසිදු මනුෂ්‍යයෙකු නැති දූපතකට බේරී යන්නට හැකිවුනේ නම් කැමති පුස්තකාලයෙන් එක පොතක් පමණක් ගෙන යන්නට ඔබට හැකියාවක් ලැබෙන්නේ නම් ඔබ තෝරාගත්තේ කුමක් දැයි" යමෙකු ප්‍රශ්න කරන්ට පුළුවන. "බයිබලය" යැයි තවත් යමෙකු පිළිතුරු දෙන්ට පුළුවන. වෙනත් අයෙකු "ෂේක්ස්පියර්ගේ පොතක්" යැයි කියන්නට පුළුවන. එහෙත් ලේඛකයෙකුට නිවැරදි පිළිතුර ඇත්තේය. "බෝට්ටුවක් හදන ආකාරය මට උගන්වන පොතක් මම තෝරා ගතිමි. එවිට මම ගොස් ගොඩබිමට ගිය විට මට කියවන්ට පුළුවන."

සියලු නිකායන් සඳහා නිදහස පවත්වාගැනීම පිණිස සහ සියලු දේවධර්මයන් සඳහා නිදහස පවත්වාගැනීමටත් බහුල ලෙස පැතිරී පවතින ආගමික පීඩනයෙන් නැතිවී, ගිය දෙය නැවත ලබාගැනීමටත් එක් දේවධර්මික මතයක් කෙරෙහි එල්බගෙන සිටීම වඩා වැදගත්ය.

"සත්‍යතාවය නුඹව නිදහස්කරන්නේය" (යොහාන් 8:32). යේසුස්වහන්සේ පැවසුසේක. එතාක් එම නිදහසට පමණක් සත්‍යතාවය ලබාදිය හැකි එකම නිදහසවන්නේය. නොවැදගත් දේ පිළිබඳව වාද විවාද කරනවා වෙනුවට මේ ලෝකය තුල සිටින භයංකර අයට විරුද්ධව නිදහස තකා සටන්කරන්නට අපි එකතු විය යුතුය.

වහල් ජාතීන් තුල සභාවන්ගේ පීඩා විඳීම වැඩිවීම පිළිබඳව බෙදාගැනීම කරනකොටගෙන පවා මම පීඩාවිඳිමි. මේකි පීඩාවන් තුලින් ගමන් කිරීම නිසා මට ඒවා තේරුම් ගත හැක.

1966 ජුනි මාසයේදී සෝවියට් ප්‍රවෘත්ති පත්‍ර වූ ඉස්වෙස්ටියා සහ ඩර්වෙන්ස්තායිස් පීසන් යන පත්‍ර රුසියානු බැප්ටිස්ට්වරුන්ට මෙවැනි චෝදනාවක් ඉදිරිපත් කලේය. ඔවුන්ගේ සාමාජිකයින් පව්වලට

සමගිකිරීමක් පිනිස දරුවන් මරාදමනු ලබන බවයි. එය යුදෙව්වන්ට විරුද්ධව ප්‍රයෝජනයට ගනු ලැබූ චාරිත්‍රමය මිනිමැරුම් සම්බන්ධවූ පැරණි චෝදනාවකි.

එහෙත් මම මෙහි අර්ථය කුමක් දැයි දනිමි. 1959 දී ගැහැණු ළමයෙකුව මරාදැමීම ගැන චෝදනා ලබා සිටි ලැසරෝවිකී නැමති සිරකරුවෙකු සමග මම ක්ලූජි බන්ධනාගාරය තුල සිටියෙමි. ඔහු වයස අවුරුදු 30ක පුද්ගලයෙක් විය. එහෙත් ඔහු විඳි පීඩා හේතුකොටගෙන ඔහුගේ හිසකෙස් එක් රාත්‍රියකදීම සුදු පැහැයට හැරුනි. ඔහු මහලු මනුෂ්‍යයෙකුසේ පෙනුනි. ඔහු නොකලාවූ අපරාධයක් ගැන ඔහුගෙන් පාපොච්චාරණයක් ලබා ගැනිම පිනිස ඔහුගේ නියපොතුද උගුලාදමන ලදි. වසරක් වධබන්ධන වලට ලක් කිරීමෙන් පසුව ඔහුගේ අහිංසකභාවය තේරුම්ගෙන ඔහුව නිදහස්කරන ලදි. එහෙත් නිදහස තවදුරටත් ඔහුට තේරුමක් ඇති දෙයක් නොවේ. ඔහු සදහටම බිඳුණු මනුෂ්‍යයෙකුවිය.

කොමියුනිස්ට් යුගයේදී බැප්ටිස්ට් වරුන්ට විරුද්ධව සොවියට් ප්‍රවෘත්ති පත්‍ර කලා වු මෝඩ චෝදනාව ගැන අන්‍යයෝ එය කියවා එයට සිනාසුනහ. මේ චෝදනාවේ අර්ථය කුමක් දැයි මම දනිමි.

බටහිර රටවල් තුල මෙසේ වීම කණගාටුදායකය. ඔබගේ ඇස් ඉදිරියෙහි එබදු ප්‍රතිරූපයක් නිරන්තරයෙන් පැවතීම කණගාටුදායකය.

සෝවියට් දේශයේ කලූගාහි ආච්බිෂොප් යෙර්මෙගන් සිදුවූ දෙය සහ පාරිදර්ශක ඇලෙක්සි සහ ආච්බිෂොප් නිකොඩිම් යන අය විසින් ක්‍රියාවේ යොදවන ලද සෝවියට් රාජ්‍යයට අතිශයින්ම සහයෝගයක් දැක්වූ ක්‍රියාවලියට විරෝධය පලකරන ලද අනිත් බිෂොප්වරු 7 දෙනාට සිදුවුයේ කුමක්ද? මෙහි පාරිදර්ශකවරයා ආච්බිෂොප්වරයාත් කොමියුනිස්ට්වාදයේ අතකොළු විය. රුමේනියාවේ සිරගෙය තුලදී මා අසල මෙකී විරෝධය දැක්වූ බිෂොප්වරු මියගිය බව මා නොදන්නේ නම් මම මේ දේවභක්තික බිෂොප්වරු පිළිබඳව සැලකිල්ලක් නොදක්වන්නට ඉඩ තිබිනි.

නිකොලායි එක්ලිමාත් සහ ග්ලෙබ්යකුනින් වැනි දේවගැතිවරු සභාව සඳහා ආගමික නිදහසක් බලා සිටි බැවින් පාරිදර්ශකවරයා විසින් විනයානුකූල හික්මවීමකට යොමුකරන ලදි. බටහිර රටවල් මේ පිළිබඳව දන්නේ මෙපමණකි. එහෙත් මම රුමේනියාවේ ව්ලැඩිමිරෙස්ව්හි ඉයෝආන් පියතුමා සමග සිරගෙයි සිටියෙමි. ඔහුටද සිදුවී තිබුනේ එම

දෙයමය. මතු පිටින් පෙනෙනුයේ එය පුජකමය "විනයානුකුල හික්මවීමක්" ලෙසටය. එහෙත් කොමියුනිස්ට් රටවල නිල සහා නායකයින් බොහෝ දෙනෙක් මෙන් අපගේ නිල සහා නායකයින් ද රහස් පොලිසිය සමඟ අතිනත ගෙන වැඩ කරමින් සිටියෝය. එලෙස විනයානුකුල හික්මවීමකට ලක්කල තැනැත්තන් ඔවුන් විසින් වඩා කාර්‍යක්ෂම "විනයානුකුල හික්මවිමකට" ද ලක්කරනු ලැබුවේ – වධබන්ධන, පහරදීම්, මත්ද්‍රව්‍ය ශරීරගතකිරීම ද කරමින් – සිරකරුවෙකු ලෙස රඳවාගනිමිනි.

විවිධ රටවල එලෙස පීඩාවට පත්කල අපගේ වේදනා විඳීම් හේතුවෙන් මම වෙව්ලීමට පත්වුනෙමි. ඔවුන්ගේ වධබන්ධන කරන්නන්වුන්ගේ සදාකාලික ඉරණම පිළිබඳව මම වෙව්ලමින් සිටියෙමි. ඔවුන්ගේ පීඩාලත් සහෝදරයින්ට උපකාර නොකරන බටහිර රටවල කිතුණුවන් ගැන ද මම වෙව්ලුම් කෑමට පත්වුනෙමි.

මගේ හදවතහි ගැඹුරෙන් එබදු බරපතල සටනකට ඇතුල් නොවී මාගේ මිදිවත්තෙහි අලංකාරීත්වය පවත්වා ගැනිමට මම කැමති වුනෙමි. යම් ස්ථානයක තිබෙන නිශ්චලතාවය හා විශ්‍රාමයට මම බොහෝසෙයින් සතුටුවුනෙමි. එහෙත් එය කල නොහැකිව තිබුනි. කොමියුනිස්ට්වරු ටිබෙටය ආක්‍රමනය කල විට සම්පුර්ණයෙන්ම ආත්මික දේවල් සඳහා පමණක් උනන්දුව දැක්වු අයට ඔව්හු අවසානය ළඟාකරදුනි. අපගේ රටේ ද යථාර්තයෙන් තමුන්වම බැහැරකරගන්නාවු සියල්ලන්ට ඔව්හු අවසානය ළඟාකරදුනි. සභාවල සහ තාපසාරාම විසුරුවා හරින ලද අතර විදේශිකයින්ට රැවටිමට පමණක් අවශ්‍යවන ප්‍රමාණයට ඒවා පවත්වාගෙනයන ලදි. මම ආශා කල නිශ්චලතාවය හා විශ්‍රාමය යථාර්තයෙන් බේරී පලායාමක් වු අතර එය මාගේ ආත්මයට අනතුරුදායක විය.

මේ සටන මා හට ඉතාමත් භයානක වුවද මම ඒ සටනට නායකත්වය දුනිමි. ඔව්හු 1948 දී වීදියේදී මා අත්අඩංගුවට ගෙන ව්‍යාජ නාමයක් යටතේ මා සිරගතකොට තබන ලදි. එකල අපගේ රටෙහි සිටි රාජ්‍ය ලේකම්වරයා වු ඇනා පව්කර් ස්විඩන් තානාපතිවරයාවු සර් පැට්‍රික් වොන් රොයිටර්ස්වෝඩ් හට පවසා සිටියේ "වරම්බ්‍රාන්ට් දැන් කෝපන්හේගන්හි විදී දිගේ කථාකරමින් ඇවිදිමින් සිටී" යන වගයි. සිරගෙයින් මා පිට කොට රහසිගතවම පිටමංකිරිම සාර්ථකව සිදුකරනු බව දැන් වෙන මාගේ ලියුමක් ස්විඩන් ජාතික දේවගැතිවරයෙකු සමඟ තිබී හමු වු බව ඔහු පැවසීය. ඔහු බොරුවක් කී බව දැනසිටියේය. එබදු දේවල් ඉදිරියටත් සිදු වීමට ඉඩ තිබේ. මාව

මරාදමනු ලැබුවහොත් මිනීමරුවාව පත්කරනු ලබන්නේ කොමියුනිංට්වරුන් විසිනී. වෙනත් කිසිවෙකුට මාව මරා දැමීමේ අරමුණක් නොමැත. මාගේ සුචරිතවත්භාවයේ අඩුවක් පිළිබඳව යම් දුෂමාන අරංචියක් එනම් සොරකම් කිරීමක්, සමලිංගික සේවනයන්, කාමමිත්‍යාචාරයන්, දේශපාලනික වශයෙන් විශ්වාසයතැබිය නොහැකි කමක්, බොරු කීමක් හෝ වෙනත් කිසියම් දෙයක් පිළිබඳව ප්‍රවෘත්තියක් අසන්ට ලැබුවහොත් රහස් පොලිසිය කල තර්ජනය වු “අපි ඔබව සුචරිතය අතින් විනාශකරමු.” යන්න ඉෂ්ටවීමක් ලෙස එය සලකම්.

1960 ගණන් වල එක්සත් ජනපද සෙනෙට් සභාව ඉදිරියේ මා දුන් සාක්ෂියෙන් පසු රුමේනියානු කොමියුනිස්ට්වරු මාව මරාදැමීමට තිරණයකල බව හොඳින් තොරතුරු දන්නා මුලාශ්‍රයකින් මට දැනගන්ට ලැබිනි. එහෙත් මට නිශ්ෂබ්දව සිටිය නොහැක. ඔබගේ යුතුකම වන්නේ මම පවසන දෙය නිශ්චලව පරීක්ෂා කිරීමයි. මම යම් දෙයක් තුලින් ගමන් කලේ ඒ සියල්ලටම පසුව මම පීඩාවිඳීමේ සංකීර්ණයන් තුල දී දැරුවාවු වේදනා ගැන ඔබ සිතන්නේ නම් මෙවන් සංකීර්ණයන් තුල තම පුරවැසියන් වේදනා විඳීමට සලස්වනු පිනිස කොමියුනිස්ට්වාදයෙහි මෙකී භයංකර බලය පිළිබඳව ඔබ ඔබගෙන්ම ප්‍රශ්න කල යුතුය. කුමන බලයක් කොමියුනිස්ට් නැගෙනහිර ජර්මනියේ මනුෂ්‍යයින් සතුවිද කිවහොත් ඔව්හු බුල්ඩෝසරයක් තුල කුඩා ළමයෙකු තබා කටු කම්බි වැටක් තුලින් ඔහුව යවමින් ක්‍රියාකලේ එසේ නොකලහොත් පවුලම වෙඩි තබා මරාදමන අවදානමට ලක්කරමිනි.

බටහිර රටවල් නිදා සිටී. ඔව්හු වහල් ජාතින්ගේ තත්වය දැකීමට අවදිවිය යුතුය.

. . .

පීඩා විඳින මනුෂ්‍යයෝ නිතරම බිලි පුජාවකට දෙන මාළුවෙකු සොයයි. එසේ සොයනුයේ ඔවුන්ගේ දෝෂාරෝපණය ඔහු මත තැබීමටය. එබදු අයෙකු සොයාගතහොත් බර බොහෝ සෙයින් සැහැල්ලුවෙයි. මට එය කල නොහැක.

කිතුණුවන්ට වෛරකරන තැනැත්තන් සමග එකගතාවයකට එන්නාවු බටහිර රටවල වෙසෙන සභානායකයින් සමහරක් දෙනා මත මට වරද පැටවිය නොහැක. නපුර පැමිණෙන්නේ ඔවුන්ගෙන් නොවේ.

මේකී නායකයින් වඩා මහලු නපුරෙකුගේ ගොදුරක් බවට පත්වී තිබේ. ඔව්හු සභාව තුල බේදනීයතාවයක් නිර්මාණයකොට නොමැත. ඔවුන් එය සොයාගෙන ඇත.

බටහිර රටවල ගත කරන කාලය තුලදී මම බොහෝ දේවධර්මානුකූල සෙමනේරි බැහැ දුටුවෙමි. මම සීනු වල ඉතිහාසය පිළිබඳව දේශනා අසා ඇත්තාමි. භාවිතා නොකරන ලබන ධර්ම ව්‍යවස්ථාව පිළිබඳව ද අසා ඇත්තේමි. එසේ නැතහොත් මේ වන විට ක්‍රියාත්මකව නොපවතින්නාවූ සභා විනයක් පිළිබඳව ද අසා ඇත්තෙමි. එපමණක් නොව මැව්ල්ල පිළිබඳව බයිබලීය කථාව, ආදම් සම්බන්ධයෙන්, ජල ගැල්ම සම්බන්ධයෙන් හෝ මෝසෙස්ගේ හාස්කම් සම්බන්ධයෙන් බයිබලීය කථාවන් සැබෑ නොවන බව ඉගෙනගන්නාවූ දේවධර්ම විද්‍යාලීය ශිෂ්‍යයින් පිළිබඳව ද අසා ඇත්තෙමි.

සමහරු උගන්වනු ලබන්නේ අනාගත වාක්‍ය ලියා ඇත්තේ ඒවා සම්පූර්ණවූ පසුව බවයි. කන්‍යා උපත මිත්‍යාවක් බවයි. යේසුස්වහන්සේගේ නැවත නැගිටීම මිත්‍යාවක් බවයි. උන්වහන්සේගේ ඇටකටු තවමත් සොහොනක් තුල පවතින බවයි. යැවුම් පත්‍ර සැබෑ ඒවා නොවන බවයි. එළිදරව් පොත පිස්සු මනුෂ්‍යයෙකුගේ පොතක් බවයි. එසේ නොවුනා නම් බයිබලය ඇද්ධවූ පොතක් බවයි! (චීනයේ කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍රවල පවතින බොරු වලට වඩා වැඩි වශයෙන් බොරු අඩංගු යැයි කියනු ලබන ඇද්ධවූ පොතක් හැටියට මෙය හඳුන්වා දී තිබේ.)

වර්තමාන සභා නායකයින් සමහරක් දෙනා සෙමනේරි තුල සිටින විට ඉගෙන ඇත්තේ මෙවන් දෙයකි. ඔවුන් ජීවත්වන වාතාවරණය මෙයයි. මෙබදු අමුතු දේවල් පවසන ස්වාමියෙකුට විශ්වාසවන්ත වියයුත්තේ මන්ද? දෙවියන්වහන්සේ මරණයට පත්වී ඇතැයි නිදහසේ උගන්වනු ලබන සභාවකට සභා නායකයින් විශ්වාසවන්ත වියයුත්තේ මන්ද.

සමහර නිකාය වල නායකයින් ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය නොවෙති. බොහෝ කලක සිට ස්වාමියාව පවා දෙන ලද සභාවක නායකයින්ව ඔවුන් සිටිති. රහසිගත සභාවක ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු දුටු කල ඔව්හු අමුතු දෙයක් දුටුවාක් මෙන් බලති.

අපිට මනුෂ්‍යයෙකුගේ ආකල්පවල එක් පැත්තක් පමණක් බලමින් ඔහුව විනිශ්චය කරන්ට නුපුළුවන. අපි එසේ කලහොත් අපිද

එරිසිවරුන්මෙන් වනු ඇත. ඒ මන්දයත් ඔවුන්ගේ ඇස් වලින් යේසුස්වහන්සේද නරක අයෙකු මෙන් ඔවුන් දුටු නිසාය. ඒ මන්දයත් උන්වහන්සේ සබත පිළිබඳව ඔවුන්ගේ නිති රීති අනුගමනය නොකල නිසා එසේ ඔවුන් සැලකූ බැවිනි. ඔවුන්ගේ ඇස් හමුයෙහි යේසුස්වහන්සේ සහමුලින්ම ප්‍රේමණීය අයකු ලෙස දකින්ට ඉඩ කඩ අහුරමින් ඔවුන් ඔවුන්ගේ ඇස් සම්පූර්ණයෙන්ම වසා ගත් නිසා එය සිදුවිය.

කොමියුනිස්ට්වාදය කෙරෙහි වැරදි ආකල්පයක් ඇති සමහර සභා නායකයින් වෙනත් බොහෝ දේවල් කෙරෙහි නිවැරදිමෙන්ම පුද්ගලිකව අවංක වන්නටද ඉඩ ඇත. තවද ඔවුන් වැරදි ඇති දේවලදී ඔවුන්ට වෙනස්කරන්ට පුළුවන් බැවින් අපි ඔවුන් විනිශ්චය නොකල යුතුවෙමු.

වරක් මම රුමේනියාවේ ඕර්තඩොක්ස් බිෂොප්වරයෙකු සමඟ සිටියෙමි. ඔහු තමාගේම බැටළු රැල ප්‍රතික්ෂේප කල, කොමියුනිස්ට්වාදයේ මනුෂ්‍යයෙකු විය. මම ඔහුගේ අත ගෙන ඔහුට අකීකරු පුත්‍රයාගේ උපමාව පැවසුවේය. එය ඔහුගේ උද්‍යානයේදී එක් සංධ්‍යාවක සිදුවිය. මම මෙසේ පැවසුවෙමි. "ආපසු පැමිණෙන්නාවූ පව්කාරයෙකුට දෙවියන්වහන්සේ කොපමණ ප්‍රේමයකින් පිළිගන්නේද යන වග බලන්න" යැයි මම පැවසුවෙමි. "ඔහු බිෂොප්වරයෙකුව සිටියද ඔහු පසුතැවිලිවී ආපසු ආවොත් උන්වහන්සේ ප්‍රීතියෙන් පිළිගන්නේය" කියා මම පැවසුවෙමි. මම කිතුණු ගීතිකා ගැයුවෙමි. මේ මනුෂ්‍යයාගේ සිත හැරිනි.

තමාගේ නිදහස තකා අදේවවාදී දේශනයක් ලියූ ඕර්තඩොක්ස් පූජකයකු සමඟ මට සිරගෙය තුල එකට මැදිරියේ සිටියෙමි. මම ඔහුට කථාකල විට ඔහු ලිවූ ලියවිල්ල ඉරා දමා නිදහස නොලැබීමට ඇති අවදානමට මුහුණ දුන්නේය.

. . .

මට තවත් වේදනාවක් ඇත. ඒ ඉතා කිට්ටු මිතුරන් පවා මාව අවබෝධ කර නොගැනිමයි. සමහරු, මම කොමියුනිස්ට්වරු කෙරෙහි තිත්තකම හා වෛරය ඇතිව කථාකරන බවට මට චෝදනා කරති. එය සැබෑ නොවන බව මම දනිමි.

ඊශ්‍රායෙල් ජාතික ලේඛකයකු වූ ක්ලෝඩ් මොන්ට්පියරෝ එරිසිවරුන් හා ලියන්නන් හා සම්බන්ධ යේසුස්වහන්සේගේ ආකල්පයවූ, ප්‍රසිද්ධියේ

ඔවුන්ව ප්‍රතික්ෂේප කිරීම, උන්වහන්සේගේ සතුරන්ට ප්‍රේම කිරීම සම්බන්ධ ආඥාවට සහ අපට ශාප කරන්නවුන්ට ආශිර්වාද කිරීම යන ආඥාවට පටහැනි බව කියයි. ලන්ඩන් වල ශාන්ත පාවුල් විද්‍යාලයේ විශ්‍රාමික පීඨාධිපති වරයා වූ දේවධර්මාචාර්ය ඩබ්ලිව්. ආර්. මැතිව්ස් මෙය යේසුස්වහන්සේ තුල තිබූ නොගැලපෙන අස්ථිර දෙයක් බව පවසයි. යේසුස්වහන්සේ බුද්ධිමතකු නොවන බව ඔහු කාරනා වශයෙන් කියයි!

මොනිට්පියෙරෝගේ, යේසුස්වහන්සේ ගැන අදහස වැරදිය. යේසුස්වහන්සේ ඵරිසිවරුන්ට ප්‍රේම කරයි. උන්වහන්සේ ප්‍රසිද්ධියේ හෙලාදැක කථා කලද එය එසේ වේ. මම කොමියුනිස්ට්වරුන්ට සහ සභාව තුල ඔවුන්ගේ අත කොළු බවට පත්ව සිටින්නවුන්ට ප්‍රේම කරමි. ඔවුන්ව ප්‍රසිද්ධියේ හෙලා දුටුවද මම ඔවුන්ට ප්‍රේම කරමි.

නිතරම මා හට පවසනු ලබන්නේ "කොමියුනිස්ට්වාදය අමතක කර, ආත්මික දේ ගැන වැඩ කරන්න" යනුවෙනි.

නාසිවරුන් යටතේ පීඩා විදි අයෙකු මට මුණගැසී තිබේ. මම ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂිදරන විට ඔහු සම්පුර්ණයෙන්ම මාගේ පැත්තේ සිටින බව ඔහු මා හට පැවසුවේය. එහෙත් මම කොමියුනිස්ට්වාදයට විරුද්ධව වචනයක් වත් පැවසිය යුතු නොවේමි. මම ඔහුගෙන් මෙසේ ඇසුවෙමි. "ජර්මනියේදි නාසිවාදයට විරුද්ධව සටන් කල කිතුණුවන් වැරදිද? භයංකර හිට්ලර්ට විරුද්ධව වචනයක්වත් නොපවසා බයිබලයෙන් ගත්තාවූ කරුණු පමණක් පැවසීමට ඔවුන් සීමා විය යුතුද?" පිළිතුර වුයේ මෙයයි. "හිට්ලර් යුදෙව්වන් හැට ලක්ෂයක් මැරුවේය. ඔහුට විරුද්ධව කථාකරන්ට යමෙකු සිටිය යුතුය." මම ඔහුට මෙසේ පිළිතුරු දුන්නෙමි. "කොමියුනිස්ට්වරු රුසියානුවන් තිස් ලක්ෂයක් හා තවත් චීන ජාතිකයින් හා වෙනත් අය ලක්ෂ ගණනාවක් මරා දැම්මෝය. ඔව්හු යුදෙව්වරුන්ද මරා දැම්මෝය. අපි විරුද්ධත්වය දැක්විය යුත්තේ යුදෙව්වන්ව මරා දමන විට පමණක්ද? රුසියානුවන් සහ චීන ජාතිකයින් මරා දමන විට විරුද්ධත්වය දැක්විය නොයුතුද?" යනුවෙන් ඔහුගෙන් ප්‍රශ්න කලෙමි. ඔහුගේ පිළිතුර වුයේ "මෙය සම්පුර්ණයෙන්ම වෙනස් දෙයක්" බවයි. මට පැහැදිලි කිරීමක් නොලැබුනේය.

හිට්ලර්ගේ කාලයේදිද කොමියුනිස්ට්වරුන්ගේ කාලයේදිද පොලිසිය මට පහර දුන්නේය. එහි වෙනසක් දක්නට මට නුපුළුවන. ඒ දෙකම අතිශයින් වේදනාත්මකය.

කිතුණුවන් පාපයෙහි බොහෝ අංගෝපාංග වලට විරුද්ධව සටන් කල යුතුය. කොමියුනිස්ට්වාදයට පමණක් නොව, අන් අංශ වලට විරුද්ධවද සටන් කල යුතුය. අපි අවධාරණය කළ යුතු නොවේ. නමුත් කොමියුනිස්ට්වාදය ක්‍රිස්තියානියේ භයානක සතුරෙකි. ඉතා භයානක බලවත් සතුරෙකි. එයට විරුද්ධව අපි එක්සත් විය යුතුය.

මම එය නැවතත් පවසන්නද! මනුෂ්‍යයාගේ ඉහළිතම එල්ලය ක්‍රිස්තුස්වහන්සේ සමග සමාන වීමටය. මෙය වැලැක්වීම කොමියුනිස්ට්වරුන්ගේ පරම එල්ලයයි. ඔවුන් මූලිකව ආගම් විරෝධිය. මරණයෙන් පසු මනුෂ්‍යයා ලුනු හා බණිජ ද්‍රව්‍ය බවට පත්වන බව ඔවුන්ගේ විශ්වාසයයි. අන් කිසිවක් ඔවුන්ගේ විශ්වාසය නොවේ. ඔවුන්ගේ ආශාව මුළු ජීවිතයම පදාර්ථයෙහි මට්ටමට අනුව ජීවත් විය යුතු බවයි.

ඔවුන් දන්නේ ජනකාය පමණි. එය නව ගිවිසුමේදි යක්ෂයෙකුගෙන් ඔහුගේ නම කුමක්ද යැයි විමසූ විට යක්ෂයා කීවේ “අපි ලෙගියොන් වෙමු” යයි කියාය. දෙවියන්වහන්සේ මනුෂ්‍යය සංහතියට දුන් ශ්‍රේෂ්ඨ දීමනාව වන පුද්ගල පෞරුෂත්වය පාගා දැමිය යුතු බව ඔවුන්ගේ විශ්වාසයයි. ඇල්ප්‍රඩ් ඇඩ්ලර් ගේ “තනි පුද්ගලයකුයේ මානසික විද්‍යාව” යන පොතක් ඔවුන්ට හමුවු නිසා ඔවුන් එම මනුෂ්‍යයා සිරගත කලෝය. රහස් පොලිසියේ නිලධාරීන් මෙසේ පවසයි. “තනි පුද්ගලයා - සැම විටම තනි පුද්ගලයෙකි. ඔහුට සාමුහික විය නොහැක්කේ මන්ද?” යනුවෙන් ඔවුන් ප්‍රශ්න කරයි.

අපි පෞරුෂත්වයෙන් සමන්විත වීම යේසුස්වහන්සේගේ බලාපොරොත්තුවයි. එබැවින් කොමියුනිස්ට්වාදය සහ අප අතර කිසිදු අතරමැදි මට්ටමක එකඟතාවයක් ඇති විය නොහැක. කොමියුනිස්ට්වාදය එය දනී. “නෞකා යි රිලිජියා” (විද්‍යාව සහ ආගම) නැමැති සඟරාව තුල ඔව්හු මෙසේ ලියා තිබේ. “ආගම කොමියුනිස්ට්වාදය සමග පෑහීමක් නොමැත. එය ආගමට විරුද්ධව එදිරිවාදීවේ. .......... කොමියුනිස්ට් පක්ෂයේ වැඩසටහන් වල අන්තර්ගතය ආගමට මරණය ගෙනෙන්නෙකි. ............ මනුෂ්‍යයන්ව ආගමික වහල්කමින් සදහටම නිදහස්කරන්නාවු අදේවවාදී සමාජයක් තුල පවතින නිර්මාණය සඳහා වු වැඩසටහනක් බවට එය පත්ව තිබේ.”

ක්‍රිස්තියානියට කොමියුනිස්ට්වාදය සමග සහජීවනයෙන් පැවතිය හැකිද? මෙය එම ප්‍රශ්නයට කොමියුනිස්ට්වරු දෙන පිළිතුරයි. “කොමියුනිස්ට් පක්ෂය ආගමට මරු පහරකි!”

## 5 පරිච්ඡේදය



# අදෘශ්‍යමාන, දීප ව්‍යාප්ත

# රහසිගත සභාව

රහසිගත සභාව ඉතා අසීරු වතාවරණයක් යටතේ ක්‍රියාකරයි. සියලු කොමියුනිස්ට් රටවල රාජ්‍ය ආගම අදේවවාදයවෙයි. ඔව්හු මහලු අයට ආගම ඇදහීමට යම් නිදහසක් ලබා දෙන නමුත් තරුණ හා බාල අයට ආගම එය විශ්වාසකිරීමට ඉඩනොදෙයි. මේකී රටවල සහ අනෙකුත් ආකාරයේ වහල් ජාතීන් තුල සියල්ල – ගුවන් විදුලිය, රූපවාහිනිය, සිනමාව, සිනමාහල්, ප්‍රවෘත්ති පත්‍ර සහ මුද්‍රණාලයන් – අරමුණු කොට ඇත්තේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල අපගේ විශ්වාසය මුලින් උපුටාදැමීමේ අරමුණෙනි.

රහසිගත සභාවට, ඒකාධිපති රාජ්‍යයන්ගේ මහත් වු හමුදාවන්ට විරුද්ධව ඇත්තේ ඉතා සුළු බලවේගයකි. රුසියාවේ රහසිගත සභාවේ දේවගැතිවරුන්ට දේව ධාර්මික පුහුණුවක් නොමැත. මුළු මහත් බයිබලය තවමත් කියවා නැති චීන සභා පාලකවරු අද ද සිටිති.

බොහෝ සභා පාලකවරු ආලේප කල අන්දම මම ඔබට පවසමි. මට තරුණ රුසියානුවෙකු මුණගැසුනි. ඔහු රහසිගත දේවගැතිවරයෙක් විය. ඔහුව ආලේපකලේ කවුදැයි මම විමසුවෙමි. ඔහුගේ පිළිතුර වුයේ "අපව ආලේපකිරීමට සැබෑ බිෂොප්වරයෙක් නොමැත. කොමියුනිස්ට් පක්ෂය විසින් අනුමත කරනු නොලැබු කිසිවෙකුට

ආලේප කිරීමට නිල බිෂොප්වරයාට නොහැක. ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු ලෙස මරණයට පත්වූ බිෂොප්වරයෙකුගේ සොහොනක් වෙත තරුණයන් දස දෙනෙකු වන අපි ගොස් අප අතරින් දෙදෙනෙක් අපගේ අත් සොහොන් කොත මත තබා අනිත් අය සොහොන වටා රවුමක් සෑදෙන සේ සිට අපව ආලේපකරන ලෙස ශුද්ධාත්මයාණන්ගෙන් ඉල්ලා සිටිමු. අපව යේසුස්වහන්සේගේ සිදුරු වුන අත් වලින් ආලේපකරනු ලැබූ බව අපට සහතිකය" මා හට මේ තරුණ මනුෂ්‍යයින්ගේ ආලේපය දෙවියන්වහන්සේ ඉදිරියෙහි ඉතා වටින්නේය.

මෙබඳු ආලේපයක් ඇති මනුෂ්‍යයින් කිසිදු දේව ධාර්මික පුහුණුවක් නැතිව වුවද බයිබලය ගැන ස්වල්ප දැනගැන්මක් ඇතිව වුව ද (බංගලි දේශයේ ඉවැන්ජලිස්තවරු මෙන්) ක්‍රිස්තුස්වහන්සේගේ වැඩය කරනු ලැබේ.

මට සැබෑ ප්‍රීතිමත් කිතුනුවන් හමුවන්නේ බයිබලය තුල, රහසිගත සභාව තුල හා සිරගෙය තුලය.



එය පළමු ශත වර්ෂයේ සභාව හා සමානය. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ලෝකය උඩුයටිකුරු පෙරලූ අය ඉගෙන ගත්තේ කුමන සෙමනේරියේද? ඔවුන් සියලු දෙනාම කියවන්නට දැනසිටියාද? කුමකින් ඔවුන්ට බයිබලයේ අඩංගු දේවල් ලැබී තිබුනේද? දෙවියන්වහන්සේ ඔවුන්ට කථා කලේය.

රහසිගත සභාවේ අපට ආසන දෙව් මැදුරු නැත. එහෙත් අප රහසිගතව කැලෑ තුලදී හමුවන විට එය ස්වර්ගයෙහි අන්‍ය කුමන ආසන දෙව්මැදුරකටත් වඩා අලංකාරවත් වන්නේද? කුරුල්ලන්ගේ මියුරු නාදය ඕගන් එකක තැනගන්නේය. මල් වල සුවඳ අපගේ සුවඳ දුම් හා සමානවන්නේය. මැතකදී සිරෙන් නිදහස්කරනු ලැබූ ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ කිලුටු ඇඳුම පූජකවරුන්ගේ ලෝගුවට වඩා බොහෝ වැඩියෙන් හැඟීම් දනවන සුළු නොවන්නේද? සඳත් තාරකාත් අපට ඉටි පහන් මෙන් නොවන්නේද? ඒවා ආලෝකමත්කරන්නාවූ දේවදූතයෝ අපගේ අතවැස්සන් මෙන් නොවේද?

මට මේ සභාවේ අලංකාරත්වය කිසි ලෙසකින්වත් විස්තර කල නොහැක. නිතරම රහසිගත දේව මෙහෙයකට පසු කිතුණුවන් අත්අඩංගුවට ගනු ලැබ සිරගෙට යවනු ලැබේ. එහිදී කිතුණුවන්ව මනාලියකගේ අලංකාර ආභරණ ඇගේ ප්‍රේමවන්තයාගෙන් ඇයට ලැබෙන්නාක් මෙන් ප්‍රීතියේ දම්වැල් වලින් ඔවුන් වෙලනු ලැබේ. සිරගෙය තුල ජලය නිශ්චලය. ඔවුන්ට උන්වහන්සේගේ සිප වැළඳ ගැනීම ලැබෙන්නේය. ඔව්හු රජවරුන්ගේ ස්ථානයෙන් වෙනස් නොවන්නේය. මට බයිබලය තුලත්, රහසිගත සභාව තුලත්, සිරගෙය තුලත් සැබෑ ප්‍රීතිමත් කිතුණුවන් හමුවේ.

රහසිගත සභාවට පීඩාකරනු ලැබේ. එසේ වෙතත් එයට බොහෝ මිතුරන් ඇත. රහස් පොලිසිය අතර පවා මිතුරන් ඇත. මේකී රහසිගත ඇදහිලිවන්තයින් රහසිගත සභාව සමහරවිටකදී ආරක්ෂාකරයි.

කලින් පැවති සෝවියට් අධිරාජ්‍ය යටතේ රුසියානු ප්‍රවෘත්ති පත්‍ර "බාහිර වශයෙන් පමණක් නොඇදහිලිවන්තයින්ව සිටින්නාවූ" අයගේ ගණන වැඩි වෙමින් පවතින බව පැමිණිල්ලක් ඉදිරිපත්කලේය. මේකී රුසියානු ප්‍රවෘත්තිය මගින් පැහැදිලිකලේ කොමියුනිස්ට්වාදී බලය යටතේ ඉතා ඉහළ ස්ථානවල වැඩකරන්නාවූ ගණන් නැති පුරුෂයින් හා ස්ත්‍රීන් – එනම් රජයේ කාර්‍යාල තුල කොමියුනිස්ට්වාදය පතුරුවා හැරීමේ දෙපාර්තමේන්තුව තුල සහ වෙනත් ස්ථාන වල – සිටින බොහෝ දෙනා බාහිර වශයෙන් කොමියුනිස්ට්වරු වන අතර ඇදහිලිවන්තයින්, රහසිගත සභාවේ සමාජිකයින් ලෙස සිටින බවයි.

කොමියුනිස්ට් ප්‍රචාරක දෙපාර්තමේන්තුවේ වැඩ කරන තරුණ කාන්තාවකගේ කථාවක් කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍රය පලකර සිටි. ඔවුන් පවසන අන්දමට වැඩ කල පසු ඇයත් ඇගේ සැමියාත් එම ගොඩනැගිල්ලේහිම වෙනත් කොටසක තරුණයින් කණ්ඩායමක් සමග රැස්ව රහසිගත බයිබල් අධ්‍යනයන් සහ යාච්ඤා රැස්වීම් වලට සහභාගීවන්නේය. මෙය තවමත් ලොවපුරා සිදුවෙමින් පවති. දහස් ගණන් දහ දහස් ගණන් මනුෂ්‍යයෝ "බාහිර වශයෙන් නොඇදහිලිවන්තයින්" ලෙස ජිවත් වෙති. ඔව්හු පෙනෙන්නට තිබෙන සභා වලට සහභාගීවීම ප්‍රඥාගෝචර නැතැයි සලකති. එහි ශුභාරංචිය දියාරු වී ගොස් ඇති බව පමණක් ඔවුන්ට දකින්නට හා අසන්ට ඇත. ඒ වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් නිශ්චලව හා ඵලදායක ලෙස සාක්ෂිදරන්ට පුළුවන් වගකීමක් හා අධිකාරීත්වයක් ඇති ස්ථානයක ඔවුන් සිටින බව ඔවුන්ට හැගේ.

විශ්වාසවන්ත රහසිගත සභාව තුල මෙබදු පුද්ගලයින් දහස් ගණනක් සමාජිකයින්ව සිටිති. ඔව්හු රහසිගත රැස්වීම් පවත්වන්නේ පොළොව යට ගොඩනැගිලි තට්ටුවල, නිවෙස් තුල, කෙත්වතු යායවල් තුල, සහ අට්ටාලයන් මතය.

කලින් කොමියුනිස්ට් රුසියාව තුල කිසිවෙකු ළමයින්ගේ හෝ වැඩිහිටියන්ගේ බව්තිස්මයට විරුද්ධව හෝ පක්ෂව තර්ක විතර්කයෙහි යෙදුනු බව කිසිවෙකුට මතක නැත. ඔව්හු පූර්ව සහශ්‍රවාදීන් හෝ පශ්චාත් සහශ්‍රවාදීන් නොවේ. ඔවුන්ට අනාගතවාක්‍ය අර්ථකතනය කරන්ට නුපුළුවන. ඒවා ගැන දබරකරන්ට නුපුළුවන. එහෙත් මම පුදුමයට පත්වන්නේ ඔව්හු නිතරම දෙවියන්වහන්සේ වැඩසිටීම පිළිබඳව අදේවවාදීන්ට පැහැදිලිකර සිටින අන්දම ගැනයි.

අදේවවාදීන් කෙරෙහි ඔවුන්ගේ පිළිතුරු ඉතාමත් සරලය. "සියලු අන්දමේ යහපත් මස්වර්ග සහිතවූ මංගල්‍ය උත්සවයකට ඔබට ආරාධනයක් ලැබී ඇත්නම් ඒ ස්ථානයේ කිසිදු අරක්කැමියෙකු ආහාර පිසීම පිණිස නොසිටියේ යැයි ඔබ විශ්වාසකරන්නේද? එහෙත් ස්වභාවධර්මයා අපට මහත් මංගල්‍ය උත්සවයක් පිලියෙලකර ඇත. ඔබට තක්කාලි, පීච්, ඇපල්, කිරි හා පැණි තිබේ. මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් මේ සියල්ල මැව්වේ කවුද? ස්වභාවධර්මය අන්ධය. ඔබ දෙවියන්වහන්සේ කෙරෙහි විශ්වාස නොකරන්නේ නම් මෙතරම් මහත් විශාල ප්‍රමාණවලින් හා විවිධ මාර්ග වලින් අපට අවශ්‍ය දේ පිළියෙල කිරීමට අන්ධ ස්වභාවධර්මය සපලකලේ කවුරුන්දැයි ඔබ පැහැදිලි කරන්නේ කෙසේද!"

ඔව්හු සදාකාල ජීවනයක් පවතින බව සනාථ කරයි. අදේවවාදීයෙක් සමග යමෙකු කථා කරනවා මට මෙසේ ඇසිනි. "කලලයක් ඔහුගේ මවගේ ගර්භාෂය තුල තිබෙන විට ඒ ගැන කථාකරන්ට අපට හැකි යැයි ඔබ යෝජනා කරන්නේ නම් සැබවින්ම ගර්භාෂය තුල පවතින කලල ජීවිතය ඉතා කෙටි යැයි ඔබට පවසන්නට පුළුවන. ඉන් අනතුරුව සැබෑ දිර්ග ජීවිතයක් හටගනී. කලලයේ පිලිතුර කුමක් වේද? අදේවවාදීයෙකු අපට පිළිතුරු වශයෙන් දෙන දෙයම කලලය පවසනු ඇත. පරාදීසය හෝ නරකාදිය ගැන අපි ඔබට කථාකරන විට ඔහු ඔබට පවසන්නේ මවගේ ගර්භාෂය තුල පවතින ජීවිතය පමණක් එකම ජීවිතය නිසාය. ආගමික වශයෙන් වන සෑම දෙයක්ම මෝඩකමක් යැයි එය පවසනු ඇත. එතාක් කලලයට සිතන්ට

පුළුවන් නම් "මෙන්න මාගේ අත් වැඩෙමින් පවතී. ඒවා මට අවශ්‍ය නැත. ඒවා මට දිගහරින්නටත් බැරිය. ඒවා වැඩෙන්නේ මන්ද? සමහරවිට මාගේ පැවැත්මෙහි අනාගත අදියරයක් සඳහා ඒවා වැඩෙන්නේය. ඒවා තුල ඒවා සමග මට වැඩකරන්ට සිදුවන්නේය. පාද ද වැඩෙන්නේය. මට ඒවා මාගේ පපුව අසල නවාගෙන තබාගන්ට සිදුවේ. ඒවා වැඩෙන්නේ මන්ද? සමහරවිට ඉදිරියේදී ඇති වන විශාල ලෝකයක් තුල ජීවිතයේදී මට ඇවිදීමට සිදුවන්නට පුළුවන. ඇස් වැඩේ. එසේ වුවත් මම සම්පූර්ණ අඳුර තුල වටවී සිටින්නෙමි. ඒවා මට අවශ්‍ය නැත. මට ඇස් ඇත්තේ මක්නිසාද? සමහරවිට ආලෝකය හා වර්ණ ඇති ලෝකයක් පසු පස යන්නට විය හැක."

"එම නිසා කළලය තම වර්ධනය දෙස බලමින් මවගේ ගර්භාෂයෙන් පිට ජීවිතයක් ඇති බව නොදුටු නමුත් දැනගන්නේය. අප සමගද එය ඒසේය. අපි තරුණකම පවතිනතාක් කල් අපට ශක්තිය ඇත. එහෙත් එය හරියාකාරව භාවිතාකිරීමට මනසක් නොමැත. කල්ගතවෙත්ම අපි දැනගැන්ම හා ප්‍රඥාව තුල වර්ධනයවෙමු. සොහොන බලා ගෙන යාමට මිනි කාරය බලාසිටින්නේය. එසේ නම් තවදුරටත් භාවිතා කල නොහැකි දැනගැන්මක් හා ප්‍රඥාවක් අප තුල වර්ධනයවීමට අවශ්‍යවන්නේ ඇයි? කලලයක් තුල අත්, පා සහ ඇස් වර්ධනය වියයුත්තේ මන්ද? ඒවා අපට අවශ්‍ය වන්නේ මතු ප්‍රයෝජනයටය. එසේම අප මෙහිදී අත්දැකීම් වලින් දැනගැන්මෙන් හා ප්‍රඥාවෙන් වර්ධනයවන්නේ පසුව පැමිණෙන්නාවූ දෙයක් සඳහාය. මරණයෙන් පසු පැමිණෙන උසස් මට්ටමක දෙයක් සඳහා අපව සූදානම්කරනු ලැබේ.

යේසුස්වහන්සේ පිළිබඳව උන්වහන්සේ වැඩසිටියේ නැතැයි කොමියුනිස්ට්වරු පොතක් මුද්‍රණයකර තිබේ. රහසිගත සභාවේ සේවකයෝ මෙයට පහසුවෙන් පිළිතුරු දෙති. ඔබගේ සාක්කුවේ ඇත්තේ කුමන ප්‍රවෘත්ති පත්‍රයද? එය අද හෝ ඊයේ ප්‍රෞඩා පුවත්පතයි. මට එය බලන්න දෙන්න. එය 1964 වර්ෂයේ ජනවාරි 04 වන දින පුවත් පතයි. මේ 1964 වර්ෂය ගණන්ගනු ලබන්නේ කවදා සිටද! යේසුස්වහන්සේ කිසිකලෙක සිටියේ නැතැයි ඔබ පවසයි. එතාක් උන්වහන්සේගේ උපතේ සිට ඔබ වර්ෂ ගණන්ගනු ලැබේ. කාලය උන්වහන්සේට ප්‍රථමයෙන් පවා පැවතුනි. එහෙත් උන්වහන්සේ පැමිනි විට මනුෂ්‍ය සංහතියට උන්වහන්සේට පෙර පැවතුනු සියල්ල නිශ්පල යැයි පෙණුනු අතර සැබෑ කාලය උන්වහන්සේගේන් පමණක් පටන්ගන්ට යෙදුනි. යේසුස්වහන්සේ ප්‍රබන්ධයක් නොවන බව සනාථ කිරීමට ඔබගේ කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍රද සාක්ෂියකි.

බටහිර රටවල් තුල සිටින සභා පාලකවරු සාමාන්‍යයෙන් ක්‍රිස්තියානියෙහි ප්‍රධාන සත්‍යතාවයන් සැබවින්ම අවබෝධකරගත් අය ඔවුන්ගේ සභා තුල සිටිතැයි සාමාන්‍යයෙන් පිළිගත්තත් එය එසේ නොවේය. අපගේ ඇදහිල්ලෙහි සත්‍යතාවය සනාතකිරීමේ දේශනයක් ඔබට ඇසෙන්නේ කලාතුරකින්ය. එහෙත් යකඩ තිරය පිටුපස කිසිකලෙකත් ඉගෙන නොගත් මනුෂ්‍යයින් ඔවුන් සිත් හරවාගන්නා මනුෂ්‍යයන්ට ඉතාමත් තදබල අත්තිවාරමක් සපයාදෙති.

කිතුදහමේ බලකොටු වන රහසිගත සභාව අවසානවී නිල සභාව ආරන්භ වන්නේ අසවල් ස්ථානයෙන් යැයි පැවසීමට පැහැදිලි බෙදුම් රේඛාවන් නැත. ඒවා එකිනෙක අතර ගෙතී පවතී. වහල් ජාතීන් තුල බාහිර වශයෙන් පෙනෙන සභාවන් වල සමහර පාලකවරු ඔවුන්ට ඔවුන්ගේ ආණ්ඩුන් විසින් පනවා තිබෙන සීමා කිරීම් වලින් ඔබ්බට දේව සේවයෙ විහිදෙන රහසිගතව සමාන්තර සේවයක් පවත්වාගෙන යති.

නිල සභාව එනම් කොමියුනිස්ට්වරු සමඟ සහයෝගයෙන් පවත්වනු ලබන සභාව සඳහා දීර්ඝ ඉතිහාසයක් ඇත. එය ආරම්භවුයේ රුසියානු සමාජවාදී විප්ලවයට පසු ක්ෂනිකවය. එය "ජිවමාන සභාව" සමඟ ආරම්භ විය. එය සර්ජියස් නම් බිෂොප්වරයෙකුගේ මුලිකත්වයෙන් තිබුනු සභාවකි. ඔවුන් සමඟ සිටි එක් අයෙකු ප්‍රකාශකලේ "මාක්ස්වාදය අදේවවාදී අකුරු වලින් ලියනු ලැබු ශුභාරංචිය බවයි." කුමන ආකාර කදිම දේවධර්මයක්ද!

සෑම රටකම අපට මෙවන් සර්ජියස්ලා බොහෝ ඇත.

හංගේරියාවේ කතෝලිකයින් අතර බැලෝග් පියතුමා මෙවැන්නෙකි. ඔහු, සමහර ප්‍රොතෙස්තන්ත්‍ර දේවගැතිවරුන් සමඟ එක්ව කොමියුනිස්වරුන්ට රාජ්‍ය පාලනය සම්පුර්ණයෙන්ම අල්ලාගැනීමට උදව්විය.

රුමේනියාවේ දී කොමියුනිස්ට්වරු බලයට පත්වුයේ බුර්ඩුජියා නම් වු ඔර්තඩොක්ස් පුජකවරයෙකුගේ උපකාරයෙනි. ඔහු කලින් සිටි පැසිස්ට්වාදීයෙකි. ඔහුගේ අතීත වැරදි වසා ගැනීම පිනිස කොමියුනිස්ට්වාදියෙකු වු අතර, එසේ වීමෙන් පසු ඔහුගේ නායකයින්ටත් වඩා වැඩියෙන් ඔහු කොමියුනිස්ට්වාදියෙකු බවට පත්විය. මේ පුජකයා සොවියට් දේශයේ රාජ්‍ය ලේකම්වරයාව සිටි විසින්ස්කි අසල සිටගෙන සිටියේය. ඔහු අළුත් කොමියුනිස්ට් ආණ්ඩුව පිහිටුවීමේදී එය අනුමත

කරන ආකාරයෙන් සිනහාමුසු මුහුණකින් සිටියේය. එම ප්‍රකාශනයේ මෙසේ සඳහන්විනි. "මේ ආණ්ඩුව මේ ලෝකය තුල පාරාදීසයක් ගොඩනගන බැවින් තවත් ස්වර්ගයක් අවශ්‍යනොවන්නේය."

රුසියාවේ නිකොලස් මෙන්ම ඔවුන් රජයේ තොරතුරු සපයන්නන්ව සිටි බව වාර්තාගතවී ඇත. රුසියානු රහස් පොලිසියෙන් පිටවී රටින් ද පිටවී පැමිණ තිබෙන මේජර් ඩෙරියාබින් විසින් නිකොලායි ඔවුන්ගේ ඔත්තු සේවා ඒජන්තවරයෙකු බව සාක්ෂිදැරීය.

මෙය සාමන්‍යයක් ලෙස සියලු නිකායන් වල තත්වයයි. රුමේනියානු බැප්ටිස්ට්වරුන්ගේ මෙම නායකත්වය පිහිටුවනලද්දේ සැබෑ කිතුණුවන්ව එපාකිරීමෙන් හා බලහත්කාරය ක්‍රියාත්මක කිරීමෙනි. රුසියාවේද බැප්ටිස්ට් සභාවේ නායකත්වය එලෙසම ක්‍රියාකලෝය. රුමේනියානු ඇඩ්වෙන්ටිස්ට්වරුන්ගේ සභාපතිවරයා වු මචිසී මා හට පැවසියේ ඔහුද කොමියුනිස්ට්වරුන් බලයට පත්වු ප්‍රථම දිනයේ පටන් රහස් පොලිසියට තොරතුරු සපයන්නෙක්ව සිටි බවයි.

සියලුම සභාවල් වසාදමනවා වෙනුවට – ඔවුන් දහස්ගණන් සභා වසා දැමුහ. – කොමියුනිස්ට්වරු වංචනික ආකාරයෙන් රැවටිලිකාර කමෙන් කිතුණුවන් හා ක්‍රිස්තියානිය අවසානයේදී විනාශකරන අරමුණක් සහ ඔවුන්ව නිරීක්ෂණයකිරීම හා පාලනයකිරීම පිනිස කවුළු විවෘතකර තැබීමට ඉඩපහසුකම් සපයන පිනිස "සංකේතාත්මක" නිල සභාවන් කිපයක් විවෘතව තැබීමට ඉඩදීමට තිරණයකලෝය. ඔවුන්ගේ රටේ සභාවේ ව්‍යුහය එලෙසම පවත්වාගැනීම තුලින් කිතුණුවන්ව පාලනයකිරීමට, එය කොමියුනිස්ට්වරුන්ගේ ආයුධයක් බවට පත්කර ගනු පිනිස සහ ඔවුන්ගේ රටට පැමිණෙන අමුත්තන්ව රැවටීම පිනිස මෙසේ කියවීමට තිරණයකලෝය. මේ තත්වය චීනයේ නිල සභාව වන TSPM සභාවේ ද දක්නට ලැබේ. අප මීලඟ ශතවර්ෂය තුලට ගමන් කරන විටද මෙසේ දක්නට ලැබෙනු ඇත. චීනයේ "එකම නෛයිතික" සභාව වු එහි නියෝජනයකරනු ලබන්නේ චීන කිතුණුවන්ගෙන් 20% පමණකි.

එහෙත් නිල සභාව තුල සැබෑ ආත්මික ජීවනයක් ඇත. (බටහිර රටවල සභා වල ද තත්වය මෙය බැව් මට හැගි ගොස් තිබේ. ඔවුන්ගේ ඉහළ මට්ටමේ නායකත්වයන් කෙබඳු ස්වරූපයක් ගත්තද ඒ සම්බන්ධව තැකීමක් නොකොට සභිකයින් විශ්වාසවන්තව සිටිති.)

රුසියාවේ ආගමිකවතාවක්‍රමය නොවෙනස්ව පවතින අතර මේ සභාවේ සාමාජිකයින්ගේ සිත් වලට එයින් පෝෂණය ගෙනදෙයි. දේශනා කොමියුනිස්ට්වරුන්ව රැවටිලිකාරව ප්‍රශංසාකරනු ලැබුව ද එය සිත් වලට ආත්මික ජිවනය ගෙනදෙයි. ලුතරන් සභාවේ ද ප්‍රෙස්බිටිරියන් සහ වෙනත් ප්‍රොතෙස්තන්ත්‍ර සභාවලද පැරණි ගීතිකා එලෙසම ගැයේ. තවද ඉන් අනතුරුව තොරතුරු සපයන්නන්ගේ දේශනා වල පවා ශුද්ධ ලියවිල්ලේ යම් දෙයක් අඩංගුවේ. චීනයේ සෙනඟ වර්තමානයේ පවා ද්‍රෝහීන් යැයි ඔවුන් විසින් දන්නා මනුෂ්‍යයින්ගේ බලපෑම යටතේ සිත්හැරීමට ලක්වී තිබේ. ඒ බව රහස් පොලිසියට ඔවුන් පවසන බව ඒ සෙනඟ දනිති. තමුන්ගේ දූෂිත දේශනා තුලින් මේ ඇදහිල්ල ඔවුන්ට දෙනු ලැබු තැනැත්තා ගෙන් ඔවුන් තමුන්ගේ ඇදහිල්ල සඟවාගනිති. ලෙවී කථාව 11:37 තුල සංඛේතාත්මක භාෂාවෙන් දෙවියන්වහන්සේ සඳහන්කර ඇති ශ්‍රේෂ්ඨ භාස්කම් හැටියට මෙය සඳහන් කල හැක. “උන්ගේ මළකුණු වලින් කිසිවක් වපුරන්ට තිබෙන මොන බිත්තර වී පිට වැටුනත් ඒවා පවිත්‍රය.” (මලකුණු යනුවෙන් මොසෙස්ගේ ව්‍යවස්ථාවට අනුව මෙහි දැක්වෙන්නේ දූෂිත ද්වේලය.)

අපි සාධාරණවීම වැදගත්ය. සියලුම නිල සභා වල නායකයින් නොහොත් සියලුම නිල සභා වල ප්‍රධාන නායකයින් කොමියුනිස්ට්වරුන්ගේ මනුෂ්‍යයන් නොවේ. රහසිගත සභාවේ සමාජිකයින්ද නිල සභාවන් තුල ඉතා වැදගත් කාර්‍යභාරයක් උසුලති. ටික දෙනෙක් හැර එනම් තමන්වම සඟවාගෙන සිටින අය හැර අන් අය එසේ කරති. තවද ක්‍රිස්තියානිය නිස්සාර දෙයක් නොව සටන්කරන ඇදහිල්ලක් බව ඔව්හු දනිති. රුමේනියාවේ වලැඩිව්රෙස්ට් වල තාපසාරාමය වසා දැම්මට රහස් පොලිසිය පැමිනි විට සහ රුසියාවේද බොහෝ ස්ථානවල එසේ සිදුවූ අවස්ථාවලදී ඔවුන්ට අමාරුකාලයක් උදාවිය. ආගම තහනම්කිරීමට උත්සහකිරීමේ අපරාධයට සමහර කොමියුනිස්ට්වරුන්ට තම ජීවිතයෙන් වන්දි ගෙවන්ටසිදුවුනි.

එහෙත් නිල සභාවන් ක්‍රමක්‍රමයෙන් අඩුවිය. කොමියුනිස්ට්වාදය යටතේ මුළු සෝවියට් සංගමයට සභාවන් 5000 ක් හෝ 6000 ක් ඇතොත් මම පුදුමවෙමි. එම ජනගහනයට ඇති ඇමරිකා එක්සත් ජනපදය තුල මීට දශකයකට ඉහලදී සභාවන් තුන් ලක්ෂයක් තිබිනි. තවද මෙකී “සභාවන්” බොහෝ විට අපි සිතන ආකාරයේ “සභාවන්” නොව නිතරම පාහේ කුඩා කාමරවේ. මොස්කව් වල ජනාකීර්ණ සභාවන් හි විදේශීය සංචාරකයින්ව දැකිය හැක. එය නගරයේ තිබෙන එකම

ප්‍රොතෙස්තන්ත්‍ර සභාවයි. එහි ඇති නිදහස කුමක් දැයි සැලකිල්ලට ගන්න - "සභාවන් පවා පිරී ඉතිරී යන මට්ටමට ඊගාවී තිබේ." ඔවුන් ප්‍රීතියෙන් යුතුව එය වාර්තාකරයි. 70 ලක්ෂයක ආත්ම සඳහා පවතින්නේ එක ප්‍රොතේසත්නත්‍ර සභාවක් පමණක්ය යන ඛේදනීය කාරණය ඔව්හු නොදනිති. තවද සෝවියට් සංගමයේ සෙනගගෙන් 80%කට පා ගමන් දුරක පිහිටන තනි කාමර සභාවන් පවා නොමැත. ජන සමුහයාව එක්කෝ අමතක කර දමා ඇත. එසේ නැතහොත් ඔවුන් කරා ළඟාවෙනුයේ ශුභාරංචි සේවයේ රහසිගත ක්‍රම තුලිනි. තෝරා ගැනීමට වෙනත් දෙයක් නැත.

කොමියුනිස්ට්වාදය වඩ වඩා රටක තම පාලනය යටතට ගන්නා විට වඩ වඩා සභාවන් රහසිගත ඒවා බවට පත්වේ.

වැසුනු නිල සභාවන්ගේ ස්ථානය ආගමික විරෝධී සංවිධාන වල රැස්වීම් සඳහා රැස්වෙන ස්ථාන වී ඇත.

## *රහසිගත සභාව අදේවවාදී ලියකියවිලි තුලින් "පෝෂණය" වු අන්දම*

රහසිගත සභාව අදේවවාදී ලියකියවිලි ද භාවිතාකරන අන්දම දනී. එලියාව කපුටන් විසින් පෝෂණය කරනු ලැබු අන්දමින් ඔවුන් ඒවා මගින් පෝෂණයවෙති. අදේවවාදීන් බයිබල් පද විවේචනය කිරීම සඳහා සහ ඒවාට අවමානකිරීම සඳහා තම දක්ෂතාවය සහ ජ්වලිතකම මහත් සේ යොදති.

ඔවුන් "විකට බයිබලය" සහ ඇදහිලිවන්තයින් සහ නො "ඇදහිලිවන්තයින් සඳහා බයිබලය" නම් පොත් ප්‍රකාශ කරති. මෙයින් ඔව්හු ඉද්ධ ලියවිල්ල කොතරම් මෝඩද යන්න පෙන්වීමට උත්සහකරති. තවද ඔව්හු එසේ කිරීමට බොහෝ බයිබල් පද උපුටා දක්වති. අප ඒවා ගැන ප්‍රීතිවන්නේ කෙලෙසද? පොත සම්පුර්ණ බයිබල් පද සහිතව කෝටි සංඛ්‍යාත පිටපත් වලින් මුද්‍රණය කරනු ලැබ පවති. කොමියුනිස්ට්වරුන් බයිබල් පද වලට අවමාන කරන විටදී පවා ඒවා කිව නොහැකි තරම් අලංකාරිත්වයෙන් පවති. විවේචනය කොතරම් මෝඩ දැයි කිවහොත් කිසිවෙකු ඒවා බරපතල ලෙස ගණන් නොගනිති. අතිතයේ දී කතෝලික සභාවේ පරීක්ෂක සභාව කින් මෙවැනි පොත් පෙරහැරකින් ගෙන ගොස් "වේදභේද" ලෙස සලකා පුළුස්සා දමන ලදී. එසේ කරන ලද්දේ සියලු

ආකාරයේ අවමාන දරන ඇඳුම් සමග ඒවා පැළඳවීමෙන් ඒ මත නිරයේ ගිනි දළු සහ යක්ෂයා සිත්තාරු කිරීමෙනි. ඒ ආකාරයෙන් බයිබල් පද තවමත් සත්‍යයව පවති. ඒවා යක්ෂයා විසින් උපුටා දැක්වුවද ඒවා සත්‍යව පවති.

බයිබල් පද වලට අපහාස කරනු ලබන මේ අදේවවාදී පොත නැවත මුද්‍රණය කරන ලෙස ඉල්ලාසිටිමින් ලිපි දහස් ගණනක් ලැබෙන විට කොමියුනිස්ට් මුද්‍රණාලය ඉතා සතුටුවුවෝය. ඒහෙත් ශුද්ධ ලියවිලි පාඨ ලබා ගැනිමට අවස්ථාවක් නැති රහසිගත සභාව විසින් මෙකී ලිපි එවූ බව ඔව්හු නොදැන සිටියෝය.

අදේවවාදී රැස්වීම් පවා හොඳින් මේ සඳහා භාවිතා කරන අන්දම අපි දනිමු.

කොමියුනිස්ට්වාදයේ මහාචාර්යවරයෙ යේසුස්වහන්සේ වෙන කිසිවෙකු නොව විජ්ජාකරුවෙකු බව රැස්වීමකදී ප්‍රකාශකලාය. මහාචාර්යවරයා ඉදිරියේ ජල බඳුනක් තිබුනි. ඔහු එයට කුඩක් දැමුවේය. එය රතු පැහැති විය. "මෙය සම්පූර්ණ භාස්කමකි," ඔහු පැහැදිලිකලේය. "යේසුස්වහන්සේගේ වස්ත්‍රයෙහි අත්වල මෙවන් කුඩක් සඟවාගෙන තිබූ" බව ඔහු පැහැදිලිකලේය. "අනතුරුව ජලය මුද්‍රිකපානය බවට පුදුමාකාරයකින් වෙනස්කරන බව පෙන්වීමට උන්වහන්සේ රඟපෑමක් කලේය. මට යේසුස්වහන්සේට වඩා හොඳින් එය කරන්ට පුළුවන. මට මුද්‍රිකපානය නැවත වතුර බවට පත්කරන්නට පුළුවන යැයි ඔහු පැහැදිලි කලේය. තවත් කුඩක් එක්කලේය. එය පැහැදිලි විය. අනතුරුව තවත් කුඩක් එක්කලේය. එය නැවත රතුවිය.

අපි අදේවවාදි ගොලියත්ට වඩා බලවත්වෙමු. ඒ මන්දයත් දෙවියන්-වහන්සේ අපගේ පැත්තේය.



කිතුණුවෙකු නැගී සිට මෙසේ පැවසීය. "ඔබට කිරීමට හැකි දෙය කරමින් සහෝදර මහාචාර්යතුමනි ඔබ අප පුදුමයට පත්කලේය.

මම ඔබෙන් එක් දෙයක් පමණක් ඉල්ලමි. ඔබගේ වයින් බෝතලය බොන්න." මහාචාර්යවරයා මෙසේ පැවසුවේය. "මෙය මට කල නොහැක. මේ කුඩ විෂ සහිතය." කිතුණුවා මෙසේ පිළිතුරු දුන්නේය. "ඔබ හා යේසුස්වහන්සේ අතර ඇති සම්පූර්ණ වෙනස නම් මෙසේ උන්වහන්සේ උන්වහන්සේගේ මුද්‍රිකපානයන් වසර 2000ක් මුළුල්ලේ අපට ප්‍රීතිය ලබාදුන්නේය. එහෙත් ඔබගේ වයින් බෝතලය විෂ බැවින් එය මරණය ගෙනදෙයි". ඔහු පැවසුවේය. කිතුණුවා සිරගෙටගියේය. එහෙත් මේ සිද්ධියෙහි ප්‍රවෘත්තිය බොහෝ දුර අපහට පැතිරීගිය අතර බොහෝදෙනාගේ ඇදහිල්ල ශක්තිමත්කලේය.

අපි දාවිත් මෙන් දුර්වල කුඩා අයවෙමු. එහෙත් අදේවවාදය නැමැති ගොලියත්ට වඩා බොහෝ ප්‍රබල අයවෙමු. දෙවියන්වහන්සේ අපගේ පැත්තට සිටින බැවින් එය එසේ වේ. සත්‍යය අපට අයිතිය.

එක අවස්ථාවකදී කොමියුනිස්ට්වාදියෙකු අදේවවාදය ගැන දේශනයක් කලේය. මේ කම්හල් සේවකයින් අතර බොහෝ දෙනා කිතුණුවන් විය. දෙවියන්වහන්සේට විරුද්ධව හා ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසකිරීමේ මෝඩකම පිළිබඳව තර්ක විතර්ක සියල්ලටම ඔව්හු නිහඬව සවන් දුන්නෝය. ආත්මික ලෝකයක් නැති බවත්, දෙවිකෙනෙක් නැති බවත්, ක්‍රිස්තුස්වහන්සේද නොපවතින බවත්, මෙතැනින් පසු අන්කිසිවක් නොමැති බවත් මනුෂ්‍යයා ආත්මයක් රහිත පදාර්ථයක් පමණක් බවත් සනාතකිරීමට දේශකයා මහත් සේ උත්සාහදැරීය. ඔහු නැවත නැවතත් පැවසුවේ පදාර්ථය පමණක් පවතින බවයි.

කිතුණුවෙක් නැගිට කථාකරන්ට අවසර ඉල්ලුවේය. එයට ඉඩදෙන ලදි. කිතුණුවා ඔහුගේ හකුලන පුටුව ගෙන විසිකලේය. ඉන් අනතුරුව ඔහු ටිකක් ඒ දෙස බලාසිටියේය. ඉන් පසු ඔහු ඇවිද ගොස් කොමියුනිස්ට් දේශකයාගේ මුහුණට පහරක් එල්ලකලේය. දේශකයා අතිශයින් කෝපයට පත්විය. සිදුවූ අවමානයෙන් ඔහුගේ මුහුණ රතුවී ගියේය. ඔහු අසභ්‍ය වචන කෑගසා කියමින් කිතුණුවා අත්අඩංගුවට ගැනීමට ඔහු සමග පැමිනි කොමියුනිස්ට්වරුන්ට කෑගසා කිවේය. "ඔබ මට පහරදෙන්ට නිර්භිතවූයේ කෙලෙසද? හේතුව කුමක්ද?" ඔහු ගුගුරමින් ප්‍රශ්න කලේය.

කිතුණුවා මෙලෙස පිළිතුරු දුන්නේය. “ඔබ බොරුකාරයෙකු බව ඔබම ඔප්පුකලෙහිය. සියල්ල පදාර්ථය බවත් ........ අන්කිසිවක් නැති බවත් ඔබ පැවසුවේය. මම පුටුවක් ගෙන එය විසිකලෙමි. එය සත්‍ය වශයෙන්ම පදාර්ථවේ. පුටුව කෝපාවිෂ්ටවුයේ නැත. එය පදාර්ථය පමණකි. මම ඔබේ කම්මුලට ගසනවිට ඔබ පුටුව මෙන් ප්‍රතිචාරය දැක්වුයේ නැත. ඔබ වෙනස් ආකාරයකට ප්‍රතිචාරය දැක්වුයේය. පදාර්ථයට පිස්සු වැටෙන්නේවත් එය කෝපාවිෂ්ට වන්නේවත් නැත. නමුත් ඔබ කෝපාවිෂ්ට වුයෙහිය. එබැවින් සහෝදර මහාචාර්යතුමනි ඔබ වැරදිය. මනුෂ්‍යයා පදාර්ථයට වඩා වැඩි යමක් වේ. අපි ආත්මික පුද්ගලයන් වෙමු.”

මෙබඳු ගණන් නැති ආකාර වලින් රහසිගත සභාවේ සාමාන්‍ය කිතුණුවන් අදේවවාදීන්ගේ උගත් තර්ක විතර්ක ප්‍රතික්ෂේප කලේය.

සිරගෙය තුල දී දේශපාලන නිලධාරියා මගෙන් මෙලෙස ඉතා තදින් ප්‍රශ්න කලේය. “ඔබ ඔබගේ මෝඩ ආගම කොපමණ කලක් පවත්වාගෙන යන්නේද?” මම ඔහුට මෙසේ පැවසුවෙමි. “ගණන් නැති තරම් අදේවවාදීන් ඔවුන්ගේ මරණ මංචකයේ දී ඔවුන් දෙවියන්වහන්සේ රහිතව සිටි බව සිහිපත් කරමින් දුක් වෙනු මා දැක තිබේ. ඔව්හු ක්‍රිස්තුස්වහන්සේට හඬගැසුවෝය. කිතුණුවෙකුට මරණය ළංව පවතිද්දි ඔහු කිතුණුවෙකුව සිටි බැවින් දුක්වෙන්ට සිදුවේ යැයි ඔබට සිතන්ට පුළුවනද? ඔහුව ඔහුගේ ඇඳහිල්ලෙන් ගලවාගැනීමට මාක්ස් හෝ ලෙනින්ව කැඳවන්ට ඔහු උත්සහකරන්නේද?” නිලධාරියා සිනහාවිය. “දක්ෂ පිළිතුරක්” යැයි ඔහු පැවසුවේය. මම තවදුරටත් කථාකරගෙන ගියෙමි. “ඉන්ජිනේරුවෙක් පාලමක් ඉදිකල විට පාලම උඩින් පුසෙකු ගමන් කිරීම මගින් පාලම ශක්තිමත් බව සනාථ නොවේ. එහි ශක්තිමත් බව සනාථකිරීමට දුම්රියක්ම එය පසුකර යා යුතුය. ඔබට සියල්ල හොඳින් සිදු වන විට අදේවවාදියෙකුව සිටින්ට පුළුවන. එයින් අදේවවාදයේ සත්‍යතාවය සනාථ නොවේ. එය මහත් අමාරු අවස්ථා වලදී ඔබව දරානොගනි.” මම ලෙනින්ගේ පොතෙන් එය සනාථකිරීමට ඔහු ගෙනහැර දැක්වුයෙමි. සෝවියට් සංගමයේ අගමැතිවරයාවීමෙන් පසු යම් යම් දේවල් වැරදී ගිය විට ඔහුම යාච්ඤාකල බව එයින් කියැවේ.

අපි නිශ්චල නිශ්ශබ්ද අයවෙමු. යම් යම් සිද්ධීන් වර්ධනය වන තුරු නිශ්ශබ්දව සිටින්ට අපට පුළුවන. කොමියුනිස්ට්වරු නිශ්ශබ්ද නොවූ තැනැත්තන්වූහ. ඔව්හු අළුත්, ආගම් විරෝධ ව්‍යාපාරයක් දියත්කලෝය. එහෙත් ඔව්හු සාන්ත ඔගස්ටින්ගේ මෙම කියමන එමගින් සනාතකලෝය. "සිත ස්වාමීන්වහන්සේ තුල විශ්‍රාමගන්න තුරු එය අපහසුතාවයෙන් යුක්තව පවතී"

## *කොමියුනිස්ට්වරුන්ව පවා දිනාගතහැකිවන්නේ මන්ද!*

නිදහස් ලෝකයේ කිතුණුවන්ගේ උපකාරය ඇත්නම් රහසිගත සභාව කොනියුනිස්ට්වාදීන්ගේ සිත් දිනාගැනිමට පුළුවන. එසේම එමගින් ලෝකයේ පෙනුමද වෙනස් කළ හැක. කොමියුනිස්ට්වරයෙකු වීම සාමාන්‍ය දෙයක් නොවන බැවින් අපට ඔවුන් දිනාගත හැක. බල්ලෙකු පවා ඔහුගේ මස් කට්ට ඇතුව සිටින්ට කැමතිවෙයි. කොමියුනිස්ට්වරුන්ගේ සිත් ඔවුන් කරන කාර්‍යභාරයට විරුද්ධව කැරලිගසයි.

සැම කොමියුනිස්ට්වාදීයෙකුම "සියල්ලම පදාර්ථය වන" බව කල්පනා කරයි. – එනම් අප යම් කිසි රටාවකට සංවිධානයවුනු රසායනික ද්‍රව්‍ය සමුහයකි. මරණයෙන් පසු අපි නැවතත් ලුණු හා ඛනිජ ද්‍රව්‍ය බවට පත්වෙති. ඔවුන්ගෙන් මේ ප්‍රශ්නය පමණක් ඇසීම ප්‍රමාණවත්ය. "එසේ නම් බොහෝ රටවල් කොමියුනිස්ට්වරුන් ඔවුන්ගේ විශ්වාසය වෙනුවෙන් ඔවුන්ගේ ජීවිත දෙන්නේ කෙලෙසද? 'රසායන ද්‍රව්‍ය ස්වල්පයකට' විශ්වාසයක් ඇත්තේද? ඛනිජ වලට අන්‍යයන්ගේ යහපත වෙනුවෙන් තමුන්වම යාගපුජා කරන්ට පුළුවන්ද?" මේවාට ඔවුන් දෙන පිළිතුරක් නැත.

තවද, අනතුරුව, කෲර අන්දමින් ක්‍රියා කිරීම නැමැති කාරණය ඇත්තේය. මනුෂ්‍යයා මවනු ලැබ ඇත්තේ කෲරතර ක්‍රියාවන්ට ලක්වීමට නොවේය. ඔහුට දිර්ඝ කාලයක් මුළුල්ලේ කෲරතර ක්‍රියාවන් දරාගතනොහැක. අපි නාසි පාලකයින්ගේ ඇදවැටීම දන්නෙමු. ඔවුන්ගෙන්, සමහරක් සිය දිවි හානිකරගත්තෝය. ඒ අතර තවත් සමහරක් පසුතැවිලිවී ඔවුන්ගේ පාප කියාදුන්නෝය.

කොමියුනිස්ට් රටවල් වල වෙසෙන බීමත්කමින් පෙලෙන ගණන් නැති සංඛ්‍යාත මනුෂ්‍යයන්ගේ බිමත්කම කොමියුනිස්ට්වාදයට දිය නොහැකි

වූ වඩා අර්ථාන්විත ජීවිතයකට පවතින තමුන්ගේ ආශාව එළිපිටම දන්වති. සාමාන්‍ය රුසියානුවෙක් ගැඹුරු විශාල හදවතක් ඇති ත්‍යාගශිලි පුද්ගලයෙකි. කොමියුනිස්ට්වාදය නොගැඹුරුවූ මිත්‍යා ප්‍රබන්ධ වලින් පිරී එකකි. රුසියානුවා ගැඹුරු ජීවිතයක් සොයයි. එය සොයා ගැනීමට කිසි ස්ථානයක් නැත. ඔහු එය මධ්‍යසාරය තුල සොයයි. ඔහු ජීවත් වෙන කෲරතර හා රැවටිලිකාර ජීවිතය පිළිබඳව ඔහු තුල ඇති බලාපොරොත්තු විරහිත දුක්කදායකකම ඔහු ප්‍රකාශකරන්නේ මධ්‍යසාර භාවිතයට ඇබ්බැහිවීම තුලිනි. මධ්‍යසාරය ඔහුව සුළු මොහොතකට නිදහස්කරයි. සත්‍යතාවය, ඔහු දන්නේ නම් සදහටම ඔහු නිදහස්වන්නේය.

රුසියානු හමුදා පාලනය තුල (1947 -1989) බුකාරිස්ට් නගරය තුල දී මට වරක් මා තුල මැඩපැවැත්විය නොහැකි හැඟීමක් ඇතිවුනි. එය නම් තැබෑරුමකට ඇතුල්වීම පිනිසය. මම මාගේ භාර්‍යාවට ද මා සමඟ පැමිණෙන්ට කිවෙමි. එයට ඇතුල්වීමේදී රුසියානු කපිතාන්වරයෙක් සෑම දෙනාටම තර්ජනය කරමින් තවතවත් බීමට මත්පැන් ඉල්ලමින් තුවක්කුව තම දැත තුල රදවාගනිමින් සිටිනු මා දුටුවෙමි. ඔහු දැනටමත් බොහෝසේ බීමත්ව ඇති නිසා ඔහුට බීමදීම ප්‍රතික්ෂේපකර තිබුනි. මනුෂ්‍යයෝ කලබලයෙන් යුතුව එහි තුල සිටියහ. මම අයිතිකරුවා වෙත ගියෙමි. – මම ඔහුව හොදින් හදුනමි. – කපිතාන්වරයාට දීමට මම ඔහුගෙන් මත්පැන් ඉල්ලාසිටියෙමි. එසේ කලේ මම ඔහුව වාඩි වෙන්න සලස්වා ඔහු නිශ්ශබ්දවනු පිනිස කටයුතු කරන බවට පොරොන්දුවෙමිනි. එකක් හැර එකක් වනසේ වයින් බෝතල් අපහට දෙන ලදි. මේසය මත විදුරු තුනක්ද විය. කපිතාන්වරයා සැමවිටම සියලුම විදුරු විනිත ලෙස පිරෙව්වෙහිය. ...... ඔහු ඒ විදුරු තුනම ගිලදැමුවේය. මාගේ භාර්‍යාවත් මමත් මත්පැන් නොගනිමු. ඔහු ඉතාමත්ම - බීමත්ව සිටියත් ඔහුගේ මනස වැඩකලේය. ඔහු මධ්‍යසාර භාවිතාකොට වැඩකරන්ට පුරුදුව සිටියේය. මම ඔහුට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව පැවසුවෙමි. ඔහු බලාපොරොත්තු නොවූ අවදානයකින් මට සවන්දුන්නේය.

මම නිමවූ විට ඔහු මෙසේ පැවසුවේය. මම කවුදැයි දැන් ඔබ මා හට පැවසුවේය. මම කවුදැයි මම ඔබට පවසන්නෙමි. මම ඕර්තඩොක්ස් පූජකයෙක්මි. ස්ටාර්ලින්ගේ සමය ආරම්භයේ පැවති මහා පීඩා කාලයේදී පළමුවෙන්ම මාගේ ඇදහිල්ල ප්‍රතික්ෂේපකරදමා පැමිණී අය අතර මම රවටනු ලැබූ බවත් දෙවියකෙනෙක් නොමැති බවත් පවසමින් දේශනා දුන්නේය.

"මම ද රවටන්නෙකු වුයෙමි. එලෙසම අන් සියලු දේවගැතිවරුද රවටන්නෝ වුවෝය." යනුවෙන් මම ඔවුන්ට පැවසුවෙමි. මාගේ ජ්වලිතකම ගැන මාව බොහෝසෙයින් ඇගයීමට පත්කොට මාව රහස් පොලිසියේ නිලධාරියෙකු බවට පත්කලෙහිය. මාගේ දඬුවම පැමුණුනේ දෙවියන්වහන්සේගෙන්ය. මම මාගේ මේ දැතින් කිතුණුවන්ව මරා දමා ඇත්තෙමි. ඔවුන්ට පීඩා කොට ඇත්තෙමි. එය දෙවියන්වහන්සේ මට දුන් දඬුවම විය. මම එය අමතක කිරීමට බොහෝසෙයින් මත්වෙන තෙක් නැවත නැවත බොන්නෙමි. නමුත් එය ක්‍රියා නොකරයි."

බොහෝ කොමියුනිස්ට්වරු සියදිවි හානිකරගනිති. ඔවුන් ශ්‍රේෂ්ඨ කවිකාරයන්වු එසෙනින් සහ මයියාකොවෙස්කි ඔවුන් අතරය. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ ලේඛකයෙකු වන ෆාඩිව් එසේවු අය අතරය. "ප්‍රීතිය" නැමැති ඔහුගේ නව කථාව ඔහු ලියා අවසන්වුවා පමණකි. ඒ නවකථාව තුල කොමියුනිස්ට්වාදය වෙනුවෙන් ඔහු වෙහෙස නොබලා වැඩ කිරීම තුල ඔහුට ලැබුණු ප්‍රීතිය ඔහු පැහැදිලිකර තිබුනි. නව කථාව ලියා නිමවු පසු ඔහු කොතරම් ප්‍රීතියට පත්වුයේද කිවහොත් ඔහු ඔහුටම වෙඩි තබාගත්තේය. මෙබඳු මහත් බොරුවක් දරාගැනීම ඔහුගේ ආත්මයට අසීරු කරුණක් විය. ශ්‍රේෂ්ඨ කොමියුනිස්ට් නායකයෙකු වු සහ සාර් රජ සමයේ සිට කොමියුනිස්ට්වාදය වෙනුවෙන් සටන්කලාවු ජොජ්සේ, ටොම්කිං වැනි අය පවා කොමියුනිස්ට්වාදයේ යථාර්තය දැකිම දරාගත නොහැකි නිසා එලෙසම ක්‍රියාකලෝය. ඔවුන් ද සිය දිවිහානිකරගැනීමෙන් කෙලවරකට පත්වුවෝය.

කොමියුනිස්ට්වරු ප්‍රීතියෙන් තොර මනුෂ්‍යයෝ වුවෝය. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨ ආඥාදායකයින් පවා එසේ වුහ. ස්ටාර්ලින් කොතරම් ප්‍රීතියෙන් තොර අයෙක් වුවද කිවහොත් ඔහුගේ පැරණි සහෝදරයින් සියලූ දෙනාම මරාදමනු ලැබීමෙන් පසු ඔහු නිතරම ඔහුවද මරාදමනු ලබතැයි හෝ ඔහුට විෂ දෙනු ලබතැයි බියෙන් පසුවුයේය. බැංකුවක සේප්පුවක් මෙන් අගුල් දැමිය හැකි නිදන කාමර 8ක් ඔහුට තිබුනේය. කිසියම් රාත්‍රියකදී ඔහු නිදාගන්නේ මෙම නිදන කාමර වලින් කවර එකක් තුළදැයි කිසිවෙකු දැන නොසිටියහ. ඔහුගේ අරක්කැමියා ඔහු ඉදිරියෙහි ආහාර රස බලන තෙක් ඔහු ආහාර නොකැවේය. කොමියුනිස්ට්වාදය කිසිවෙකුව ප්‍රීතිමත් කලේ නැත. ආඥාදායකයින්වද ප්‍රීතිමත් කලේ නැත. ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ අවශ්‍යවිය.



*මෙය රිචඩ් හා සබීනා වර්ම්බ්‍රාන්ඩ් යුවලගේ පවුලේ ඡායාරූපයකි. එය මුල් කාලයේ ගන්නා ලද්දකි. එහි ඔවුන්ගේ පුත් මිහායි (මයිකල්) ද සිටී. දෙමව්පියන් දෙදෙනාම සිරගතව සහ වහල් කඳවුරු වල සිටියදී මයිකල් ජීවත්වූයේ වෙනත් කිතුණුවන්ගේ රැකවරණය යටතේ "අනාතයෙකු" ලෙසය. එහෙත් පාසැල් වලදී ඔහුට උසුළු විසුළු කරනු ලැබ අවමානයට පත්කරන ලදී. පසු කලෙක මයිකල් ඇ. එ. ජී. "ද වොයිස් ද මාස්ටර්ස්" නැමැති සංවිධානයේ පළමු අධ්‍යක්ෂකවරයා බවට පත්වූයේය (ඔක්තෝබර් 1967). එවිට මෙම දූතන සේවය හඳුන්වන ලද්දේ කොමියුනිස්ට් ලෝකය වෙත යේසුස්වහන්සේ" යනුවෙනි.*



කොමියුනිස්ට් සිරගෙයින් ඔහුව නිදහස් කල විට සිනාමුසු මුහුණින් සිටින දේවගැති වර්ම්බ්‍රාන්ඩ්; ඔහු කොන්දේසි විරහිතව සමාවදීමට ක්‍රියාකිරීමෙන් බොහෝ කිතුණුවන්ව පුදුමයට පත්කලේය. .... ඔහු කොමියුනිස්ට්වාදයට වෛර කල අතර කොමියුනිස්ට්වරුන්ට ප්‍රේමකලේය.



සබීනා වර්ම්බ්‍රාන්ඩ්ගේ මුළු පවුල (ඔවුන් යුදෙව්වන්ය.) නාසි සිරකඳවුරක් තුල දී මරණයට පත්විය. සබීනා හා රිචඩ්ට මෙවන් කඳවුරක සිටි නාසිවාදියෙකුව තම නිවසට ආරාධනා කිරීමට වරප්‍රසාදය ලැබිනි. ඔව්හු ඔහුව පෝෂණයකල අතර ඔහුට ප්‍රේමකලේය. ඔවුන් ඔහුව ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙනාවෝය.




*"Tortured For Christ"* නැමැති කෘතියෙහි මුල් කාලීන පිටපතක්. මෙය 1960 ගණන් වල මුද්‍රණය කරනලද්දකි. බටහිර රටවල කිතුණුවෝ නැගෙනහිර රටවල සිටින කිතුණු පවුල් වල පීඩා විදීම් ගැන අසා තිබුනේ ස්වල්ප වශයෙනි. ඒ කාලයේ බටහිර රටවල බොහෝ සභාවන් මෙවන් තොරතුරු මුද්‍රණයකිරීම ප්‍රතික්ෂේප කලෝය.



අඩ සිය වසක මුළුල්ලේ සෝවියට් දේශය පුරාම කිතුණුවන් රහසිගත දේව මෙහෙයන් සඳහා මෙලෙස රැස්වූවෝය. ඔව්හු අදත් ආසියාවේ හා මැදපෙරදිග රටවල් වල එලෙස රැස්වන්නෝය.



ඔහුගේ ගෙල, පපුව සහ පිට තුවාල කැළැල් වලින් පිරී තිබිනි. බොහෝ අප්‍රිකානු කිතුණුවෝ පීඩාව යටතේ සිටින විට එය දරාගන්නා අන්දම දේවගැති වර්ම්බ්‍රාන්ඩ් අවබෝධකරගනී. VOM නැමැති මෙම සංවිධානයේ සේවා පවුල් 1960 ගණන් වල සිට අප්‍රිකාවට උපකාර යවා තිබේ.




ස්විස්ටර්ලන්ත සම්මේලනය–
"යකඩ කඩතිරය" පැවති සමයේදී එනම් කොමියුනිස්ට් සෝවියට් සංගමය නැගෙනහිර යුරෝපය පාලනය කල සමයේදී දේවගැති වර්ම්බ්‍රාන්ඩ් දහස් ගණන් දේව මෙහෙයන් තුල හා සම්මේලන තුල කථාකලේය. මේවා සංවිධානය කරන ලද්දේ VOM සංවිධානය විසිනි. දැන් එය ජාත්‍යන්තර කිතුණු සංවිධානය ලෙස පිහිටුවා තිබේ.



*20 වන ශත වර්ෂයේදී කිතුණුවන් රහසිගත ඇතුල්වීමේ මාර්ගසහිත පොළොව යට කාමර තුල දී ශුභාරංචිය මුද්‍රණය කලෝය. අපි ඊළඟ ශත වර්ෂයට යන විටත් එබඳු ක්‍රියා මැද පෙරදිග හා ආසියාව තුල සහ වෙනත් ප්‍රදේශවල නොකඩවා පැවැත්වෙනු ඇත. සිරකරුවෙකු වූ පාවුල් 2 තිමොති 2:9 තුල මෙසේ ලියයි. "මම නපුර කරන්නෙකු මෙන් (ශුභරංචිය වෙනුවෙන්) වේදනා විඳිමි. බැඳුම් වල විලංගුලා සිටිමි. එහෙත් දේව වචනය බැඳලා නැත."*



*නැගෙනහිර ජර්මනියේ දේශසීමාරක්ෂක සෙබලුන් විදින යන්ත්‍ර භාවිතාකරමින් මෝටර් රථවල "නීති විරෝධී" බයිබල ඇද්දැයි සොයා බලති.*



දේවගැති වර්බ්‍රාන්ඩ් බොහෝ ආගමික හා දේශපාලනික රැස්වීම් වල කථා කලේය. ඔහු "ඇඳහිල්ලේ ගෘහයෙහි අයවළුන්ට නොසලකා නොහරින ලෙස බටහිර රටවල වැසියන්ගෙන් ඉල්ලා සිටියේය. (ගලාති 6: 10) ඇමරිකානු කොංග්‍රස් සභාව ඉදිරියේ දී ඔහු තම කමිසය ගලවා පීඩා විදිම නිසා හටගත් තුවාල කැලලි පෙන්විය. භාෂා කිපයකින් චතුර ලෙස කථා කල හැකි ඔහු රුසියානු ප්‍රවෘත්ති පත්‍ර උපුටා දක්වමින් සභාව පිළිබඳව සඳහන් කර තිබෙන බොරු හෙලිදරව් කලේය.



*VOM දූතක සේවය පින්ලන්තය තුල දී බැඳුම් වල සිටින කිතුණුවන්ව සිහිපත්කරයි. (හෙබ්‍රෙව් 13:3)*





*70 ගණන් වල අගභාගයේදී ටොම් වයිට් හට ක්‍රිස්තියානි පොත පත කියුබාවට ගෙනයෑම හේතුකොටගෙන අවුරුදු 24ක සිර දඬුවමක් නියමකරන ලදී. බොහෝ VOM සේවකයින් පහරදෙනු ලැබ අත්අඩංගුවට ගෙන වෙඩි තබා මරා දමන ලදී.*



1900 ගණන් වල දී රහසිගත "සබත් පාසැලක්" සඳහා සෝවියට් සංගමය තුලදී කැලෑවකට ඇවිද යමින් සිටියදී. රහසිගත සබත් පාසැල් අදත් වියට්නාමයේ, ලාඕසයේ, චිනයේ, භූතානයේ, මැද පෙරදිග සහ වෙනත් ප්‍රදේශවල පැවැත්වේ.



රුසියාවේ අතුරු සිදුරු නැතිව පිරී යන සභාවන් ගැන කථාකරමින් රිචඩ් හා සබීනා වර්ම්බ්‍රාන්ඩ් යුවල ඔවුන්ගේ ජීවිත කාලය තුල දීම යකඩ කඩ තිරය බිඳදැමීම ගැන සාක්ෂිදරති.



1969 දී
උතුරු කොරියාවට ශුභාරංචි පොත් බැලුම් තුල බහාලා යවනු ලැබීම 30 අවුරුද්දකට පසු අදත් මෙම වැඩය නොකඩවා කරනු ලැබේ.



*කියුබාව*
*පිදෙල්කස්ත්‍රෝ බයිබල් එක් ලක්ෂයක් විනාශකලේය. 1970 මුල් භාගයේදී VOM සංවිධානය ගුවන් යානා වලින් මුහුදට ඉහාරංචි පොත් හෙලීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කලේය. ඒවා "කුරියර්" තැපැල් මලු ආධාරයෙන් එසේ බෙදාහරින ලදී.*



වර්ම්බ්‍රාන්ඩ් යුවල ඔවුන්ගේ මාතෘභූමිය වන රුමේනියාවට ආපසු පැමිනීම. එහිදී ඔව්හු රුමේනියාවේ සභාවන් තුල ජාතික රූපවාහිනියෙන් ඔවුන්ගේ සතුරන්ට සමාවදීමේ හා ප්‍රේම කිරීමේ පනිවිඩය ප්‍රකාශකලෝය.

කිතුණුවන්ට පීඩාකරන තැනැත්තන්ගේ සිත්හරවා ගැනීම කරණකොටගෙන අපි ඔවුන්ගේ ගොදුරක් බවට පත්වන අයව පමණක් නොව පීඩාකරන්නන්වද නිදහස්කරගත්තෙමු.

රහසිගත සභාව වහල් ජාතීන් තුල වහල්වී සිටින මනුෂ්‍යයින්ගේ ගැඹුරු අවශ්‍යතාවයන් නියෝජනය කරයි. ඇයට උපකාරකරන්න!

. . .

රහසිගත සභාවේ සුවිශේෂාත්මක අංග ලක්ෂණය වන්නේ ඇදහිල්ල තුල පැවතිමට එය දක්වන උනන්දුවයි.

"ජොර්ජ්" යන නමින් නම් වෙනස්කර මෙහි සිටි දේවගැතිවරයෙකු "දෙවියන්වහන්සේගේ රහසිගත" යන නාමය යටතේ ලියු ඔහුගේ පොත තුල පහත සඳහන් සිද්ධිය ලියා තිබේ.

රුසියානු හමුදා කපිතාන්වරයෙක් හංගේරියාවේ දේවගැතිවරයෙකු වෙත පැමිනියේය. ඔහු සමග තනිව කථාකරන්ට හමුදා නිලධාරියාට උවමනා විය. තරුණ කපිතාන්වරයා කලබල සහිත ඉවසුම් නැති අයෙක්ව සිටියේය. ඔහු ජයගත්තෙකු යන කල්පනාව ඔහුගේ සිතේ තදින් කා වැදී තිබුණේය. ඔහුව කුඩා සම්මන්ත්‍රණ කාමරයකට ගෙන යන ලදුව දොර ද වසා දමනු ලැබු විට බිත්තියේ එල්ලා තිබු කුරුසිය දෙස බලා හිස සොලවමින් ඔහු මෙසේ පැවසුවේය.

"මේ දෙය බොරුවක් බව ඔබ දන්නෙහිද?" යැයි ඔහු දේවගැතිවරයාට පැවසුවේය. "මෙය නුඹලා වැනි දේවගැතිවරු දිළිඳු මනුෂ්‍යයින්ව රැවටීම පිනිස සහ ධනවතුන්ට ඔවුන් ගැන නොසලකා සිටිමට පහසුකරවනු පිනිස භාවිතාකරන රැවටිලිකාර දෙයක්" යැයි ඔහු ඒ ගැන හැදින්විය. "දැන් එන්න. අපි තනිව සිටිමු. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් වන බව ඔබ කිසිකලෙක විශ්වාස නොකරන බැව් මා ඉදිරියෙහි පිළිගන්න."

දේවගැතිවරයා සිනහවිය. "නමුත් මාගේ දිළිඳු තරුණය ඇත්ත වශයෙන්ම මම එය විශ්වාසකරමි. එය සැබෑය" යනුවෙන් මුවගට නගාගත් සිනහවත් සමග පිළිතුරු දුන්නේය.

"මා හට රැවටීමට නොකරන්න. මෙය බරපතලයි. මා දෙස බලා සිනහ නොවන්න." යැයි කපිතාන්වරයා ගුගුලේය.

ඔහු තම රිවෝල්වරයගෙන දේවගැතිවරයාගේ සිරුරට ඵ්ං කලේය.

"ඔබ මේ බව එනම් එය බොරුවක් බව මා ඉදිරියේ පිළිනොගතහොත් මම ඔබට වෙඩි තබමි." යැයි ඔහු නැවතත් කෑ ගසා කිවේය.

"මට එය පිළිගත නොහැක. මන්ද එය සත්‍යයක් නොවේ. අපගේ ස්වාමීන්වහන්සේ සැබවින්ම සැබෑවු දේව පුත්‍රයාණෝය." දේවගැතිවරයා පැවසුවේය.

කපිතාන්වරයා තම රිවෝල්වරය බිමට විසිකොට දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාව වැළඳගනිමින් ඔහුගේ දෑස් වලින් වැගිරෙන කඳුළු සහිතව කථාකලේය.

"එය සැබෑය!" ඔහු කෑගැසුවේය. "එය සැබෑය. මම ද එය විශ්වාසකරමි. මා විසින් සොයාගන්නා තෙක් මෙම විශ්වාසය සඳහා මැරෙන්ට තරම් සහතික කමක් ඇතිව සිටින මනුෂ්‍යයා කවරෙකු දැයි මම නොදැන සිටියෙමි. අහෝ ඔබට ස්තුතියි! ඔබ මාගේ ඇදහිල්ල ශක්තිමත් කලෙහිය. දැන් මටද ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මියයන්නට පුළුවන. ඔබ මා හට එසේ කරන අන්දම පෙන්නුවෙහිය" යැයි පැවසුවේය.

මම මෙවන් වෙනත් අවස්ථාවල් ගැන ද අසා තිබේ. රුසියන්වරු රුමේනියාව අල්ලාගත් විට රුසියානු හමුදා සෙබළු දෙදෙනෙක් තමන්ගේ අතේ තුවක්කු ඇතිව සභාවකට ඇතුල්ව මෙසේ පැවසුවෝය. "අපි ඔබගේ ඇදහිල්ල විශ්වාස නොකරමු. මෙය අත්නොහරින කවර තැනැත්තෙකු වුවද ක්ෂණිකවම එක්වර වෙඩි තබා මරනු ලැබේ! ඔබගේ ඇදහිල්ල අත්හරින කවරෙකු නමුත් දකුණු පැත්තට වෙන්න!" යැයි ඔව්හු පැවසුහ.

සමහර දෙනෙක් දකුණු පැත්තට විය. ඔව්හු ඔවුන්ට දේවස්ථානයෙන් පිටව යන්නැයි අණදුන්නෝය. ඔව්හු ඔවුන්ගේ ජීවිත වෙනුවෙන් පලාගියෝය. ඉතිරිවු කිතුණුවන් සමඟ තනි වු රුසියානුවන් දෙදෙනා ඔවුන්ව වැළඳගනිමින් මෙසේ පැවසුහ. "අපි ද කිතුණුවන්වෙමු. අප සහභාගීත්වය පැවැත්වීමට බලාපොරොත්තු වන්නේ මේ සත්‍යතාවය මියයන්නට තරම් වටිනා එකක් යැයි සලකන මනුෂ්‍යයින් සමඟය."

එවැනි මනුෂ්‍යයන් ශුභාරංචිය වෙනුවෙන් සටන් කළ අතර අදටත් ආසියාවේ කොමියුනිස්ට් දේශයන් තුල සටන් කරති. එබඳු මනුෂ්‍යයෝ ශුභාරංචිය වෙනුවෙන් පමණක් නොව ඔවුන්ගේ නිදහස සඳහා ද සටන්කරන සටන්කාමීන්වූහ.

බොහෝ බටහිර කිතුණුවන්ගේ නිවෙස් තුල ඔව්හු ලෝකාකර සංගීතය අසමින් පැය ගණන් කල්ගෙවන්නෝය. අපගේ නිවෙස් වල ද මහත් හඩින් සංගීතය ඇසෙන්ට සලස්වන අවස්ථාද ඇත්තේය. එය ශුභාරංචිය පිළිබඳව සහ අපගේ රහසිගත වැඩ පිළිබඳව අප කථා කරන කරුණු නොඇසීමට යොදාගන්නා උපායකි. එමගින් අසල්වැසියෝ අප කථාකරන දේවල් වලට සවන් දී රහස් පොලිසියට අප ගැන තොරතුරු නොසපයන්නෝය.

කලාතුරකින් හෝ බටහිරින් පැමිණෙන තදබල කිතුණුවෙක්ව මුණගැසුණු විට රහසිගත සභාවේ කිතුණුවන් ඔවුන් ගැන ප්‍රීති වන අන්දම කෙතරම් කදිමද!

මේ ජේලි ලියන මනුෂ්‍යයා නොවැදගත් මනුෂ්‍යයෙක්ය. නමුත් එම හඩක් නැති අයගේ හඬකි. කට වසා බැඳ තිබෙන බටහිර රටවල් තුල නියෝජනය නොවන්නාවූ අයගේ හඬය. ඇදහිල්ලේ ගැඹුරත්වයක් හා කිතුදහමේ ගැටළු පිළිබඳ බැරෑරුම් ලෙස කල්පනාවට ගන්නා ලෙස මම ඔවුන් වෙනුවෙන් ඉල්ලා සිටිමි. වර්තමානයේ කොමියුනිස්ට් රටවල තුල හා වෙනස් වහල් ජාතීන් තුල රහසිගත සභාවේ පීඩා විඳින, විශ්වාසවන්ත තැනැත්තන්ට ඔබගේ යාච්ඤාවෙන් හා ප්‍රායෝගික උපකාර තුලින් උපකාර කරන ලෙස මම ඉල්ලමි.

. . .

අපි කොමියුනිස්ට්වරුන්ව දිනාගත යුතුය. ඒ මන්දයත් පළමුව, දෙවියන්වහන්සේ අපගේ පැත්තේ සිටින නිසාය. දෙවනුව, අපගේ පණිවිඩය හදවතෙහි ගැඹුරුතම අවශ්‍යතාවයන් වලට ගැලපෙන නිසාය.

නාසිවරු යටතේ සිරගතව සිටි කොමියුනිස්ට්වරු අමාරු අවස්ථා වලදී යාච්ඤා කළ බව මට පැවසුවෝය. "යේසුස්, යේසුස්" යන වචන පවසමින්, මේ වචන තොල් වල උච්චාරණය කරමින් කොමියුනිස්ට් නිලධාරීන් මිය යනු මා දැක තිබේ.

අපගේ සෙනඟගේ සියලුම සංස්කෘතික උරුමයන් අපගේ පැත්තේ වන නිසා අපි ජයගන්නෙමු. රුසියානුවන්ට වර්තමාන කිතුණුවන්ගේ සියලු ලියවිලි තහනම් කිරීමට පුළුවන. එහෙත් ටොලොස්ටොයි, සහ ඩොස්ටොයෙස්කි යන අයගේ පොත් තුල පවා ක්‍රිස්තුස්වහන්සේගේ ආලෝකය ඇත. නැගෙනහිර ජර්මනියේ ගොයෙත්, පෝලන්තයේ සිනිකෙවිස් යන අයගේ සහ වෙනත් අයගේ පොත් තුල පවා එය තිබේ. ශ්‍රේෂ්ඨතම රුමේනියානු ලේඛකයා ෂැඩොවීනුය. කොමියුනිස්ට්වරු "සාන්තුවරයින්ගේ ජීවිත" නමැති ඔහුගේ පොත "සාන්තුවරයින්ගේ ජනකථා" යන නමින් මුද්‍රණය කලෝය. මේ මාතෘකාව යටතේ වුවද සාන්තුවරයින්ගේ ජීවිත ආනුභාවය ගෙනදෙන ආදර්ශය වුයේය.

ඔවුන්ට රපායෙල්, මයිකල් ඇන්ජලෝ, ලියනාඩෝ ඩාවින්චි යන අයගේ කෘති කලා ඉතිහාසයෙහි නිර්මාන අතරින් වෙන්කොට නැවත මුද්‍රණය කරන්ට නුපුළුවන. මෙහි පින්තුර ක්‍රිස්තුස්වහන්සේ ගැන කථා කරයි.

මම කොමියුනිස්ට්වරුන්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කථාකරන විට ඔවුන්ගේ සිත්වල ගැඹුරුතම අවශ්‍යතාවය මාගේ සහකරුවා නොහොත් මාගේ උදව්කරුවා වී තිබේ. ඔවුන්ට තිබෙන ඉතාමත්ම අමාරුම කාර්ය්‍ය මාගේ තර්ක විතර්ක යනාදියට පිළිතුරු දීම නොවේ. ඔහුගේ මහත් අමාරුකම මාගේ පැත්තට සිටින ඔහුගේ හෘදසාක්ෂියෙහි හඬ නිශ්ශබ්ද කිරීමය.

තමන්ට, තමන්ගේ අදේවවාදී දේශනය කිරීමට උපකාර කරන ලෙස ඉල්ලා යාච්ඤා කල මාක්ස්වාදය පිළිබඳව මහාචාර්යවරයෙකු පිළිබඳවද මම පුද්ගලිකව දනිමි! කොමියුනිස්ට්වරු රහසිගත රැස්වීම් සඳහා දුර ඇත ප්‍රදේශවලට පවා යන බව මම දනිමි. ඔවුන්ව සොයාගනු ලැබු කල ඔව්හු රහසිගත රැස්වීම් වල සිටි බව ප්‍රතික්ෂේප කරති. අනතුරුව ඔව්හු තමන්ව එයට සහභාගීවීමට බල කෙරුනු ඇදහිල්ල සඳහා ධෛර්යමත්ව පෙනී සිටීමට නොහැකිවීම ගැන හඬති. එසේ වන්නේ ඔවුන්ද මිනිසුන් වන හෙයිනි.

එසේ ඇදහිල්ලට පැමිණි කල- එනම් ප්‍රාතමික ඇදහිල්ලට පැමිණි කල පවා - එම ඇදහිල්ල ධෛර්යමත් වී වර්ධනය වෙයි. එය ජයගන්නා බව අපි දනිමු. ඒ මන්දයත් රහසිගත සහාව වන අපි එය නැවත නැවතත් දැක ඇති නිසා එසේ වන බව දනිමු.

ක්‍රිස්තුස්වහන්සේ කොමියුනිස්ට්වරුන්ට හා "ඇදහිල්ලෙහි අනිත් සතුරන්ට" ප්‍රේමකරයි. ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගත යුතුය. දිනාගත හැකිය. මනුෂ්‍ය සංහතියෙහි ආත්ම ගැලවීම සඳහා යේසුස්වහන්සේගේ සිතෙහි ආශාව තෘප්තිමත් කරන්නාවූ කවරකු නමුත් ඔහුගේ වැඩය තුල රහසිගත සභාව රැකබලාගත යුතුය. "සියලු ජාතීන්ට උගන්වන්න" යේසුස්වහන්සේ පැවසීය. ශුභාරංචිය දේශනාකිරීමට අපට රජයේ අවසරය අවශ්‍ය වන බව ඔහු කිසිදිනක පැවසුවේ නැත. දෙවියන්වහන්සේට සහ මහ ආඥාවට විශ්වාසවන්ත වීම වහල් ජාතීන්ගේ දේශසීමා වලින් ඔබ්බට යෑම පිණිස අපට බලකරයි.

අපට දැනටමත් එහි පවතින රහසිගත සභාවන් සමග ක්‍රියාකරමින් ඔවුන් වෙතට ලගාවීමට පුළුවන.

## *රහසිගත සභාවේ අංගෝපාංග*

රහසිගත සභාව සමන්විත වන්නාවූ කණ්ඩායම් මෙසේය. පළමුව, පළමු කණ්ඩායම වශයෙන් ගැනෙන්නේ කොමියුනිට්වාදය සමග ශුභාරංචිය එකග කරලීමට උත්සහයේදී ඒ ගැන එකග නොවීම හේතු කොටගෙන තනතුරු වලින් පහ කරනු ලැබූ ලක්ෂ සංඛ්‍යාත සභා පාලකවරු සහ දේවගැතිවරුය. ඔවුන්ට ඔවුන්ගේ සභා හා රැල අහිමිවී ගොස් තිබේ. මෙවැනි බොහෝ සභා පාලකවරු හෝ දේවගැතිවරු ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් වසර ගණනාවක් සිරකරනු ලැබ පීඩා විදිනු ලැබ තිබේ. ඔවුන්ව නිදහස් කරනු ලැබූ පසු ඔවුන් ඔවුන්ගේ සේවය නැවත ආරම්භ කර තිබේ. රහසිගත සභාවේ ක්‍රියාකාරීත්වය තුල ඵලදායක ලෙස සහ රහසිගතව ඔව්හු ක්‍රියා කරමින් සිටිති. කොමියුනිස්ට්වාදීන් සහ වෙනත් ආකාර රජයේ සේවකයින් ඔවුන්ගේ සභාවන් වසා දමනු ලැබුවත් වඩා "විශ්වාසදායක" දේවගැතිවරුන්ගෙන් පිරෙව්වත් එම පාලකවරු රහසිගත රැස්වීම් තුල රහසිගතව පෙරට වඩා ඵලදායක ලෙස ක්‍රියාකරමින් සභා පාලකවරු ලෙස ගොවිපලවල අට්ටාලවල, පොළොව යට කාමර වල, රාත්‍රියේදී කමත් වල හෝ ඔවුන්ට රහසේ රැවටිය හැකි ඕනෑම ස්ථානයක රහසිගතව සේවයකරති. මෙකී මනුෂ්‍යයෝ "ජීවමාන ප්‍රාණපරිත්‍යාගීවරුන්ය." ඔව්හු ඔවුන්ගේ සේවාව අත්නොහළෝය. ඔව්හු වඩ වඩා පීඩා විදිමේ අවදානමට සහ නැවත අත් අඩංගුවට ගැනීමේ අවදානමට ලක්වන්නෝය.

රහසිගත සභාවේ දෙවන කණ්ඩායම නම් කැපවූ ගිහි මනුෂ්‍යයින්ගෙන් සැදුම්ලත් සුවිශාල ආත්මික හමුදාවයි. ලොව ජීවත්වන මනුෂ්‍යයන් සෑම පස්දෙනෙකුගෙන්ම එක් අයෙකු කොමියුනිස්ට් විනය තුල ජීවත් වෙති. එහි රජයේ “අවසරයක්” නොමැතිව ශුභාරංචි සේවයේ යෙදෙන කිතුණුවන්, ගිහියන් දහස්ගණනක් සිටිති. පීඩාවට හැමවිටම වඩා හොඳ කිතුණුවෙක්ව නිපදවයි. සාක්ෂිදරන කිතුණුවෙක්ව, ආත්ම දිනාගන්නා කිතුණුවෙක්ව නිපදවයි. කොමියුනිස්ට්වරුන්ගේ පීඩාව ආපස්සට ඇවිලී ඇති අතර එයින් තද සිතක් ඇති කැපවූ කිතුණුවන් නිපදවයි. එවැනි කිතුණුවන් නිදහස් දේශයක් තුල දක්නට ලැබෙන්නේ කලාතුරකිනි. යමෙකුට කිතුණුවෙක් වන්ට පුළුවන්කම තිබෙන අතර ඔවුන්ට මුණගැසෙන සෑම ආත්මයක්ම දිනාගැනීමට උවමනා නොවන අයෙකුවීම මේ මනුෂ්‍යයන්ට අවබෝධකරගත නොහැක.



> පීඩාව සැමවිටම වඩා හොද කිතුණුවෙක්ව, ආත්ම දිනන්නාවූ කිතුණුවෙක්ව නිපදවයි.

රතු තරුව (රුසියානු හමුදා පුවත් පත) රුසියානු කිතුණුවන්ට පහර දෙමින් මෙසේ පවසයි. “ක්‍රිස්තුස්වහන්සේට නමස්කාර කරන්නවුන් සියලු දෙනාම තම රුදුරු නියපොතු වලින් හැම කෙනෙක්ම ග්‍රහණය කරගන්නට උත්සාහ කරයි.” එහෙත් ඔවුන්ගේ දිලෙන කිතුණු ජීවිත ඔවුන්ගේ අනුගාමික ගම් වැසියන්ගේ සහ අසල්වැසියන්ගේ ප්‍රේමය හා ගෞරවය දිනාගනි. ඕනැම ගම්මානයක හෝ නගරයක කිතුණුවන් ඉතාමත් ප්‍රිය ප්‍රසන්න, සැවොම කැමති වැසියන්වේ. මවක් තම දරුවන් රැක බලා ගැනිමට නොහැකි තරමට රෝගී වූ විට කිතුණුවන් පැමිණ ඔවුන් රැක බලා ගනි. පුරුෂයෙකු තමන්ගේ දර කපා ගැනීමට තරම් නොහැකි අන්දමට රෝගී වූ විට කිතුණුවකු පැමිණ ඔහු වෙනුවෙන් ඒ දෙය කර දෙයි. ඔව්හු ඔවුන්ගේ ක්‍රිස්තියානිය තුල ජීවත් වෙති. ඔවුහු ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂිදරන්ට යන විට මනුෂ්‍යයෝ සවන් දී විශ්වාස කරති. ඒ මන්දයත් සියලු දෙනාම ඔවුන්ගේ ජීවිත තුල ක්‍රිස්තුස්වහන්සේව දැක ඇති හෙයිනි. නිල සභාවක දේශනා කල හැක්කේ අන් කිසිවකුට නොව බලපත්‍ර ලත් දේවගැතිවරයෙකුට පමණි. ලක්ෂ සංඛ්‍යාත ජ්වලිත, කැපවූ කිතුණුවන් කොමියුනිස්ට් ලෝකයේ සෑම

විඳී කොණකම ආත්ම දිනාගනී; සාක්ෂි දරයි; වෙළඳ පොලවල සිට උපස්ථාන කරයි; ගම්මානයේ ජලය බෙදාහරින නල ලිං පවතින ස්ථාන වල ස්ව සේවය කරති. ඔවුන් යන සෑම ස්ථානයකදීම සේවය කරයි. කිතුණු මස් කඩකරුවන් ඔවුන් මස් ඔතනා කොල තුල ශුභාරංචි පත්‍රිකා බෙදාහරින බව කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍ර පිළිගනී. කොමියුනිස්ට් මුද්‍රණාල වල අධිකාරිත්වය දරණ තැනැත්තන්, අධිකාරිත්වය දරණ කිතුණු පුද්ගලයින් මධ්‍යම රාත්‍රියේදී ඔවුන්ගේ මුද්‍රණාලයත් ආරම්භකොට කිතුණු මුද්‍රිත පත්‍රිකා දහස් ගණනක් මුද්‍රණය කොට නැවත එය ඉරු උදාවෙන්ට පෙර වසාදමන බව කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍ර පිළිගනී. තවදුරටත් මොස්කව් කිතුණු දරුවන්ට "කිසියම් ආකාරයකින්" ශුභාරංචි පොත් ලැබෙන බවත් ඔව්හු ඒවායේ කොටස් අතින් පිටපත් කරනු ලබන බවත් කොමියුනිස්ට් මුද්‍රණාලය තවදුරටත් පිළිගනී. පාසැල් රාක්කයේ එල්ලා තිබෙන ඔවුන්ගේ ගුරුවරුන්ගේ කබායන් තුල මේ ළමයි මෙසේ අතින් පිටපත්කරගන්නා කොටස් බහාලති. ගිහි පුරුෂ සහ කාන්තාවන්ගෙන් බලකාය අතිශයින් බලවත්ය. ඵලදායකය. ඔවුන් සෑම කොමියුනිස්ට් දේශයක් තුලම දැනටමත් ආත්ම දිනාගන්නාවු මිෂනාරී බලවේගයක් බවට පත් වී ඇත.

ගිහි සභාව තුල සිටින ඇදහිලිවන්තයින් කෝටි සංඛ්‍යාත ගණනක් කැපවූ, සැබෑ ජ්වලිත ඇදහිලිවන්තයින් එම පීඩාවේ ගින්නෙන් විනාශ වෙනවා වෙනුවටපවිත්‍රකරණු ලැබේ.

කොමියුනිස්ට් කියුබාව තුල රජයේ පීඩා මධ්‍යයේ වුව ද දහස් ගණනක් ගෘහ සභා පැන නැගී ඇත. කියුබාවේ ක්‍රිස්තියානි කවුන්සලය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ මාක්ස්වාදී සභා නායකයින්ගෙනි.

රහසිගත සභාවේ තුන්වෙනි වැදගත් අංශය නිල සභාව තුල විශ්වාසවන්ත පාලකවරුන්ගෙන් සැදුම්ලත් විශාල කන්ඩායමයි. ඔව්හු කටකලියාවකින් බඳිනු ලැබ සිටින නිශ්ශබ්ද "සභාවයි". රහසිගත සභාව නිල සභාවෙන් සම්පූර්ණයෙන්ම වෙන්වූ එකක් නොවේ. පෝලන්තයේ, හංගේරියාවේ, සහ කලින් යුගොස්ලෝවියාව නමින් හැඳින්වූ රටෙහි කොමියුනිස්ට් පාලනය තුලදී නිල සභාවේ බොහෝ පාලකවරු රහසිගතව රහසිගත සභාව තුල සේවය කලෝය. සමහර රටවල වර්තමානයේ පවා මේ දෙක අතර අන්තර් වශයෙන් එකක් අනිකක් පිට ගෙතුනු ස්වභාවයක් දක්නට ලැබේ. පාලකවරුන්ට ඔවුන්ගේ කුඩා, එක් කාමරයකින් සැදුම්ලත් සභාවන්

වලට පිටින් වෙනත් කිසිදු ස්ථානයක ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව දේශනාකිරීමට ඉඩදෙනු නොලැබේ. ඔවුන්ට ළමා රැස්වීම හා තරුණ රැස්වීම් පැවැත්වීමට ඉඩ දෙනු නොලැබේ. කිතුණු නොවන අය එහි පැමිනිමට බියවෙති. සභා පාලකවරුන්ට ඔවුන්ගේ නිවෙස්වලදී රෝගී සහා සමාජිකයින් වෙනුවෙන් යාච්ඤා කිරීමට ඉඩදෙනු නොලැබේ. ඔවුන්ට කොමියුනිස්ට් නිති වල සෑම අංශයක් මගින්ම වැඩකඩලු බැඳ ඇත. එලෙස ඔවුන්ගේ "සභා" සැදී ඇති නමුත් ඒ සියල්ල අර්ථ විරහිතවේ.

නිතරම මෙහි පාලකවරු "ආගමික නිදහස" විහිළුවකට ලක්කරනු ලබන මේකී සීමාකිරීම් අභිබවා යන සමාන්තරගත රහස් දේව සේවයක් පවත්වාගෙන යති. ඔවුන් ඒවා පවත්වාගෙන යන්නේ ඔවුන්ගේ නිදහස අවදානමකට ලක්කරමිනි. මේකී පාලකවරු රහසිගතව ළමයින්ට හා තරුණයින්ට උපස්ථාන කරති. මැදපෙරදිග රටවලදී සහා උ. අප්‍රිකාවේදී කිතුණු නිවෙස්වල හා පොළොව යට කාමර වල රහසිගතව ඔව්හු ශුභාරංචි සේවයේහි යෙදෙති. ආසියාවේද එසේ කරති. ඔව්හු රහසිගතව කිතුණු පත්‍රිකා ලබාගෙන පිපාසිතව සිටින ආත්ම වලට ඒවා රහසිගතව බෙදාහරිති. රජයේ නිතිරීති නොසලකා හරිමින් ඔව්හු රහසිගතව ඔවුන්ගේ නිදහස අවදානමට ලක්කරමින් ඔවුන් වටා සිටින සියලු පිපාසිත ආත්ම වලට සේවය කරති. බාහිර ලෙස පෙනෙන පරිදි කීකරුවන්තකම පෙන්වමින් දේව වචනය පතුරුවා හැරීම පිනිස රහසිගතව ඔවුන්ගේ ජිවිත තුල ඔව්හු මෙලෙස ක්‍රියාකරති. කලින් පැවති සෝවියට් සංගමයේ දී මෙවැනි පුරුෂයින් බොහෝ ගණනක් සොයාගනු ලැබ අත්අඩංගුවට ගෙන වසර කීපයක් සිරගත කරන ලදි.

වර්තමානයේ පවා බොහෝ පුරුෂයින් හා ස්ත්‍රීන් මෙලෙස අත්අඩංගුවට ගනු ලබති. ඔව්හු සීමා කිරීම් පනවා ඇති ජාතීන් තුල රහසිගත සභාවේ වැදගත් කොටස් වෙති.

තමුන්ගේ සභා වලින් පලවාහැර තිබෙන කලින් සිටි දේවගැතිවරු සහ රජයේ නිලධාරීන් විසින් පීඩාවට පත්කරන ලද එවැනි තැනැත්තන් ගිහි සභාවන් සහ නිල පාලකවරු මෙලෙස ඔවුන්ට අවසරදී ඇති ප්‍රමාණයට වඩා වැඩියෙන් විශාල වශයෙන් හා පුළුල් වශයෙන් රහසිගතව සේවය කරති. මේ සියල්ලෝම රහසිගත හෝ "නිල නොවන" සභාව තුල ක්‍රියාකරති. රහසිගත සභාව කොමියුනිස්ට්වාදයේ කෙලවර දක්වා සහ අනිකුත් මෙවන් "වාදයන්" පරාජය වන තුරු පවතින්නේය. සමහර

රටවල එක් අංශයක් අනිත් අංශ වලට වඩා ක්‍රියාශීලිව පවතී. එහෙත් ඒ සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මහත් අවදානමක් ඇතුව ක්‍රියාකරති.

**පාලකවරුන්ට ඔවුන්ගේ කුඩා, එක් කාමරයකින් සමන්විත සභාවෙන් පිටත වෙනත් කිසිදු ස්ථානය ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කථාකරන්ට ඉඩදෙනු ලැබ නැත.**



කොමියුනිස්ට් දේශයක් තුල නිතරම ගමන් කරන, ආගමික ප්‍රශ්න ගැන උනන්දුවක් දක්වන මනුෂ්‍යයා එවැනි සංචාරයකට පසු ආපසු පැමිණ ඔහුට රහසිගත සභාව මුණනොගැසුණු බව වාර්තාකලේය.

එය හරියට මධ්‍යම අප්‍රිකාවේ නුගත් ගෝත්‍ර අතර ගමන්කරමින් ආපසු පැමිණ මම තදින් විමසා බැලුවෙමි. ඔවුන් සියල්ලෝම ග්‍රාම්‍ය භාෂාවෙන් කථාකරන්නේ දැයි මම විමසුවෙමි. ඔව්හු එසේ නොකරන බව මා හට පැවසුවෝය." යනුවෙන් පවසනවා වැනි දෙයකි. සත්‍යතාවය නම් ඔව්හු සියල්ලෝම ග්‍රාම්‍ය භාෂාවෙන් කථාකරන නමුත් ඔව්හු ග්‍රාම්‍ය භාෂාවෙන් කථා කරන බව ඔවුන් නොදනිති.

පළමුවන දශකයේ කිතුණුවෝ ඔව්හු කිතුණුවන් බව නොදැන සිටියහ. ඔවුන්ගෙන් ඔවුන්ගේ ආගම පිළිබඳව ප්‍රශ්න කලේ නම් ඔව්හු යුදෙව්වන් බව පවසනු නොඅනුමානය. ඊශ්‍රායෙල්වරු, යේසුස්වහන්සේව මෙසියස්වහන්සේ ලෙස විශ්වාසකරන්නවුන්, සහෝදරයින්, ශුද්ධවන්තයින්, දේව දරුවන් ලෙස ඔව්හු පිළිතුරු දෙනු නොඅනුමානය. කිතුණුවන් යන නාමය ඔවුන්ට දෙනලද්දේ පසුකලෙකදී වන අතර එය ප්‍රථමවරට දෙනලද්දේ අන්තියෝකියේ දීය.

ලූතර් අනුගාමිකයින් කිසිවෙකු ඔව්හු ලූතරන්වරු යැයි දැන නොසිටියහ. මේ නමට විරුද්ධව ලූතර් තදින් විරෝධය පළකලේය.

"රහසිගත සභාව" කොමියුනිස්ට්වරුන් විසින් දෙන ලද නාමයකි. නැගෙනහිර යුරෝපයේ ආගමික වතාවරණය පිළිබඳව පර්යේෂණ කරන බටහිර රටවල වැසියන් විසින් ද ක්ෂනිකව බිහිවු මේ රහසිගත සංවිධානයට මෙම නාමය දෙන ලදි. මේ සංවිධානය සියලු කොමියුනිස්ට් ජාතීන් තුල පවතින්නකි. රහසිගත සභාවේ සමාජිකයින් ඔවුන්ගේ සංවිධානය මේ නාමයෙන් නොහඳුන්වති. ඔහු ඔවුන්ව හඳුන්වන්නේ කිතුණුවන්, ඇදහිලිවන්තයින්, දේව දරුවන් යනාදී ලෙසටය. එහෙත් ඔවුන් රහසිගතව වැඩ කිරීමට යොමුවෙති: රහසිගතව රැස්වෙති: නිති විරෝධි රැස්වීම් වලදී ශුභාරංචිය බෙදාහරිති. විදේශකයින් මේ සභාවට පැමිණෙන නමුත් ඔව්හු රහසිගත සභාව නුදුටු බව කියාපාති. එය, මෙම පුදුමාකාර රහසිගත සංවිධානය ලෙස පිටත සිට ප්‍රේමයෙන් බලන්නාවු අය සහ එහි සතුරන් විසින් දෙන ලද එයට ප්‍රමාණවත් වුනු නාමයකි.

ඔබ බටහිර ජාතීන් පුරා වසර ගණනක් ගමන් කල නමුත් ජාත්‍යන්තර ඔත්තු සේවා ජාලයක් ඔබ මුණ නොගැසුණු බව පවසයි. එයින් අදහස්කරන්නේ මේ ඔත්තු සේවා ජාලය නොපවතින බව නොවේ. උනන්දුව දක්වන සංචාරකයින් හට එය පෙන්වීමට තරම් ඔව්හු මෝඩ නොවෙති.

ඊළඟ පරිච්චේදයේ දී සෝවියට් මුද්‍රණාල මගින් දශකයකට ඉහත මුද්‍රණයකරන ලද ප්‍රවෘත්ති පත්‍ර ලිපි මම උපුටාදන්වම්. නිර්භීත වු මේ රහසිගත සභාවේ පැවැත්ම සහ එහි වර්ධනයවන්නා වු වැදගත්කම මේ ලිපිවලින් සනාථකර දක්වයි.

# 6 පරිච්ඡේදය



# ක්‍රිස්තියානිය මගින් කොමියුනිස්ට්වාදය පරදවන අන්දම

සෝවියට් හමුදාව තුල මෙන්ම කොමියුනිස්ට් රුමේනියාව තුල ද රහසිගතව ක්‍රිස්තුස්වහන්සේගේ පනිවිඩය පතල කර හැරීම තුල මාගේ අත්දැකීම් මම ඔබට පවසා ඇත්තෙමි. කොමියුනිස්ට්වරුන්ට ක්‍රිස්තුස්වහන්සේව දේශනාකිරීමට උපකාර කරන ලෙස මම අයැද සිටිමි. ඔවුන්ව පීඩනයට පත්කරන මනුෂ්‍යයින්ට ක්‍රිස්තුස්වහන්සේව දේශනාකිරීමට ද මෙලෙස උපකාර කරන ලෙස ද මම ඔබගෙන් ඉල්ලා සිටිමි. මාගේ අභියෝගය සිහිනයක්ද? "ක්‍රියාත්මක කල නොහැකි" එකක්ද? එය සැබෑ එකක්ද?

රහසිගත සභාව ආසියාවේ කොමියුනිස්ට් රටවල සහ වෙනත් වහල් ජාතින් තුල තවමත් පවතිනවාද? රහසිගත වැඩ තවමත් එහි කරන්නට පුලුවන්ද?

මෙකී ප්‍රශ්න වලට ඉතාමත් හොඳ ප්‍රවෘත්ති වලින් පිළිතුරුදීමට පුලුවන.

කොමියුනිස්ට්වරු අවුරුදු 50කට පවා වැඩි කාලයක් පාලනය පවත්වාගෙන ගියහ. ඔව්හු එම පාලනය පිළිබඳ උත්සව පැවැත්තුවෝය. එහෙත් ඔවුන්ගේ ජයග්‍රහනය පරාජයක් විය. ක්‍රිස්තියානුවන් ජයගත්තෝය.

කොමියුනිස්ට්වරු ජයනොගත්තෝය. රුමේනියානු ප්‍රවෘත්ති මාධ්‍ය අපගේ සංවිධානය ගැන තදින් විමර්ශනය කලේය. එය රහසිගත සභාව පිළිබඳ අශුබවාදී ප්‍රචාරක කටයුතු වලින් පිරී එකක් විය. රුමේනියානු රහසිගත සභාව කොතරම් ශක්තිමත් එකක්ද කිවහොත් එය අර්ධ වශයෙන් ප්‍රසිද්ධියේ ක්‍රියාකලේය. කොමියුනිස්ට්වාදීන් බියගන්වමින් ක්‍රියාකලේය. තවද කලින් සෝවියට් සංගමයේ වර්තමාන නායකත්වය දැන් කොමියුනිස්ට් ප්‍රවෘත්ති මාධ්‍යයේ වාර්තාවන් ස්ථිරකරයි.

මෙය මතක තබාගන්න. ලොව පුරා රහසිගත සභාව මුහුද මතුපිටින් පැන නැගෙන අයිස් කන්දක් හා සමානය. එයින් බෝහෝ කොටසක් මතු පිටට නොපෙනි ඉන් පහළ සැගවී තිබේ. එහෙත් කුඩා කොටසක් මතු පිටට පෙනෙන සේ ක්‍රියාකරයි.

පහත සඳහන් පිටුවල 20වන ශත වර්ෂයේ ඔවුන්ගේ ජයග්‍රාහී වැඩවලින් කීපයක් ගැන කෙටි රචනාවක් මම තබාගෙන ඇත.

## *අයිස් කන්දක් මුදුනේ*

1966 නොවැම්බර් 7වන දින කොකෙෂස් කඳුවැටියේ සුහුම් නම් ස්ථානයේ විවෘත ස්ථානයක රහසිගත සභාව මහත් රැස්වීමක් පැවැත්විය. වෙනත් නගර වලින් පවා බෝහෝ ඇදහිලිවන්තයෝ මේ ස්ථානයට පැමිනියෝය. පුජාසනය ඉදිරියට කරනලද කැඳවීමෙන් පසු තරුණයින් 47 දෙනෙක් ක්‍රිස්තුස්වහන්සේව පිළිගනු ලැබ කළුමුහුදේ එම ස්ථානයේ දිම බව්තිස්ම කරනලදි. මෙය බයිබලය කාලය මෙන් සිදුවිය.

කොමියුනිස්ට් ආඥාදායකත්වයෙන් දශක කීපයකට පසුව වුවද බයිබල් නොමැතිව වෙනත් කිතුනු පොත් නොමැතිව, සෙමනේරි නොමැතිව, රහසිගත සභාවේ දේවගැතිවරුන් නොමැතිව, පුහුණු කරන ලද දේව ධර්මාඥයින් නොමැතිව මෙය සිදුවේ. උපස්ථායෙකු වු පිලිප්ද නොමැතිව මෙය සිදුවේ. එහෙත් එක් පැයක් පමන සමහර විට කථාකරනලදුව නපුංසකයෙකු සමග පිලිප් කලාක් වැනිම, නපුංසකයා විසින් මෙසේ අසන්නට යෙදුනි. "බලන්න මෙන්න වතුර, මාව බව්තිස්ම කරනු ලැබිමට පවතින බාධාව කුමක්ද?" එවිට පිලිප් මෙසේ පැවසුවේය. "ඔබ මුළු හදින්ම විශ්වාස කරන්නේ නම් ඔබට එසේ කරන්නට පුලුවන.......!" පිලිප් හා නපුංසකයා ජලය වෙත බැස ගිය අතර පිලිප් විසින් නපුංසකයාව බව්තිස්ම කරනලදී (ක්‍රියා 8:36-38).

කළුමුහුදේ මේ සඳහා ප්‍රමාණවත් ජලය තිබේ. එබැවින් රහසිගත සභාව බයිබලීය කාලයේ ක්‍රියාකාරීත්වයෙන් නැවත පිහිටෙව්වේය. අද කොමියුනිට්ස් පක්ෂය තවදුරටත් රැසියාව පාලනය නොකලද සමහර සෝවියට් සමුහාණ්ඩුව තුල කිතුණුවන් තවමත් පීඩාවිඳිති.

1966 අගෝස්තු 23 වන දින "උච්ටෙල්ස්කෙයා ගැසටා" නැමති ප්‍රවෘත්ති පත්‍රය (ගුරුවරුන්ගේ සඟරාව) මෙලෙස වාර්තා කරයි. කොමියුනිස්ට්වරුන් විසින් පත්කරනලද ඔවුන්ගේ ව්‍යාජ "නායකයින්" හට කීකරුවීම හා තමුන්ගේ සභාවේ සාමාජිකයින් ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේපකල බැප්ටිස්වරු විසින් රෝස්ටොව් ඔන් ඩොන් හි විදි දිගේ විරෝධය පෑමක් සංවිධානය කරනලදී.

මෙය මැයි 01 දින සිදුවිය. යේසුස්වහන්සේ උන්වහන්සේගේ විරුද්ධවාදී ෆරිසිවරුන්ගේ තර්ජන නොසලකා ක්‍රියාකිරීම පිනිස සබත් දින හාස්කම් සිදුකලාක් මෙන්ම කොමියුනිස්ට් නිති වල තර්ජන නොසලකා ක්‍රියාකිරීම පිනිස සමහර විටෙක කොමියුනිස්ට් උත්සව දිනයක්ම රහසිගත සභාව විසින් තෝරාගන්නාලදී. මැයි මස 01 දින කොමියුනිස්ට්වරුන්ගේ උත්සව දිනයක් විය. ඔවුන් මෙදින විශාල පෙළපාලි පවත්වන දිනයක් විය. සැම අයෙකුටම එවාට සහභාගිවීම අනිවාර්ය කෙරිනි. එහෙත් මේ දිනයේ රුසියාවේ දෙවැනි විශාලතම බලවේගය වන රහසිගත සභාවද විදිවල පෙනිසිටියාය.

ඇදහිලිවන්තයෝ 1500ක් මෙයට පැමිනියහ. දෙවියන්වහන්සේ කෙරෙහි ඔවුන්ගේ ප්‍රේමය ඔවුන් තුල ඇතිකර තිබු පෙළඹවීමක මහත! ඔවුන්ගේ නිදහස අවදානමට තබන බව දැනදැනත්, සිරගෙය තුල කුසගින්නේ වධ විඳින්නට සිදුවන බව දැනදැනත් ඔවුහු මෙසේ කලහ.

සිරගෙය තුලදී තම ස්වාමිපුරුෂයා මියගිය පුවත කුලුන්දා ගම්මානයේ හමාරා සොයුරිය දැනගත් ආකාරය විස්තර කරන "සීක්‍රට් මැනිෆෙස්ටෝ" නැමැති කෘතිය බාර්නාවුල්හි ඉවැන්ජලිස්ත කිතුණුවන් විසින් මුද්‍රණය කළ බව රුසියාවේ සියළු ඇදහිලිවතුන් දැන සිටියෝය. ඇය කුඩා ළමුන් හතරදෙනෙකු සමග වැන්දඹුවක් බවට පත්වුවාය. ඇයට ඇගේ ස්වාමිපුරුෂයාගේ සිරුර ලැබෙන විට ඔහුගේ අතේහි මාංචුවල ලකුණු ඇයට දක්නට හැකිවිය. ඔහුගේ අත් ඇඟිලි හා පාද පත්ල භයානක ලෙස පිලිස්සී තිබිනි. කුසෙහි පහල කොටසෙහි පිහි පහරවල්වල සලකුණු තිබිනි. ඔහුගේ දකුනු පාද ඉදිමී තිබිනි. පාද

දෙකෙහිම පහර දීම් වල සලකුණු තිබිනි. ඔහුගේ මුලු සිරුරෙහිම භයානක වද්දීම් වල තුවාල ලකුණු පිරී පැවතිනි.

සෑම ඇදහිලිවන්තයෙක්ම, මේ ප්‍රසිද්ධ පෙළපාලියට සහභාගිවීමේ ඉරණම මේ බව දැන දැනත් රොස්ටව් ඔන් ඩොන් වෙත පැමිණියෝය.

මේ ප්‍රාණ පරිත්‍යාගිවරයා තමාගේ ජීවිතය දෙවියන්වහන්සේට දුන්නේ ඔහුගේ සිත්හැරීම සිදුවී මාස තුනකට පමණ පසුවය. ඔහුගේ භූමදානයට පහත සඳහන් ශුද්ධ ලියවිලි පාට පුවරුවල සඳහන්කරගත් මහත් ඇදහිලිවන්තයින් සමුහයක් පැමිනියෝය.

"ජීවත්වීම ක්‍රිස්තුස්වහන්සේ උදෙසාය මරණය මට ලාභයක්ය" (පිලිප්. 1:21)

"ශරීරය නසන්ට පුලුවන්වූ අයට භය නොවෙල්ලා එහෙත් ඔවුන්ට ආත්මය නසන්ට නුපුලුවන" (මතෙව් 10:28)

දේව වචනය සඳහා මරාදමනු ලැබුවන්ගේ ආත්ම පූජාසනය යට තිබෙනවා මම දුටුවෙමි. (එළිද 6:9)

මේ ප්‍රාණ පරිත්‍යාගිවරයාගේ අදර්ශයේ අනුභාවය රොස්ටව් ඔන් ඩොන් හි පැතිර ගියේය. මහජනකාය කුඩා නිවස වටා රොක්වුනි. මනුෂ්‍යයෝ සෑම අතකින්ම රැස්වුනි. සමහරු අසල වහලවල් මත නැගුනෝය. සමහරු සකෙවුස් මෙන් ගස් මතට නැගුනෝය. මනුෂ්‍යයෝ 80 දෙනෙක්ගේ සිත් හැරුනෝය. බොහෝ දෙනෙක් තරුණයින්ය. මේ ගණනින් 23 ක් කලින් කොම්සොමොල් හි සමාජිකයෝය. (තරුණ කොමියුනිස්ට් සංවිධානයේ සමාජිකයෝය.)

කිතුනුවන් ඩොන් ගංගාව වෙත ඇවිද ගියෝය. තවද ඇදහිලිවන්තයෝ එහිදී බව්තිස්ම කරනුලැබූහ.

කොමියුනිස්ට් පොලිසියේ වාහන විගස ඒ ස්ථානයට ළඟාවිය. පොලිසිය ගං ඉවුර දිගේ ඇදහිලිවන්තයින්ව වටකරනු ලැබුවෝය. සහෝදරයින්ගේ නායකයින්ව අත් අඩංගුවට ගැනීමට ඔවුන්ට උවමනාවිය. (ඔවුන්ට 1500 දෙනා සහ මුලින්ම අත් අඩංගුවට ගැනීමට නොහැකිවිය.) ඇදහිලිවන්තයෝ ක්ෂනිකව දණගසා තදබල ලෙස යාච්ඥාකරන්නට

වුහ. ඔවුහු තමසෙනග ආරක්ෂා කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටියහ. එම දිනයේ මේ දේව මෙහෙය බාධාවකින් තොරව පවත්වන්නට දෙවියන්වහන්සේගෙන් අවසර ඉල්ලුවෝය. අනතුරුව සහෝදර සහෝදරියන් එකිනෙකා පවුරක් ලෙස ලංවෙමින් මේ දේව මෙහෙයට නායකත්වය දුන් අය වටා රොක්වුහ. පොලීසිය ඔවුන්ව අත්අඩංගුවට ගැනිම වැලක්විම බලාපොරත්තුවෙන් ඔවුහු එසේ කලහ. වාතාවරණය ඉතාමත් උණුසුම් විය.

"උච්ටෙල්ස්කෙයා ගැසටා" වාර්තා කල අන්දමට මේ "නිති විරෝධි" බැප්ටිස් සංවිධානය සතුව රොස්ටොවෙහි රහසිගත මුද්‍රණාලයක් ද පැවතුනි. (රුසියාවේ "බැප්ටිස්" යන වචනය ඉවැන්ජලිකල් සහා සඳහාත් පෙන්තකොස්ත සභා සඳහාත් පොදුවේ භාවිතාවේ.) මේ රහසිගත මුද්‍රණාලයේ තරුණයින්ව ඔවුන්ගේ ඇදහිල්ල සඳහා ස්ථිරව සිටින්නට කැඳවනලදි. "එමෙන්ම දරුවන් භූමදානය කරන ස්ථානයට ගෙනයන ලෙසත් මේ ලෝකයෙ දේවල් ගැන කනස්සලු නොවන ලෙස ඉගෙනගන්නා පිණිස එසේ කරන ලෙසත්" ඔවුන් දෙමව්පියන්ගෙන් ඉල්ලා සිටිනලදි. දෙමව්පියෝ කොමියුනිස්ට් පාසැල්වල දරුවන් දෙනු ලබන විෂ සහිත අදේවවාදි ඉගැන්විම් වලට විරුද්ධව ප්‍රතිවිෂ වශයෙන් ඔවුන්ගෙ දරුවන්ට කිතුණු අධ්‍යාපනය ලබාදිමට පවා ධෛර්යමත්වුහ.

රහසිගතව බව්තිස්මය කරනු ලබන රහසිගත දේව සේවකයින්ගේ නඩු විභාගවලදි සිදුවන දේ පිළිබඳව පවා මෙකි "ගුරුවරුන්ගේ සඟරාව" වාර්තාකරයි. "තරුණ ඇදහිලිවන්තයින් සාක්ෂි දරන්නන් ලෙස නිර්භිතව ක්‍රියාකරන අතර ඔව්හු කොමියුනිස්ට් අධිකරණය තුලදි අධිකරණයට අපහාසාත්මක අයුරින් හැසිරිණි. ඔව්හු කෝපාවිෂ්ටව හා උමතුවු අයුරින් හැසිරෙති. තරුණ කාන්තා නිරික්ෂකයින් විත්තිකාරයින් දෙස අගේ කිරීමෙන් යුතුව නෙත් නොහෙලා බලා සිටින අතර අදේවවාදි මහජනයා වෙත අනුමාන නොකරන ලීලාවෙන් හැසිරෙති."

රහසිගත සභාවේ සාමාජිකයින් සිරගතකිරිම් හා පහරදිම් ගැන අවදානම් යටතේ වුවද රුසියාවේ කොමියුනිස්ට් පක්ෂ මුලස්ථානය ඉදිරියේ දි පවා වැඩි නිදහසක් ඉල්ලා සිටින්නට වුහ.

රහසිගත මාර්ග ඔස්සේ බටහිරට ගෙනඑනු ලැබු ලියවිල්ලක් අප සතුවේ. මේ ලියවිල්ල සෝවියට් සංගමයේ ඉවැජලිකල් බැප්ටිස්ට් සභාවන්ගේ "නිති විරෝධි" කොමිටිය විසින් එවන ලද්දෙකි. (මෙය

කොමියුනිස්ට්වරු විසින් පාලනයකරන "බැප්ටිස්ට් සංගමයට" විරුද්ධව පවතින්නකි. මෙම බැප්ටිස්ට් සංගමය මෙහෙයවනු ලබන්නේ, දහස් සංඛ්‍යාත කිතුණුවන් ඝාතනය කළ මානවවාදී කොමියුනුස්ට්වරු පිළිබඳ ප්‍රශංසාමුඛයෙන් කථා කරන එහි "නිදහස" රජයන බව පවසන ද්‍රෝහියෙකු වන කවරෙව් විසිනි.

මේ රහසිගත ලියවිල්ල තුල අපට පවසනු ලබන්නේ තවත් විරෝධාර විරෝධය පලකිරීමක් කෙරෙහිය. මෙය මෙවර සිදුවුයේ මොස්කව් වලදීය.

මේ ලියවිල්ලෙහි පරිවර්තණය පහල දක්වා ඇත.

හදිසි නිවේදනයයි!

ප්‍රේමනීය සහෝදර සහෝදරයෙනි, අපගේ පියාණන්වූ දෙවියන්වහන්සේගේ ද අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේද සමාදානයත් අභිර්වාදයත් නුඹලා සමග වේවා. අපට ඔබ වෙත මෙය පවසන්නට අවශ්‍යව ඇත. ගණනින් 500ක් වූ ඉවැන්ජලිකල් බැප්ටිස්ට් කිතුණුවන්ගේ සභාවන්ගෙන් නියෝජිතයින් පිරිසක් 1966 මැයි මස 16 වැනි දින මොස්කව් වෙත ගමන්කලෝය. මෙසේ ගමන් කලේ සෝවියට් සමාජවාදී සමුහාන්ඩු සංගමය කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටුවේ ගොඩනැගිල්ල වෙතය. මෙසේ යවනලද්දේ ඉල්ලිමක් කරන පිණිස වන අතර මෙය අසා සිටිනලදී.

අප ප්‍රධාන ලේකම් වරයාවු බ්‍රෙෂ්නෙව් වෙත පෙත්සමක් භාරදෙනු ලැබිනි.

මේ ලියවිල්ලේ තවදුරටත් සඳහන් කරන්නේ මේ 500 දෙනා මෙකී ගොඩනැල්ල ඉදිරියේ දවස මුළුල්ලේම සිටගෙන සිටිය බවත් එය කොමියුනිස්ට්වාදයට විරුද්ධව මොස්කව් තුල පැවති ප්‍රථම විරෝධය පලකිරීම බලවත්ය. තවද මෙය රහසිගත සභාවේ නියෝජිතයින් පිරිසක් විසින් සිදුකරනලදී. දිනය අවසානයේ දී බ්‍රෙෂ්නෙව් අමතා දෙවැනි පෙත්සමක්ද ඔවුන් විසින් යවනලද අතර මෙයින් ඔවුන් පැමිනිලි කර සිටියේ එක්තරා සගයෙක් එනම් ස්ට්‍රෝගැනොප් ඔවුන්ගේ ඉල්ලිම බ්‍රෙෂ්නෙව් වෙත භාරදිම ප්‍රතික්ෂේප කල බවත් ඔවුන්ට තර්ජනය කල බවත්ය.

මේ 500 දෙනාගෙන් සමන්විත නියෝජිතයින් පිරිස වර්ෂාව මධ්‍යයේ රාත්‍රිය පුරාම වීදිවල රැඳී සිටිය අතර ඔවුන්ට වචන වලින් බැන වැදුනු ලැබුනු අතර ඔවුන් පසුකර යන මෝටර් රථවල මඩ පාරවල් පවා ඔවුන්ට වැදුනි. ඔවුන් කොමියුනිස්ට් පක්ෂයේ ගොඩනැගිල්ල ඉදිරියේ පසු දින උදැසන තෙක් රැඳීසිටියෝය.

ඊළඟ දිනයේ නියෝජිතයින් 500 දෙනා සුලු කොමියුනිස්ට් නිලධාරියෙකු මුණගැසෙනු පිනිස ගොඩනැගිල්ලට ඇතුල්විය යුතු යැයි යෝජනාකරනලදි. එහෙත් සාක්ෂිකරුවෝ නොමැති අවස්ථාවක ඇදහිලිවතුන් බලධාරීන් මුණගැසීමට ගොඩනැගිල්ලකට ඇතුල්වූ පසු පහර දෙන බව දන්නද බැවින් ඇදහිලිවතුන් එහි ඇතුල්වීම ඒකමතිකව එය ප්‍රතික්ෂේප කල අතර බ්‍රෂ්නෙජ් පැමිණෙන තුරු එහි බලා සිටියෝය.

නොවැලැක්විය හැකි දෙයක් එහිදී සිදුවිය.

සවස 1.45ට පමණ බස් රථ 28 පැමිනි අය අතර ඇදහිලිවන්තයින්ට විරුද්ධව කෲර පහරදීමක් එහිදී අරම්භ කලෝය. "මෙහිදී අපි රවුමක් සේ සැදී සිට එකිනෙකාගේ අත්අල්ලා ගීතිකා ගායනා කලෙමු." එම ගීතිකාව නම් "අපගේ ජීවිතයේ හොදම දවස් වන්නේ අපි කුරුසයක් දරාගන්නා දවස්ය". රහස් පොලිසිය අපට පහරදෙන්නට පටන්ගත්තෝය. තරුණයන් මහලු මනුෂ්‍යයන්ව ජේලිවලින් එලියට ඇද ඔවුන්ට මුහුණට සහ හිසට පහරදී මහපාරට ඔවුන්ව විසිකලෝය. ඔවුහු සමහර සහෝදරවරු ඔවුන්ගේ හිසකෙස් වලින් ඇදගෙන ගියෝය. සමහරු බේරී පලායන්නට උත්සහා කලවිට සිහිය නැති වනතුරු ඔවුන්ට පහරදුන්නේය. බස්රථ ඇදහිලිවන්තයින්ගෙන් පිරුනු පසු පොලිසිය නොදන්නා තැනකට ඔවුන්ව ගෙනගියෝය. අපගේ සහෝදර සහෝදරියන්ගේ ගීතිකා රහස් පොලිසියේ බසය තුලින් අපට ඇසිනි. මෙය මහා ජනකායක් ඉදිරියේ සිදුවිය.

දැන් ඊට වඩා අලංකාර දෙයක් සිදුවෙමින් පවති. 500ක් දෙනා අත්අඩංගුවට ගත් පසු සහතික ලෙස වදදෙන්නට ඇත. සහෝදර ජී. විතිස් සහ තවත් නායක සහෝදරයෙක් වන හෝරෙජ් නැමැත්තෙක් (ක්‍රිස්තුස්වහන්සේගේ රැලෙහි සැබෑ එඬේරු) හට එම කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටුව වෙත යෑමට තවමත් ධෛර්ය ඇතුව සිටියේය. යොහාන් බව්තිස්ත පීඩාවට ලක්වූ එම වචන දේශනා කරමින් එම

ස්ථානයේම යේසුස්වහන්සේ තම සේවය ආරම්භ කලාක් මෙන් මෙම සහෝදරයන්ද සේවය කලෝය.

වින්ස් සහ හොරෙප්, අත්අඩංගුවට ගත් නියෝජිතයන් කොහේද කියා ප්‍රශ්න කල අතර ඔවුන්ගේ නිදහස ඉල්ලා සිටියෝය. මේ ධෛර්යමත් සොහොයුරන් දෙදෙනා එක එල්ලේම අතුරුදහන් වූහ. ඔවුන්ව ලෙප්ටොරොවොස්කියා හිරගෙදර තුල තබා ඇති බව ඉන්පසු ප්‍රවෘත්ති පැතිර ගියේය.

ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව උන්වහන්සේ උදෙසා දුක් විඳින්ටත් නුඹලාට වරප්‍රසාද දෙන ලද්දේය. (පිලිප්ප 1:29)



රහසිගත සභාවේ කිතුණුවන් බියට පත්වන්නේද? නැත. අනික් අය තමුන්ගේ නිදහස නැවතත් අවදානමට ලක් කරමින් අප සමග පැවති ප්‍රකාශය මුද්‍රණය කලේය. ඔවුන්ට සිදුවූ දෙය පැවසූ විට එම ප්‍රකාශනය මුද්‍රණය කලේය.එසේ කරන ලද්දේ ඔවුන්ට මේසේ පවසමිනි. "මක්නිසාද ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි අදහන්ට පමණක් නොව උන්වහන්සේ උදෙසා දුක් විඳින්ටත් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා නුඹලාට වරප්‍රසාදය දෙන ලද්දේය." (පිලිප් 1:29). ඔවුහු සහෝදරයින්ට මෙසේ උපදෙස් දුන්නෝය. "මෙකී පීඩාවලින් කිසිවෙකු සැලෙන්ට උවමනා නැත. අප දුක් විඳීමට නියමව තිබෙන බව නුඹලාම දනිහුය." (1 තෙස 3:3)

ඔවුහු හෙබ්‍රෙව් 12:2 උපුටා දක්වමින් ඇදහිලිවන්තයින්ට "උන්වහන්සේ තමන් ඉදිරියෙහි තබා තිබුනු ප්‍රීතිය නිසා ලැජ්ජාව නොසලකා කුරුසිය දරාගෙන, අපගෙ ඇදහිල්ලේ කතෘ වරයානෝද සම්පූර්ණ කරන්නාද වන යේසුස්වහන්සේ දෙසම බලමින්...." (හෙබ්‍රෙව් 12:1,2) සිටින්නට යැයි කීවෝය.

රොස්වොව් සහ මොස්කව් වල රහසිගත සභාව තරුණයන් අදේවවාදී විසෙන් පිරවීම ගැන තම විරුද්ධත්වය පැවෝය. රුසියාව මුලුල්ලෙම මෙය සිදුවිය. ඔව්හු කොමියුනිස්ට් විෂට විරුද්ධවත් නිල

සභාවේ ද්‍රෝහි නායකත්වයට විරුද්ධවත් සටන් කලෝය. ඔවුන්ගේ රහසිගත ප්‍රකාශනයකට ඔව්හු මෙසේ ලියා තිබුනාහ. "අපගේ කාලයේ සාතන් අණදෙන අතර දෙවියන්වහන්සේගේ අඥාවලට විරුද්ධවෙති. සියලු තීරණ "සභාව" පිළිගන්නේය. (1966 ඔක්. 04 දින ප්‍රව්ඩා යුක්රෙනි පුවත්පතේන් උපුටා ගන්නා ලදි.)

ඇමරිකාවේ සිට කෙරෙන සුභාරංචි ප්‍රචාරයන්ට සවන් දෙන පිණිස කන්ඩායමක් සංවිධානය කල ඇලෙක්සි නෙටිරොෂ්, බොරිස් රේවෂොප්, ඇක්ෂන් ප්‍රෝබොෂ් යන අයට විරුද්ධව පැවති නඩු විභාගෙය ප්‍රව්ඩා වස්ටොකා විසින් මුද්‍රණය කොට පල කරන ලදි. ඔවුහු පටිගත කල පණිවිඩ ඉන් පසුව බෙදාහරින ලදි.

"විනෝද යාත්‍රාව" සහ "කලාත්මක චක්‍රය" යන නම් වලින් සැදුම්ලත් රහසිගත සුභාරංචි රැස්වීම් ඔවුන් විසින් සංවිධානය කරනලද බවට ඔවුන්ට රරෙහි චෝදනා එල්ල කරන ලදි. මෙලෙස රහසිගත සභාවද රොමයේ පොළව යට ගුහාවල රැස්වු මුල් සභාව මෙන් ක්‍රියා කලෝය.

1966 සැප්. 15 වන දින "සොවියට්ස්කයියා මොල්ටාවියා" ප්‍රවෘත්ති පත්‍රය රහසිගත සභාව ස්ටෙන්සිල් ආධාරයෙන් පිටපත් ලබාගන්නා උපකරණයක් මඟින් පොත් පිටපත් කරන බව දන්වයි. ඔවුහු නීතියෙන් තහනම් වුවද ප්‍රසිද්ධ ස්ථාන වල රැස්වී ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂිදැරීම පිනිස තැනින් තැනට යන්නාහ.

මෙම ප්‍රවෘත්ති පත්‍රයේම රෙකී සිට මොස්කව් දක්වා යන දුම්රිය ගමනකදි තරුණයන් දෙදෙනෙකු හා තරුණියන් හතර දෙනෙකු කිතුණු ගීතයක් ගැයු බව දන්වයි. ඒම ගීතය "අපි ක්‍රිස්තුස්වහන්සේට අපගේ තරුණකාලය කැපකරමු." යන්නයි. මේ වාර්තාකාරයා මේ ගැන බලවත් විරෝධය දැක්විය. එසේ කලේ මේ ඇදහිලිවන්තයින් විදී දිගේ, දුම්රිය පොළවල, දුම්රිය තුල, බස්රථ තුල සහ රාජ්‍ය ආයතන තුල පවා දේශනා කරන බැවිනුයි. මෙය කොමියුනිස්ට් සමයේ රුසියාව තුල රහසිගත සභාව ක්‍රියාකරන අන්දමයි.

කිතුනු ගීතිකා ප්‍රසිද්ධ ස්ථානවල ගැයිම සම්බන්දයෙන් මෙකි කිතුණුවන්ගේ නඩු විභාග වලදී දඩුවම ප්‍රකාශයට පත් කලවිට වරදකරුවන් දනින් වැටී මෙසේ කීයන්නෝය. "අපි අපගේ ජීවිත දැන්

ඔබවහන්සේට යටත්කරමු. මේ ඇදහිල්ල වෙනුවෙන් පීඩාවිඳීමට ඉඩදුන්න නිසා ස්වාමිනි අපි ඔබවහන්සේට ස්තුතිවන්තවෙමු." අනතුරුව අධිකරණ ශාලාවේ රැස්ව සිටියවුන් සියලු දෙනාම "උන්මන්තකයින්" සේ මෙම සහෝදරයින්ව සිරගතකොට වධබන්ධන වලට ලක් කිරීමට හේතුවූ ගීතිකාව අධිකරණ ශාලාවේ දී ගයන්නාහ.

මැයි මස 01 වන දින සභාවක් නොමැති කිතුණු ගම්මානවූ තොප්සියග් සහ සහරෝකා යන ගම්මාන වල වනාන්තරයේ රහසිගත දේව මෙහෙයන් සංවිධානය කෙරෙනි. ඔවුහු උපන්දින උත්සවයක් මෙන් රඟපාමින් මෙම දේව මෙහෙය පවත්වති. (4 දෙනෙකුගෙන් හා 5 දෙනෙකුගෙන් සමන්විත බෝහො කිතුණු පවුල් වලට මෙබඳු රහසිගත දේව මෙහෙයන් ආවරනය කරනු පිනිස වසරකට උපන්දින 35 පමණ යෙදෙන්නේය.)

සිරගත කිරීම් වලින් හෝ වධදීමෙන් රහසිගත සභාවේ කිතුණුවන්ට දඬුවම් කලනොහැක. මුල් සභාව තුලමෙන් පීඩාව නිසා පමණක් ඔවුන්ගේ කැපවීම ගැඹුරුත්වයකට පත්වුනි.

1966 ඔක්තොබර් 04 වන දින ප්‍රව්ඩා යුක්රේනි පුවත්පත සහෝදර ප්‍රොකපිසු පිළිබඳව මෙසේ පවසා තිබිනි. ඔහු රුසියානු රහසිගත සභාවේ නායකයින්ගෙන් කෙනෙකි. ඔහුව මෙවනවිට තුන්වරක් සිරගත කරුනු ලැබිනි. ඔහු නිදහස් කල විගසින්ම රහසිගත සබත් පාසල් නැවත නැවතත් සංවිධානය කිරීමට පටන්ගනී. එවිට නැවතත් ඔහුව අත්අඩංගුවට ගනුලැබින. ඔහු රහසිගත ප්‍රකාශණයක් ලියා දැන්වුයේය. "මිනිස් නීති රීති වලට යටත්වීම (කොමියුනිස්ට් නිතියට යටත්වීම) මගින් නිල සභාව දෙවියන්වහන්සේගේ අශිර්වාදය අහිමිකරගනි."

සීමාකිරීම් පනවා තිබෙන ජාතියක සිරගතවීම බටහිර රටවල සිරගතවීම මෙන් බව නොසලකන්න. මෙහි සිරගතවීම යනු කුසගින්නේ හිඳීම, වද බන්ධනවලට ලක්කරවීම සහ මොල සේදීමට ලක්වීමයි.

නෙව්කා අයි රිලිජියා (විද්‍යාව සහ ආගම) නැමති සඟරාව 1966 අංක 9 දරණ මෙම සඟරාවේ කලාපයෙන් පහත සඳහන් තොරතුරු වර්තාකරයි. කිතුනුවන් ඔගනියොක් සඟරාවේ පිටත කවරය තුල සඟවා ශුභාරංචි පත්‍රිකා බෙදාහරී. ඇනා කැරනිනා නැමති පොත් තුලද සඟවමින් ඔව්හු බයිබලයේ කුඩා කොටස් එය තුල බහා බෙදාහරිති. (ඇනා කැරනිනා යනු ලියෝ ටොල්ස්ටොයිගේ නවකථාවකි.)

මීට අතිරේක ඇදහිලිවන්තයෝ ප්‍රසිද්ධියේ ක්‍රිස්තියානි ගීතිකා ගයති. ඔව්හු "ද කොමියුනිස්ට් ඉන්ටර්නැෂනල්" යන ගීයේහි තාලයට ක්‍රිස්තුස්වහන්සේට ප්‍රශංසා ගීතිකා ගයති. (කසකස්ටාන්ස්කයියා ප්‍රෞඩා, 1966 ජුනි 30)

සයිබීරියාවේ කුලුන්දා හිදී රහසිගතව මුද්‍රණයකරනලද ලිපියක කිතුනුවන් පවසා තිබෙන්නේ නිල "බැප්ටිස්ට් සභාවේ නායකයින් සභාවේ සහ ලෝකය තුල එහි සැබෑ සේවකයින්ව විනාශකර ඇති අතර එසේ කර ඇත්තේ උත්තම පූජකයින්, ලියන්නන් හා ඵරිසිවරුන් එක්ව යේසුස් ක්‍රිස්තුස්වහන්සේව පිලාත්ට පාවා දුන් ආකාරයෙන් ක්‍රියාකිරීම මගිනි." එහෙත් විශ්වාසවන්ත රහසිගත සභාව තවදුරටත් ක්‍රියාත්මක වේ.

ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය තවදුරටත් උන්වහන්සේට සේවය කරන්නීය. රහසිගත සභාව ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් කොමියුනිස්ට්වරුන්ව දිනාගනිමින් සිටින බව කොමියුනිස්ට්වරුම පිළිගනිති. කොමියුනිස්ට්වරුන්ව දිනාගැනීමට පුළුවන.

බැකින්ස්කි රැබොචි (බාතු නගරයේ කම්කරුවා) යන පුවත් පතෙහි 1966 අප්‍රේයෙල් 27 වන දින මෙම ලිපිය නැවත පලකරුනු ලැබ තිබුනි. මෙය ටානියා සියගුනොවා විසින් ලියනලද්දකි. (ඇය කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සමාජිකාවකි) ඇයව ක්‍රිස්තුස් වහන්සේ වෙතට දිනාගනු ලැබසිටියාය. මේ ලිපිය කොමියුනිස්ට් බලධාරීන් විසින් අත්අඩංගුවට ගනු ලැබූ එකකි. එය මෙසේය,

ආදරණීය නාඩියා නැන්දා,

මම අපගේ ප්‍රේමණීය ස්වාමින්වහන්සේගේ ආශිර්වාදයත් ඔබවෙත එවමි. නාඩියා නැන්දේ, උන්වහන්සේ අපට කොතරම් ප්‍රේමකරනවාද? මේ වචන ඔබ අවබෝධකරගනු ඇතැයි මම විශ්වාස කරමි. "ඔබගේ සතුරන්ට ප්‍රේමකරන්න, ඔබට ශාප කරන්නවුන්ට ආශිර්වාදකරන්න, ඔබට වෛරකරන්නවුන්ට යහපතකරන්න, ඔබට අවමාන කරන්නවුන්ට යාච්ඤාකරන්න."

මේ ලිපිය අත්අඩංගුවට ගත් පසු පීටර් පෙරබ්‍රිනිනෝ ඇය වෙත ශුභාරංචිය ගෙනා ඇගේ සහෝදරයා සහා ක්‍රිස්තුස්වහන්සේව පිළිගත් වෙනත් බොහෝ තරුණ කොමියුනිස්ට්වරුන්ව සිරගෙයට යවනලදී.

කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍රය ඔහුගේ දේශනාවන් ගෙන් එකක්ද උපුටා දක්වනු ලැබිනි. "අපි පලමු කිතුණුවන් මෙන් අපගේ ගැලවුම්කාරයාණන්ව විශ්වාස කරමු. අපට මුලික නීතිය බයිබලයයි. අපි වෙනත් කිසිවක් පිලිනොගනිමු. අපි මනුෂ්‍යයින්ව පාපයෙන් ගැලවීම පිනිස විශේෂයෙන් තරුණයන්, ගැලවීම පිණිස ඉක්මන් විය යුත්තෙමු." සෝවියට් ව්‍යවස්ථාව තරුණයන්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව පැවසීම තහනම් කරන බව ඔහු සඳහන්කරයි. "අපට නම් එකම නීතිය බයිබලයයි". කෲර අදේවවාදී ආඥාදායකත්වය රටක් පාලනය කරණවිට එහි පැවති එකම සමාන්‍ය පිළිතුර මෙය පමණකි.

කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍ර ඉන් අනතුරුව මෙකී "කාලකන්නි" පිංතූරය විස්තර කරයි: "තරුණයන් හා තරුණියන් ආත්මික ගීතිකා ගායනා කරති. ඔව්හු චාරිත්‍රමය බව්තිස්මය ලබති. සතුරා වෙත ප්‍රේමකිරීම නැමති නපුරු ද්‍රෝහිකාර ඉගැන්වීම් ඔහු ක්‍රියාත්මක කරති." මෙම ලිපියේ තවදුරටත් සඳහන් වන්නේ කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සමාජිකත්වය උසුලන තරුණයන් සහ තරුණියන් සැබැවටම කිතුනුවන් වන බවයි. මෙම ලිපිය අවසන් කරන්නේ මෙවන් වදන්වලිනි. "කොමියුනිස්ට් පාසැල් කොපමණ බලයෙන් පිරිහී ඇද්ද? කොපමණ මලානික වී ආලෝකයෙන් හීනවී ඇද්ද?.... දේවගැතිවරුන්ට ඒවායේ ගෝලයින් අධ්‍යාපනඥයින්ගේ නාස්ලනුව යටින් පැහැර ගත හැකිව ඇත."

1966 දී "කසකස්තාන්කයියා ප්‍රෞඩා" පුවත්පත ජුනි 30වන දින වාර්තාකලේ මෙයයි. කොමියුනිස්ට්වරු ඔවුන්ගේ පාසැලේ හොඳම ලකුණු ලබන ශිෂ්‍යයා කිතුණු ළමයෙක් බව දැනගත්විට ඒ පිළිබඳ තම හිතිය පලකර තිබුනේය!

"කිර්කිස්කයියා ප්‍රෞඩා" පුවත්පත 1966 ජනවාරි 17වැනි දින මව්වරුන්ට යවනු ලැබු රහසිගත කිතුනු පත්‍රිකාවක් උපුටා දක්වමින් මෙසේ කියයි. "තොටිල්ලේ සිට අපගේ දරුවන්ගේ ජිවිත දෙවියන්වහන්සේට කැපකිරීම පිණිස උත්සාහකිරීමත් යාච්ඤාකිරීමත් අප විසින් කලයුතුව ඇත..... අපි අපගේ දරුවන් ලෝකයේ බලපෑම්වලින් ගලවාගනිමු."

මෙකී උත්සහයන් සාර්ථකවී තිබේ. ක්‍රිස්තියානිය තරුණයන් අතරේ පෙරටුවෙන් ගමන්ගන්නා බව යන කාරණයට කොමියුනිස්ට් ප්‍රවෘත්ති පත්‍රද සාක්ෂිදරයි.

රහසිගත ක්‍රිස්තියානි රැස්වීමකට ඇතුල්වීමෙන් තරුණ කොමියුනිස්ට් සංවිධානයේ තරුණියකවූ නිනා කිතුනුවෙකු වූ හැටි රුසියාවේ පෙලියාබින්ත්හි ප්‍රවෘත්ති පත්‍රයෙන් විස්තරකරමි.

"සෝවියට්කයියා ජස්ට්පීයා" යන සඟරාව 1966 අංක 09 දරණ කලාපයෙන් මෙබඳු රහසිගත රැස්වීමක් පිළිබඳ විස්තර කරයි.

"මෙය මධ්‍යම රාත්‍රියේ පවත්වනු ලබයි. රහසිගතව පවත්වනු ලබයි. ඔවුන්ගේ සෙවනැලිවලට පවා රහසිගතව පවත්වනු ලබන එයට බෝහෝ ප්‍රදේශ මනුෂ්‍යයින් රැස්වන්නාහ. ඔවුන් ඉතා පහත් සීලිමක් ඇති අඳුරු කාමරයක රැස්වෙති. දණගැසීමට තැනක් නැතිවෙන තරමට ඔවුන් පිරීපවති. වාතයෙහි හිඟකම නිසා මුල් යුගයේ පවති ගෑස් ලාම්පුවක දුර්වල ආලෝකය නිවී යයි. සහභාගිවන්නන් ඉහින් කනින් දාඩිය දමමින් එහි රැස්ව සිටිති. වීදියේ ස්වාමින්වහන්සේගේ එක් සේවකයෙක් පොලිස් නිලධාරින් එත්දැයි බලාසිටී." මෙබඳු රැස්වීමක් තුලට නීනාව උනුසුම්ව සුහදශීලිත්වයෙන් පිළිගනු ලැබිණි. නීනා මෙසේද පැවසිය. ඔවුන්ට ඔවුන්ගේ ඇතුලාන්තය ආලෝකමත් කරන්නාවූ ශ්‍රේෂ්ට ඇදහිල්ලක් තිබුනේය. එය දැන් මටද ඇත්තේය. එය දෙවියන්වන්සේ තුල ඇදහිල්ලයි. උන්වහන්සේගේ රැකවරණය යටතේ මාව තබාගනී. බලන්න, කොම්සෝමොල්හි රැස්විම දෙස. මා අසලින් යන තැනැත්තා මාව දන්නවා වුවද මට ශුභපතමින් නොයයි. ඔවුන්ට විරෝධය මධ්‍යයේ වුවද මා දෙස බලන්න ඉඩ දෙන්න. මට කථාකරන්නට ඉඩ දෙන්න. මගේ කම්මුලට ගසන්නාක් මෙන් කථාකරන්න ඉඩ දෙන්න. "බැප්ටිස්ට්වරුනි" ඔවුහු මට එසේ කෙරේවා. මට ඔවුන් අවශ්‍ය නැත."

ඇය මෙන් වෙනත් බෝහෝ තරුණ කොමියුනිස්ට් වරු අවසානය වනතෙක් ක්‍රිස්තුස්වහන්සේට සේවයකිරීමට තීරණය කරඇත්තෝය.

"කසකස්තාන්කයියා ප්‍රෞඩා" පුවත්පතෙහි 1967 අගෝස්තු මස 18වන දින සහෝදර ක්ලහාන්, බොන්ඩාර් සහ තෙලගින් යන අයට විරුද්ධව නඩුව විස්තරකර ඇත. ඔවුන් විරුද්ධව දෙනලද නඩු තින්දුව කුමක්දැයි මෙහිදී සඳහන්ව නැතත් ඔවුන්ට කරනලද අපරාධය ළමයින්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ඉගැන්විම බව සඳහන්කර ඇත.

"සෝවියට්කයියා කිර්ගිසියා" පුවත්පතෙහි 1967 ජුනි 15වෙනි දින කලාපයෙන් කිතුණුවන් ගැන පැමිනිල්ලක් විය. එහි දැක්වෙන්නේ

"ඔවුන්ට විරුද්ධව පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනිම පිනිස ඔවුහු ප්‍රකෝපකිරීම් සිදුකර ඇතිබවයි." එබැවින් අහිංසක කොමියුනිස්ට් අධිකාරිත්වයෙන් නොකඩවා මෙකී හිතුවක්කාර කිතුනුවන් අත්අඩංගුවට ගැනිමට කෙරෙන ප්‍රකෝපකිරීම් වලට නොකඩවා බඳුන් වී තිබේ. මොවිහු නිදහස් විමට කැමතිනොවන අය වන අතර මේ අනුව තවත් කණ්ඩායමක් අත්අඩංගුවට ගනුලැබ තිබේ. ඔවුන්ගේ අපරාධය වන්නේ නෙත්ට්‍රොග්‍රාෆ් පහලොවක් සමග පොත්බඳින යන්ත්‍ර 6ක් ද ඇතිව නීතීවිරෝධී මුද්‍රණාගාරයක් පවත්වාගෙනයැමයි. මෙහි ක්‍රිස්තියානි පොත්පත් මුද්‍රණයකරනු ලැබතිබේ.

1968 පෙබරවාරි 21 වන දින ප්‍රව්ඩා පුවත්පත මෙසේ වාර්තාකලාය. දහස්ගනන් කාන්තාවන් හා ගැහැණු ළමයින් බයිබල් පද හා යාච්ඤා මුද්‍රණයකල බඳපටි හා රිබන් පටි පැලඳ සිටිනවා දක්නට ලැබිනි. මෙ අලුත් රටාව දියත්කල පුද්ගලයා පිළිබඳව විමර්ශනය කරනුලැබ සොයාගනු ලැබිනි. මෙම ක්‍රියාවලිය බටහිර රටවල් වලටද නිර්දේශ කරනුලැබේ. මේ කොමියුනිස්ට් පොලිසියේ කිතුණු සමාජිකයෙකු වන ලියුබරට්ස් හි ස්ටැපිසුත් නැමැති සහෝදරයාය. ප්‍රවෘත්ති පත්‍රය ඔහු අත්අඩංගුවට ගැනිම වාර්තා කරනලදී.

කොමියුනිස්ට් අධිකරණයක් ඉදිරියේ දිව්‍යානුභාවයෙන් පිරි රහසිගත සභාවේ කිතුනුවන් දෙන ලද පිළිතුරු පිළිබඳව මෙසේ වාර්තාවී තිබේ. එක විනිසුරුවෙක් මෙසේ ප්‍රශ්න කරන්නට යෙදුනේය. "ඔබගේ තහනම් කරනලද කණ්ඩායමට ඔබ සෙනගව ආකර්ශනය කරන්නට යෙදෙන්නේ මන්ද?" කිතුනු සහෝදරියන් මෙසේ පිළිතුරු දුන්නාය. "අපගේ අරමුණ මුළු ලෝකය ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් දිනාගැනිමය"



"මාගේ ශ්‍රේෂ්ඨ සොයාගැනීම වන්නේ මාව දෙවියන්-වහන්සේගේ අනුග්‍රහයෙන් ගලවනු ලැබූ බවයි."

"ඔබගේ ආගම විද්‍යාත්මක නොවනඑකකී" යනුවෙන් විනිශ්චකාරවරයෙක් තවත් නඩුවිභාගයකදී පැවසුවේය. ශිෂ්‍යාවක වන ගැහැණු ළමයෙකුගෙන් ලැබු පිළිතුරු මෙසේය. "ඔබ අයින්ස්ටයින්ට් ට වඩා වැඩියෙන්, නිව්ටන්ට වඩා වැඩියෙන් විද්‍යාව දන්නවාද? ඔව්හු ඇදහිලිවන්තයෝ වුහ. අපගේ විශ්වය අයින්ස්ටයින්ට්ගේ නාමය දරයි.

එහි නම අයින්ස්ටයින්ට් විශ්වය යැයි ඉහල පාඨශාලාවෙදී මම ඉගෙනගෙන තිබේ. අයින්ස්ටයින්ට් මෙසේ ලියයි. "අපි අනාගත වෘක්තාවරුන්ගේ යුදා ආගමෙන් සහ යේසුස්වහන්සේ ඉගැන්වූ පරිදි ක්‍රිස්තියානියෙන් පිරිසිදුවන්නේ නම් ඉන් පසු පැමිණෙන්නාවූ විශේෂයෙන්ම පූජක උපායමර්ග වලින් අපව ගලවන්නාවූ සහ සියලූ සමාජමය සතුරන්ගෙන් පැමිණෙන ලෝකයෙන් අපව ගලවන්නාවූ ආගමක් අපට තිබේ. මෙය අපගේ ශුද්ධ යුතුකමයි. එනම් ආගම ජයග්‍රහනය කිරීමට අපට කල හැකි සියලුම දේ කිරීම මනුෂ්‍යාගේ ශුද්ධ යුතුකමයි" තවද අපගේ ශ්‍රේෂ්ඨ කායික විද්‍යාඥ පැව්ලොව් සිහිකරගන්න. අපගේ පොත් වල ඔහු කිතුණුවෙකු බව නොපවසන්නේද? මාක්ස් පවා දාස් කැපිටාල් පොතට ලියූ ඔහුගේ සංඥාපනයෙහි මෙසේ පවසයි. "ක්‍රිස්තියානිය විශේෂයෙන්ම ප්‍රොතෙස්තන්ත ආකාරයේ ක්‍රිස්තියානිය පාපයෙන් විනාශ කරන ලද චරිතයක් සඳහා පැහැදිලිවූ සුදුසු ආගමයි." මට පාපයෙන් විනාශවූ චරිතයක් තිබේ. මාක්ස් මා හට ඉගැන්වූයේ එය සාදා ගැනීම පිනිස කිතුණුවෙකු වෙන ලෙසයි. එසේ නම් මාර්ක්ස්වාදිහු වන ඔබට මාව මෙලෙස විනිශ්චය කල හැක්කේ කෙලෙසද?

විනිශ්චයකරුවා කථා නැතිව සිටින්නේ මන්දැයි අවබෝධ කරගැනීම පහසුය.

කිතුණුවෙකු අධිකරණය ඉදිරියේ විද්‍යා විරෝධී ආගමක් ඇතුව සිටින්නේ මන්දැයි යන චෝදනාවට දුන් පිළිතුරු මෙසේය. "විනිශ්චයකාරතුමනි ක්ලොරෆෝම් සහ වෙනත් බොහෝ ඖෂධ වර්ග සොයාගත් සිම්ප්සන් මෙන් ඔබ ශ්‍රේෂ්ඨ විද්‍යාඥයෙකු නොවන බව මට සහතිකය. ඔහුගේ ශ්‍රේෂ්ඨතම සොයා ගැනීම කුමක්දැයි ඔහුගෙන් අසනු ලැබූ කල ඔහුගේ පිළිතුර වූයේ "එය ක්ලොරෆෝම් නොවේ. මාගේ ශ්‍රේෂ්ඨතම සොයාගැනීම මම පව්කාරයෙකු බවත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් ගලවනු ලැබියහැකි මනුෂ්‍යයෙකු බවත් දැනගෙනසිටීමය."

රහසිගත සභාව විසින් ඉදිරිපත් කරනලද ක්‍රිස්තියානිය සඳහා වූ ශ්‍රේෂ්ඨ විතර්කයවන්නේ ඇදහිලිවන්තයන් ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් ඔවුන්ගේ ජීවිතය යාගකිරීම, සහ ඔවුන්ගේ ලේ හෙලීමට ඉඩදෙනු ලැබීමට ඇති සූදානමයි. අප්‍රිකාවේ සුප්‍රසිද්ධ මිශනාරිවරයෙකු වූ ඇල්බට් ස්විස්ටර් මෙසේ කියයි. "වෙදනාවේ සලකුණ ඇත්තාවූ අයගේ ශුද්ධවූ සහභාගිකම" යැයි ඔහු එය හඳුන්වයි. එය නම් යේසුස්වහන්සේ එනම් වේදනාවේ මනුෂ්‍යයා

සමඟ පවත්වනු ලබන සහභාගිකමයි. රහසිගත සභාව එහි ගැලවුම්කාරයාණන් වෙත වූ ප්‍රේමනීය බැම්මෙන් එක්සත්ව සිටී. මෙම එකම බැම්මෙන් සභාවේ සාමාජිකයන්ද ඒකත්වයකට පැමිණ තිබේ. ලොව කිසිවෙකුට හෝ එය පරාජයකරන්නට නොහැක.

රහසිගතව ගෙන එනු ලැබූ ලියුමක රහසිගත සභාව මෙසේ පවසයි. "අපි වඩා හොඳ කිතුණුවන් වීමට යාච්ඤාකරමු. එහෙත් දෙවියන්වහන්සේ අප ගැන අදහස්කරන ආකාරයට එවැනි කිතුණුවන් වීමට පමණක් අපි බලාපොරොත්තුවෙමු. එනම් ක්‍රිස්තු ස්වරූපයේ කිතුණුවන් වීමට අපි බලාපොරොත්තු වෙමු. කිතුනුවන් දෙවියන්වහන්සේගේ මහිමය සඳහා කුරුසය කැමැත්තෙන් දරාගන්නේය."

සර්පයින්ගේ ප්‍රඥාව ඇතිව ක්‍රිස්තුස්වහන්සේගේ ඉගැන්වීම්වලට අනුකූලව අධිකරණය ඉදිරියේදී ඔවුන්ගේ නායකයින් පෙන්වාදීම කිතුණුවන් හැමවිටම ප්‍රතික්ෂේපකරති.

1966 ජනවාරි මස 15වන දින "ප්‍රව්ඩා වොස්ටොකා" පුවත්පත (පෙරදිග සත්‍යතාවය පුවත්පත) මෙසේ වාර්තාකරයි. එහි සඳහන් වන්නේ කිතුණුවෙකු වීම වෙනුවෙන් චෝදනාලත් මරියා සෙව්සියුත් නැමති අයගේ ප්‍රතිචාරයයි. ඇයව ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන එන ලද්දේ කවුරුන්දැයි ඇයගෙන් විමසනු ලැබූවිට ඇගේ පිළිතුරවූයේ "දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සභාව තුලින් මාව ආකර්ශනය කරගත් බවයි. වෙනත් අයෙකුගෙන් "ඔබගෙ නායකයා කවුද" යනුවෙන් විමසූවිට ඔහුගේ ප්‍රතිචාරය වූයේ අපට මිනිස් නායකයන් නොමැති බවයි.

කිතුණු ළමයින්ගෙන් මෙසේ විමසා තිබේ. "පයනියර් සංවිධානය අත්හැරයාමට සහ ඔබගේ රතුපැහැති ගෙල බැඳි පටිය ඉවත්කරලීමට ඔබට ඉගැන්වූයේ කව්ද?" "අපි මෙය කලේ අපගේ නිදහස් කැමැත්තෙනි. කිසිවෙකු අපට එය ඉගැන්වූයේ නැත."

එය කෙසේවෙතත් සමහර ස්ථානවලදී අයිස්කන්ද මුදුන පෙනියයි. වෙනත් ස්ථානවලදී කිතුනුවන් ඔහුගේ නායකයින් අත්අඩංගුවට ගනු ලැබීම වැලැක්වීමට ස්වයං බව්තිස්මය ක්‍රියාවේ යොදවති. තවත් අවස්ථාවකදී ගඟක් අසල බව්තිස්මය සිදුවන කල කිසිවෙකුට ඡායාරූප තුල ඔවුන් හඳුනාගත නොහැකිවන පරිදි බව්තිස්මය කරන්නා හා බව්තිස්මය ලබන්නා වෙස් මුහුණු පැලඳ සිටි.

1964 ජනවාරි මස 30වන දින වෙරොනින් ගම්මානය තුල අදේවවාදී දේශනයක් පැවැත්වූ අවස්ථාව ගැන “උච්ටෙල්ස්කයියා ගැපටා” පුවත් වාර්තාකරයි. මෙය වොල් නෙච්නො කොර්ස්කි දිස්ත්‍රික්කයේ පිහිටි ගම්මානයකි. දේශනා නිමවූ ඉනික්බිති “ඇදහිලිවන්තයින් ප්‍රශ්න ඇසීම තුලින් අදේවවාදී ඉගැන්වීම්වලට ප්‍රසිද්ධියේ පහර දෙන්නට පටන්ගත්තේය. අදේවවාදී දේශකයාට එයට පිළිතුරු දෙන්නට නොහැකිවිය. ඔව්හු මෙසේ විමසන්නෝය “ඔබ කිකරුවන්නැයි ප්‍රකාශකර සිටින සොරකම් නොකරව, මිනිනොමරව යනාදී වශයෙන්වූ සුචරිතවාදී ප්‍රතිපත්තින් ඔබ වැනි කොමියුනිස්ට්වරුන් ලබාගන්නේ කොහැනින්ද.?” කිතුණුවන් දේශකයාට පෙන්වා දුන්නේ බයිබලයට විරුද්ධව සටන්කරන කොමියුනිස්ටවරුන් පවා ප්‍රතිපත්ති ලබාගත්තේ බයිබලයෙන් බවයි. එම දේශකයා සම්පුර්ණයෙන්ම ව්‍යාකූල වු අතර ඇදහිලිවන්තයින්ට ජයග්‍රහණයක් ලබාදෙමින් දේශකයා දේශනය නිමකලේය.

## රහසිගත සභාවේ පීඩාව වර්ධනයවීම

කලින් සෝවියට් සමුහාණ්ඩුව ලෙස පැවති රටවල් කිහිපයක කිතුණුවන් තවමත් පීඩාවිඳිමින් සිටිති. ලොවපුරා සීමාකිරීම් පනවා ඇති ජාතින්වල කිතුණුවන් ඔවුන්ගේ රහසිගත සභාවන් තුල සිටිමින් පෙරට වඩා වැඩියෙන් අඳද පීඩා විඳිති. 1997 දී ප්‍රාණ පරිත්‍යාගින් වු කිතුණුවන් ප්‍රමානය දළවශයෙන් එක්ලක්ෂ හැටදාහකැයි තක්සේරු කරඇත. කොමියුනිස්ට් රටවල යුදෙව්වන්ට පීඩාකරනු ලැබීම පිළිබඳව දැනගැනීම කිතුණුවන්ට සිත් කම්පාකරවන්නා සුලු එකක් වේ. එහෙත් පීඩාව ප්‍රාථමික එල්ලයවන්නේ රහසිගත සභාවයි. වසර ගණනාවකට පෙර සොවියට් ප්‍රවෘත්ති සේවය වර්තාකල අන්දමට සමුහ වශයෙන් අත්අඩංගුවට ගැනීම් හා නඩුවිභාග කිරීම් රැල්ලක් ඇතිවුනි. එක් ස්ථානයක දී කිතුණුවන් අසු දෙදනෙකු පිස්සන් සඳහා වු උන්මන්තකාගාරයකට යවනලදී. “දීර්ඝ යාච්ඤාව” හේතුකොටගෙන දින කිපයකට පසු 24 දෙනෙක් මියගියෝය. මේ දීර්ඝ යාච්ඤාවෙන් මිනිසුන් මරණයට පත්වුයේ කවදා සිටද? සිදුවු දෙය ඔබට සිතාගැනීමට පුලුවන්ද?

බරපතල පීඩාවිඳීම පනවනු ලැබ ඇත්තේ තම දරුවන්ට ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ඉගැන්වු දෙමව්පියන්ටය. ඔවුන්ගේ දරුවන් මුළු ජීවිතකාලය සඳහා ඔවුන්ගෙන් ඉවතට ගෙනයනුලැබ තිබිනි. දරුවන් බැහැදැකීමේ අයිතියක් ඔවුන්ට නොතිබුනි.

කොමියුනිස්ට් යුගයේදී සෝවියට් සංගමය "අධ්‍යාපන තුල අසාධාරණකම් කිරීම් වලට විරුද්ධව" එක්සත් ජාතින්ගේ ප්‍රකාශනයට අත්සන් තැබිය. එයින් ගෙනහැර දැක්වුයේ "දෙමව්පියන්ට ඔවුන්ගේම එත්තුගැනිමට අනුව දරුවන්ව ආගමික හා සුචරිතවාදී අධ්‍යාපනයක නිරතකරනු ලැබිම සහතික කිරීම සඳහා අයිතියක් ඇතැයි" යන වගයි. එක් ලිපියක දෝහියාවු කාරෙව් එනම් සෝවියට් සංගමයේ නිල බැප්ටිස්ට් සංගමයේ නායකයාවු තැනැත්තා රුසියාව තුල මෙම අයිතිය යථාර්ථයක් බවට පත්වී ඇතිබව සහතික කල අතර මෝඩයෝ ඔහුව විශ්වාස කලෝය. දැන් සෝවියට් ප්‍රවෘත්ති පත්‍ර පවසන දෙයට ඇහුන්කන්දෙන්න.

1963 ජුනි 4වෙනි දින "සොව්ජෙට්කයියා රුසියා" නැමති පුවත්පත පහත සඳහන් වාර්තාව ගෙනහැරදක්වයි. මැක්හින්කෝවා නැමති බැප්ටිස්ට් කාන්තාවන් කෙරෙන් ඇගේ දරුවන් හයදෙනාම ඉවත්කරනලදී. එයට හේතුව වුයේ ඇය ඔවුන්ට ක්‍රිස්තියානි ඇදහිල්ල බෙදාගැනිමයි. එපමණක් නොව පයනියර් සංවිධානයේ ගෙල බඳින පටිය පැලදිමද ඇය විසින් තහනම්කරනලදී.

ඇයට දෙනලද දඬුවම ඇයට ඇසුනු විට ඇය පැවසුවේ මෙපමණකි. ඇයට ඇයගෙන් ඉවත්කර දරුවන් සඳහා නේවාසික ගාස්තු ගෙවිමට සිදුවිය. ඇය මෙසේ පැවසුවාය. "මම ඇදහිල්ල වෙනුවෙන් පීඩාවිඳිමි". මෙලෙස ඔවුන් අදේවවාදයෙන් මත්කරවනු ලැබ එහි විශෙෂන් පොවනලදී. කිතුණු මව්වරුනි, ඇගේ වේදනාව ගැන සිතන්න.

ඉග්නාටි මුලින් සහ ඔහුගේ භාර්යාවට මෙවැනිම දෙයක් සිදුවු බව "උච්වේස්ල්කයියා ගැසටා" පුවත්පත වාර්තාකලාය. ඔවුන්ගේ ඇදහිල්ල අත්හල යුතු බව නඩුකාරයා කියා සිටියේය. "දෙවියන්වහන්සේ හෝ ඔබගේ දුව තොරාගන්න. ඔබ දෙවියන්වහන්සේව තොරාගන්නෙහිද?" පියා මෙසේ පිළිතුරු දුන්නේය. "මම මාගේ ඇදහිල්ල අත්නොහරිමි"

පාවුල් මෙසේ පවසයි "සියල්ල යහපත පිනිස එක්ව ක්‍රියාකරන්නේය" (රෝම 8:28). කිතුණුවන් ලෙස ඇතිදැඩි වුනු මෙබඳු දරුවන් ඔවුන්ගේ දෙමාපියන් කෙරෙන් ඉවත්කරගෙන කොමියුනිස්ට් පාඨශාලාවලට දැමීම මම දැක ඇත්තෙමි. ඔවුහු අදේවවාදී විශෙෂන් මත්කරනු ලැබිම වෙනුවට ඔවුන්ගේ නිවසේදී ඉගෙනගත් ඇදහිල්ල අන්‍යයන් වෙත පතුරුවා හැරියෝය.

ඔබට මෙසේ පවසමි. "තමාගේ පුත්‍රයාට හෝ දුවට මට වැඩියෙන් ප්‍රේම කරන්නා මට වටින්නේ නැත" (මතෙව් 10:37). මෙකී වචනවල අර්ථය වහල් ජාතින් තුල පවතී.



දළ වශයෙන් කිතුණුවන් එක් ලක්ෂ හැටදාහක් 1997 වර්ෂය තුළ දී ප්‍රාණ පරිත්‍යාගිවරුන් වූහ.

ඔබේ දරුවන් නොදැන ජාතියක් වෙන්නට උත්සාහකරන්න. එවිට සීමාකිරීම් වලට යටත්ව සිටින ජාතින් තුල අපගේ සහෝදරයින් වේදනා විඳින අන්දම ඔබට දැනගතහැකිවන්නේය. 1967 මාර්තු මස 29 වෙනි දින පළමු "ස්නාමියා ඉව්නොස්ටි" පුවත්පතට අනුව සික්ස් මැතිනියගේ පුත්‍රයා වූ විසෙස්ලාවුව ඇය කෙරෙන් ඉවතට ගෙනගියේ ඇය ඔහුව ස්වාමින්වහන්සේ තුල ඇදහිල්ලෙන් හැදූ වැඩූ නිසාය. හබරව්ස් ගම්මානයේ සබාවිනා මැතිනියට ඇගේ දෙමව්පියන් නැති මිනිබිරියවූ වානියාව ඇය කෙරෙන් ඉවතට ගෙනගියේ ඇය එ මිනිබිරියට අස්වාභාවික (කිතුණු) අධ්‍යාපනයක් ලබාදුන් නිසාය. (සෝවියට්කයියා රොෂියා පුවත්පත 1968 ජනවාරි 13 වෙනි දින කලාපය) සීමාකිරීම් වලට ලක්වී ඇති ජාතින් තුල වර්තමානයේ පවා කිතුණුවන්ගේ දෙමව්පිය අයිතින් අත්හරිනු ලැබ පවති.

ප්‍රොතෙස්තන්ත රහසිගත සභාව පිළිබඳව පමණක් කථාකිරීම අසාධාරණය.

රුසියාවේ ඔර්තඩොක්ස් කිතුණුවන් පවා සම්පූර්ණයෙන් වෙනස්විය. කෝටි සංඛ්‍යාත දෙනා සිරගෙවල් තුලින් ගමන්කලෝය. එහිදී ඔවුන්ට යව්රැවුල් නොමැත, කුරුස ලකුනු නොමැත, ශුද්ධවූ ප්‍රතිමා නොමැත, සුවඳ දුම් නොමැත, ඉටිපන්දම් නොමැත, ගිහි මනුෂ්‍යන්, ආලේපලත් පූජකවරයෙකු නොමැතිව සිරගෙය තුල සිටියෝය. පූජකවරුන්ට ලෝගු නොතිබුණි. තිරිඟු පාන් නොතිබුණි. සක්‍රමෙන්තු සඳහා මිදී යුෂ නොතිබුනේය. ශුද්ධවූ තෙල් නොතිබුනේය. කියවීම පිනිස සුදානම් කරනලද යාච්ඤා සහිත පොත් නොතිබුනේය. මේ සියල්ල රහිතව ඔවුන්ට සිටිය හැකි බව ඔවුන් සොයාගත්තේය. එනම් යාච්ඤාවන් තුල දෙවියන්වහන්සේ සමග

සෘජුවම සම්බන්ධ වෙමින් සිටිය හැකිබව සොයාගත්තේය. ඔව්හු යාච්ඤාකරන්නට පටන්ගත්තෝය. දෙවියන්වහන්සේ ඔවුන් මත උන්වහන්සේගේ ආත්මය පතුරුවන්නට පටන්ගත්සේක. සැබෑ ආත්මික පිබිදීමක් හටගත්තේය. මූලික කිතුදහමට සමානවූ පිබිදීමක් හටගත්තේය. කොමියුනිස්ට්වරු යටතේ රුසියාවෙ ඕර්තඩොක්ස්වරු අතරේ මෙය සිදුවිය.

මෙය රුසියාව තුල මෙන්ම එහි විජිතයක් වශයෙන් පැවති රටවල් තුලද පැවතුනේය. ඒවායෙහි රහසිගත ඕර්තඩොක්ස් සභාව පැවතුනේය. එය යතාර්ථයෙන්ම ධර්මදාන සේවයෙහි යෙදුන මූලධර්මවාදී දෙවියන්වහන්සේට ඉතා සමීප එකක්විය. එය පවත්වාගෙනයනු ලැබුවේ පුරුද්දෙහි බලය කරණකොටගෙන පමණක් වන අතර ඕර්තඩොක්ස් චාරිත්‍ර එහි පැවතියේ මඳ වශයෙනි. මෙ ඕර්තඩොක්ස් රහසිගත සභාවල පවා ශ්‍රේෂ්ඨ ප්‍රාණ පරිත්‍යාගීවරු බිහිවිය. කලුගා නගරයෙ සිටි අගරදගුරුප්‍රසාදී යෙර්මොගන් හට සිදුවුදේ පැවසිය හැක්කේ කාටද? අදේව භක්තික කොමියුනිස්ට් ආණ්ඩුව සහ සභා නායකයින් අතර පැවති ද්‍රෝහිමය වූ සහයෝගයට විරුද්ධව ඔහු ප්‍රසිද්ධියේ නිර්භීතව නැගිට්ටේය.

1990 වෙනි දශකයෙ මුල්භාගයේ සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පාලනය කෙලවර වන තෙක් පැවති දශක 7ක කාලය තුල රුසියානු ප්‍රවෘත්ති පත්‍ර රහසිගත සභාවේ ජයග්‍රහණ පුන පුනා වර්ණනාකලෝය. එය කිවනොහැකි තරම්වූ අමාරුකම් මැදින් ගිය අතර එහෙත් විශ්වාසවන්තව පැවතුනි..... එපමනක් නොව වර්ධනය වීමද වුනි.

රුමේනියාවෙ අපි රුසියානු හමුදාව තුල අපගේ රහසිගත වැඩය කරණකොටගෙන බීජ වපුලෙමු. එලෙසම රුසියාවේ අන් අය ද රුසියාව ආක්‍රමණයකල අනිත් රටවල මනුෂ්‍යයන්ද ක්‍රියාකලෝය. ඔවුන්ගේ බීජවල බොහෝ ඵල බිහි වුනි.

කොමියුනිස්ට් ආසියාව සහ අනිකුත් වහල් ජාතීන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට දිනා ගතහැක. අපගේ සතුරන්ට කිතුණුවන් බවට පත්වීමට පුලුවන! ඔවුන් කරණකොටගෙන පීඩා ලබන අය තුලින් එසේ සිදුවීමට පුලුවන. එසේ වන්නේ අපි ඔවුන්ට උදව් කරන්නේනම් පමණකි. සෝවියට් සංගමය කොමියුනිස්ට්වාදය යටතේ රහසිගත සභාව මනාලෙස වර්ධණයවූ බව සැබෑවා සේම මෙම සහතිකය තුලම කොමියුනිස්ට්

ආසියාවේද මැද පෙරදිග රටවලද වර්තමානයේ පවතින සභාව වර්ධණයවන්නට හැකි අතර එවා මනා ලෙස විහිදී පැතිරී යනු ඇත.

භයානක වතාවරණයක් යටතේ අපගේ සැම කිතුණුවන් ක්‍රියාකල ආකාරයේ අලංකාරත්වය පෙන්විමට මම රුසියානු තරුණියක් විසින් යැව්වාවු ලිපි කිපයක් ඔබ ඉදිරියේ තබමි. අවසාන ලිපි දෙක ඇය ලියනලද්දේ රුසියානු සිරගෙය තුලදිය.

## *කොමියුනිස්ට්වාදී තරුණියකට ක්‍රිස්තුස්වහන්සේ හමුවු අන්දම.*

පහත සඳහන් ලියුම් තුන කිතුණු තරුණියකවු මරියාගෙනි. ඇය කොමියුනිස්ට් තරුණ සංවිධානයේ සමාජිකාවකවු වැරියාව ක්‍රිස්තුස්වන්සේ තුලට ගෙනාවාය.

පලමු ලියුම

... මම මෙහි දිගටම ජිවත්වෙමි. ඔබහට බොහෝ සෙයින් හිතෙෂිවන්තවු ... අය සිටියෝය. මම කොම්සොමොල් (තරුණ කොමියුනිස්ට් සංවිධානයේ) හි සෛලයක සමාජිකාවන් පවා මට බොහෝ සෙයින් හිතෙෂිවන්ත වුනි. ඇය මා හට මෙසේ පැවසුවාය. "ඔබ කෙබදු තැනත්තෙකුදැයි මට අවබෝධ කර ගැනිමට නුපුලුවන. කොපමණ දෙනා ඔබට කොපමන අපහාස කලත් කොපමන හිරිහැර කලත් ඔබ ඔවුන්ට ප්‍රේමකරයි" ඔබ සියල්ලන්ටම ප්‍රේම කිරිමට දෙවියන්වහන්සේ අපට උගන්වා ඇති බව මම ඇයට පැවසුවෙමි. මිතුරන්ට පමණක් නොව සතුරන්ට පවා ප්‍රේමකරන්නට උන්වහන්සේ අපට උගන්වා තිබේ. කලින් මෙ තරුණිය මට මහත්සේ හිරිහැර කලාය. එහෙත් විශේෂ සැලකිල්ලකින් යුතුව ඇය වෙනුවෙන් මම යාච්ඤා කලෙමි. ඇයටද ප්‍රේම කරන්නට හැකිදැයි ඇය මගෙන් විමසුවාය. මම ඇය බදාගතිමි. අප දෙදෙනාම එක්ව හැඩුවෙමු. දැන් අපි එකට යාවඤාකරන්නෙමු.

කරුණාකර ඇය වෙනුවෙන් යාවඤාකරන්න ඇගේ නම වැරියා වේ.

ප්‍රසිද්ධියේ ශබ්ද නගා දෙවියන්වහන්සේව ප්‍රතික්ෂේප කරන අය පිළිබඳව ඇසෙන විට ඔවුන් එය සැබවින් කරන බව පෙනියයි. එහෙත් ඔවුන් ඔවුන්ගේ තොල්වලින් දෙවියන්වහන්සේට ශාප කලද

ඔවුන්ගේ සිත්වලින් දෙවියන්වහන්සේව මහත්සේ වැලඳගන්නා බව ඔවුන් බොහෝ දෙනෙකුගේ ජීවිත තුලින් පෙනියයි. තවද ඔබට හදවතෙහි කෙදිරීමෙහි හඩ ඇසෙයි....... ඔවුන් යම් දෙයක් සොයති. ඔවුහු ඔවුන්ගේ දේව අභක්තිකයෙහි ඇතුලාන්ත ස්වභාවය සගවා ගැනිමට බලාපොරොත්තුවේ.

ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සහෝදරිය වු මරියා

දෙවන ලියුම.

මගේ කලින් ලියුමෙහි මම අදේවවාදි ගැහැණු ළමයෙකු පිළිබඳව ඔබට ලිව්වෙමි. ඇයගේ නම වැරියා වේ. දැන් මම මහත් වු ප්‍රීතියෙන් යුතුව ඔබට එනම් මාගේ ප්‍රේමවන්ත අයවලුන්ට මෙසේ පවසන්නට ඉක්මන් වෙමි. වැරියා ඇගේ පුද්ගලික ගැලවුම්කාරයා ලෙස ක්‍රිස්තුස්වහන්සේව පිළිගෙන තිබුනි. ඇය මේ පිළිබඳව සියලුම දෙනාටම විවෘතව සාක්ෂිදරන්නීය.

ඇය ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාස කරන්නට පටන්ගත් විට ඇයට ගැලවීමේ ප්‍රීතිය ලැබුනි. ඒ හා සමග ඇයට මහත් අසන්තෝෂයක් දැනිනි. ඇය මහත් අසන්තෝෂයෙන් පසුවුවාය. දෙවිකෙනෙකු නොමැතිබව ඇය කලින් අභ්‍යාස කරතිබු බැවින් එම අසන්තෝෂය ඇයට දැනුනි. ඇගේ වරද වෙනුවෙන් සමගිකම් කිරීමට ඇය දැන් තිරණයකොට තිබේ.

අපි දෙදෙනා එක්ව දේව අභක්තික රැස්වීමට ගියෙමු. ඇයට ප්‍රවේසම්ව සිටින ලෙස මම අනතුරු අගවා තිබුනත් එය නිෂ්ප්‍රයෝජන විය. (වැරියා එහි ගිය අතර මමද කුමක් සිදුවන්නේදැයි දැකිමට එහි ගියාය. කොමියුනිස්ට් ගීය පොදුවේ ගැයිමෙන් පසුව (වැරියා මෙම ගීය ගැයිමට සහභාගිනොවුවාය.) ඇය රැස්වීම ඉදිරියට පැමිණියාය. ඇය ධෛර්යමත් හැගීමකින් යුතුව මහත් හැගීමකින් යුක්තව ඇගේ ගැලවුම්කාරයා ලෙස ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව රැස්වී සිටියවුන්ට සාක්ෂිදැරුවාය. එහෙත් ඇය පෙර ඇගේ ආත්මික ඇස් වසාගෙන සිටි බැවින් ඇගේ කලින් කොමියුනිස්ටවාදය තුල සගයින්ව සිටි ඇයගෙන් සමාව ඉල්ලා සිටියාය. ඇය, ඇය විසින්ම විනාශය කරා යමින් සිටි බව ඇය නොදැන සිටි බැව් පවසමින් ඔවුන්ගෙන් සමාව ඉල්ලා සිටියාය. තවද අන්යන්වද එකී විනාශය කරා යොමුකල බැවින් ඇය ඒ ගැනද සමාව ඉල්ලා සිටියාය. ඇය සියල්ලන්ටම පාපයේ මාර්ගය අත්හැර ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණෙන ලෙස බැගෑපත්ව ආයාචනය කලාය.

සියල්ලෝම නිශ්ශබ්දව සිටියෝය. කිසිවෙකු ඇයට බාධා නොකලෝය. ඇය කථාකොට නිමවූ කල ඇගේ අලංකාර කටහඬින් කිතුණු ගීතිකාවක් ගැයුවාය. එය "උන්වහන්සේගේ කුරුසියේ බලය සහ උන්වහන්සේගේ ආඥාවන් රදාපවත්වනු පිනිස මරණයට පත්වූ ක්‍රිස්තුස්වහන්සේව ප්‍රකාශකිරීමට මම ලැජ්ජා නොවෙමි." යන ගීතිකාවයි.

ඉන්පසු ...... ඉන්පසු ඔව්හු වැරියාව පිටතට ගෙන ගියෝය.

අද මැයි මස නමවෙනි දිනයයි. අපි ඇය පිළිබඳ කිසිවක් නොදනිමු. ඇයව ගැලවීමට දෙවියන්වහන්සේ බලවන්තය. යාච්ඤාකරන්න!

ඔබගේ මරියා

තුන්වෙනි ලියුම

ඊයෙ අගොස්තු දෙවෙනිදාය. මම අපගේ ආදරණීය වැරියාව සමඟ සිරගෙය තුල දී කථාකලෙමි. මම ඇය ගැන සිතන විට මගේ හදවතට වේදනා ගෙනදෙන්නේය. ඇත්තෙන්ම ඇය තවමත් දැරියකි. ඇගේ වයස අවුරුදු 19ක් පමණකි. ස්වාමීන්වහන්සේ තුල ඇදහිලිවන්තයෙකු වශයෙන් ඇයද ආත්මීක ළිදරුවෙකි. ඇය ඇගේ මුළු හදවතින්ම ස්වාමීන්වහන්සේට කොතරම් ප්‍රේමකලේදයත් එක් වරම ඇය අමාරු මාර්ග වලට පිවිසියාය. දිළිදු දැරිය කුසගින්නේ පසුවන්නීය. ඇය සිරගෙය තුල සිටින බව අපි දැනගත් විට ඇය වෙත පාර්සල් යවන්නට පටන්ගතිමු. අපි ඇය වෙත යැවූ දේවලින් ඇයට ලැබී තිබුනේ ස්වල්පයක් පමනි.

මම ඊයේ ඇය දකින විට ඇය කෘෂ වී සුදු මැලි වී සිටියාය. ඇයට පහරදෙනු ලැබ තිබුනි. ඇගේ ඇස් දෙකෙන් පමණක් ඇය දෙවියන්වහන්සේගේ සමාදානය තුල භෞතික නොවන ප්‍රීතියකින් පිරී සිටියාය.

එසේය, මගේ ආදරණීය මිතුරනි, ක්‍රිස්තුස්වහන්සේගේ පුදුමාකාර සමාදානය අත් නුදුටු අයෙකුට එය අවබෝධකරගැනීමට නොහැක. ....... එහෙත් මේ සමාදානය ඇත්තාවූ අය කොතරම ප්‍රීතිමත්ද? ....... ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින අප වේදනාවිඳීම් වලින් හා බලාපොරොත්තු කඩවීම් වලින් නතරකරන්ට නුපුළුවන.

යකඩ පොලු තුලින් මම ඇය දෙස බලා "වැරියා ඔබ කල දේ ගැන ඔබ කණගාටුවන්නේද?" යනුවෙන් ඇසුවෙමි. "නැත" යැයි ඈ පිළිතුරු දුන්නාය. ඇය තවදුරටත් කථාකරමින් මෙසේ පැවසුවාය. "ඔවුන් මාව නිදහස් කලොත් මම නැවතත් ගොස් ක්‍රිස්තුස්වහන්සේගේ

මහත් වු ප්‍රේමය ඔවුන්ට පවසන්නෙමි. මම වේදනා විඳින බව නොසිතන්න. ස්වාමීන්වහන්සේ මට මහත්සේ ප්‍රේමකරන බැවින් හා උන්වහන්සේගේ නාමය නිසා වේදනා දරාගැනීමට මට ඉඩදී තිබෙන බැවින් එය මහත් ප්‍රීතියක් සේ මම සලකන්නෙමි.”

ඇය වෙනුවෙන් යාච්ඤාකරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි. ඇයව සයිබීරියාවට යවන්නට සමහර විට ඉඩ තිබේ. ඔවුහු ඇගේ ඇඳුම් සහ ඇය සතු සියල්ල පැහැරගෙන තිබේ. ඇය කිසිත් නැතුව සිටින්නීය. ඇයගේ සිරුරේ ඇති දේ මිස වෙනකිසිවක් නැතිව සිටින්නීය. ඇයට ඥාතින් නැත. වඩා අත්‍යවශ්‍යම දේවල් අපි රැස්කල යුතු වෙමු. ඔබ අවසාන වරට මා වෙත එවු මුදල් මම මේ සඳහා තබාගතිමි. වැරියාව පිටුවහල් කරනු ලැබුහොත් මම එය ඇයට දෙන්නෙමි. දෙවියන්වහන්සේ ඇයව ශක්තිමත් කරනු ඇතැයි මම විශ්වාසකරමි. අනාගතය තුල පීඩා දරාගැනීමට බලය දෙවියන්වහන්සේ ඇයට දෙනු ඇතැයිද මම විශ්වාස කරමි. දෙවියන්වහන්සේ ඇයව ආරක්ෂාකරන සේක්වා!

ඔබගේ මරියා

හතර වන ලියුම

ආදරණීය මරියා,

අවසානයේදී ඔබට ලියන්නට මට හැකිවුනි. අපි (ස්ථානය කපා දමා තිබුනි.) යන ස්ථානයට පැමිණියෙමු. අපගේ කඳවුර නගරයෙන් සැතපුම් දහයක් ඈතය. මට අපගේ ජීවිතය විස්තර කිරීමට නොහැක. ඔබ එය දන්නෙහිය. මා පිළිබඳව යමක් ඔබට ලියන්නට මම බලාපොරොත්තුවෙමි. උන්වහන්සේ මට සෞඛ්‍ය තත්වයන් කායිකව වැඩ කරන්ට හැකිකමත් දී ඇති නිසා මම ස්තුතිකරමි. X නැමැති සොහොයුරියන් මාවත් මැෂින් වල වැඩ සඳහා වැඩ පොලක් තුලට දමා තිබේ. වැඩ අමාරුය. X සොහායුරියගේ සෞඛ්‍ය තත්වය අයහපත්ය. මම ඇය වෙනුවෙන් හා මා වෙනුවෙන් වැඩකරන්ට ඕනෑය.

දෙවියන්වහන්සේ අප වෙත එවන වේදනාවිඳිම් අපව වඩ වඩා උන්වහන්සේ තුල ඇදහිල්ල තුලටෙ ශක්තිමත් කරයි.



මම පළමුවෙන් මාගේ වැඩ නිම කොට ඇයට උදව්වෙන්නෙමි. අපි දවසකට පැය 12-13ක් වැඩ කරමු. අපගේ ආහාර ඔබගේ හා සමානය.

ඉතා ස්වල්පයක් පමණක් තිබේ. එහෙත් මම ඔබට කියන්නේ මේ පිළිබඳව නොවේ.

මාගේ හදවත දෙවියන්වහන්සේ වෙත ප්‍රශංසාවෙන් හා ස්තුතියෙන් පිරියයි. උන්වහන්සේ මා හට ගැලවීමේ මාර්ගය පෙන්වාදුන්නේ ඔබ තුලිනි. දැන් මේ මාර්ගයේ සිට මාගේ ජීවිතයට අරමුණක් ඇත්තේය. යා යුතු ස්ථානය මම දනිමි. කා වෙනුවෙන් වේදනා විදිය යුතු දැයි මම දනිමි. මා සිත තුල ඇති ගැලවීමේ මහත් ප්‍රීතිය සෑම දෙනාටම සාක්ෂිදැරීම හා පැවසීම මාගේ ආශාවයි. ක්‍රිස්තුස්වහන්සේ තුල දෙවියන්වහන්සේගේ ප්‍රේමයෙන් අපව වෙන්කරන්නේ කවුද? කිසිවෙක් නැත. කිසිවකට ද නුපුළුවන. දෙවියන්වහන්සේ අපට එවා තිබෙන වේදනා විදීම් උන්වහන්සේ තුල ඇදහිල්ල තුල අපව තව තවත් ශක්තිමත්කරයි. මාගේ හදවත කොතරම් ප්‍රීතියෙන් පිරී ඇද්දැයි කිවහොත් දෙවියන්වහන්සේගේ අනුග්‍රහය පිරී ඉතිරී යයි. වැඩකරන අතර තුර ඔව්හු මට ශාප කරති. දඩුවම්කරති. මට නිශ්ශබ්දව සිටින්ට නුපුළුවන් නිසා ඔව්හු මට අතිරේක වැඩ දෙති. ස්වාමීන්වහන්සේ මා වෙනුවෙන් කර තිබෙන දෙය මම සියල්ලන්ටම පැවසිය යුතුය. උන්වහන්සේ මාව අළුත් මැවිල්ලක් කළ සේක. අළුත් පුද්ගලයෙකු කල සේක. උන්වහන්සේ විනාශයේ මාර්ගයෙන් මාව මුදාගත්සේක, මෙයට පසු මට නිශ්ශබ්දව සිටිය හැකිද? නැත කිසිකලෙකත් නැත. මාගේ තොල් වලට කථාකල හැකි නම් උන්වහන්සේගේ මහත් ප්‍රේමය ගැන මම සියලු දෙනාටම සාක්ෂිදෙන්නෙමි.

කඳවුරට යන අතරතුරේ දී අපට ක්‍රිස්තුස්වහන්සේ තුල බොහෝ සහෝදර සහෝදරියන් මුණගැසුනි. ඔවුන් දේව දරුවන් බව ආත්මයාණන්වහන්සේ තුලින් හැගෙන විට එය කොතරම් පුදුමාකාර දෙයක්ද? මේ සහෝදර සහෝදරියන්ව ඔබ පළමුවරට දකින විට එය කොතරම් පුදුමාකාර දෙයක්ද! කථාකිරීම නිශ්ප්‍රයෝජනය. පළමු දැක්මේ සිටම ඔවුන් කවුදැයි ඔබට හැගෙන අතර ඔබට එය දැනගන්ට පුළුවන.

අපි කඳවුර බලා යන අතරතුරේදී දුම්රිය පොළකදී කාන්තාවන් මා වෙත පැමිණෙන අපට ආහාර දී වචන දෙකක් පමණක් පැවසුවාය. එය "දෙවියන්වහන්සේ ජීවමානයි" යන්නයි.

අපි මෙහි පැමිනි පසු සන්ධ්‍යාවේ (එවිට රෑබෝවී ඇත.) අපව පොළව යට බැරැක්ක වෙත ගෙන යන ලදී. එහිදී අපි "නුඹලා සමග

සමාදානය වේවා" යනුවෙන් පවසමින් ඔවුන්ට සුභ පැතුවෙමු. අපගේ මහත් ප්‍රීතියට මෙන් සෑම ස්ථානයකින්ම "අපි ඔබව සමාදානයෙන් පිළිගන්නෙමු" යන හඬ ඇසුනේය. පළමු සන්ධ්‍යාවේ සිටම අපි එක පවුලක් යැයි අපට හැඟුනෙමු.

එසේය. එය සැබවින්ම නිවැරදිය. මෙහි ක්‍රිස්තුස්වහන්සේ තුල විශ්වාසකරන බොහෝ දෙනා සිටියහ. ඔවුන්ගේ පුද්ගලික ගැලවුම්කාරයාණන් ලෙස ක්‍රිස්තුස්වහන්සේ පිළිගත් අය සිටියහ. සිරගතව සිටිය අයගෙන් අඩකට වඩා ඇදහිලිවන්තයෝ වූහ. ඔවුන් අතර ශ්‍රේෂ්ඨ ගායකයෝද ශුභාරංචි දේශකයෝද සිටියහ. සන්ධ්‍යාවේදී අපි බර වැඩ කලායින් පසුව සියල්ලෝම සාමුහිකව එකතු වී අපගේ ගැලවුම්කාරයාණන්ගේ පාමුල යාච්ඤාකිරීම කෙතරම් පුදුමාකාරද? ක්‍රිස්තුස්වහන්සේ සමග එහි සෑම තැනම නිදහස තිබේ. මම එහි දී කොතරම් අලංකාර ගීතිකා ඉගෙනගත්තෙම්ද? දිනපතා දෙවියන්වහන්සේත් උන්වහන්සේගේ වචනය මා හට වැඩි වැඩියෙන් දුන්නේය. වයස අවුරුදු 19 දී පළමුවර මම ක්‍රිස්තුස්වහන්සේ තුල උපන්දිනය සැමරුවෙමි. මේ දිනය මට කිසිදිනක අමතකවන්නේ නැත. අපට මුළු දවස තිස්සේ වැඩකරන්ට සිදුවුනි. ඔව්හු අයිස් කඩා දමා දේව වචනයට අනුව රාත්‍රියේ දී අපව බව්තිස්ම කරන පිනිස ස්ථානයක් පිළියෙල කලෝය. සහෝදරවරුන් 7 දෙනෙක් හා මාව බව්තිස්ම කරන ලදි. මම කොතරම් ප්‍රීතිමත් වුයෙම්ද! මරියා ඔබත් මේ මොහොතේ දී මා සමග සිටියේ නම් මා කෙතරම් ආශාද? අතිතයේදී මම ඔබට විරුද්ධව කල වැරදි වෙනුවෙන් මා තුල ඔබ වෙත පවතින ප්‍රේමය තුලින් මදක් වෙනුවෙන්වත් සමගිකමක් කිරීමට හැකිවීම කෙතරම් දෙයක් ද? දෙවියන්වහන්සේ අප එකිනෙකාව උන්වහන්සේගේ ස්ථානය තුල තබන සේක. අපි දෙවියන්වහන්සේ අපව තබා තිබෙන ස්ථානය තුල ස්ථිරව සිටිය යුතු වෙමු.

දේව දරුවන්ගේ මුළු පවුලට ශුභපැතුම් ලබාදෙන්න. ඔබගේ පොදු වැඩ සඳහා දෙවියන්වහන්සේ බොහෝ සේ ආශිර්වාද කරනසේක්වා. උන්වහන්සේ මා හට ද ආශිර්වාද කරන සේක. හෙබ්‍රෙව් 12:1-3 කියවන්න.

අපගේ සහෝදරවරු සියලු දෙනා ඔබට ශුභපතන්නෝය. දෙවියන්වහන්සේ තුල ඔබගේ ඇදහිල්ල බලවත් නිසා ප්‍රීතිවන්න. ඔබ

නොකඩවා පීඩා විඳිම් තුල උන්වහන්සේට ප්‍රශංසා කරන්නෙමිය. ඔබට අන්‍යයන්ට ලියන්නේ නම් අපගේ ශුභපැතුම් ඔවුන්ට පවසන්න.

ඔබගේ මැරියා

පස්වන ලියුම
ආදරණීය මරියා,

අවසානයේදී ඔබට ජේලි කිපයක් ලියන්ට මට අවස්ථාව ලබාදුන්නේය. මාගේ ආදරණීය මිතුරිය, දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් X නැමැති සොහොයුරිය සහ මම සෞඛ්‍යසම්පන්නව හොඳින් සිටින බව මම ඔබට පවසමි. අපි දැන් සිටින්නේ (ස්ථානය කපාදමා තිබේ.) ස්ථානයෙහිය.

මවක් මෙන් ඔබ මාව රැකබලා ගැනීම ගැන මම ඔබට ස්තුතිකරමි. මා වෙනුවෙන් පිළියෙල කල සියල්ල මට ලැබුනේය. ඉතාමත් වටිනා දේ වන බයිබලය ද මට ලැබුනු හෙයින් මම ඔබට ස්තුතිකරමි. සියල්ල ගැන ඔබට ස්තුතියි. ඔබ ඔවුන්ට දන්වන්න. ඔව්හු මා වෙනුවෙන් කර තිබෙන සියල්ලට ඔවුන්ට ස්තුතියි.

ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ශුද්ධ වු ප්‍රේමයෙහි ගැඹුරු අභිරහස මා හට අනාවරණය කොට තිබෙන බැවින් මම මේ ලෝකයේ ප්‍රීතිමත් පුද්ගලයා යැයි සලකන්නෙමි. මා හට දරන්නට සිදු වී තිබෙන පීඩාවන් විශේෂ අනුග්‍රහයක් කොට සලකමි. මාගේ ඇදහිල්ලේ පළමු දවසේ පටන් ස්වාමීන්වහන්සේ මා හට දී තිබෙන උන්වහන්සේ සඳහා වේදනා විදිමේ මහත් වු ප්‍රීතිය සැබවින්ම ප්‍රීතියක් කොට සලකමි. අවසානය දක්වා ස්වාමීන්වහන්සේට විශ්වාසවන්තවීමට මා හට පුළුවන් වන මෙන් මා වෙනුවෙන් යාච්ඤාකරන්න.

ශුද්ධවු සටන සඳහා ස්වාමීන්වහන්සේ නුඹලාව ආරක්ෂාකොට ශක්තිමත් කරනසේක්වා.

X සොහොයුරිය සහ මම නුඹලාව සිපගනිමි. අපව (ස්ථානය කපාදමා ඇත.)ගෙන ගිය විට සමහර විට ඔබට නැවත ලියන්නට මට අවස්ථාව ලැබේ. අප පිළිබඳව කනස්සලුනොවන්න. ස්වර්ගයේදී අපගේ

විපාකය මහත් වන බැවින් අපි ප්‍රීතිමත් සන්තෝෂයටත් පත්වන්නෙමු (මතෙව් 5:11, 12).

ඔබගේ වැරියා

මෙය ක්‍රිස්තුස්වහන්සේව හමු වූ උන්වහන්සේ පිළිබඳව සාක්ෂිදැරූ ඒ නිසාම වහල් කම්කරුවෙක් හැටියට සිරගත කිරීමට නියමකරනු ලැබූ තරුණ කොමියුනිස්ට් ගැහැණු ළමයෙකු වූ වැරියාගෙන් ලැබුනු අවසාන ලිපියයි.

ඉන්පසු ඇය පිළිබඳව අසන්නට නොලැබුනි. එහෙත් ඇගේ අලංකාර ප්‍රේමය සහ ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සාක්ෂිදැරීම රහසිගත සභාවේ විශ්වාසවන්තභාවය හා වේදනාවිදීම පිළිබඳව පෙන්වන ආත්මික අලංකාරත්වයන්වේ.

# 7 පරිච්ඡේදය



# බටහිර කිතුණුවන් විසින් උපකාර කල හැකි ආකාරය

මාව "රහසිගත සභාවේ හඬ" යැයි හඳුන්වනු ලැබේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුල වු එබඳු ගෞරවනීය කොටසක හඬ බවට පත්වීමට මම වටිනා යැයි නොසිතමි. කෙසේ හෝ කොමියුනිස්ට් ජාතීන් තුල රහසිගත සභාවේ කොටසකට මම වසර ගණනක් මුළුල්ලේ නායකත්වය දුනිමි. අවුරුදු 14ක් මුළුල්ලේ සිරගත කරන ලද වධදීමට ලක්වු මා ආරක්ෂා සහිතව සිටිම භාස්කමකි. එයින් අවුරුදු දෙකක්ම මා ගත කලේ සිරගෙයක "මියයමින් සිටින කාමරය තුලය". මීටත් වඩා වැඩි වු භාස්කමවන්නේ දෙවියන්වහන්සේ සිරගෙය තුලට ළඟාවී මාව ඉන් පිටතට ගෙනඒමය. රුමේනියාවේ රහසිගත සභාවේ තීරණයකට අනුව මා මාගේ රටින් පිටවී ලෝකයේ නිදහස් කිතුණුවන් වෙත පනිවිඩයක් ගෙන යා යුතු විය. භාස්කමකින් මාගේ පවුලටත් මටත් පිටවීමට හැකිවිනි. වහල් ජාතීන් දුසිමක් තුල වෙහෙසවී වැඩ කරමින් තම ජීවිතය අවදානමකට ලක්කරමින් වේදනාවිඳිමින් මියයමින් සිටින තිරයෙන් පිටුපස සිටින අය විසින් මා හට දෙන ලද එම අණ සම්පූර්ණ කිරීමට මට හැකිව තිබිනි.

ගණන් නැති, නම් රහිත සොහොන් වල සැතපෙන මාගේ සහෝදරයන් වෙනුවෙන් මම කථාකරමි. දැන් රහසිගතව කැලෑ තුල, පොළව යට තිබෙන කාමර තුල, අට්ටාලයන් මත සහ වෙනත් අනිකුත් ස්ථාන වල රැස්වෙන මාගේ සහෝදරයන් වෙනුවෙන් මම කථාකරමි.

රහසිගත සභාවෙන් මා ගෙන එන පනිවිඩය වන්නේ:

අපව අත් නොහරින්න.
අපව අමතක නොකරන්න.
අපව ඉවත නොහෙලන්න.

"අපට අවශ්‍ය ආයුධ අපට දෙන්න; ඒවා භාවිතාකිරීමේ මිළය අපි ගෙවන්නෙමු"

මේ පනිවිඩය මම නිදහස් සභාවලට බෙදාහැරීමට බලාපොරොත්තු වන පනිවිඩයයි.

මම රහසිගත සභාව වෙනුවෙන් කථාකරමි. නිශ්ශබ්ද සභාව වෙනුවෙන් කථාකරමි. "ගොළු" සභාව වෙනුවෙන් කථාකරමි. මන්ද එයට කථාකරන්ට හඩක් නොමැත.

මෙය වහල් ජාතීන් තුල ඔබගේ සහෝදර සහෝදරියන්ගේ මොරගැසීමේ හඩයි. ඔව්හු පහසු ජීවිතයක් හෝ සුරක්ෂිතභාවය හෝ ගැලවෙන්ට ඕනෑකම හෝ නොසොයති. ඔවුන් ඉල්ලා සිටිනුයේ අදේව වාදයෙන් ඊළඟ පරම්පරාව වු ඔවුන්ගේ තරුණයන් විෂකොට මත්කිරීමේ ක්‍රියාවලියට විරුද්ධව එය බැදදමන්ට අවශ්‍ය ආයුධ පමණකි. දේව වචනය පතුරුවා හැරීම පිනිස ඔව්හු බයිබල් ඉල්ලා සිටිති. ඔවුන්ට එය නොමැති නම් ඔවුන් කෙසේ දේව වචනය පතුරුවා හරින්නද!

රහසිගත සභාව දුම්රියකින් ගමන්කරන ශෛල්‍ය වෛද්‍යවරයෙකු හා සමානය. දුම්රිය තවත් දුම්රියක් සමඟ ගැටී සිය ගණන් මනුෂ්‍යයන් පොඩිකරනු ලැබ, තුවාල කරනු ලැබ මිය යමින් බිම වැතිර ඉන්නෙහිය. ශෛල්‍ය වෛද්‍යවරයා නම් මිය යමින් සිටින මනුෂ්‍යයින් අතර "මා හට ආයුධ ඇත්නම්! මා හට මාගේ ආයුධ ඇත්නම්!" යනුවෙන් මොරගසමින් ඔබමොබ ඇවිදී: මේ ශෛල්‍ය වෛද්‍ය උපකරණ සමඟ ඔහුට බොහෝ ජීවිත ගලවන්නට පුළුවන. ඔහුට කැමැත්ත ඇත්තේය. ....... එහෙත් ආයුධ නොමැත්තේය. රහසිගත සභාව සිටිනුයේ මේ ස්ථානයේය. එය ඒ සියල්ල ලබාදෙන්ට කැමැත්තේන් සිටින්නේය. එය ඒ සියල්ල ප්‍රාණ පරිත්‍යාගීවරුන්ට ලබා දෙන්ට කැමැත්තේය. වසර ගණනාවක් සිරගෙය තුල ගතකරන්ට කැමැත්තෙන් සිටින්නේය! එහෙත් වැඩ කිරීමට ආයුධ නොමැති නම් ඒ සියලු කැමැත්තෙහි වටිනාකමක් නොමැත්තේය. විශ්වාසවන්ත, ධෛර්‍යමත්, රහසිගත සභාවේ ආයාචනය නිදහස්ව

සිටින ඔබටයි. "ආයුධ අපට දෙන්න. – ශුභාරංචි පොත්, බයිබල්, සාහිත්‍ය පත්‍රිකා, උපකාර අපට ලබාදෙන්න. අපි ඉතිරි කොටස කරන්නෙමු!"

## නිදහස් ලෝකයේ කිතුණුවන්ට උපකාර කල හැකි ආකාරය

නිදහස් ලෝකයේ සෑම කිතුණුවෙකුටම පහත සඳහන් ආකාරයෙන් උපකාරකරන්ට පුළුවන.

අදේවවාදීන් ඔවුන්ගේ ජීවිත තුල අදෘශ්‍යමාන ප්‍රභවයන් පිළිනොගන්නා මනුෂ්‍යයන්ය. විශ්වය තුල හා ජීවිතය තුල අභිරහස් පිළිබඳව හැඟීමක් ඔවුන්ට නැත්තේය. කිතුණුවන්ට පෙනීමට අනුව නොව, ඇදහිල්ලෙන් ඔවුන් අතර ගමන්කරමින් වඩා හොඳින් ඔවුන්ට උපකාර කරන්ට පුළුවන. එසේ පුළුවන්වන්නේ අදෘශ්‍යමාන දෙවියන්වහන්සේ සමඟ සහභාගීත්වය පවත්වන ජීවිතයක් ගතකිරීමෙනි.

ස්ථිරසාර කිතුණුවන්ගේ ජීවිත සහ යාගකිරීමේ ජීවිත ගතකිරීම මගින් අපට වඩා හොඳින් උපකාරකරන්ට පුළුවන. කිතුණුවන්ව පීඩාවට ලක්කරන සෑම අවස්ථාවකදීම ප්‍රසිද්ධියේ විරෝධය දක්වමින් ඔවුන්ට උපකාරකරන්ට පුළුවන.

ඔවුන්ට පීඩාකරන්නවුන් ගැලවෙන පිනිස යාච්ඤා කිරීම මගින් බටහිර කිතුණුවන්ට උපකාරකරන්ට පුළුවන. එබඳු යාච්ඤාවන් නිවට යැයි පෙනෙන්නට පුළුවන. අපි කොමියුනිස්ට්වරු වෙනුවෙන් යාච්ඤා කලෙමු. ඊළඟ දවසේ යාච්ඤාවට ප්‍රථමයෙන් පැමිනියාට වඩා පීඩාව දරුණු විය. යෙරුසලමේ දී ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව පවා "නිවටකමක්" මෙන් පෙනෙන්නට තිබුනි. උන්වහන්සේ මේ යාච්ඤාව කල පසු වුව ද ඔව්හු උන්වහන්සේව කුරුසිපත් කලෝය. එහෙත් ටික දිනකට පසුව ඔව්හු තමුන්ගේ ළයට ගසාගනිමින් එක් දිනක දී 5000 ක් දෙනෙකුගේ සිත් හැරුනාහ.

අන්‍යයන්ට ද යාච්ඤාව නිශ්චලකමක් නොවුනි. ඔබ උතුම් අයෙකු වෙනුවෙන් මැදහත්කාරකම් කරන්නේද? එම යාච්ඤාව පිළිගනු නොලැබුවා වු ද මහත් වු ආශිර්වාද ඔබට ගෙනෙන්නේය. ක්‍රිස්තුස්වහන්සේගේ වචනය සම්පුර්ණකරමින් බොහෝ කිතුණුවන් සහ මම හිට්ලර් සහ ඔහුගේ මනුෂ්‍යයන් වෙනුවෙන් සැමවිටම යාච්ඤා

කලෙමු. මිත්‍ර පක්ෂයේ සොල්දාදුවන්ගේ උණ්ඩ හා සමාන ලෙසටම ඔවුන්ව පරාජය කිරීමට අපගේ යාච්ඥාව උපකාර වූ බව මට සහතිකය.

අපි අපට මෙන් අපගේ අසල්වැසියන්ට ප්‍රේමකල යුතු වෙමු. කොමියුනිස්ට්වරු සහ අනිකුත් පීඩාකරන්නවුන් අන් අය හා සමාන ලෙසට අපගේ අසල්වැසියෝ වන්නාහ. ඔවුන් වනාහි “මා පැමිනියේ ඔවුන් ජීවනය ලබන පිනිසත් ඔවුන්ට එය බහුල ලෙස ලැබෙන පිනිසත්ය” (යොහාන් 10:10), යන ක්‍රිස්තුස්වහන්සේගේ වචනය පිලිබඳ අප දැනගන්ට සලස්වා නොමැතිකමේ ප්‍රථිපලයකි. කිතුණුවන් තවමත් සියලු දෙනාටම අධිකවූ ජීවිතය ලබා ගැනීමට අවස්ථාව උදාකර දී නොමැත. ජීවිතය තුල සෑම වටිනා දෙයකම කෙලවර ඔච්චු යමක් ඉතිරිකොට තබා ඇත. එබැවින් මෙම පුද්ගලයන් කැරලිගසා ගොස් කොමියුනිස්ට් පක්ෂය හා වෙනත් වැරදි ආගම් බිහි කොට තිබේ. සමාජ අසාධාරණයට ලක්වූ ඔවුන් දැන් තිත්තකමින් පිරී කෲරව සිටිති. දැන් අපි ඔවුන්ට එරෙහිව සටන් කළ යුතුය. නමුත් කිතුණුවන් ලෙස ඔවුන් සතුරෙකුට එරෙහිව සටන් කළත් අපි අවබෝධයෙන් යුතුව ඔවුන්ට ප්‍රේම කළ යුත්තේමු. සමහරු කැරළිකාරකම් කිරීමේ වරදට අපි වැරදිකාරයන් නොවෙමු. එහෙත් අපගේ යුතුකම් ඉටු නොකිරීම පිළිබඳව අපි වැරදිකාරයෝ වෙමු.

ඔවුන්ට ප්‍රේම කිරීමෙන් හා යාච්ඥා කිරීමෙන් අපි ඔවුන් උදෙසා සමඟි කිරීමක් කරමු. මෙකී ප්‍රශ්ණය ප්‍රේමයට පමණක් විසඳිය හැකි යැයි සිතීමට තරම් මම නිවට නොවෙමි. කල්ලි ගැසී අපරාධ කරන මැරවරයින් පිළිබඳව ගැටළුව ප්‍රේමයෙන් පමණක් විසඳිය හැකි යැයි මම රජයට උපදෙස් නොදෙමි. මෙම මැර කණ්ඩායම් සඳහා දේවගැතිවරු පමණක් නොව පොලිස් හමුදාවත්, විනිශ්චය යකාරවරුන් හා සිරගෙවල් ද තිබිය යුතුය. මෙවන් තක්කඩින් පසුතැවිලි නොවන්නෝ නම් ඔවුන්ව සිරගත කල යුතුය. කොමියුනිස්ට්වාදය සහ වෙනත් භයංකර භීෂණයන්ට විරුද්ධව සටන් කිරීමට “ප්‍රේමය” පිළිබඳව කිතුණු ප්‍රකාශනය පමණක් භාවිතා කල යුතු යැයි මම නොකියමි. ඒවා මැඩපැවැත්වීමට සුදුසු දේශපාලනික ආර්ථික සහ සංස්කෘතික සටන් ද කල යුතුය. මන්දයත් මෙවන් භයංකර භීෂණයන් ඇතිකරන්නාවූ පුද්ගලයින් අන් කිසිවෙකු ද නොව ජාත්‍යන්තර පරිමාණ මැරවරයින් වන බැවිනි. මැරවරයින් සොරකම්කරන්නේ මුදල් පසුම්බි පමණකි. එහෙත් මොවුන් මුළු රටක්ම සොරකම් කරති.

එසේ වෙනත් දේවගැතිවරු හා තනි තනි කිතුණුවන් මෙවැනි කැරලිකාර ජාතීන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන ඒමට තමුන්ට කල හැකි උපරිමය කලයුතුය. ඔවුන් කරන්නාවු අපරාධ කවරක වුවද ඔවුන් මෙන්ම ඔවුන්ගේ අහිංසක, ගොදුරක් බවට පත්වන අය ද, ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙනෙන්ට ඕනැය. අපි අවබෝධයෙන් යුතුව ඔවුන් වෙනුවෙන් යාච්ඥා කලයුත්තෙමු.

## *බයිබල් හදිසි අවශ්‍යතාවයකි.*

නිදහස් කිතුණුවන්ට උපකාර කල හැකි තවත් ආකාරයක් නම් බයිබල් සහ බයිබල් කොටස් යැවීම මගිනි. නිදහස් කිතුණුවන් ඒවා සපයන්නේ නම් රහසිගත සභාවල අපගේ සහෝදර සහෝදරියන් වෙත ඒවා සැපයීමට හැකි සීමාකිරීම් පනවා ඇති ජාතීන් තුලට ආරක්ෂා සහිතව ඒවා යැවිය හැකි මාර්ගයන් විවෘතව තිබේ. යම් යම් මාර්ග වලින් බයිබල් එලෙස රුමේනියාවට තවමත් ගෙන එන බව සඳහන් කරන්ට පුළුවන. ඒවා යවනු ලබන ආකාරය පිළිබඳව ප්‍රශ්නයක් නැත. අවශ්‍යවන්නේ ඒවා සැපයීමයි.

ඒවා අතිශයින් අවශ්‍යවී තිබේ. චීනය සහ උතුරු කොරියාව වැනි කොමියුනිස්ට් ජාතීන් පවා බයිබල් හෝ ශුභාරංචි පොත් දැක නැත.

දවසක් ඉතා කිලිටු ලෙස ඇඳගත් ග්‍රාමීය වැසියන් දෙදෙනෙකු බයිබලයක් මිළදී ගැනීම සඳහා මාගේ නිවසට පැමිණියෝය. ඔව්හු ඔවුන්ගේ ගම්මානයේ සිට පැමිණ තිබුනේ පොළොවෙන් මිදුනු හිම ශීත කාලයේදී ඉවත්කිරීමේ රැකියාවක් සඳහාය. ඔවුන් මෙලෙස පැමිණි ඉරී ගිය හෝ බයිබලයක් මිළදී ගැනීමට හැකි වෙතැයි බලාපොරොත්තුවක් හෝ තබාගෙන ඒ රැකියාව තුලින් මුදල් උපයන්ට වුහ. එසේ කොට එම බයිබලය රැගෙන ආපසු ඔවුන්ගේ ගම්මානයට යන පිනිස ඔව්හු පැමිණ තිබුනි. මට ඇමරිකාවෙන් බයිබල් ලැබී තිබුනු නිසා පැරණි ඉරී ගිය බයිබලයක් නොව අළුත් බයිබලයක් ඔවුන් අතට පත්කරන්නට මට හැකිවුනි. ඔවුන්ට ඔවුන්ගේ ඇස් අදහාගත නොහැකි විය. ඔවුන් ඉපැයු මුදල් වලින් මට ගෙවීමට ඔව්හු උත්සහ කලෝය. මම ඔවුන්ගේ මුදල් ප්‍රතික්ෂේප කලෙමි. ඔව්හු බයිබලය රැගෙන ඔවුන්ගේ ගම්මානයට ඉක්මන් ගමනින් යන්ට විය. ටික දිනකට පසු ශුද්ධ ලියවිල්ල ගැන මා හට ස්තුතිකරමින් කිව නොහැකි තරම් ප්‍රීති ප්‍රමෝදයට පත්වු පිරිසගෙන් ලිපියක් මා හට ලැබුනි. එය එම ගම්මානයේ වැසියන් කිප දෙනෙකු

විසින් අත්පත් කරනු ලැබ තිබුනි. ඔව්හු ඉතා ප්‍රවේශම් සහගතව බයිබලය කොටස් තිහකට බෙදාගෙන එකිනෙකා අතර හුවමාරුකරගෙන තිබුනි.

තමුන්ගේ ආත්මය පෝෂණය කිරීම පිනිස බයිබලයෙන් පිටුවක් ඉල්ලමින් හිගාකන රුසියානුවෙකු ගැන ඇසීම කොතරම් දුක් උපදවන දෙයක්ද? ඔව්හු බයිබලයක් වෙනුවෙන් එළි හරකෙකු හෝ එළුවෙකු හුවමාරුකරගන්ට තරම් ප්‍රීතියෙන් සිටිති. එක් මනුෂ්‍යයෙක් ඔහුගේ මගුල් මුද්ද ඉරිගිය අලුත් ගිව්සුමක් සඳහා විකුණුවේය. බොහෝ ළමයින් නත්තල් කාඩ්පතක් දැක නැත. ඔවුන්ට එවැන්නක් තිබුනි නම් ගම්මානයේ සියලු ළමයින් එක්ව ඒ වටා රැස්වෙන අතර මහලු මනුෂ්‍යයෙකු ඔවුන්ට ළදරු යේසුතුමා පිළිබඳව, උන්වහන්සේගේ කන්‍යා උත්පත්තිය ස ක්‍රිස්තුස්වහන්සේගේ කථා සහ ගැලවීම පිළිබඳව තොරතුරු පැහැදිලි කරන්නේය. මේ සියල්ල එක නත්තල් පතකින් සිදුවේ! අපි බයිබල්, සුවිශේෂ පොත්, ක්‍රිස්තියානි පොතපත මෙකී සීමා කිරීම් වලට ලක් වු ජාතීන් වෙත යවමු. ඔබට යම් දෙයක් කල හැකි එක් මාර්ගයක් මෙලෙස ඉදිරිපත් කරමි.

රුසියානුවෙකු තම ආත්මය පෝෂණය කරගැනීම



පිනිස බයිබලයෙන් පිටුවක් ඉල්ලා හිගමනේ යනවා ඇසනු ලැබීම කෙතරම් ඛේදජනකද?

බාලාංශයේ සිට විශ්ව විද්‍යාලය දක්වා ළමයින්ට හා තරුණයින්ට සපයනු ලබන අදේවවාදි විෂ සහිත පොතපතට විරුද්ධව ලියැවුනු විශේෂ පොත් පත් පවා අපි මුද්‍රණය කොට යවමු. සෝවියට් සංගමය තුල කොමියුනිස්ට්වරු අදේවවාදීන්ගේ "බයිබලය" නමින් සුප්‍රකට පොතට අදේවවාදී මගපෙන්වීම් පොතනම් වු පොතක් මුද්‍රණය කෙරේ. එය සරල භාෂාවෙන් බාලාංශ ළමයි සඳහා ඉගෙනගැනීමට හැකි පරිදි සකසා ඇත. එම පොතම ළමයි ක්‍රමක්‍රමයෙන් වැඩෙත්ම වඩ වඩා සංකීර්ණ ආකාරයට ඔවුන්ට උගන්වනු ලැබේ. මේ නපුරු "බයිබලය" ළමයින් වැඩෙන විට සහ ඔවුන් උසස් පන්ති වලට යන විට ඔවුන් අනුගමනයකරති. එය සියලු ආකාර වලින්

ඔවුන් වෙත අදේවවාදී විෂ නිකුත් කරයි. අපි අදේවවාදී අත් පොතට පිළිතුරු යනුවෙන් පොතක් මුද්‍රණය කොට යැව්වෙමු. එය විෂ සහිත අදේවවාදී ඉගැන්වීම් වලට කිතුණු පිළිතුර විය.

අපගේ, මේකී අදේවවාදී විෂෙන් මත්වුනු තරුණයන් හට පිළිතුරක් තිබි යුතුය. දෙවියන්වහන්සේගේ පිළිතුර, කිතුණු පිළිතුර, අපගේ පිළිතුර ඔවුන්ට තිබිය යුතුය! ඔබට කල හැකි තවත් දෙයක් තිබේ. දෙවියන්වහන්සේව "නිති විරෝධි" කර තිබෙන ජාතීන් වෙත විශේෂ පොත පත සැපයීමට උදව්කරන්ට ඔබට පුළුවන. එබදු පොත පතට, තරුණයන් වෙත යවනු ලබන පොත පත සහ ළමා බයිබල් වැනි දෑ ඇතුලත් කල හැකිය.

අපි රහසිගත සභාවේ සමාජිකයින් සමග "අතිනතගෙන" ක්‍රියාකල යුතුය. එසේ කරමු. පුද්ගලයෙකුගෙන් පුද්ගලයෙකුට ශුභාරංචිය ගෙන යාම පිනිස ශුභාරංචි පොත් සමග ගමන් කිරීමට මූල්‍ය පහසුකම් අපි ඔවුන්ට සපයනු ලැබේ. බොහෝ දෙනෙක් ගමන සඳහා ප්‍රවේශ පත්‍ර මිළදී ගත නොහැකිව ගමනේ යෙදෙන අතරතුරේදී ආහාර සඳහා මුදල් නොමැතිව ඔවුන්ගේ නිවෙස් වල "විලංගු ලා" සිටිති. එලෙස ඔව්හු අතරමංව සැතපුම් 20-30 හෝ ඇතින් පිහිටි ගම්මාන වලට යාගත නොහැකිව රහසිගත රැස්වීම් වලට පැමිණෙන ලෙස අන්‍යයන් වෙත නිශ්චල කැඳවීමක් කරමින් සිටිති. මුදල් සැපයීම තුලින් සෑම මාසයකදීම ඔවුන්ට මේකී "විලංගු වලින් මුදවාගැනීමට" අපට පුළුවන. එලෙස එකී කැඳවීම් වලට පිළිතුරු දීමට ඔවුන්ට පුළුවන. දේව වචනය සමග දුරබැහැර නගර හා ගම්මාන වලට යෑමට අපට පුළුවන.

උදාහරණ වශයෙන් අපි වියට්නාම් හා චීන දේවගැතිවරුන් වෙනුවෙන් මෝටර් සයිකල් මිළදී ගනිමු. ඔව්හු ඒවායින් ඔවුන්ගේ ජාතීන් වල "තහනම් කරන ලද ප්‍රදේශ වලට" ශුභාරංචිය ගෙනගොස් බෙදාගන්නෝය. සාක්ෂිදැරීම මහත් අවදානමක්ව පතින්නාවූ මුස්ලිම් බංග්ලාදේශය තුල ඉවැන්ජිලිස්තවරුන් සඳහා අපි බයිසිකල් සැපයුවෙමු.

කිතුණු ගිහියන් හා ගිහි කාන්තාවන් හට මුදල් උපකාර සැපයිය යුතුය. කිතුණුවෙකු වීමෙන් පසු ඔව්හු ජීවත්වීමට ප්‍රමාණවත් මුදලක් උපයන්නේ ඉතාමත් අමාරුවෙනි. ගමින් ගමට ගොස් ශුභාරංචිය පැවසීමට ඔවුන් අත කිසිවක් ඉතුරු නොවේ. එබැවින් මසකට ඩොලර් කීපයක් හෝ ඔවුන් වෙත සැපයුම "හාස්කමක්" බදු දෙයකි.

නිල සභා වල දේවගැතිවරු ඔවුන්ගේ සේවයට අමතරව මහත් අවදානමකින් යුතුව ඊට සමාන්තරගත රහසිගත සේවා වල නිරතවෙති. මෙකී අරමුණු සඳහා ඔවුන්ට මුදල් සැපයිය යුත්තේ රහසිගතවය. නිතිරීති නොසලකාහරිමින් තමුන්ගේ නිදහස ද අවදානමට ලක්කරමින් ළමයින්ට, තරුණයින්ට හා වැඩිහිටියන්ට රහසිගත රැස්වීම් තුල දී ශුභාරංචිය දේශනාකිරීමට මෙකී දේවගැතිවරු තුල කැමැත්ත තිබීම පමණක් ප්‍රමාණවත් මදිය. ඔවුන්ගේ ඵලදායක රහසිගත සභාවේ එබදු සමාජිකයෙකුට ඒකී අරමුණු සඳහා උපකාරකිරීම පිනිස මුදල් ලබාදීම මගින් ශුභාරංචිය පතුරුවාහැරීම බලවත්කෙරේ.

ඊළඟට ගුවන් විදුලිය මගින් අපි වහල් ජාතීන් වෙත ශුභාරංචිය විකාශනයකරමු. නිදහස් ලෝකයේ මධ්‍යස්ථාන භාවිතා කරමින් අපට රහසිගත සභාව ආත්මිකව පෝෂණයකරන්ට පුළුවන. රහසිගත සභාවට ජීවනයේ රොටි වල මහත් අවශ්‍යතාවක් තිබේ. කොමියුනිස්ට් ආණ්ඩු ඔවුන්ගේ ප්‍රචාරක වැඩ පිළිවෙලවල් ඔවුන්ගේ සෙනඟ වෙත පතලකරගැනීම පිනිස කෙටි තරංග ගුවන් විදුලිය භාවිතාකරන බැවින් සීමා කිරීම් වලට ලක්වී ඇති ජාතීන් තුල කෝටි සංඛ්‍යාත මනුෂ්‍යයන් අත මෙකී විකාශනයන් ලබා ගත හැකි ගුවන් විදුලි යන්ත්‍ර තිබේ. වහල් ජාතීන් වෙත ගුවන් විදුලිය මගින් විකාශනයකිරීමට මෙලෙස දොරටු විවෘතව පවති. මේ වැඩ පුළුල් කල යුතුය. මෙකී සීමාකිරීම් වලට ලක්ව ඇති රටවල රහසිගත සභාව වෙත උපකාර කල හැකි තවත් ආකාරයක් මෙලෙස සඳහන්වේ.

## *කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වල ඛේදවාචකය*

කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වලට පවා අපගේ උපකාරය අවශ්‍යය. දහස් සංඛ්‍යාත මෙබදු පවුල් කිව නොහැකි තරම් වු ඛේදනිය තත්වයකින් පීඩා විඳිති. රහසිගත සභාවේ සමාජිකයෙකු අත්අඩංගුවට ගත් විට ඔහුගේ පවුල කිවනොහැකි තරම් පීඩා වලින් පහරකති. එබදු අයෙකුට උපකාර කිරීම සාමාන්‍යයෙන් නිති විරෝධිය. මෙය ආණ්ඩු විසින් හොඳින් සැලසුම්කර ක්‍රියාත්මකකරන දෙයකි. එමගින් භාර්‍යාවන්ගේ හා අත්හරිනු ලබන දරුවන්ගේ වේදනා විඳීම් වැඩිවෙති. කිතුණුවෙකු සිරගෙයට යැවු විට නිතරම වධබන්ධන වලට ලක්වේ. එසේ නැතහොත් මරණයට පත්වෙයි. වේදනා විඳීම පමණක් එහිදී ආරම්භවෙයි. ඔහුගේ පවුල කෙලවරක් නැතුව වේදනා විඳියි. පීඩා විඳියි. නිදහස් ලෝකයේ සාමාන්‍ය කිතුණුවන් මා හටත් මාගේ පවුලටත්

උපකාර නොකලේ නම් මේකී වචන කියන්නට අපි ජිවතුන් අතර කිසිවිටකත් නොසිටිතැයි මට කාරණයක් හැටියට සඳහන් කරන්ට පුළුවන.

සියලු කාලවල වැඩි වැඩියෙන් ප්‍රාණ පරිත්‍යාගීවරු බිහිවෙති. ඔව්හු සොහොන් කරා ගමන්කරතත් ඔවුන්ගේ විපාකය ලබතත් ඔවුන්ගේ පවුල් අතිශයින් කණගාටුදායක වාතාවරණයක් තුල ජීවත්වෙති. අපට, ඔවුන්ට උපකාරකිරීමට පුළුවන; උපකාර කල යුතුය. ඇත්තවශයෙන්ම අපි කුසගින්නේ පීඩාවිඳින ඉන්දියානුවන්ට හා අප්‍රිකානුවන්ට පවා උපකාර කල යුතුය. එහෙත් කිතුණුවන්ගේ උපකාරය වඩා ලැබීමට අයිතියක් ඇත්තේ මේකී පවුල් වලට වඩා ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් මිය ගියාවූ තැනැත්තන්ගේ පවුල් වලටය. එසේ නැතහොත් සීමා කිරීම් පනවා ඇති ජාතීන් තුල සිරගෙවල් වල ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් වධබන්ධන වලට ලක්ව සිටින තැනැත්තන් හටය.

මා නිදහස් කල තැන් පටන් “ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ” නැමැති සංවිධානය කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වලට මේ වන විටත් බොහෝ උපකාර යවා ඇත. මේ දක්වා අප කර තිබෙන දෙය ඔබගේ උපකාරය ඇතිව අපට කරන්ට හැකි දෙය සමග සැසඳුවහොත් ඉතා කුඩාය.

## *රහසිගත සභාවේ සිට ඔබට කෙරෙන මාගේ පනිවිඩය.*

රහසිගත සභාවේ සිට ගැලවී, බේරී පලා ආ සාමාජිකයෙකු හැටියට මා විසින් එහි අත්හැර දමා ආවාවූ මාගේ සහෝදරයන්ගේ ආයාචනයක්, අභියාචනයක්, පනිවිඩයක් මම ඔබ වෙතට ගෙනෙන්නෙමි.

මේ පනිවිඩය ඔබට ඉදිරිපත්කිරීමට ඔව්හු මාව එවා තිබේ. හාස්කමක අයුරින් එය බෙදාහැරීමට මම ආරක්ෂිතව සිටින්නෙමි.

කොමියුනිස්ට් ලෝකය වෙත සහ වෙනත් වහල් ජාතීන් වෙත ක්‍රිස්තුස්වහන්සේව ගෙන ඒමට ඇති හදිසිය මම ඔබට පවසා ඇත්තෙමි. කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වලට උදව්කිරීමට ඇති බලවත් ඕනෑකම මම ඔබට පවසා ඇත්තෙමි. ශුභාරංචිය බෙදාහැරීමේ දූත මෙහෙවර ඉටුකිරීම පිනිස රහසිගත සභාවට උපකාරයක් විය හැකි ආකාරයෙන් ප්‍රායෝගික ආකාර වලින් මම ඔබට කථාකර ඇත්තෙමි.

මාගේ දෙපා වල පත්ලට පහර දෙන විට මාගේ දිව කෑ ගැසුවේය. මාගේ දිව කෑගැසුවේ මන්ද? එයට පහරදුන්නේ නැත. එය කෑගැසුවේ දිවත් පාදයත් එකම ශරීරයේ කොටස් බැවිනි. සීමා කිරීම් වලට ලක්ව ඇති ජාතීන් තුල දැන් පහර ලබන එකම ක්‍රිස්තු ශරීරයේ කොටසක් හැටියට නිදහස් කිතුණුවන් වන ඔබ ද අයත්ව සිටී. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් වූ ප්‍රාණ පරිත්‍යාගීවරුන්ට දෙන්නට ඔබත් බැදී සිටී. ඔබට අපගේ වේදනාව දැනෙන්නේ නැද්ද?

මුල් සභාවේ සියලු අලංකාරත්වය තුල යාගවීම හා කැපවීම තුල මෙකී රටවල් තුල නැවතත් ජීවමාන බවට පත්ව ඇත.

ගෙත්සමෙනි උද්‍යානයේ දී ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම වූ නාටකයට මදක් ඈතින් ගලක් ගසන තරම් දුර ඈතින් පේත්‍රුස්, යාකොබ් සහ යොහාන් ගැඹුරු නින්දක වැටී සිටින විට අපගේ ස්වාමී වූ යේසුස්ක්‍රිස්තුස්වහන්සේ යාච්ඤාව තුල මහත් වූ වේදනාවකින් වැතිර සිටියේය. ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ සභාවේ සහනය සඳහා කිතුණුවන් කොපමණ සැලකිල්ලක් දක්වන්නේද? සීමා කිරීම් වලට යටත්ව තිබෙන ලොව පුරා පවතින ජාතීන් තුල සිටින ඔබගේ සහෝදර සහෝදරියන් හට උපකාර පිනිස ඔබගේ නාමයෙන් කල යුතුව තිබෙන දෙය කුමක් දැයි ඔබගේ නායකයින්ගෙන් විමසන්න.

මෙකී රටවල මුල් සභාව තුල පැවතියාක් මෙන් සිදුවීම්, නිර්භීතකම් සහ ප්‍රාණ පරිත්‍යාගීවරුන් බිහිවීම් නැවතත් ඇතිවෙමින් පවති. දැනුත් එය වෙමින් පවති. එහෙත් නිදහස් සභාව තවමත් නිදන්නීය.

අපගේ සහෝදරවරු එහිදි තනිව කිසිදු උපකාරයක් නැතුව 20 වන ශතවර්ෂයේ ඉතාමත් ධෛර්‍යාත්මක සහ ශ්‍රෙෂ්ඨතම සටනෙහි නිරතවෙමින් සිටින්නෝය. එය මුල් සභාවේ පැවති වීරෝධාරකමට ධෛර්‍යමත්කමට සහ කැපවීමට සමානය: පේත්‍රුස්, යාකොබ් සහ යොහාන් ඔවුන් ගැලවුම්කාරයාණන්ගේ වේදනාත්මක මොහොතේදී නිදා සිටියාක් මෙන්ම රහසිගත සභාවේ මහත් වූ පොරබැදීම් සහ වේදනාත්මක මොහොත ගැන අවධානය නොමැතිකමින් නිදහස් සභාව තවමත් නිදන්නීය.

ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සහෝදරයින් ශුභාරංචිය වෙනුවෙන් සටන්කරද්දී, වේදනා විදිද්දී ඔබ තවමත් නිදා ඉන්නේද?

ඔබට අපගේ පනිවිඩය ඇසෙනවාද? "අපව සිහිපත් කරන්න. අපට උපකාර කරන්න."

"අපව අත්නොහරින්න."

දැන් මම විශ්වාසවන්ත, ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ සභාවේ පනිවිඩය ඔබ වෙත ඉදිරිපත්කලෙමි. අදේවවාදි කොමියුනිස්ට්වාදයේ බැම්ම තුල වේදනා විඳින ඔබගේ සහෝදරයන් සහ සහෝදරියන්ගේ පනිවිඩය ඔබට ඉදිරිපත් කලෙමි. ඉන්දුනිසියාවේ සිට අප්‍රිකාව දක්වා ලොව හරහා පහරකමින් සිටින රහසිගත සභාවේ පනිවිඩය ඔබ වෙත ඉදිරිපත් කලෙමි. ඔවුන්ව අත් නොහරින්න.

## අවසානය



# කථාකිරීමට නිර්භීත වු මනුෂ්‍යයා

කෲර වු රුමේනියානු කොමියුනිස්ට් ආණ්ඩුවේ ක්‍රියා කලාපයෙන් බේරී පලා ඒමට හැකි වු ප්‍රථම කිතුණු නායකයා දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් නොවේ. ඔහුට කලින් ආ අය සිටිති. එහෙත් රහසිගත සභාවේ සිටින තැනැත්තන් විසින් විඳිනු ලබන වේදනාවන් ගැන බටහිර ලෝකය නොදැන සිටියේය. කිසිවකු කථා නොකලේ මන්ද?

මෙයට පිළිතුරු වශයෙන් පෙනියන්නේ දේවගැති වර්ම්බ්‍රාන්ඩ් හට රුමේනියාවෙන් පිටවන්නට ඉඩ ලැබුනු විගස කොමියුනිස්ට්වරුන්ට විරුද්ධව කථා නොකරන ලෙස රහස් පොලිසියේ නිලධාරීන් ඔහුට අනතුරු අඟවා තිබුනු හෙයිනි. බටහිර ලෝකයේ ඔවුන්ට ඒජන්තවරු සිටින බවත් ඔව්හු වර්ම්බ්‍රාන්ඩ් ගැන සුපරීක්ෂාකාරීව සිටින බවත් පැහැදිලිව පවසන ලදී. තවද ඔහු කථා කලයුත්තේ මන්ද? ඔහු ඇති තරම් වේදනා විඳ නැත්තේද?

එහෙත් වර්ම්බ්‍රාන්ඩ් කතා කලේය. කොමියුනිස්ට් තර්ජන හා සමහර සභා නායකයින් විවේචන මධ්‍යයේ වුවද, කොමියුනිස්ට් නරකාදියෙහි පීඩාවන් දරාගන්න තැනැත්තන් ගැන ඔහු සාක්ෂි දැරුවේය. තවද, ඔවුන්ගේ ජයගන්නාවු ඇදහිල්ල ගැන ඔහු කථාකලේය.

එක්සත් ජනපදයෙහි ඔහු ගත කල පළමු වසර තුල දේවගැති වර්ම්බ්‍රාන්ඩ්ව දෙවරක් අත්අඩංගුවට ගන්නා ලදී. එසේ කරන ලද්දේ

කොමියුනිස්ට්වරුන්ට සහයෝගය දක්වන මහජන රැස්වීම් සඳහා “බාධා කල හෙයිනි.” සෙනෙට් සභාව ඉදිරියේ සාක්ෂිදරන පිනිසද ඔහු කැඳවන ලදි. නිතර වධදීම් වලට ලක් කිරීමෙන් හටගත් තුවාල කැලලි 18ක සලකුණු ඔහු තම බැනියම ඉවත් කිරීමෙන් එහිදි සෙනෙට් මණ්ඩලයට දැන්නුවේය. තනි සිර මැදිරියක සිටීම හේතුකොටගෙන තම මනස ව්‍යාකූල තත්වයකට පත්වූ පිස්සකු ලෙස සමහර කිතුණු නායකයින් ඔහු හැඳින්විය. වෙනත් අයට ඔහු “යකඩ කඩතිරය පිටුපස සිටි පාවුල්” හෝ “රහසිගත සභාවේ හඬ” බවට පත්විය. පිලඩෙල්පියා හෙරල්ඩ් පුවත්පතෙහි වාර්තාකරුවෝ වර්ම්බ්‍රාන්ඩ් ගැන පැවසුවේ “ඔහු සිංහයින් මාධ්‍යයේ සිටි නමුත් සිංහයින්ට ඔහුව විනාශ කල නොහැකි විය.” යන්නයි.

1967 ඔක්තෝබර් මස ඩොලර් 100ක් සහ පැරණි යතුරු ලියනයක් අතැතිව රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් “ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ” නැමැති ප්‍රවෘත්ති පත්‍රයෙහි මුල් පිටපත ඔහු මුද්‍රණය කලේය. ඒ සඳහා නම් හා ලිපිනයන් 500ක් ඔහු සතුව තිබුනි. මෙම කුඩා ප්‍රවෘත්ති පත්‍රය කැපකරන ලද්දේ ලොව පුරා සීමාකිරීම් වලට ලක්ව සිටින ජාතීන්ගේ රටවල වෙසෙන අයගේ සහෝදර හා සහෝදරියන් සාක්ෂි හා පීඩාවිදීම් ගැන සංනිවේදනය කරනු පිණිසය.

මේ ප්‍රවෘත්ති පත්‍රය වෙනත් කිසිවක් මෙන් නොවීය. පාඨකයෝ ඔහු විසින් විස්තර කල දරුනු වධබන්ධන පිළිබඳව හද තැති ආකාරයකින් වර්ම්බ්‍රාන්ඩ් හට ලියා යැව්වෝය. “මෙය සත්‍යය විය හැක්කේ කෙලෙසද?” යනුවෙන් ඔවුන් ප්‍රශ්නකලෝය. වෙනත් අය ඔහුට ලියා එව්වේ මේ ප්‍රවෘත්ති පත්‍රය ඔවුන්ට භයංකර සිහින දකින්නට පැමිණි වගත් එය නැවත ඔවුන් වෙත ලබා නොදෙන ලෙසත්ය. වේදනා විදීම් හා වධබන්ධන අභිබවා ඔවුන්ව දුටු අය - ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කල පුරුෂයින්ගේ, කාන්තාවන්ගේ හා කුඩා දරුවන්ගේ කථා අලංකාර හදවත් වල - අලංකාරත්වය පවා දුටුවෝය. ක්‍රිස්තුස්වහන්සේගේ වේදනා විදීම් සමඟ පංගුකාරවීම තුල ප්‍රීතියට පත්ව, “දේවගැති වර්ම්බ්‍රාන්ඩ් මෙන් සිරගෙදර යකඩ පොලු සිපගන්නට” තරම් හැකියාවක් සමඟ ජීවමාන ඇදහිල්ලක් අනිත් පාඨකයන් විසින් ලබාගත් බව ඔව්හු සාක්ෂිදැරුවෝය.

බටහිර ලෝකය තුල, කිතුණුවන්ට පීඩා කිරීම නිතරම “මානුෂික අයිතීන්” පිළිබඳ කාරණයක් ඉස්මතු කරවයි. එමගින් ආගමික නිදහස

සහතික කරලීමට රජයට අවධාරණය කිරීමක් හා එහි ආරක්ෂාව ලබාදීමට කාරණයක් ඉස්මතු කරවයි. තවද, මෙය යම් පමණකට සත්‍ය වුවද, අපි මානුෂික හේතු දැක්වීම් වලින් ඔබ්බට හා ස්වර්ගයක් තුලට එබී බැල්ම අවශ්‍යය. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක. "සේවකයෙක් තමාගේ ස්වාමියාට වඩා උතුම් නැත" (යොහාන් 15:20). "ලෝකය තුල නුඹලාට පීඩා ඇත්තේය" යනුවෙන් උන්වහන්සේ අපට අනතුරු ඇඟවූසේක (යොහාන් 16:33). තවද "මාගේ නාමය නිසා නුඹලා සියල්ලන්ගේ වෛරයට ලක්වෙනවා ඇත" මතෙව් 10:22). "ප්‍රීති වෙයන්න! මහත් සේ ප්‍රීති වෙයන්න. මක්නිසාද නුඹලාගේ විපාකය ස්වර්ගයේදී මහත්ය" (මතෙව් 5:12).

අවශ්‍යතාවයෙන් පෙලෙන අයට උපකාර කිරීම පිණිස සෑම අවස්ථාවක්ම ගැනීමට අපව කැඳවනු ලැබ තිබුනද, පීඩා කරනු ලැබීමට ලක්වීමට කිතුණුවන්ට "අයිතියක්" ඇති බව හඳුනා ගැනීමට අවශ්‍යය. ගෝලයින් 12 දෙනා ගෙන් 11 දෙනෙක්ම මරා දමනු ලැබූහ. අප හට එය ඊට වඩා වෙනස් දෙයක් නොවන බව යේසුස්වහන්සේ පැවසුසේක. ක්‍රිස්තුස්වහන්සේ තුල සිටින අපට එය අයත් වන කොටසකි. දේවගැති වර්ම්බ්‍රාන්ඩ් විඳි ආකාරයට පීඩා විඳිනු ලැබීමට අප සියලු දෙනාම කැඳවා නොමැත. එහෙත් පීඩාව පැවති කල අපි පුදුම විය නොයුත්තෙමු. ඒ වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් පීඩා විඳීමට වටිනා අය ලෙස සැලකීම ගැන අපි ප්‍රීති විය යුත්තෙමු. ඒ මන්දයත් උන්වහන්සේ මෙලෙස පවසා තිබුනි. "ධර්මිෂ්ටකම නිසා පීඩා විඳින තැනැත්තන් ආශිර්වාද ලද්දෝය. ඒ මක්නිසාදයත් ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය" (මතෙව් 5:10).




1 කොරින්ති 12:25, 26 තුල පාවුල් ක්‍රිස්තු ශරීරයේහි සාමාජිකයන් අතර පැවතිය යුතු සම්බන්ධතාවය දන්වයි. "නමුත් ශරීරයෙහි කිසි භේදයක් නොව අවයව එකිනෙක ගැන එකාකාර සලකන පිණිසය, දෙවියන්වහන්සේ අඩුකම් ඇති කොටසට වඩා නම්බු දී ශරීරය සංයෝජනය කල සේක. මෙසේ එක අවයවයක් වේදනා විඳී නම් ඒ සමඟ සියලු අවයවයෝම වේදනා විඳිති. නොහොත් එක අවයවයක්

නම්බු ලබයි නම් ඒ සමග සියලු අවයවයෝ ප්‍රීති වෙති.” හේබ්‍රෙව් පොතෙහි රචකයා මෙසේද ලියයි. “නුඹලාත් බැඳිසිටින්නාක් මෙන් බැඳුම් වල සිටින්නන්ද, නුඹලාත් ශරීරයෙහි සිටින බැවින් දුක්විඳින්නන්ද සිහිකරපල්ලා” (හෙබ්‍රෙව් 13:3). 1967 දි පටන් “ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ” නැමැති සංවිධානයේ තේමාව මේ පදයයි.

පීඩාව පොළව මතදී සභාවට කිසිදාක අමුතු දෙයක් නොවන බවත්, එය කිසි දිනකදී අනාගතය තුලද අමුතු දෙයක් නොවන බවත් නව ගිවිසුම අධ්‍යනය කල විට අපට පැහැදිලි වේ. එබැවින් ශරීරයෙහි සමාජිකයන් ලෙස අපට “එකිනෙකාව ධෛර්‍යමත්කිරීමටද, එකිනෙකාව ගොඩනැගීමටද” යුතුකමක් තිබේ. (1 තෙස. 5:11). ක්‍රිස්තුස්වහන්සේ ආපසු එනතුරු එසේ කරන්ට ඕනැය. එසේ නොකිරීම මගින් අපගේ කිතුණු වගකීම ප්‍රතික්ෂේප කිරීමක් අපි කරමු. එමෙන්ම යේසුස්වහන්සේගේ ඉගැන්වීමද ප්‍රක්ෂේප කරමු.



> ඉස්ලාම් රටවල් තුල පසු ගිය දශකය මුළුල්ලේ දිනකට කිතුණුවන් හාරසියයක් පමණ ප්‍රාණ පරිත්‍යාගිවරු බවට පත්වෙති.

මේ හේතුව නිසාම, ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ ආසන්න වශයෙන් රටවල 40 කට සේවය කරයි. එහිදී ලොව වටා සිටින අයගේ සහෝදර, සහෝදරියන් වෙත සේවය කරයි. මොවුහු ක්‍රමානුකූල පීඩාවකට ලක්ව සිටින අයවලුන්ය. වියට්නාමය, ලාඕසය හා චීනය තුල කිතුණුවන්ට පහර දෙනු ලැබ මරාදැමීම හෝ සිරගතකිරීම සිදුකරති. ඔවුන්ගේ සභාවන් විනාශකරනු ලබන අතර ඔවුන්ගේ බයිබල් පුළුස්සා දමනු ලැබේ. පසුගිය දශකය තුල ඉස්ලාම් රටවල දිනකට කිතුණුවන් හාරසිය දෙනකු පමණ ප්‍රාණ පරිත්‍යාගීවරුන් බවට පත්වුහ. අන්තවාදී ඉස්ලාමීය හමුදා සූඩානය තුල කෝටි ගණන් කිතුණුවන්ව විනාශ කර ඇත. ඔව්හු කිතුණු මනුෂ්‍යයින් දහස්ගණන් කුරුපත් කර ඇත. එසේ නැතහොත් නයිල් ගංගාවේ ගිල්වා දමා ඇත. වෙනත් අයව එසේ කුරුසපත් කොට හෝ එල්ලා දැම්මට නියම්තව සිරගත කරනු ලැබ තිබේ. සූඩාන කාන්තාවන්ව දූෂණය කරනු

ලබන අතර ඔවුන්ගේ දරුවන්ව ඔවුන්ගේ නිවෙස් කෙරෙන් පැහැර ගෙන ගොස් උතුරේ සිටින මුස්ලිම්වරුන්ට වහලුන් පිනිස හෝ අන්තඃපුර සඳහා හෝ විකුණාදමති. තවද මෙකී බේදවාචකය හමුවේ සුඩාන කිතුණුවන් මෙසේ සඳහන් කරති. "අපගේ නිවෙස් පුළුස්සා දමනු ලැබුවද අපි මනුෂ්‍යයින්ට වඩ වඩා ක්‍රිස්තුස්වහන්සේව දේශනාකිරීමට තරයේ අදිටන්කරගෙන සිටිමු."

ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් අපට "දීමනාවක්" ලෙස දෙනු ලැබ තිබෙන වේදනා විඳීම් වලට එකතුවීම පිනිස මනුෂ්‍යයා විසින් දන්නාවූ බරපතලම වේදනාවිඳීම් සමහරක් අතරේදී ප්‍රීතිය හා නිදහස එකිනෙකා සමග අතිනත් ගෙන පවතින ආකාරය තේරුම්ගැනීම අපහසුය (පිලිප්පි 1:29). එහෙත් ක්‍රිස්තුස්වහන්සේ සමග සදාකාලයටම ජීවත්වන පිනිස යන්නාවූ ඉරණමක් සහිත ආත්මික මනුෂ්‍යයා තුල මානුෂික අවබෝධය සඳහා ඇත්තේ සුළු ඉඩකඩකි.

"ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ" නැමැති ප්‍රවෘත්ති පත්‍රය යේසුස්ක්‍රිස්තුස්වහන්සේ තුල තම ඇදහිල්ල සඳහා වේදනා විඳින්නාවූ තැනැත්තන්ගේ තත්වය නිදහස් ලෝකය පුරා කිතුණුවන්ට තොරතුරු දන්වන අතර ඔවුන්ට ක්‍රියාමාර්ග ගනු පිණිස ඉඩ සලසාදෙයි.

ලොවපුරා අපගේ කාර්‍යාල ජාලය තුලින් මෙම ප්‍රවෘත්ති පත්‍රය වර්තමානයේදී භාෂා 30කින් මුද්‍රණය කොට බෙදාහරිනු ලබන අතර සෑම මසකදීම ඇදහිලිවන්තයින් දෙලක්ෂ පනස්දාහක් හට බෙදා දෙනු ලැබේ.

1. කිතුණුවන් වෙත බයිබල් හා පොතපත සැපයීම පිනිස හා කිතුණුවන්ට පීඩාකරනු ලබන අවස්ථා වලදී එකී සීමා කිරීම් වලට ලක්කරනු ලබන ජාතීන් තුල ඔවුන්ගේම භාෂාවෙන් ගුවන් විදුලි වැඩ සටහන් පවත්වාගෙන යාම.

2. ලොව පුරා මෙකී ප්‍රදේශවල කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ පවුල් වලට සහනය ලබා දෙන පිනිස.

3. කොමියුනිස්ට්වාදී පීඩා කිරීම් වලින් පීඩා විඳින රටවල ඇදහිලිවන්තයින්ගේ ජීවිත හා සාක්ෂින් නැවත ගොඩ නැගීම පිනිස ඇදහිලිවන්තයින්ට උපකාරකරන්නා වූ ධෛර්‍යමත්වීම් හා සම්බන්ධ යෝජනා ක්‍රම පවත්වාගෙන යනු පිනිස.

4.ශුභාරංචියට විරුද්ධවුවන් ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගැනීම පිනිස.

5. කිතුනුවන්ට විරුද්ධව ක්‍රියාත්මක කරනු ලබන බේදවාචික පීඩාවන් පිළිබඳව ලොවට තොරතුරු දන්වමින් සහ පීඩාවට ලක්වෙන්නන්ගේ ධෛර්ය හා ඇදහිල්ල පිළිබඳව තොරතුරු දැක්වීම.

අපි මේ දේව සේවාව තුල නිරත වන ලෙස ඔබට අරාධනා කරමු. "නුඹලාත් බැඳී සිටින්නාක් මෙන් බැඳුම් වල සිටින්නන් ද ....... සිහිකරපල්ලා "(හෙබ්‍රෙව් 13:3). ඔවුන්ගේ ඇදහිල්ල ජයගැනීම තුල ධෛර්යමත්කම ලබාගැනීමට ද ක්‍රිස්තුස්වහන්සේ තුල ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් පීඩා විදිනු ලබන්නන්ව ධෛර්යමත් කිරීම පිනිස අවස්ථාව ලබාගැනීමටද කටයුතුකරන්න.

පීඩා විදිනු ලබන සභාවන් ගැන වර්තමාන තොරතුරු ලබාගැනීමට ඔබට අවශ්‍යවේ නම් හෝ "ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඬ" නැමැති ප්‍රවෘත්ති පත්‍රයෙහි නොමිලේ පිටපතක් ලබාගැනීමට අවශ්‍යවේ නම් කරුණාකර අපට ලියන්න.

The Voice of The Martyrs
P.O.Box 443
Bartlesville, OK74005
U.S.A.
දුරකතන අංකය **(800)747-0085**
අපේ වෙබ් අඩවියෙහි ලිපිනය: www.perscution.com

## ඌනපූර්ණය



# "මරණය දක්වා විශ්වාසවන්තව"

වසර 30ක් මුළුල්ලේ මේ පොත මුද්‍රණය කරනු ලැබ තිබේ. "ක්‍රිස්තුස් වෙනුවෙන් විදි වේදනා" නැමැති මේ පොත දහස් ගණන් කිතුණු හා නොකිතුණු මනුෂ්‍යයින්ගේ ජීවිත ස්පර්ශකොට ඇත. විවිධාකාර වෘත්තිය වල යෙදුනු අය, සංස්කෘතියන්ට අයත් අය සහ ආගමික දෘෂ්ටින්ට හා සම්ප්‍රදායන්ට අයත් අයව ස්පර්ශකර තිබේ. ක්‍රිස්තියානියෙහි විවිධාකාර අංගෝපාංග ගැන එකිනෙකට වෙනස් දෘෂ්ටින් ඇත්තාවු විවිධාකාර නිකායන් තුල වුවද පීඩා විදින සහාව නැමැති පණිවිඩය මගින් හෙබ්‍රෙව් 13:3 හි ඇති පහත සඳහන් උපදෙස යටතේ බොහෝ මනුෂ්‍යයන්ව එකමුතු කරනු ලැබ පවති. "නුඹලාත් බැඳී සිටින්නාක්මෙන් බැදුම් වල සිටින්නන්ද ........... සිහිකරපල්ලා."

මීට පසු පවතින පිටු කීපයක දක්නට ලැබෙන්නේ දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්ගේ ජීවිතය සහ "ක්‍රිස්තුස් වෙනුවෙන් විදි වේදනා " නැමැති පොත පිළිබඳව කිතුණු නායකයින් කලාවු අගය කිරීමය. රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් සහ ඔහුගේ භාර්‍යාව වු සැබිනා විසින් කල විශ්වාසවන්ත දේව සේවය සඳහා දෙවියන්වහන්සේට ස්තුති කිරීමේ ආත්මයක් එමගින් ඔබ තුල ජනිතකරවතැයි අපි විශ්වාසකරමු. තවද ඔවුන්ගේ වෙහෙස මහන්සියෙහි ඵල ගැන පවා දෙවියන්වහන්සේට ස්තුති කිරීමේ ආත්මයක් ඔබ තුල බිහිවෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

# ලෝක ව්‍යාප්ත ශුභාරංචි සහභාගිත්වය
## "යේසුස්ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ලෝකය"

ජාත්‍යන්තර කාර්‍යාලය:141, Middle Rd, #05-05 GSM Building, Singapore 0718, Phone: 65-339-7900, Fax 65-338-3756

1997 සැප්. 12

ටොම් වයිට් මහතා
වොයිස් ඔෆ් මාටස්
තැ.පෙ. 443
බාර්ට්ලස්විල් ඔක්ලෝහෝමා
74005-0443
ඇ. එ. ජ.

මිත්‍ර ටොම් මහතාණෙනි,

රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් සම්බන්ධයෙන් වු ඔබගේ ලිපිය ගැන සහ "Tortured For Christ" පොතෙහි 30 වෙනි සංවත්සරය ගැන ඔබ එවු ලිපියට ස්තූතියි.

මම විවිධ රටවල් වල ගමන් කරන අතරතුර පීඩා විඳින සභාව පිළිබඳව ඔවුන් හා දන්නාවු හා අවබෝධකරගෙන ඇති දේවල් පිළිබඳව විමසු කල මා විසින් සොයාගන්නා ලද කරුණු අතර "Tortured For Christ" නැමැති පොතෙහි පළමුවරට පීඩා විඳින සභාව පිළිබඳව ඇසු අය බොහෝ දෙනෙකුට එය අභියෝගයක් සහ දෙවියන්වහන්සේ අමාරු වතාවරණයන් තුලදී ඔහුව උපයෝගිකොටගත් ආකාරය පිළිබඳව ආදර්ශයක් මහත් ආනුභාවය හා ධෛර්‍ය ගෙන දෙන එකකි. මේ පොත වේදනාවිඳිම පිළිබඳව පොතක් නොව ඉතා අමාරු වතාවරණයන්හිදී දෙවියන්වහන්සේට විශ්වාසවන්ත වන අනදම පිළිබඳව පොතකි.

පසුගිය වසරේදී මම රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් සමඟ තනිව සම්මුක සාකච්ඡාවකට එළඹුනු අතර අපගේ ස්වාමීන්වහන්සේගේ වැඩය සඳහා කැපවුනු මනුෂ්‍යයෙකුගේ මහත් වු කැපවීම පිළිබඳව ශ්‍රවණය කලෙමි. පීඩා විඳින සභාව වෙනුවෙන් යාච්ඤා කිරීමට ජාත්‍යන්තර දිනයක් ඇරඹීමේ අරමුණ ඇතිව "වොයිස් ඔෆ් මාටර්ස්" සංවිධානයට පංගුකාරවීමට මට ලැබුනු ඉඩකඩ පිළිබඳව මම කෘතඥවෙමි. තවද අදටත් ස්ථිරව පවත්නා ඔහුගේ දේව සේවය හා ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි කැපවීම පිළිබඳව බොහෝ මනුෂ්‍යයින් ඉගෙනගත් බව දැකීමෙන් මම කෘතඥවෙමි. "නුඹලා බැඳීසිටින්නාක්මෙන් බැදුම් වල සිටින්නන්ද ...... සිහිකරපල්ලා." යන ඔහුගේ යාච්ඤාව පවත්වාගෙන යැමට දැන් බොහෝ දෙනෙකු ඉදිරිපත්ව ඇති හෙයින් ඔහු ඒ ගැන ප්‍රීති වෙනු ඇතැයි මම දනිමි.

ඔබටත් ඔබගේ කාර්‍ය මණ්ඩලයටත් දෙවියන්වහන්සේ නොකඩවා ආශිර්වාද කරන ලෙස මම යාච්ඤා කරමි. ඒ අතරම මේ පොත ගැන මා කරන මෙකී සඳහන් කිරීම් විමසා එවීම ගැන මම අගයකරමි.

ක්‍රිස්තුස්වහන්සේ තුල අවංක
ඩ්වයිට් එල්. ගිබසන්
උතුරු ඇමරිකානු අධ්‍යක්ෂක

P.O. Box WEF, Wheaton II 60189-8003 U.S.A.
Tel: 630/668-0440 Fax: 630/668-0498
E-mail: WEF.NA@XC.org
Web Page: WWW.xc.org/wef

## D.James Kennedy

1997 සැප්.12

ටොම් වයිට් මහතා
වොයිස් ඔෆ් මාටර්ස්,
තැ.පෙ. 443
බාර්ට්ලස්විල් ඔක්ලෝහෝමා
74005-0443
ඇ. එ. ජ.

ටොම් මහතාණෙනි,

"රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්" යන නාමය ගැන සඳහන් කරන විට ඒ හා සබැඳිව මාගේ මතකයට එන්නේ ප්‍රථම ශත වර්ෂයේ සිට එනම් සභාවේ ආරම්භයේ සිට 2000 වසරක් දක්වා පැවති කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ වාර්තාගත කරුණුයි. මේවා දැන් 21 වන ශත වර්ෂය දක්වා විහිදෙන ප්‍රවනතාවයකින් යුතුව පවතී.

"Tortured For Christ" නැමැති ශාස්ත්‍රිය පොත ප්‍රථම වරට මුද්‍රණයකොට වසර 30ක් ගෙවනු පසු සිහිවටනයක් හැටියට වන මුද්‍රණයක් පිටකිරීමට "වොයිස් ඔෆ් ද මාටර්ස්" නැමැති මිෂනාරි සංවිධානය පියවරගැනීම නොබිඳුනු, රුධිරයෙන් නැහැවුනු සෝදිසි කිරීමක කදිම ආකාරය පිළිබිඹු කරන අතර එය වර්ම්බ්‍රාන්ඩ්ගේ ධෛර්‍යයෙන් නැහැවී තිබේ.

ලොව පුරා දේශයන් තුල යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ සභාව තුල පීඩාවන් නැවත ඉස්මතුවීගෙන එන මේ කාලයේදී ජන මාධ්‍ය විසින් එයට දැක්වෙන සැලකිල්ල සහ තොරතුරු විදුලියෙන් හුවමාරුකරගන්නා මෙවන් යුගයක මේ ගැන නොසැලකිලිමත්වීම ඛේදජනකය. දේවගැති වර්ම්බ්‍රාන්ඩ් විසින් ලියු හා කථාකරන පනිවිඩය ලොව පුරා සෑම ජනසංනිවේදන මාධ්‍ය විකාශනයන් තුලම විකාශනය කල යුතු හා මුද්‍රණය කල යුතු වටිනා පනිවිඩයකි. "Tortured For Christ" නැමැති කෘතිය උන්වහන්සේගේ බලයෙන් වැඩියෙන්ම අලෙවි වන කෘතියක් බවට පත්වීම හා එයින් නිකුත් කල අනතුරු ඇඟවීමේ හඬ හා කදිම ආයාචනය ගැන අපි දෙවියන්වහන්සේට ස්තුතිකරමු.

රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් ක්‍රිස්තියානි සමාජය වෙත සහ ලෞකික ලෝකය වෙත බෙදාගන්නාවු අසමසම වු පීඩාවිඳීමේ දේව සේවය ගැන මෙකල කාලීන වශයෙන් සැමරීමට අවස්ථාව ලැබීම ගෞරවයෙන් හා වරප්‍රසාදයක් කොට සලකමි. ඔහු අන් අයට සිහිපත්කරවන අසාර්තක නොව කදිම ආකාර වු සහ අයාචනාත්මක වු දෙයෙහි බලපෑම බයිබලයෙහි හෙබ්‍රෙව් පොතෙහි රචකයා කල බලපෑමට සමානය. එනම් "නුඹලා රධිරය සම්බන්ධයෙන් තවමත් විරෝධතාවයන් දක්වා නැත්තෙහිය." ඔහුට එය පවතින බව ඔවුන් දන්නා නිසා ඔවුන් එයට ඇහුන්කන් දුන්නහුය.

ක්‍රිස්තුස්වහන්සේ තුල අවංක
ඩී. ජේම්ස් කෙනඩි.
ජ්‍යෙෂ්ඨ දේවගැතිතුමා.

## ඇ.එ.ජ. කොන්ග්‍රසය

**නියෝජිත මන්ත්‍රී මණ්ඩලය**
**වොෂින්ටන් ඩී.ස. 20515-4610**
**1997 ඔක්.9**

### "Tortured For Christ" *නැමැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්ගේ පොතෙහි 30 වන සංවත්සරය සැමරීම*

ලෝකයේ බොහෝ රටවල වර්තමානයේ කිතුණුවන් බියෙන් ජීවත්වෙති. ඔව්හු ඔවුන්ගේ ජීවිත ගැනත් ඔවුන් ජීවත්වන ස්ථානය ගැනත් බියෙන් පසුවෙති. ලෝකයේ සමහර රටවල කිතුණුවන්ට ඔවුන්ගේ ඇදහිල්ල ක්‍රියාවේ යෙදවීම තහනම්කර ඇති අතර "ආගමික භේදවාදී ස්වරූපය" කරණකොටගෙන ඔවුන්ව එහි ගොදුරක් බවට පත්කර තිබේ. එය ඔවුන්ට අසාධාරණ ලෙස සැලකීමට මෙන්ම අමානුෂික ලෙස හා ලැජ්ජාශීලී ලෙස සැලකීමට කටයුතු කරයි. සමහර මුස්ලිම් රටවල ඉස්ලාම් දහමේ සිට කිතුණු දහමට හැරීම මරණයෙන් දඬුවම ලබන වරදකි.

ලෝක ව්‍යාප්ත පීඩාව හා කිතුණුවන් ප්‍රාණ පරිත්‍යාගීබවට පැමිනීම වැඩි වී ඇති අතර එය කොතරම් වැඩි වී ඇද්ද කිවහොත් ගතවූ ශත වර්ෂ 19ක් තුල ප්‍රාණ පරිත්‍යාගීබවට පැමිණ මුළු කිතුණුවන් සංඛ්‍යාවට වඩා වැඩි දෙනෙක් 20 වන ශත වර්ෂය තුල පමණක් ඔවුන්ගේ ඇදහිල්ල හේතුකොටගෙන මරණයට පත්වී තිබේ. කිතුණුවන්ට පීඩාකිරීම යකඩ කඩ තිරයට අයත් රටවල වල වැටීමෙන් පමණක් නිමවූයේ නැත. එසේ වුවද එය තදබල වී වේගවත් වී ඇත. මේ කාලය තුල කිව නොහැකි තරම් ගණනකින් වූ මහත් වූ මානුෂික අයිතිවාසිකම් සම්බන්ධයෙන් කථාවලට කිතුණුවනට පීඩා කිරීම හේතුවක් වී ඇත.

"Tortured For Christ" නැමැති ඔහුගේ පොත තුල දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් පවසන කථාව අදටත් ගැලපෙයි. එය මීට 30 අවුරුද්දකට පෙර තිබුනාට වඩා අදට වැදගත්ය. එමගින් වර්තමාන කාලවලදී කිතුණුවන්ට පීඩාකිරීම හේතුකොටගෙන සිදුවන සිද්ධීන් පිළිබඳව අපගේ අවධානය කැඳවයි. රුමේනියාව තුල ඔහුගේ දේව සේවය මහත් සේ අගයකරයි. එපමණක් නොව වොයිස් ඔෆ් ද මාටර්ස් නැමැති සංවිධානය සමග ඔහු තවමත් දරන්නාවූ උත්සහයන් ගැන ද මම අගයකරමි. ඔවුන්ගේ ඇදහිල්ල හේතුකොටගෙන තවමත් පීඩා විඳින කිතුණුවන් දහස් ගණන් වෙනුවෙන් ඔවුන් කරන සේවය මම අගයකරමි.

මීට අවංක,
ෆ්‍රෑන්ක් ආර් වොල්ෆ්
කොන්ග්‍රසයේ සාමාජික

# මූල්‍යමය ගණන්දීම සදහා වූ
# එවැන්ජලිකල් කවුන්සිලය

දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්
පුරෝගාමික සහ සභාපති
වොයිස් ඔෆ් මාටර්ස්,
තැ.පෙ. 443
බාර්ට්ලස්විල් ඔක්ලෝහෝමා 74005-0443

මිත්‍ර දේවගැති වර්ම්බ්‍රාන්ඩ්,

E.C.F.A. සංවිධානයේ අධ්‍යක්ෂක මණ්ඩලය හා කාර්ය මණ්ඩලය වෙනුවෙන් "Tortured For Christ" නැමැති ඔබගේ පොතෙහි 30 වෙනි සංවත්සරය හදුනාගැනීම වෙනුවෙන් මාගේ හඬද එක්කිරීමට ලැබීම මා හට වරප්‍රසාදයකි. ඔබ කෙතරම් පුරෝගාමී දේව සේවකයෙක්ද! ඔබට ඇත්තේ කෙබදු ඉදිරි දර්ශනයක්ද!

වසර ගණනාවක් මුළුල්ලේ ද වොයිස් ඔෆ් ද මාටර්ස් නැමැති සංවිධානය පීඩා විදින සභාවක් වෙනුවෙන් කථාකර තිබේ. මේකී සමහර වසර වලදී වෙනත් ප්‍රමුඛතාවයන්ගෙන් යුත් සමූදයක් තුල ඔබ විසින් උපකාරය හා යාච්ඥාව ඉල්ලා නැගූ මොරගැසීම ගිලියන්නට ඇතැයි මට සහතිකය. එතාක් ලෝකය දැන් එය අසන බව මට විශ්වාසය. වඩා වැදගත් වන්නේ යේසුස්ක්‍රිස්තුස්වහන්සේගේ සභාව එයට සවන් දෙමින් සිටින බවත්ය. එය මම විශ්වාසකරමි. ඔවුන්ගේ ඇදහිල්ල හේතුකොටගෙන පීඩා විදින අයවළුන්ගේ භයංකර තත්වය අමතනු පිනිස බොහෝ අනුගාමික ඇදහිලිවනතයයින් මාත් සමඟ ඔබට එක්වෙන බව මම විශ්වාසකරමි.

පීඩා විදින සභාවට අවධානය යොමුකිරීම පිනිස දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයට තබා ඇති විශේෂ කැඳවීමට අතිරේක වශයෙන් E.C.F.A. සංවිධානය තුල ඔබගේ සමාජිකත්වය තුලින් ඔබ ප්‍රදර්ශනය කර තිබෙන ඉහළ ආචාරධර්ම පිළිබඳව අපි අඩම්බරවෙමු. දෙවියන්වහන්සේ ඔබට ලැබෙන මූල්‍යමය ආධාර වැඩිකරන සේක්වා! ඔබගේ කාර්ය මණ්ඩලය සහ ස්වේච්ඡා සේවකයින් දරාසිටින සියළු හැකියාවන් උන්වහන්සේ වැඩිකරන සේක්වා!

මගේ සහෝදරය ඔබට ආශිර්වාදකරමි. කුරුසියේ ධජය ඔබ තදින් උසුලාගෙන සිටින විට දෙවියන්වහන්සේ ඔබව ධෛර්‍යමත්කරන සේක්වා!

මීට අවංක
පෝල් ඩී. නෙල්සන්
සභාපති

# බන්ධනාගාර සහභාගිත්ව දේව සභාව

තැ.පෙ.17500
වොෂින්ටන් ඩී.සී.
20041-0500
දු.අ. (703)478-0100
ෆැක්ස් (703)834-3658

1997 ඔක්. 07 දින

දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්
සහ එම මැතිණිය
c/o. ද වොයිස් ඔෆ් මාටර්ස්
තැ.පෙ. 443
බාර්ට්ලස්විල්
ඔක්ලොහෝමා 74005

මාගේ සහෝදරය සහ සහෝදරිය,

"Totured For Christ" නැමැති පොතෙහි 30 වෙනි සංවත්සරය සැමරීම වෙනුවෙන් උපකාරකරන්ට ලැබීම කෙබදු ප්‍රීතියක්ද?

යකඩ කඩ තිරය පිටුපස සිටින අපගේ සහෝදර සහෝදරියන්ගේ භයානක අත්දැකීම් පිළිබඳව නිදහස් ලෝකයේ හෘද සාක්ෂිය අවදිකිරීම පිනිස මේ පොත තනි උපකරණයක් සේ ක්‍රියාකලේය. අවුරුදු බොහෝ ගණනක් පෙර මම මේ පොත කියවීමෙන් ගැඹුරු හැඟීමකට පත්වුන බව සහ ඒ තුලින් මහත් ඒත්තුගැනීමක් ඇති වූ බව මට මතකය. කෝටි සංඛ්‍යාත බොහෝ දෙනාට එසේ වී ඇත.

අපි දැන කොමියුනිස්ටවාදයේ බිඳවැටීම දෙස බලමු. වර්තමාන ඉතිහාසයේ සිදුවූ අතිවිශිෂ්ට සිද්ධීන්ගෙන් එකක් වන්නේ එයයි. එය රජයේ ප්‍රතිපත්ති වලට අනුකූලව හෝ මාක්ස්වාදී දර්ශනයේ අභ්‍යන්තර අසාර්තකවීම් වලට අනුකූලව පැහැදිලිකර දිය හැකකක් නොවේ. එය ඊටත් වඩා බලවත් වූ සිදුවීම් වලින් ගහනය. ස්වාදිපත්‍යය තිබී දෙවිකෙනෙක් උන්වහන්සේගේ සෙනඟ උපයෝගීකරගැනීමකි. ඒ බොහෝ දෙනා අතරින් ඔබ වැන්නවුන් ඔවුන්ගේ ඇදහිල්ල හේතුකොටගෙන පීඩා විද තිබේ. එමගින් යකඩ කඩතුරය පිටපස සිටි සෙනඟගේ පමණක් නොව නිදහස් ලෝකයේ සිටි සෙනඟගේ ද හෘද සාක්ෂිය කලබවා අවදිකර තිබේ. එය යක්ෂාවේශ වූ කොමියුනිස්ට් අදිරාජ්‍යය බිඳදමමින් ක්‍රියාකිරීමට හැකි වූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලවත් ක්‍රියාකිරීමක් නිර්මානය කලේය.

මේ සටනේ ඉදිරි පෙරමුණේ සිටි අයෙකු හැටියට සහ දෙවියන්වහන්සේ විසින් බලවත් ලෙස පාවිච්චි කල අයෙකු හැටියට ඔබ ලොව වටා කිතුණුවන්ගේ අගය කිරීම, උපකාරය සහ ගෞරවය ලැබීමට සුදුසුය.

ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ විශ්වාසවන්ත සේවයට දෙවියන්වහන්සේ ආශිර්වාද කරන සේක්වා!

උන්වහන්සේගේ සේවය තුල සිටින
ඔබගේ විශ්වාසී
චාල්ස් ඩබ්. කොල්සන්

# වැන් නියුස් ප්‍රථම සිව්වතුරස්‍ර සභාව
# ද චර්ච් ඔන් ද වේ

රිචඩ් සහ සබිනා වර්ම්බ්‍රාන්ඩ්
ද වොයිස් ඔෆ් ද මාටර්ස්, සංස්ථාව
තැ.පෙ. 493
බාර්ට්ලස්විල්
ඔක්ලොහෝමා 74005-0443

ආදරනීය රිචඩ් සහ සබිනා

"ද චර්ච් ඔෆ් ද වේ" සභාවේ සභිකයින් වෙනුවෙන් දේවගැති වර්ම්බ්‍රාන්ඩ් විසින් ක්‍රිස්තුස්වහන්සේ වෙත දැක්වූ විශ්වාසවන්ත භාවය හා ධෛර්‍ය වෙනුවෙන් ඔබට පුද්ගලිකව ස්තුතිකරන්නට මම මෙය අවස්ථාවක් කරගනිමි. ලොව පුරා පීඩා විඳින කිතුණුවන් වෙනුවෙන් මැදහත්කාරවීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමට ආරම්භවීමට යෙදුනු කාලයකදී සකල ලෝකය තුල ඔබගේ සාක්ෂිය හා කථාව සියල්ලන්ටම ධෛර්‍යමත්වීමේ පහන් කණුවක් බවට පත්වුනි.

"Tortured For Christ" නැමැති ඔබගේ පොත ආගමික පීඩනයේ වතාවරණය තුල ජීවත්වෙන සෙනඟට සිදුවන දේවල් පිළිබඳව අපව අවදිකර අවධානයට ලක් කොට එය උච්ච ස්ථානයකට ගෙන එන ලදී. ජීවත්වීමට තරම් ලෝකය නොවටී යැයි (හෙබ්‍රෙව් 11:36-38) සැලකූ තැනැත්තන් විසින් දැරූ පීඩා හා වධබන්ධන සහ ඔවුන්ගේ බලාපොරොත්තු කඩවීම් පිළිබඳ මෙම සාක්ෂිය දරන්නාවූ ගණන් නැති නොදන්නාවූ විශ්වාසවන්ත අයවළුන්ව ඔබ විසින් ගණනට ගෙන තිබේ.

දෙවියන්වහන්සේ ඔබට නිතරම ගෞරවකරනසේක්වා!

ආශිර්වාදලත් බලාපොරොත්තුව දෙස බලාසිටින
දේවධර්මාචාර්‍ය ජැක් ඩබ්. හේෆොර්ඩ්
ජේ‍යෂ්ට සභාපාලකතුමා

# පවුල් පර්යේෂණ කවුන්සිලය

1997 ඔක්. 20 දින

ටොම් වයිට් මහතා
ඇ.එ.ජ. අධ්‍යක්ෂක
ද වොයිස් ඔෆ් ද මාටර්ස්, සංස්ථාව

ආදරණීය වයිට් මහතාණෙනි,

රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් විසින් රචිත "Tortured For Christ" නැමැති කෘතියෙහි 30 වන සංවත්සරික මුද්‍රණය පිළිබඳව කරුණු කිපයක් වාර්තාකිරීමට ලැබීම ගෞරවයකි. පළමුවරට මුද්‍රණයකොට දශක තුනක් ගතවුනු පසුවත් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් එය ලියු ලේඛකයා හා ඔහුගේ භාර්‍යාව තුල යාගවීම් වල අසාමාන්‍ය බලය මේ කුඩා පොත විසින් තවමත් සංනිවේදනය කරනුලැබේ.

දෙවන ලෝක මහා යුද්ධයෙන් පසු සෝවියට් දේශය විසින් අත්පත්කරගත් රුමේනියාව "Tortured For Christ" නැමැති පොත සඳහා මුලික වුනි. එහි සඳහන් කර තිබෙන කථාව සිත්දනවන සුළු හා හදවත තුල මහත් දැනවීමක් ඇතිකරන සුළු එකකි. එහෙත් එය සාක්ෂිදැරීම නැමැති විශ්ව විද්‍යාලයක සෑම පිටුවක්ම එයින් ඉදිරිපත් කරයි. තවද සහශ්‍ර වර්ෂ දෙකක් තුල පීඩාව තුලින් ගමන් ගත් කිතුණු ප්‍රාණ පරිත්‍යාගීවරුන් විසින් දරාගන්නා ලද කායික හා මානසීක පීඩාවන් ඒ තුලින් පිළිබිඹුකරයි. රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් ඔහුගේ සිරගතවීම හා හුදකලාව සිටීම නැවත සිහියට ගෙනඑයි. අපට කෙලවරනොවන්නාවු ජීවිතයක් ලබාදෙන වේදනා විඳ මරණයට පත්වු ක්‍රිස්තුස්වහන්සේ සමග ගැඹුරු සමගිවීමක් හා එකමුතුවීමක් ඇතිකරන්නාවු ඔහුගේ ඇදහිල්ලේ මුලාරම්භයට වඩා වැඩි වු දෙයක් එයින් ඉස්මතුකරවයි.

මේකී කඳුළු බිඳු උපදවන ශත වර්ෂයක් නිමාවකට පත්වන්නට ආසන්නවී ඇති කල සහ සෝවියට් අදිරාජ්‍යය තවදුරටත් නොපවතින කල සහ නැගෙනහිර යුරෝපයේ දේශයන් ඔවුන්ගේ වහල්කමේ යදම් බැමි දේව අභක්තික න්‍යායවාදයකින් බැහැරව විසිකරනු ලැබ ඇත. එනමුත් වර්ම්බ්‍රාන්ඩ් යුවල විසින් දරාගන්නා ලද පීඩාවේ සෝදිසිකිරීම සහ කෲරත්වය මේකී පෙළඹවීමේ වැඩය සිදුකිරීම පිනිස කාලයට යෝග්‍ය ලෙස සැකසී තිබේ. ලෝකය පුරාම වෙනත් කිතුණුවන් ඔවුන්ගේ ඇදහිල්ල වෙනුවෙන් පීඩාවිදීම දක්නට ලැබේ. තවද ඔවුන්ව සුඩානයේදී වහල්කමට විකුණනු ලැබීම සහ කුරුසපත්කරනු ලැබීම සිදුවේ. එපමණක් නොව මැදපෙරදිග රටවල් තුල ප්‍රසිද්දියේ නමස්කාර කිරීම තහනම්කරනු ලැබ පවතී. චීනයේ ලාඕගායි නැමැති වහල් කඳවුර තුල සිරගත කරනු ලැබීමට ද කිතුණුවන් ලක්වී ඇත. එපමණක් නොව නීතියෙන් කෙරෙන අසාධාරණකම් වලට හා වෙනත් රටවල් දුසිම් ගණනක් තුලදී ඔවුන් ලක්කරනු ලැබ ඇත. ඔවුන් අතර අපි තවමත් දැනගෙන නැති පොර බැදීම් සිදුකරන පුරුෂයින් සහ ස්ත්‍රීන් ගණන් නැති සංඛ්‍යාවක් සිටිති. එහෙත් රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්ගෙ වේදනාවේ ප්‍රසව වේදනාව අපට දැඩි කර්කශභාවයක් ගෙන දෙන අතර අවසානයේ දී මිදීමක් හා දර්ශනයක් ලබාදෙයි.

මේකී පිටුවල නැවත නැවතත් දන්වනු ලබන ධෛර්‍යමත්වීම් තුල සෑම කිතුණුවෙකුම ප්‍රීතිමත් වෙත්වා! තවද අපගේ කාලයේ හා මතු පැමිණෙන්ට යෙදෙන සියලු කාලවල සහකාර ඇදහිලිවන්තයින් වෙත කෙරෙන ඔවුන්ගේ ප්‍රදානයකිරීම් නැමැති බලාපොරොත්තුව තුල සෑම කිතුණුවෙක්ම ප්‍රීතිවෙත්වා!

මීට අවංක
ගැරී එල්. බවර්

# විටන් විද්‍යාලය

**වර්ෂ 1860 පටන් ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් සහ උන්වහන්සේගේ රාජ්‍ය වෙනුවෙන්**

**විටන්, ඉලිනොයිස් 60187-5593**

ටොම් වයිට්
ද වොයිස් ඔෆ් ද මාටර්ස්, සංස්ථාව
තැ.පෙ. 643
බාර්ට්ලස්විල්
ඔක්ලෝහෝමා
74003

කිතුණුවන්ට ඔවුන්ගේ මේරූ ස්වභාවය ඇතිකරගැනීමට සහ ඇදහිල්ල තුල වර්ධනයවීමට උපකාරවන බයිබලයට අතිරේකව පවතින ඉතාමත් බලවත් පොත් පත් සමූහයවන්නේ ජීවිත ප්‍රවෘත්ති හා ස්වයං ජීවිත කථා ලියා ඇති පොතපතය. රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්ගේ ස්වයං ජීවිත කථාව අතිශයින්ම වැදගත් පොතකි. වර්තමානයේ දක්නට ලැබෙන මෘදු දේවල් වලට එය වැදගත් නිවැරදි කිරීමකි. වර්ම්බ්‍රාන්ඩ්ගේ ජීවිත කථාව “ලෝකය තුල නුඹලාට පීඩා තිබේ.” නැමැති යේසුස්වහන්සේ පැවසු සත්‍යතාවය ගෙනහැර දක්වයි. ඔබ යේසුස්වහන්සේව අනුගමනය කරන්නේ නම් මෙය මෙසේ වනු ඇත. මේකී කතෘවරයා යේසුස්ක්‍රිස්තුස්වහන්සේ ලෝකය ජයග්‍රාහණය කල නිසා ඇදහිල්ල හා බලාපොරොත්තුව ආරක්ෂාකර තිබේ.

ලයිලි ඩබ්. ඩෝසට්
අධ්‍යාපනික දේව සේවා හා
ශුභාරංචි සේවය පිළිබඳ මහාචාර්ය
විටන් විද්‍යාලය, ලිනොයිස්.

## මූලාශ්‍ර



# පීඩාවට ලක්වුනු සභාව ගැන මූලාශ්‍ර

## *රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් විසින් රචිත වෙනත් පොත්*

1. The Oracles of God
දෙවියන්වහන්සේගේ ගුප්ත අභිරහස්

2. In God's underground
දෙවියන්වහන්සේගේ රහසිගත සභාව තුල

3. From suffering to triumph
පීඩා විදීමේ සිට ජයග්‍රහණය දක්වා

4. Christ on the Jewish road
යුදෙව් මාවතේ වු ක්‍රිස්තුස්වහන්සේ

5. The overcommers
විරුද්ධතාවය අභිබවා ජයගන්නන්

6. Victorious Faith
ජයග්‍රාහික ඇදහිල්ල

7. Reaching toward the heights
උච්චතම ස්ථානය කරා ඒගාවීම.

8. With God in solitary confinement
දෙවියන්වහන්සේ සමඟ හුදකලාව සිරමැදිරියක් තුලදී.

9. Proofs of God's Existence
දෙවියන්වහන්සේගේ පැවැත්ම සනාථකරන සාධක

10. The Answer to the Atheist's Handbook.
අදේවවාදීන්ගේ අත් පොතට පිළිතුරු

11 Marx And Satan
මාක්ස් සහ සතන්

12. The Sweetest Song
මිහිරිතම ගීතය

## *"Voice of the Martyrs" විසින් පළකරනු ලැබූ වෙනත් පොත්*

1. The Pastor's Wife
– දේවගැතිවරයාගේ භාර්යාව
සබිනා වර්ම්බ්‍රාන්ඩ් විසිනි.

2. God's Missilies over Cuba
– කියුබාවට ඉහලින් දෙවියන්වහන්සේගේ මිසයිල.
ටොම් වයිට් විසිනි

3. The Spiritual Battle for Cuba
– කියුබාව සඳහා ආත්මික සටන
ටොම් වයිට් විසිනි.

4. Between Two Tigers
කොටින් දෙදෙනෙකු මැද.
ටොම් වයිට් විසිනි.

5. Flight Over the Border
දේශසීමාවට ඉහලින් පියාසැරිය
හැන්ස් මාටින් බ්‍රෝන්

## *රිචඩ් වර්ම්බ්‍රාන්ඩ්ගේ විඩියෝ පට*

1. Preserve The Word
දේව වචනය ආරක්ෂාකිරීම

2. No Other God
වෙනත් දෙවිකෙනෙකු නැත.

3. The Faces of God
දෙවියන්වහන්සේගේ මුහුණු

4. To Shout or to Listen
කෑගැසීමට හෝ සවන්දීමට

5. Rumania: The Return
රුමේනියාවට ආපසු පැමිනිම

6. In Prison with Psalm 107
– සිරගෙය තුල ගීතාවලිය 107 වැනි ගීතිකාව සමග
සබිනා වර්ම්බ්‍රාන්ඩ් විසිනි.

***"Voice of the Martyrs" විසින් පිලියෙල කරන ලද විඩියෝ පටි.***

1. Faith under fire
ගිනි මැදින් ඇදහිල්ල

මේ විඩියෝ පටියෙන් දැක්වෙන්නේ පීඩාවට මුහුණට මුහුණ ලා පෙනි සිටි කිතුණුවන් සමග සම්මුඛ සාකච්ජාවකි - මෙහිදී ඔබට "දමස්කයට යන මාවතේදී" සිත්හැරුණු මුස්ලිම්වරයෙකු හා ඔහුගේ සිත්හැරීමෙන් පසු ඔහු පීඩාවට මුහුණ දුන් අන්දම ඔබට හමුවේ. එපමණක් නොව චීනයේ කිතුණුවන් දැන් මුහුණදෙන්නාවූ "කදිම පහරගසන්න" යන ප්‍රතිපත්තිය යටතේ වූ පීඩා විදිමකට ලක්වුනු චීන දේවගැතිවරයෙකු ද හමුවේ. එපමණක් නොව රහසිගත සභාව තුල කලාවූ වැඩ කොටස හේතුවෙන් අත්අඩංගුවට ගෙන සිරගතකරනු ලැබූ තම පියා ගැන ක්‍රියාකරන වියට්නාම ජාතික නව යොවුන් තරුණයෙකුගේ කථාව ද හමුවේ. මෙම විඩියෝ පටිය "පීඩාව, ගිනිමය පීඩාව දරාගැනිමට මාගේ ඇදහිල්ල සුදානම්ද?" යන්න ගැන සැලකිලිමත්වීමට ඔබට අභියෝගයක් එල්ල කරයි. (ළමයින්ට සුදුසු නොවන බේදජනක දර්ශන මෙහි අඩංගුවන්නට පුළුවන.)

Stephen's Test Of Faith (ළමා විඩියෝ පටිය)
– ස්ටීවන්ගේ ඇදහිල්ල සෝදිසිකිරීම.

දොළොස් වියැති ස්ටීවන් හට ඔහුගේ ඇදහිල්ල හේතුකොට ගෙන උසුළුවිසුළු කරනු ලැබ අවමානයට ලක්කරනු ලබයි. එම රාත්‍රියේදී සිහිනයකින් ස්ටීවන් යේසුස්වහන්සේ මුණගැසීමට ඉතිහාසය මැදින් ගමන්කරයි. ප්‍රාණ පරිත්‍යාගීවු ස්ටීවන්ද ඔහු මුණගැසෙයි. එපමණක් නොව රෝම ක්‍රීඩාගාර තුලට ඇතුල් වු පවුල්ද විලියම් ටින්ඩේල්ව ද වර්තමානයේ මැදපෙරදිග සිටින කිතුණු ළමයින්වද තමුන්ගේ ඇදහිල්ල බෙදාගැනිමට නිර්භිත වු වෙනත් අයද ඔහු මුණගැසෙයි.

ජාත්‍යන්තර වශයෙන් රූපගත කරන ලද ස්ටීවන්ගේ සෝදිසිකිරීම සියලු වයස් වල අයට අභියෝගයක් කරන සබත් පාසැල් සඳහා බලවත් ආයුධයක් වු ආලේපලත් විඩියෝ පටියකි. එය ඔබගේ නිවසට ද පන්තිකාමර වලට ද ගැලවීම නොලැබු අයට ද අභියෝගයක් ගෙන දෙයි. විශ්වාසවන්ත වීරයින් සමග කෙරෙන මෙම ගමනෙන් යේසුස්වහන්සේව අනුගමනය කිරීම නොකඩවා කරන ලෙස කෙරෙන ඔවුන්ගේ ඓයිතිහාසිකමය කැඳවීමකට අපව ධෛර්‍යමත් කරයි. එසේ කරනුයේ අපව "සෝදිසිකිරීම පිනිස" ලක්කරනු ලැබු අවස්ථාවලදීය. (මෙයට ඉද්ධ ලියවිලි පාඨ සඳහන් අධ්‍යයන සැකිල්ලක් ද ඇතුලත්ය.)

ප්‍රාණ පරිත්‍යාගීවරුන්ගේ හඩ නැමැති සංවිධානයට වෙනත් බොහෝ පොත්, විඩියෝ පටි, අත් පත්‍රිකා හා වෙනත් නිශ්පාදන සභාව පිළිබඳව ඔබට වඩ වඩා ඉගෙනගැනීම පිනිස මේවා උපකාරවේ. එක්සත් ජනපදය තුලදී මෙකී පොත පත ලබාගැනීමට අවශ්‍යය නම් නැතහොත් නොමිලේ බේදාදෙනු ලබන මාසික ප්‍රවෘත්ති පත්‍රය ලබාගැනිමට අවශ්‍ය නම් (800)747-0085 වෙත දුරකථනයෙන් කථාකරන්න. එසේ නැතහොත් මෙම ලිපිනයට ලියන්න.

The Voice Of The Martyrs, Inc.
P.O. Box 443
Bartlesville, OK 74005 – 0443
U.S.A.

ඔබ කැනඩාවේ, ඕස්ට්‍රේලියාවේ, එංගලන්තයේ හෝ නවසීලන්තයේ සිටි නම් පහත ලිපිනයට ලියන්න.

The Voice Of The Martyrs
P.O. Box 117
Port Credict
Mississauga, Ontario LSG4L5
Canada

Release International
P.O. Box 19
Bromley BR2 9TZ
England

The Voice Of Matyrs
P.O. Box 598
Penrith NSW2751
Australia

Jesus To The Communist World
P.O. Box 69-158
Glendene, Auckland 1230
New Zealand

# කතෘවරයා පිළිබඳව



දේවගැති රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් කොමියුනිස්ට් සිරගෙයක් තුල වසර 14ක් මුළුල්ලේ පීඩා දරාගත් ශුභාරංචි දේශක දේවගැතිවරයෙකි. ඔහු රුමේනියාවේ සිටින මනුෂ්‍යයින් අතරින් ප්‍රසිද්ධියක් ලබා ඇති ඉතා ස්වල්පදෙනා අතරින් කෙනෙකි. කිතුණු නායකයින්, ග්‍රන්ත කතෘවරුන් සහ අධ්‍යාපනඥයින් අතර ඔහු ද සිටී.

1945 වසර තුල කොමියුනිස්ට්වරු රුමේනියාවේ බලය අත්පත්කරගත් තැන් පටන් ඔවුන්ගේ අරමුණු සඳහා සභාවන් පාලනය කිරීමට ප්‍රයත්න දරන ලදි. එහිදී රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් ක්ෂනිකවම ක්‍රියාත්මකවෙන්ට පටන්ගත් අතර ඔහු ඔහුගේම රටෙහි වහල් සෙනඟ අතර මෙන්ම ආක්‍රමනික රුසියානු සෙබලුන් අතර ද අතිශයින් බලවන්ත “රහසිගත” දේව සේවාවක් පවත්වාගෙන ගියෝය. 1948 දී ඔහුව අත්අඩංගුවට ගනු ලැබු අතර ඔහුගේ භාර්‍යාව වු සබීනාව ද ඒ සමගම අත්අඩංගුවට ගන්නා ලදි. ඔහුගේ භාර්‍යාව තුන් වසරක් මුළුල්ලේ ඩැනියුබ් ගංගාධාරයේ උමංමාර්ග තැනීම පිනිස වහල් කම්කරුවෙකු ලෙස යොදාගන්නා ලදි. රිචඩ් වර්ම්බ්‍රාන්ඩ් තනි සිරමැදුරක තුන් වසරක් ගත කල අතර ඒ කාලයේ ඔහුව දක්නට ලැබුනේ ඔහුට පීඩා කල ඔහුව වධබන්ධන වලට ලක්කල අයට මිස වෙනත් කිසිවෙකුට නොවේ. ඉන් අනතුරුව ඔහුව කණ්ඩායම් සිරමැදිරියකට මාරුකරනලද අතර තවත් වසර 5ක් මුළුල්ලේ එහිදී පීඩා වලට හා වධබන්ධන වලට ලක්කරන ලදි.

කිතුණු නායකයෙකු ලෙස ඔහුට පැවති ජාත්‍යන්තර පිළිගැන්ම හේතුකොටගෙන විදේශ තානාපති නිලධාරීන් විසින් ඔහුගේ සුරක්ෂිතභාවය පිළිබඳව කොමියුනිස්ට් ආණ්ඩුවෙන් ප්‍රශ්න කරනු ලැබු විට ඔවුන් දැන්වුයේ ඔහු රුමේනියාවෙන් පලාගිය බවයි. රහස් පොලිසිය ඔහු හා සමාන, නිදහස ලද වෙනත් කිතුණුවන් මෙන් රඟදක්වමින් සිරගෙදර කනත්ත තුලදී ඔව්හු ඔහුගේ භූමදානයට සහභාගිවු බව ඔහුගේ භාර්‍යාවට දැන්වුවෝය. රුමේනියාවේ ඔහුගේ පවුලට හා විදේශ රටවල ඔහු මරණයටපත්වු බැවින් අමතකකරදමන ලෙස දැන්වුවෝය.

වසර අටහමාරක් සිරගෙය තුල සිටි පසු ඔහුව නිදහස් කරනු ලදුව රහසිගත සභාව සමග ඔහුගේ වැඩය ක්ෂනිකව නැවත ආරම්භකරන ලදි. වසර කීපයකට පසුව ඔහුව නැවත අත්අඩංගුවට ගනු ලැබ අවුරුදු 25ක සිරදඩුවමකට ලක්කරන ලදි. එය සිදුවුයේ 1959 දීය.

වර්ම්බ්‍රාන්ඩ් මහතා 1964 දී පොදු සමාවක් තුල නිදහස්කරන ලදුව ඔහු නැවතත් ඔහුගේ රහසිගත සේවය සිදුකරගෙන ගියේය. තුන්වෙනි වර සිරගතකිරීමක මහත් අනතුරුදායක තත්වය ගැන අවබෝධයක් ඇතුව නෝර්වේ රාජ්‍යයෙහි සිටින කිතුණුවෝ රුමේනියාවෙන් ඔහුව නිදහස්කරගැනීමට කොමියුනිස්ට් ආධිකාරත්වයන් සමග සාකච්ජාකරන ලදි. කොමියුනිස්ට් ආණ්ඩුව ඔවුන්ගේ දේශපාලන සිරකරුවන් "විකිණීම" ආරම්භකලෝය. සිරකරුවෙකුගේ "නිදහස්කිරීමේ මිළය" වුයේ ඩොලර් 1900කි. කෙසේවුවද වර්ම්බ්‍රාන්ඩ් සඳහා එම මිළය වුයේ ඩොලර් 10,000කි.

1966 මැයි මස දී ඔහු ඇ.එ.ජ. සෙනට් මන්ත්‍රි මණ්ඩලයේ අභ්‍යන්තර ආරක්ෂක උපකමිටුව ඉදිරියේ සාක්ෂිදෙන ලද අතර ඔහුගේ පිට පැත්ත පුරා පැතිරී පැවතුනු වධබන්ධන වලින් හටගත් ගැඹුරු තුවාල වල කැලලි 18ක් පෙන්වීම පිනිස ඔහු එම කමිටුව ඉදිරියේදී තම කමිසය හා බැනියම ඉවත්කරන ලදුව සාක්ෂි දෙනලදි. ඇ.එ.ජ. ද යුරෝපයේ ද ආසියාව මුළුල්ලේ ද ප්‍රවෘත්ති පත්‍ර වල එනම් ලොව පුරා ඔහුගේ කථාව පලකරනලදි. 1966 සැප්. මස තුල රුමේනියාවේ කොමියුනිස්ට ආණ්ඩුව ඔහුව ඝාතනයකරනු ලබන්ට සැලසුම්කර තිබෙන බව අනතුරු ඇඟවුවද ඔහු මේකී මරණ තර්ජනය අභියස වුවද නොසැලී සිටි අතර නිශ්ශබ්ද නොවුයේය.

“ද වොයිස් ඔෆ් ද මාටර්ස්” නැමැති කිතුණු ධර්මදුත සේවය ආරම්භකයා හැටියට ඔහුත් ඔහුගේ භාර්යාවත් ලොව පුරා කාර්යාල 30 කට වැඩි ගණනක ජාලයක් පිහිටවීම පිනිස සැරිසැරුවෝය. එමගින් ඉස්ලාමීය ජාතීන් තුලද කොමියුනිස්ට් වියට්නාමයේ ද චීනයේ සහ වෙනත් රටවල ද ස්වකීය ඇදහිල්ල වෙනුවෙන් පිඩාවිදින කිතුණුවන්ට සහ සිරගත වු කිතුණුවන්ගේ පවුල් සඳහා සහනාධාර සැපයීමට ඔහුට හැකිවුනි. ඔහුගේ පනිවිඩය වී තිබුනේ “නපුරු ක්‍රම වේදයන්ට වෛරකරන්න. එහෙත් ඔබට පීඩා කරන්නන්ට ප්‍රේමකරන්න. ක්‍රිස්තුස්වහන්සේ වෙනුවෙන් ඔවුන්ව දිනාගැනීමට උත්සහකරන්න.”

දේවගැති වර්ම්බ්‍රාන්ඩ් පොත් කීපයක කතෘවරයා වන අතර මෙම පොත් ලොව මුළුල්ලේ භාෂා 60 කට වැඩි ගණනකට පරිවර්තනයකරනු ලැබ පවතී. ඔහුව "රහසිගත සභාවේ හඬ" යනුවෙන් ද හඳුන්වනු ලබන අතර කිතුණු නායකයින් ඔහුට ජීවත්වන ප්‍රාණ පරිත්‍යාගීවරයෙකු යන නම පටබැඳ තිබේ. තවද ඔහුව යකඩ කඩතිරය පිටුපස සිටින පාවුල් යන නමින් ද හඳුනවති.

"ඒකාන්තයෙන් ම මෙම ග්‍රන්ථය යකඩ කඩතුරාව පිටුපස භීෂණයේ අත්දැකීම් වලට මුහුණ දෙන අපගේ ම සහෝදර සහෝදරියන් පිළිබඳ නිදහස් ලෝකයේ හෘදසාක්ෂිය පුබුදුවන උපකරණයකි."

වාල්ස් ඩබ්ලිව්. කෝල්සන්
බන්ධනාගාර සහභාගීත්වය

කොමියුනිස්ට් බන්ධනාගාරයක සිරකරුවෙකු ව සිටි රුමේනියානු සභාපාලකවරයෙකුගේ වසර දහහතරක අත්දැකීම් වූයේ මාස ගණන් සිරමැදිරියක් තුළ හුදකලා වී නිරන්තර කුසගින්න සහ අධික සීතලෙන් පීඩා විඳිමින් තම අකමැත්ත පිට මනස වෙනස් කිරීම පිළිබඳ හදවත තුළ ඇතිවූ බලවත් ශෝකය සහ කටුක මානසික වද හිංසාවන් ය.

අතීතයේ බොහෝ පුද්ගලයන්ට සිදුවූ ලෙස ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ තිබූ උද්යෝගිමත් විශ්වාසය සහ උන් වහන්සේ කෙරෙහි වූ ඇදහිල්ල පිළිබඳ ප්‍රසිද්ධියේ සාක්ෂි දැරීම ඔහුගේ අපරාධය ලෙස ගණන් ගැනිණ.

තමන් නිරත වී සිටින ක්‍රියාවන් නිසා තමන්ට ගෙවීමට සිදුවන මිලය පිළිබඳ පූර්ව අවබෝධයක් සහිත ව තම කිතුනු සාක්ෂිය ප්‍රකාශ කිරීමේ කර්තව්‍ය ඉදිරියට ගෙන ගිය මෙම විශ්වාසවන්ත ආත්ම ගෘහයන් තුළ ද, යටිමහල් තුළ සහ කැළෑවන් තුළ ද රැස්වූ අතර සමහර අවස්ථාවලදී විදි කෙළවරක ප්‍රසිද්ධියේ දේශනා කිරීමට පවා නිර්භීත වූහ.

මෙය ශ්‍රේෂ්ඨ ධෛර්ය සම්පන්න භාවයකින් පූර්ණ වූ ද, නොසෙල්වන ඇදහිල්ලකින් සහ විශ්වාස කළ නොහැකි ස්ථිරත්වයකින්ද යුතු ඔවුන්ගේ කථාන්දරයයි.

පොළොව යට රැස්වන සභාව පිළිබඳ වූ මෙම ඉතිහාසය අද දිනය තුළදී ලෝකයේ නොයෙක් දෙසින් නොකඩවා සිදුවන අරගලයන් දක්වා විහිදී යයි.

දේවගැති වුම්බ්‍රැන්ඩ් අත්විඳි පීඩාවේ පරීක්ෂාව සහ කෲරභාවය පිළිබඳ රචනා කිරීමට උචිත ම දිනයේ දී ඔහු ඒ සඳහා යොමු වී ඇත. ලොවපුරා සිටින කිතුනුවන්ට ඔවුන්ගේ ඇදහිල්ල නිසා දිගින් දිගට ම පීඩා විඳීමට සිදුව තිබෙන අතර මොවුන්ගෙන් කරදරයට පත්ව සිටින පුරුෂයන් සහ ස්ත්‍රීන් පිළිබඳ තවදුරටත් අපට අධ්‍යයනය කිරීමට බොහෝ කරුණු තිබෙන අතර ඔවුන්ගේ අවසාන විමුක්තිය පිළිබඳ දැඩි ප්‍රසව වේදනාවකින් යුතුව රිචඩ් වුම්බ්‍රැන්ඩ් තම දර්ශනය ඉදිරිපත් කර ඇත.

ගැරි. එල්. බාවර්
ෆැමිලි රිසච් කවුන්සිල්

දේවගැති වුම්බ්‍රැන්ඩ්ගේ මෙම වාචික හා ලිඛිත පණිවුඩය අද දිනයේ දී ප්‍රකාශයට පත් කර විකාශනය කළ හැකි, සියළුම සන්නිවේදන මාධ්‍යයන් තුළින් ප්‍රකාශයට පත් කර විකාශනය කළ යුතු ය. අධික ලෙස අලෙවිවූ "ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දුක් විඳීම" නම් ඔහුගේ කෘතිය තුළින් ඔහු කරනු ලබන වාචික අයැදීම සහ අවවාදාත්මක හඬ පිළිබඳ අපි දෙවියන් වහන්සේට ස්තුති කරමු.

ආචාර්ය ඩී. ජේම්ස් කෙනඩි
කොරල් රිජ් ප්‍රේස්බෙටේරිය සභාව

වසර 30ක් පැරණි "ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දුක්විඳීම" යන කෘතිය නූතන යුගයේ දී පීඩාවිඳින කිතුනුවන්ගේ තත්ත්වය පිළිබඳ අවධානය යොමු කිරීම සඳහා අද දවසේදී ද බෙහෙවින් වැදගත් වේ.

ෆ්‍රෑන්ක් ආර්. වුල්ෆ්
ඇමරිකා එක්සත් ජනපදයේ කොංග්‍රස් සභික.